209 වන කාණ්ඩය - 7 වන කලාපය
தொகுதி 209 - இல. 7
**Volume 209 - No. 7**

2012 ජුනි 21 වන බ්‍රහස්පතින්දා
2012 யூன் 21, வியாழக்கிழமை
**Thursday, 21st June, 2012**

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**විගණකාධිපතිවරයාගේ වාර්තාව**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
සේවක අර්ථසාධක අරමුදලින් සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලින් කළ ගනුදෙනු

**කල් තැබීමේ යෝජනාව:**
අය වැය කාරක සභාවක් ස්ථාපිත කිරීම

---

# பிரதான உள்ளடக்கம்

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல்மூல வினா:**
ஊழியர் சேமலாப மற்றும் ஊழியர் நம்பிக்கை நிதியங்களின் மூலமான நடவடிக்கைகள்

**ஒத்திவைப்புப் பிரேரணை:**
வரவு செலவு திட்டக் குழுவொன்றைத் தாபித்தல்

---

# PRINCIPAL CONTENTS

AUDITOR-GENERAL'S REPORT

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Transactions Made Through Employees' Provident Fund and Employees' Trust Fund

ADJOURNMENT MOTION:
Establishment of Budget Committee

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

*2012 ජුනි 21 වන බ්‍රහස්පතින්දා*
*2012 யூன் 21, வியாழக்கிழமை*
*Thursday, 21st June, 2012*

***අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස්විය. නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.***
*பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது. பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 1.00 p.m.,* MR .DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *in the Chair.*

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

## පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම

பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக்கூட்டம்
MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2012 ජුනි මස 21 වන බ්‍රහස්පතින්දා, එනම් අද දින පස් වරු 2.30ට ගරු කථානායකතුමාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින් එයට පැමිණ සහභාගි වන ලෙස ගරු සභික මන්ත්‍රීන් සියලු දෙනාට මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාර 2010 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ III වැනි කොටස; දෙවැනි කාණ්ඩයේ VII, VIII සහ IX වැනි කොටස්; සහ හතරවැනි කාණ්ඩයේ IV වැනි කොටස මම ඉදිරිපත් කරමි.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා )**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,"එකී වාර්තාවේ එකී කොටස් මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් 2010 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2011 වර්ෂය සඳහා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාව. - [අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු දි.මු. ජයරත්න මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - கூட்டுறவு, உள்நாட்டு வர்த்தக அமைச்சர்)
(The Hon. Johnston Fernando - Minister of Co-operatives and Internal Trade)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2009 වර්ෂය සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

[ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

2011 වර්ෂය සඳහා ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.- [ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍ය ගරු වාසුදේව නානායක්කාර මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා - පැමිණ නැත.

**ගරු නියෝමාල් පෙරේරා මහතා (විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நியோமால் பெரேரா - வெளிநாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Neomal Perera - Deputy Minister of External Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හෝමාගම, පිටිපන උතුර, ප්‍රීතිකා මාවත, නො. 522/6, බී. යන ලිපිනයෙහි පදිංචි ඊ.ඒ. මහින්ද පියතිලක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු අචල ජාගොඩගේ මහතා - පැමිණ නැත.
ගරු දිලිප් වෙදආරච්චි මහතා - පැමිණ නැත.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාතලේ, දූන්කලවත්ත, දූනුකේවත්ත, නො. 01 ලිපිනයෙහි පදිංචි එල්.ජී. කලුබංඩාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු වී.කේ. ඉන්දික මහතා**
(மாண்புமிகு வி.கே. இந்திக)
(The Hon.V.K. Indika)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පහත සඳහන් පෙත්සම් පහ මම පිළිගන්වමි.

(1) වලස්මුල්ල, කන්දෙ බැද්ද, කන්තෝරුව නිවස යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.එම්. කරුණාසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) සූරියවැව, මහවැලි කඩ ආර, ඇඹිලිපිටිය කඩේ බාරේ යන ලිපිනයෙහි පදිංචි සිරිසේන සමරසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) හම්බන්තොට, සිරිබෝපුර, ඉසුරු නිවස, නො. 6/1 යන ලිපිනයෙහි පදිංචි කාලිංග පද්මතිලක මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) ගාල්ල, බටගන්විල, එම්.ඩී. රතනසූරිය මාවත, නො. 1/16 යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.ජී. බුද්ධදාස මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(5) සූරියවැව, පැරණි බද්දේවැව, මහින්ද ස්ටෝර්ස් බාරේ යන ලිපිනයෙහි පදිංචි කේ.පී. කුසුමපාල මහතාගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### රජයේ රෝහල් : ඖෂධ හිඟය
### அரச வைத்தியசாலைகள்: மருந்துத் தட்டுப்பாடு
### GOVERNMENT HOSPITALS : DRUG SHORTAGE

1330/'11

2. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) රජයේ රෝහල්වලට අවශ්‍ය ඖෂධ වර්ග මිලදී ගැනීම සඳහා වර්ෂ 2011 ජනවාරි මස සිට මේ දක්වා කැඳවා ඇති ටෙන්ඩර් සංඛ්‍යාව කොපමණද;

(ii) ඖෂධ සැපයීම සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කර ඇති ආයතනවල නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) දිවයින පුරා පිහිටි රජයේ රෝහල්වල මේ වන විට අත්‍යවශ්‍ය ඖෂධ වර්ගවල කිසියම් හිඟයක් ඇති වී තිබේද;

(ii) රජයේ රෝහල්වල ඖෂධ හිඟයක් ඇති වීමට හේතු කවරේද;

(iii) හිඟයක් පවතින ඖෂධ වර්ග කවරේද;

(iv) මෙම තත්ත්වය මඟහරවා රජයේ රෝහල්වලට හිඟයකින් තොරව ඖෂධ වර්ග ලබා දීමට කඩිනමින් කටයුතු කරන්නේද;

(v) එසේ නම්, ඒ සඳහා අනුගමනය කරන වැඩ පිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அரச வைத்தியசாலைகளுக்குத் தேவையான மருந்து வகைகளைக் கொள்வனவு செய்வதற்காக 2011 ஆம் ஆண்டு சனவரி மாதம் தொடக்கம் இதுவரை கோரப்பட்டுள்ள கேள்விப்பத்திரங்களின் எண்ணிக்கை யாது;

(ii) மருந்துகளை வழங்குவதற்கு கேள்விப்பத்திரங்களை முன்வைத்த நிறுவனங்களின் பெயர்கள் யாவை

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) நாடு முழுவதிலுமுள்ள அரச வைத்தியசாலைகளில் தற்போது அத்தியாவசிய மருந்து வகைகளுக்கான தட்டுப்பாடு நிலவுகின்றதா;

(ii) அரச வைத்தியசாலைகளில் மருந்துத் தட்டுப்பாடு ஏற்படுவதற்கான காரணங்கள் யாவை;

(iii) தட்டுப்பாடு ஏற்பட்டுள்ள மருந்து வகைகள் யாவை;

(iv) இந்நிலையைத் தவிர்த்து அரச வைத்தியசாலைகளுக்கு தட்டுப்பாடின்றி மருந்து வகைகளை வழங்க துரித நடவடிக்கை மேற்கொள்வாரா;

(v) அவ்வாறாயின் அதற்காகக் கடைப்பிடிக்கப்படும் வேலைத்திட்டம் யாது

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Will he state-

(i) the number of tenders called from January 2011 up to now for the purchase of drugs required for Government hospitals; and

(ii) the names of institutions which have submitted tenders for the supply of drugs?

(b) Will he inform this House-

(i) whether there is a shortage of essential drugs at Government hospitals situated throughout the island at present;

(ii) of the reasons for a drug shortage in Government hospitals;

(iii) of the types of drugs which are in short supply;

(iv) whether action will be taken to overcome this situation promptly and supply drugs without any shortage to Government hospitals; and

(v) if so, the programme to be adopted in this regard?

(c) If not, why?

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 2011 ජනවාරි මාසයේ සිට 2012.05.31 දින දක්වා ටෙන්ඩර් 1461ක් කැඳවා ඇත.

(ii) එම විස්තර ඇමුණුම I හි සඳහන් වේ. ඇමුණුම **සභාගත*** කරමි.

(ආ) (i) නැත. ඖෂධ කිහිපයක හිඟයක් ඇති නමුත්, ඒවා කඩිනමින් ලබා දීමට පියවර ගෙන ඇත.

(ii)
- ඖෂධ සැපයුම්කරුවන් විසින් තොග ලැබීමට නියමිත කාල සටහනට අනුව ඖෂධ සපයා නොදීම.
- සපයනු ලැබූ ඇතැම් ඖෂධවල තොග ඉල්ලුම් කළ ප්‍රමාණයට වඩා අඩු වීම.
- ඇතැම් ඖෂධවල ඉල්ලුම අනපේක්ෂිත ලෙස වැඩි වීම නිසා ඇණවුම් කළ තොග ප්‍රමාණවත් නොවීම.
- රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාව මඟින් සපයන ඖෂධ සඳහා එහි නිෂ්පාදන ධාරිතාව ප්‍රමාණවත් නොවීම. (රජයේ ඖෂධ ඉල්ලුමට සරිලන පරිදි)
- රජයේ රෝහල්වල භාවිත කරන ඖෂධ සඳහා වන ආයු කාලය. ගබඩා උෂ්ණත්වය හා ලේබල තත්ත්වයන් වැනි පිරිවිතරයන් වෙනස් වීම මත උද්ගත වන ගැටලු හේතුවෙන් ඖෂධවල තාවකාලික හිඟයන් ඇති වීම.

(iii) 2012.05.23 දින වන විට හිඟ ඖෂධ වර්ග පිළිබඳ විස්තර ඇමුණුම II හි සඳහන් වේ. ඇමුණුම II **සභාගත*** කරමි.

(iv) ඔව්.

(v)
- වෛද්‍ය සැපයුම් අංශයේ මාස 03කට වඩා හිඟ ඖෂධ ලැයිස්තුවක් සතිපතා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත දන්වා යවන අතර, ඒ අතරින් අත්‍යවශ්‍ය ඖෂධ පිළිබඳ එම සංස්ථාවේ නිලධාරින් සමඟ සාකච්ඡා කර ඒවා කඩිනමින් ලබා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම.
- තොග ලැබීම ප්‍රමාද වන බවට හඳුනා ගත් ජීවිතාරක්ෂක ඖෂධ හිඟ කාල පරාසවලට අනුව ප්‍රාදේශීය වශයෙන් මිලදී ගැනීමට කටයුතු යෙදීම සහ ඇතැම් ඖෂධ වැඩිපුර තොග ඇති සැපයුම්කරුවන්ගෙන් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව හරහා ලබා ගැනීමට කටයුතු කිරීම.
- එසේම හිඟ ඖෂධ පිළිබඳ සමාලෝචන කමිටු රැස්වීම් මඟින් නිරන්තරයෙන් සොයා බලා මෙම තත්ත්වය පාලනය කිරීමට කටයුතු කිරීම.

(ඇ) පැන නොනඟී.

[ගරු ලලිත් දිසානායක මහතා]

***සභාමේසය මත තබන ලද ඇමුණුම්:***

*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்புகள்:*

*Annexes tabled:*

**ඇමුණුම - 1**

Names of Institutions Submitted Tenders for the Supply of Drugs From January 2011

**2012**

| | |
|---|---|
| 1 | A Baur & Co,-Colombo |
| 2 | Abbott - India |
| 3 | Abbott Laboratories - Pakistan |
| 4 | Abbott Labs, USA |
| 5 | ABC Pharma, Colombo |
| 6 | Aditi - India |
| 7 | Agio Pharmaceuticals - India |
| 8 | Agog Pharma - India |
| 9 | Ain Medicare, Malaysia |
| 0 | Akbar Pharmaceuticals - Colombo |
| 1 | Alembic Pharmaceuticals-India |
| 2 | Alice Pharma - India |
| 3 | Alkem Laboratories-India |
| 4 | Alvita Pharma, India |
| 5 | AMN Life Science, India |
| 6 | Amso Pharma - India |
| 7 | Analytical Instruments - Colombo |
| 8 | [illegible]avind Remedies - India |
| 9 | Asence Pharma - India |
| 0 | Astra Zeneca, Sweden |
| 1 | Atco Laboratories-Pakistan |
| 2 | Atoz Pharma, India |
| 3 | Aventis Pharma, India |
| 4 | Axon Drugs, India |
| 5 | B.Braun Medical-Malaysia |
| 6 | B.D.H Industries-India |
| 27 | Bafna Pharma, India |
| 28 | Baxter Healthcere, Singapore |
| 29 | Bayer Schering, Germany |
| 30 | Belco Pharma, India |
| 31 | Biochem Pharmaceutical-India |
| 32 | Biodeal Labs, India |
| 33 | Cadila Healthcare-India |
| 34 | Cadila Pharmaceuticals - India |
| 35 | [illegible]assel Research - India |
| 36 | Celon Laboratories-India |
| 37 | Centaur Pharmaceuticals - India |
| 38 | Central Drugs & Pharma-India |
| 39 | Cipla Ltd-India |
| 40 | Ciron Drugs-India |
| 41 | Citrus Biosys - India |
| 42 | Claris Life Sciences-India |
| 43 | Cosme Pharma - India |
| 44 | CSL Biotherapies-Hong Kong |
| 45 | Elysium Pharma, India |
| 46 | Emar Pharma, Dehiwala |
| 47 | Emcure Pharma, India |
| 48 | Emerchemie, Colombo |
| 49 | Esses Pharmacy-Colombo |
| 50 | Euro Med Labs, Philippine |
| 51 | Famicare, India |
| 52 | Fresenius Kabi Asia-H'Kong |
| 53 | Fresenius Kabi-India |
| 54 | Galentic Pharma, India |

**2011**

| | |
|---|---|
| 1 | A. Baur & Co - Colombo |
| 2 | Abbott Laboratories - USA |
| 3 | Abbott Logistics-Netherlands |
| 4 | Abbott- India |
| 5 | ABC Pharma - Colombo |
| 6 | Aditi International, India |
| 7 | Agio Pharmaceuticals-India |
| 8 | AL.CHI.MI.A.SRL-Italy |
| 9 | Alcon Pharmaceuticals, Switzerland |
| 10 | Alice Pharma , India |
| 11 | Alkem , India |
| 12 | Amso Pharma , India |
| 13 | Anglo French, India |
| 14 | Arora Pharmaceuticals- India |
| 15 | Asence Pharma-India |
| 16 | Associated Lab-Colombo |
| 17 | Astra Zeneca, Switzerland |
| 18 | Atco Laboratories-Pakistan |
| 19 | Atlantic Labs, Thailand |
| 20 | Atoz Pharma , India |
| 21 | Aventis Pharma , India |
| 22 | Axon Drugs, India |
| 23 | B.D.H.Industries-India |
| 24 | Bafna Pharmaceuticals-India |
| 25 | Baxter , Singapore |
| 26 | Bayer, Germany |
| 27 | BDH Industries, India |
| 28 | Belco Pharma-India |
| 29 | Bharat Biotech - India |
| 30 | Bharat Serum, India |
| 31 | Biochem Pharmaceutical-India |
| 32 | Bochringer Inglhein - India |
| 33 | Cadila Healthcare-India |
| 34 | Cadila Pharmaceuticals-India |
| 35 | Cantaur Pharma, India |
| 36 | Cassel Reserch, India |
| 37 | Celon Laboratories - India |
| 38 | Central Drugs - India |
| 39 | Chandra Bhagat Pharma, India |
| 40 | CIC, Colombo |
| 41 | Cipla Ltd - India |
| 42 | Ciron Drugs , India |
| 43 | Claris Life Science-India |
| 44 | CSL Biotherapics , Hongkong |
| 45 | Duxen Pharmaceuticals-India |
| 46 | Elysium Pharmaceuticals-India |
| 47 | Emar Pharma-Dehiwala |
| 48 | Emarchemie - Colombo |
| 49 | Embio Ltd., India |
| 50 | Emcure Pharma, India |
| 51 | Emerchemi , Colombo |
| 52 | Euromed, Philippine |
| 53 | Famicare, India |
| 54 | Ferozsons Labs, Pakistan |

| | 2012 |
|---|---|
| 5 | Galpha Labs, India |
| 6 | Gamma Pharmaceutical, Colombo |
| 7 | George Steuart, Colombo |
| 8 | Getwell Pharmaceuticals - India |
| 9 | Getz Pharma - Pakistan |
| 0 | Gland Pharma - India |
| 1 | Glaxo Wellcome, Moratuwa |
| 2 | Glenmark Pharmaceuticals - India |
| 3 | Hameln Parma - Germany |
| 4 | Hansel Pharmaceuticals - Pakistan |
| 5 | Harcourts - Dehiwala |
| 6 | Harson Laboratories- India |
| 7 | Hemas Pharmaceuticals-Colombo |
| 8 | Hoe Pharmaceuticals - Malaysia |
| 9 | Icconol Petrolium - India |
| 0 | Inga Laboratories -India |
| 1 | Intas Biopharma-India |
| 2 | Inter Pharm - Colombo |
| 1Z | ayson Pharma , Bangladesh |
| 4 | J.A United Exports - India |
| 5 | Johnson & Johnson, India |
| 6 | Karnataka Antibiotics-India |
| 7 | Kilitch Drugs, India |
| 8 | Kopran Ltd-India |
| 9 | Laborate Pharma, India |
| 0 | Leben Laboratories-India |
| 1 | Lenstech Innovations-Battaramulla |
| 2 | Leo Pharmaceuticals-Denmark |
| 3 | M.J Biopharm - India |
| 4 | M.S.J Industries - Colombo |
| 5 | Macleods Pharmaceuticals - India |
| 6 | Madras Pharma, India |
| 7 | Makcur Labs, India |
| 8 | Marck Biosciences-India |
| | Marcue Laboratories India |
| | Marksans Pharma - India |
| 1 | Masters Pharmaceuticals - U.K |
| 2 | MBL Pharma - Pakistan |
| 3 | MEDIBIOS LAB INDIA |
| 4 | Medicamen Biotec, India |
| 5 | Merck Export - Germany |
| 6 | Midascare Pharmaceuticals-India |
| 7 | Miracalus Pharma-India |
| 8 | Molecular Products- UK |
| 9 | Nabiqasim Industries - Pakistan |
| 0 | Naprod Lifescience, India |
| 1 | Nawakethan Reserch, India |
| 2 | NCPC International - China |
| 3 | Neon Laboratories - India |
| 4 | Nestor Pharma- India |
| 5 | Nirma Ltd., India |
| 6 | Novaris, Switzerland |
| 7 | Novartis Pharma, Switzerland |
| 8 | Novo Nordisk, Denmark |
| 9 | Oboi Laboratories-India |

| | 2011 |
|---|---|
| 55 | Fredun Pharma , India |
| 56 | Galentic Pharma , India |
| 57 | Galpha Laboratories-India |
| 58 | George Steuart-Colombo |
| 59 | Getwell Pharma, India |
| 60 | Getz Pharma - Pakistan |
| 61 | Gland Pharma, India |
| 62 | Glaxo Wellcome, Moratuwa |
| 63 | Glenmark Pharmaceuticals-India |
| 64 | Government Pharma , Thailand |
| 65 | Govt. Pharma, Thailand |
| 66 | Halewood Chemical, UK |
| 67 | Hameln Parma, Germany |
| 68 | Harcourts, Dehiwala |
| 69 | Harson Labs , India |
| 70 | Hemas Pharmaceuticals-Colombo |
| 71 | Hoe Pharmaceuticals , Malaysia |
| 72 | Incepta Pharmaceuticals - Bagladesh |
| 73 | IND Swift, India |
| 74 | Indian immunologicals, India |
| 75 | Inga Laboratories-India |
| 76 | Interpharm , Colombo |
| 77 | Jayson Pharma , Bangladesh |
| 78 | Jiangsu, China. |
| 79 | Kalbe International-Singapore |
| 80 | Kandelwal, India |
| 81 | Karnataka Antibiotics - India |
| 82 | Kopran Ltd , India |
| 83 | Laborate Pharmaceuticals-India |
| 84 | Leben Laboratories-India |
| 85 | Leo Pharma - Denmark |
| 86 | Lyka BDR , India |
| 87 | M.J. Biopharma, India |
| 88 | M.S.J Industries - Colombo |
| 89 | Mac Mohan , India |
| 90 | Mackleods, India |
| 91 | Madras Parma, Colombo |
| 92 | Madras Pharma, India |
| 93 | Makcur Laboratories-India |
| 94 | Masters Pharmaceuticals-U.K |
| 95 | Medicamen , India |
| 96 | Medipack - Pakistan |
| 97 | Medopharma, India |
| 98 | Merck Bio Science-India |
| 99 | Merck Sharp-Netherlands |
| 100 | Micro Labs-India |
| 101 | Miracalus Pharma-India |
| 102 | Naprod Lifesciences-India |
| 103 | NCPC International Corp, China |
| 104 | Neon Laboratories-India |
| 105 | Nester, India |
| 106 | Nirma Ltd-India |
| 107 | Norvartis , India |
| 108 | Novartis, Switzerland |
| 109 | Orchid Healthcare, India |

[ගරු ලලිත් දිසානායක මහතා]

2012

| | |
|---|---|
| | Opth Pharma- Pakistan |
| | Orchid Healthcare, India |
| | P.C Pharma - Colombo |
| | P.Jayaneththi & Sons-Ratmalana |
| | Panacea Biotec, India |
| | Pharma Associates-Colombo |
| | Piramal healthcare-India |
| | Pfizer Enterprises - Belgium |
| | Poonam Pharma - India |
| | R & D Intertraders - Colombo |
| | Ranbaxy Laboratories-India |
| | Randwin Exim - India |
| | Reliance Lifescience, India |
| 3 | Remedies - India |
| 4 | S.K Age Exports - India |
| 5 | S.M Pharmaceuticals-Malaysia |
| 6 | Samarth Life Science-India |
| 7 | Sanofi Pasteur SA - France |
| | Sanofi Synthelabo - India |
| | Sante, Pakistan |
| 0 | Serum Institute, India |
| 1 | Searle- Pakistan |
| 2 | Shandong Jewim - china |
| 3 | Shantha Biotechnics-India |
| 4 | Shenyng Sunshine, China |
| 5 | Shree Ganesh-India |
| 5 | Square Pharmaceuticals-Bangladesh |
| 7 | Srimaxo Chemicals |
| 8 | Stallion Labs, India |
| 9 | Star Drugs, India |
| 0 | Sun Pharmaceuticals-India |
| 1 | Swiss Biogenics- Colombo |
| 2 | Swiss Exports, India |
| 3 | Synmedic Labs, India |
| 4 | Thai Nakorn, Thailand |
| | Toprak Mahsullerri, Turkey |
| 6 | Torrent, India |
| 7 | Tozai Boeki Ltd., Japan |
| 8 | Troikaa, India |
| 9 | Umedica Laboratories - India |
| 0 | Unicure Remedies, India |
| 1 | Unijules Life Science- India |
| 2 | Unilab Chemicals - India |
| 3 | Unique Pharmaceutical-India |
| 4 | United Biotech - India |
| 5 | USV Ltd-India |
| 6 | V.H.B Medi Science-India |
| 7 | Vins Bioproducts - India |
| 8 | Vital Healthcare-India |
| 9 | Vivek, India |
| 0 | Wallace Pharmaceuticals-India |
| 1 | Wockhardt Ltd - India |
| 2 | Y.S.P Industries - Malaysia |

2011

| | |
|---|---|
| 110 | P.Jayanetti & Co. Colombo |
| 111 | Panacea Biotec, India |
| 112 | PC Pharma - Colombo. |
| 113 | Pettah Pharmacy, Colombo |
| 114 | Pharma Associates-Colombo |
| 115 | Phillip Chapper ,UK |
| 116 | Piramal Healthcare , India |
| 117 | Poonam Pharma , India |
| 118 | Popular Pharmaceuticals-Bangladesh |
| 119 | PT Otsuka , Indonesia |
| 120 | R&D International-Sri Lanka |
| 121 | Ranbaxy Laboratories-India |
| 122 | Randwin Exim, India |
| 123 | Reliance Life science, India |
| 124 | Renata Ltd-Bangladesh |
| 125 | RPG Life Science, India |
| 126 | S.J. Enterprise, Colombo |
| 127 | Samarth Life Science , India |
| 128 | Sanofi Pasture - France |
| 129 | Sanofi Syntholabo-India |
| 130 | Sante Pharma, Pakistan |
| 131 | Searle, Pakistan |
| 132 | Serum Institute - India |
| 133 | Shandong Jewim - china |
| 134 | Shantha Biotechnics-India |
| 135 | Shenyang Sunshine , china |
| 136 | Shree Ganesh , India |
| 137 | Sirmaxo Chemical, India |
| 138 | Sisili Project, Colombo |
| 139 | SJ & Fazul-Pakistan |
| 140 | Square Pharma, Bangladesh |
| 141 | Star Drugs-India |
| 142 | Sun Pharmaceuticals - India |
| 143 | Swiss Biogenics-Colombo |
| 144 | Thai Nakom Patana, Thailand |
| 145 | Toprak, Turkey |
| 146 | Tozai Boeki, Japan |
| 147 | Troikaa Pharma, India |
| 148 | Unicel - Colombo |
| 149 | Unijules , India |
| 150 | Unique Pharma, India |
| 151 | United Biotech , India |
| 152 | USV Ltd, India |
| 153 | Venus Remedies - India |
| 154 | Vins Bio, India |
| 155 | Wallace Pharmaceuticals-India |
| 156 | Waxoils - India |
| 157 | Win Medicare-India |
| 158 | Y.S.P Industries-Malaysia |
| 159 | Zee Labs , India |

ඇමුණුම - II

**Out of stock Essential items as at 23-05-2012**

| Item No | SRNO | ITEM |
|---|---|---|
| 1 | 010908 | Erythromycin Tablet 250mg |
| 2 | 020212 | Frusemide Injection 20mg in 2ml Ampoule |
| 3 | 020806 | Atenolol Tablet 50 mg |
| 4 | 020864 | Carvedilol tablet 6.25mg |
| 5 | 021218 | Methyldopa Tablet 250 mg |
| 6 | 021519 | Enalapril maleate Tablet 5mg |
| 7 | 022256 | Diltiazem tablet 30mg |
| 8 | 022515 | Dopamine Injection 200mg in 5ml Ampoule |
| 9 | 022701 | Metaraminol Injection 10mg in 1ml Ampoule |
| 10 | 022963 | Clopidogrel tablet 75mg |
| 11 | 030518 | Chlorpromazine hydrochloride Tablet 50mg |
| 12 | 030542 | Fluphenazine decanoate Injection 25mg in 1ml Ampoule |
| 13 | 030770 | Risperidone tablet 2mg |
| 14 | 032586 | Phenobarbitone Injection 200mg in 1ml Ampoule |
| 15 | 040042 | Folic acid Tablet 5mg |
| 16 | 041200 | Calcium lactate Tablet 300mg |
| 17 | 041218 | Magnesium sulphate 40% in 25ml Injection Ampoule |
| 18 | 041501 | Alfacalcidol Capsule 250ng |
| 19 | 041632 | Vitamin C Tablet 100mg |
| 20 | 045181 | Calcium carbonate Tablet 1.25g |
| 21 | 050021 | Ephedrine sulphate Injection 30mg in 1ml Ampoule |
| 22 | 065458 | Human immunoglobulin injection for IV use 5g - 6g vial |
| 23 | 070607 | Metformin Tablet 500mg |
| 24 | 071556 | Prednisolone Tablet 5mg |
| 25 | 075089 | Biphasic Isophane Insulin injection ( Human ) 30% Soluble/70% Isophane |
| 26 | 080733 | Famotidine Tablet 20mg |
| 27 | 090013 | Chloramphenicol Eye Drops 0.5% ,5ml Vial |
| 28 | 091255 | Tropicamide Eye Drops 1% ,5ml Vial |
| 29 | 091289 | Atropine sulphate Eye Drops 1% in 5ml Vial |
| 30 | 100012 | Chloramphenicol Ear Drops 5% 15ml Vial |
| 31 | 110229 | Methoxsalen Tablet 10mg |
| 32 | 120012 | Busulphan Tablet 2mg |
| 33 | 120070 | Melphalan Tablet 2mg |
| 34 | 120525 | Fluorouracil Injection 250mg in 10ml vial |
| 35 | 120533 | Folinic acid Tablet 15mg |
| 36 | 121000 | Asparaginase Injection 10,000 Unit Vial |
| 37 | 121042 | Procarbazine Capsule 50mg |
| 38 | 125070 | Filgrastim Injection 300mcg in 1ml for paediatrics |
| 39 | 125371 | Letrozole Tablet 2.5mg |
| 40 | 140038 | Ibuprofen Tablet 200mg |
| 41 | 140054 | Ibuprofen Syrup 100mg/5ml,100ml Bottle |
| 42 | 140509 | Penicillamine Capsule 250mg |
| 43 | 161505 | Pralidoxime chloride Injection 1g in 20ml Ampoule |

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. "(ආ) (iii)" කොටස යටතේ මා අහපු, "හිඟයක් පවතින ඖෂධ වර්ග කවරේද;" යන ප්‍රශ්නයේ පිළිතුරට අදාළ නම් ලැයිස්තුව ගරු නියෝජ්‍ය ඇමතිතුමා කියෙව්වේ නැහැ. එය සභාගත කිරීම තමයි එතුමා කළේ. නමුත් මට වග කීමක් ඇතිව කියන්නට පුළුවන් එක පැත්තකින් මේක ඖෂධ මාෆියාවක් බව. මහාචාර්ය සේනක බිබිලේට -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමා, කරුණාකර අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

බොහොම කෙටියෙන් අහන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම අද ප්‍රශ්න තුනක් අහලා තිබුණාට, මෙම ප්‍රශ්නයට අදාළව විතරයි මා අතුරු ප්‍රශ්න අහන්නේ. ඒ නිසා ඔබතුමාට කාලය ඉතිරි වනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

මට ප්‍රශ්නයක් නැහැ. නමුත් අතුරු ප්‍රශ්නය අහන්න, අතුරු ප්‍රශ්නයක් විධියට.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහාචාර්ය සේනක බිබිලේ වාගේ අයට ජීවිතයෙන් වන්දි ගෙවන්නත් සිදු වුණේ මේ ඖෂධ මාෆියාව නිසායි. මට දැන ගන්නට අවශ්‍ය වන්නේ මෙයයි. මේ මොහොත වනකොට සාමාන්‍යයෙන් දියවැඩියා රෝගීන්ට ඉතාමත් වැදගත් metformin වැනි ඖෂධවල අඩුවක් තිබෙනවා. ඒ වාගේම glucose strips නැහැ. 3 cc and 5 cc syringesවල අඩුවක් තිබෙනවා. ශත දෙකක් පමණ වන calcium lactate සහ ශත තුනක් පමණ වන thyroxineවල සමහර අවස්ථාවලදී අඩුවක් තිබෙනවා. ඔබතුමා මගේ ප්‍රශ්නයේ "(ආ) (i)" කොටසට පිළිතුරු දැක්වීමේ දී සඳහන් කළා, ඖෂධ සැපයුම්කරුවන් විසින් ඉල්ලන තොග ලබා දෙන්නේ නැහැයි කියලා.

ඔබතුමන්ලා මුදල් ගෙවලා තොග ඉල්ලනවා. ඒ ඉල්ලන තොග ප්‍රමාණය දෙන්නේ නැත්නම් ඒක ඖෂධ සැපයුම්කරුවන්ගේ වැරැද්දක්. තවදුරටත් එවැනි අය ඖෂධ සැපයුම්කරුවන් විධියට අමාත්‍යාංශය ලියා පදිංචි කරලා තියා ගෙන ඉන්නේ ඇයි?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු මන්ත්‍රීතුමනි, කලින් කිව්ව විධියට ඖෂධ වර්ග 43ක් තිබෙනවා. ඒ ලැයිස්තුව තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඖෂධ සම්බන්ධයෙන් කියන්න තිබෙන්නේ මේ කාරණයයි. නිදහස් වෙළෙඳ ක්‍රමය තුළ ලියා පදිංචි වෙන්න ඕනෑ. ඔවුන් ඖෂධ සැපයුවේ නැත්නම් අපි ඒ බලපත්‍රය අවලංගු කිරීමක් කරනවා. අද "ලංකාදීප" පත්‍රය බැලුවා නම් අපේ අමාත්‍යාංශ අනු කමිටුවේ තීරණය තිබෙනවා. ඒ අනුව බාල බෙහෙත් ගෙනාවොත් වටිනාකමින් සියයට 25ක දඩයකුත්, අදාළ

[ගරු ලලිත් දිසානායක මහතා]

සම්පූර්ණ වටිනාකමත් අපි අය කර ගන්නවා. එහෙම අය කර ගන්න කටයුතු කරලා තිබෙනවා. නමුත් නිදහස් වෙළෙඳාමක් තිබෙන්නේ. එතකොට ලියා පදිංචිවීම් කරනවා. ඒ අනුව අපට සමාගම් ලියා පදිංචි කරන්න පුළුවන්. ගිවිසුම්ගතව තමයි අපි මේ කටයුතු කරන්නේ. වෙලාවට සැපයීම් නොකළහොත්; ගිවිසුමට අදාළව කටයුතු නොකළහොත් අපි ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්නවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
වෙලාව ගැන විතරයි කිව්වේ. ප්‍රමාණය ගැනත් කියන්න. වෙලාව පමණක් නොවෙයි, ප්‍රමාණය ගැනත් කියන්න.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
අවශ්‍ය ප්‍රමාණය, සැපයිය යුතු කාලසීමාව ආදී සියල්ල ටෙන්ඩරයක තිබෙනවා. අදාළ ටෙන්ඩර් ගිවිසුමට අනුව සැපයීම නොකළහොත් අදාළ කොන්දේසි කඩ කිරීම මත අනිවාර්යයෙන්ම ඔහුට විරුද්ධව කටයුතු කරනවා. ඒ විධියට ලියා පදිංචි වීම් විශාල සංඛ්‍යාවක් අපි අහෝසි කරලා තිබෙනවා. මීට කලින් ගරු මන්ත්‍රීවරයකු අහපු ප්‍රශ්නයකට මම උත්තර දීලා තිබෙනවා. එහිදී සමාගම්වල නම්, ලබා ගත් මුදල් ප්‍රමාණය සියල්ලම මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙසේයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමා සඳහන් කළා මේ මොහොත වන විට ඖෂධ වර්ග 43ක හිඟයක් තිබෙන බව.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඖෂධ වර්ග 43ක හිඟයක් නැහැ. මේ ඖෂධ 43ම දිගටම හිඟයි කියලා නොවෙයි මා කිව්වේ, ගරු මන්ත්‍රීතුමා. කඩයකින් පාන් ගෙඩියක් ගන්නවා වාගේ එක පාරටම ගිහින් ගන්න බැහැ. පළාත් රෝහල්වල අවශ්‍යතාව, රෝහල්වල අධ්‍යක්ෂවරුන්ගේ අවශ්‍යතාව අනුව තමයි අපි ඖෂධ ඇණවුම් කරන්නේ. යම් යම් අවස්ථාවල හඳුනා ගෙන තිබෙනවා, මේ මේ ඖෂධවල හිඟයක් තිබෙනවාය කියලා. රෝහල් අධිකාරියට, අධ්‍යක්ෂවරුන්ට අපි බලතල දීලා තිබෙනවා, එහෙම අඩු පාඩුවක් වුණාම ඔවුන්ට තිබෙන බලතල අනුව ප්‍රදේශයෙන් ඖෂධ මිල දී ගන්න කියලා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, (ආ) (iii) යටතේ හිඟයක් පවතින ඖෂධ වර්ගවල ලැයිස්තුවක් කිව්වා නේ. ඒ ලැයිස්තුවේ සඳහන් සංඛ්‍යාව කීයද? සභාගත කළ ලැයිස්තුවේ තිබෙන සංඛ්‍යාව කීයද?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
43ක් තිබෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, glucose test strip එකක් ඉවර වෙන්න යන කොට, X-ray සඳහා පාවිච්චි කරන tracing papers ඉවර වෙන්න යන කොට, ඒ අන්තිම එක පාවිච්චියට ගන්න මොහොත වන කොට ඊළඟ stock එක ඇවිල්ලා තිබෙන්න ඕනෑ. එතකොට හිඟයක් ඇති වන්නේ යාන්ත්‍රණය පිළිබඳ ප්‍රශ්නයක් නිසායි. මා අහන්නේ, සියලුම ටෙන්ඩර් පටිපාටි, ක්‍රමවේද තිබියදී ඖෂධයක් ඉවර වෙන්න යන කොට, ඊළඟ ඖෂධ තොගය ලැබෙන පරිදි අඛණ්ඩ ගලා යාමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කරන්න අමාත්‍යාංශයට නොහැකි වෙලා තිබෙන්නේ ඇයි කියලායි.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගලා යාමේ ක්‍රමයක් ඇති කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහර අවස්ථාවල හිඟයන් ඇති වනවා. නමුත් එවැනි හිඟ අවස්ථාවන් වැඩි කාල වේලාවක් තිබෙන්නේ නැහැ. එවැනි අවස්ථාවල එම ඖෂධ මිල දී ගැනීම සඳහා රෝහල් අධිකාරීන්ට අවශ්‍ය බලතල දීලා තිබෙනවා. රෝහල් අධිකාරීන් locally purchase කරනවා. ඒ ප්‍රදේශවලින් මිල ගණන් කැඳවා බලයලත් අයගෙන් ඖෂධ මිල දී ගැනීම් කරනවා. ඖෂධ හිඟයක් ඇති වනවාය කියන එක නමට කියන දෙයක්. නමුත් එහෙම දෙයක් වන්නේ නැහැ. විශේෂයෙන්ම හෘදය රෝග, වකුගඩු රෝග, පිළිකා රෝග සඳහා අවශ්‍ය ඖෂධවලට විශාල මුදලක් වැය වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහර විට එක එන්නත රුපියල් ලක්ෂ හතරකට වඩා වැඩි වෙනවා. නමුත් ඒ සියල්ලම අපි ඒ රෝගීන් වෙනුවෙන් ලබා දෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වකුගඩු රෝගියෙකුට සති ගණනකට සැරයක් ලේ පිරිසිදු කරන්න ඕනෑ; dialysis කරන්න ඕනෑ. ඒක සම්පූර්ණයෙන්ම අප නොමිලේ කර දෙනවා. නැත්නම් ඔහුට රුපියල් හත් අටදාහක් ඒකට වියදම් කරන්න වෙනවා. බෙහෙත් වර්ග අනිවාර්යයෙන් ඔවුන්ට දෙන්න ඕනෑ. මේවා සියල්ල රජය බලා ගන්න ඕනෑ. නිකම් රෝගීන්ට මියැදෙන්න දෙන්නේ නැහැ. ඒ නිසා රජය මේ නිදහස් සෞඛ්‍ය සේවාව ශක්තිමත්ව කර ගෙන යනවා. ඒ නිසා මෙහෙම ඖෂධවල හිඟතාවක් ඇති වෙන්නේ නැහැ.

## මෝටර් වාහන ලියා පදිංචි කිරීමේ සහතික මුද්‍රණය : ටෙන්ඩර්

## மோட்டார் வாகனப் பதிவுச் சான்றிதழ் அச்சிடல்: கேள்விகோரல்கள்

## PRINTING OF MOTOR VEHICLE REGISTRATION CETIFICATES : TENDERS

2041/'11

4. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මෝටර් වාහන ලියා පදිංචි කිරීමේ සහතික මුද්‍රණය කිරීමේ ටෙන්ඩරය සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් ප්‍රසිද්ධ කළ දැන්වීම අනුව අයදුම්පත් ඉදිරිපත් කළ ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනය ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ ආයතනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ටෙන්ඩර් කමිටුවේ සාමාජිකයින්ගේ නම්, ලිපිනයන් සහ ඔවුන් දරන තනතුර කවරේද;

(ii) මේ වනවිට ටෙන්ඩරය ලබා දී ඇති ආයතනය කවරේද;

(iii) එම ආයතනයේ අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) එම ආයතනයට ටෙන්ඩරය ලබා දීමට හේතු කවරේද;

(v) එම ටෙන්ඩරයේ වලංගු කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மோட்டார் வாகனப் பதிவுச் சான்றிதழை அச்சிடும் கேள்விப் பத்திரத்திற்காக மோட்டார் வாகனப் போக்குவரத்துத் திணைக்களத்தினால் வெளியிடப்பட்ட அறிவித்தலின் பிரகாரம் விண்ணப்பங்களைச் சமர்ப்பித்த நிறுவனங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) கேள்விப்பத்திரத்திற்கு விண்ணப்பித்திருந்த ஒவ்வொரு நிறுவனமும் சமர்ப்பித்திருந்த விலைகள் வெவ்வேறாக யாவை என்பதையும்;

(iii) ஆகக்குறைந்த விலையைச் சமர்ப்பித்திருந்த நிறுவனம் யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்படி கேள்விப் பத்திரக் குழுவிலுள்ள உறுப்பினர்களின் பெயர்கள், முகவரிகள் மற்றும் அவர்கள் வகிக்கும் பதவிகள் யாவை என்பதையும்;

(ii) இன்றளவில் கேள்விப்பத்திரம் வழங்கப் பட்டிருக்கும் நிறுவனம் யாதென்பதையும்;

(iii) அந்த நிறுவனத்தின் பணிப்பாளர் சபை உறுப்பினர்களின் பெயர்கள் மற்றும் முகவரிகள் யாவை என்பதையும்;

(iv) குறித்த நிறுவனத்திற்கு கேள்விப்பத்திரம் வழங்கப்பட்டமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(v) மேற்படி கேள்விப்பத்திரத்தின் செல்லுபடியாகும் காலம் யாதென்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport:

(a) Will he state-

(i) the number of institutions that submitted applications for the tender to print motor vehicle registration certificates, in response to the advertisement published by the Department of Motor Traffic;

(ii) the bids submitted by each of the institutions that applied for the tender, separately; and

(iii) the name of the institution that had submitted the lowest bid?

(b) Will he inform this House -

(i) the names and addresses of the members of the above-mentioned tender board and the posts held by them;

(ii) the institution that has been awarded the tender by now;

(iii) the names and addresses of the members of the board of directors of that institution;

(iv) the reasons for awarding the tender to the aforesaid institution; and

(v) the valid period of that tender ?

(c) If not, why?

**ගරු කුමාර වෙල්ගම මහතා (ප්‍රවාහන අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார வெல்கம - போக்குவரத்து அமைச்சர்)
(The Hon. Kumara Welgama - Minister of Transport)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ආයතන 3 කි.

(ii)

| ආයතනයේ නම | ඒකක මිල | ලක්ෂ 10ක් සඳහා මිල | NBT | VAT | මුළු මුදල |
|---|---|---|---|---|---|
| MBA සිස්ටම්ස් පුද්ගලික සමාගම | 5.02 | 5,020,000.00 | 100,400.00 | 614,448.00 | 5,734,848.00 |
| ටොපෑන් ෆෝම්ස් (කලම්බු) ලිමිටඩ් | 6.40 | 6,400,000.00 | 128,000.00 | 783,360.00 | 7,311,360.00 |
| ඩයමන්ඩ් ඉන්ටර්නැෂනල් ලංකා (පුද්) සමාගම | 19.80 | 19,800,000.00 | _ | 2,376,000.00 | 22,176,000.00 |

[ගරු කුමාර වෙල්ගම මහතා]

(iii) එක් මෝටර් වාහන ලියා පදිංචි කිරීමේ සහතිකයක් සඳහා රු. 5.02+ NBT+VAT ක අවම මිල MBA සිස්ටම්ස් (පුද්) සමාගම ඉදිරිපත් කර ඇත.

(ආ) (i) 01. බී.ඩී.එල්. ධර්මප්‍රිය මහතා (සභාපති)
මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්,
මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව.

02. ඩී.එම්.ආර්.කේ. ගුණතිලක මිය (සාමාජික)
ප්‍රධාන ගණකාධිකාරී,
මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව.

03. ජේ.එම්. තිලකරත්න බණ්ඩා මහතා (සාමාජික)
අධ්‍යක්ෂ (සැලසුම්)
ප්‍රවාහන අමාත්‍යාංශය.

(ii) ටොපැන් ෆෝම්ස් (කලම්බු) ලිමිටඩ් ආයතනය

| | සම්පූර්ණ නම | ලිපිනය |
|---|---|---|
| (iii) (1) | සංජීව අනුප්‍රිය වික්‍රමනායක | අංක 4/40 D, තලාකොටුව ගාර්ඩින්, කොළඹ 05. |
| (2) | හරිත්‍රානි ලීඩියා රොසේන් විජේනායක | අංක 02, බොතේජු මාවත, කොළඹ 05. |
| (3) | කාංචන රත්වත්තේ | අංක 7/18, 2වන පටුමග, නාවල පාර, රාජගිරිය. |
| (4) | මෙයිකෝ ඔකා | අංක 345, ශාන්ති මාවත, අළුබෝමුල්ල, පානදුර |

(iv) වාහන ලියා පදිංචි කිරීමේදී සහ නැවත පැවරුම් කිරීමේදී නව ලියා පදිංචි සහතිකයක් වාහන හිමිකරුවන් වෙත නිකුත් කිරීම මෝටර් රථ ආඥාපනතට අනුව අවශ්‍ය වේ. එබැවින් තාක්ෂණික ඇගැයීම් කමිටුවේ පහත දක්වා ඇති නිර්දේශ මත කරන ලද නිර්දේශ හා ටෙන්ඩර් මණ්ඩල අනුමැතිය පරිදි දෙවන අවම මිල සඳහන් ආයතනය වෙත ටෙන්ඩරය පිරිනමා ඇත.

1. අවම මිල ඉදිරිපත් කර තිබූ MBA සිස්ටම්ස් පෞද්ගලික සමාගම විසින් ඉදිරිපත් කළ ආදර්ශ ලියා පදිංචි කිරීමේ සහතිකය දෙපාර්තමේන්තුව විසින් දක්වන ලද අවශ්‍යතා සම්පූර්ණ කර නොතිබීම, එනම් ටෙන්ඩර්කරුවන් වෙත පරීක්ෂා කිරීම සඳහා ලබා දෙන ලද ලියා පදිංචි සහතික ආකෘති පත්‍රයට මුළුමනින්ම සමාන වන ලෙස ආදර්ශ ඉදිරිපත් කර නොතිබීම.

2. ටෙන්ඩර් කොන්දේසි යටතේ පහත සඳහන් කරනු ලැබූ අමතර ආරක්ෂිත උපක්‍රම ලෙස අවම මිල සඳහන් ටෙන්ඩර්කරුගේ ආරක්ෂිත උපක්‍රමවලට වඩා විධිමත් ලෙස හා වැඩි උපයෝගීතාවෙන් යුත් ආරක්ෂිත උපක්‍රමයක් ටොපැන් ෆෝම්ස් ලිමිඩට් (කලම්බු) ආයතනය විසින් ඉදිරිපත් කර තිබීම. එනම්, පාරජම්බුල ආලෝකයෙන් පමණක් කියවිය හැකි නොපෙනෙන තීන්තෙන් මුද්‍රතයක් ලියා පදිංචි සහතිකයට ඇතුළත් කර තිබීම.

3. ටොපැන් ෆෝම්ස් ආයතනය රුපියල් 6.40+NBT+VAT ක් වැනි මුදලකට වඩාත් තත්ත්වයකින් යුක්ත ලියා පදිංචි සහතික ආකෘති පත්‍රයක් ලබා දීම.

4. ටොපැන් ෆෝම්ස් ආයතනය විසින් දීර්ඝ කාලයක සිට මේ දක්වා සාර්ථක ලෙස ලියා පදිංචි සහතික ආකෘතිපත්‍ර ප්‍රමාදයකින් තොරව සහ නියමිත පිරිවිතරයන්ට අනුව සැපයීමට කටයුතු කර තිබීම.

(v) ලියා පදිංචි සහතික ආකෘති පත්‍ර ලක්ෂ 10ක් මුද්‍රණය කිරීමේ ටෙන්ටර් කාලය 2012.03.14 දක්වා වලංගුව පැවති අතර, ටෙන්ඩර්කරුගේ ඉල්ලීම මත එම කාලය 2012.04.03 දින දක්වා දීර්ඝ කරන ලදී.

(ඇ) අදාළ නොවේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්න තිබෙනවාද, ගරු මන්ත්‍රීතුමා?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැත.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දෙන්නාට නම් අතුරු ප්‍රශ්න තිබෙනවා. නමුත් මම මුලින් සඳහන් කළ විධියට ඒවා මේ සභාවේ කියන්න බැහැ. ඒ නිසා අපි දෙන්නා එළියට ගිහිල්ලා ඒ ගැන සාකච්ඡා කරන්නම්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
බොහොම ස්තුතියි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රවාහනය ගැන අතුරු ප්‍රශ්නයක්-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මන්ත්‍රීතුමා එළියට ගිහිල්ලා අහගන්න.

## වාහන දුම් පරීක්ෂා කිරීමේ ව්‍යාපෘතිය : විස්තර

வாகனப் புகை பரிசோதனைக் கருத்திட்டம்: விபரம்
VEHICLE EMISSION TESTING PROJECT : DETAILS

2237/'12

**5. ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය (1):

(අ) (i) වාහන දුම් පරීක්ෂා කිරීමේ ව්‍යාපෘතියේ අරමුණු කවරේද;

(ii) එම පරීක්ෂණයේ ක්‍රියා පටිපාටිය කුමක්ද;

(iii) 2011 වර්ෂයේදී දුම් පරීක්ෂාව සිදු කළ වාහන සංඛ්‍යාව, ඒ සඳහා එක් වාහනයකින් අය කළ මිල ගණන් එක් එක් වාහන වර්ගය අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) 2011 වර්ෂයේදී දුම් පරීක්ෂාවෙන් උපයා ගත් මුළු මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වාහන දුම් පරීක්ෂා කිරීමේ ව්‍යාපෘතියේ පෞද්ගලික ඒජන්තවරුන්ගේ හා මහජන ආයතනයන්ගේ කාර්ය භාරය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත පරීක්ෂණය සිදු කරනු ලබන පෞද්ගලික ඒජන්තවරුන් තෝරා ගැනීම පිළිගත් ටෙන්ඩර් පටිපාටියක් අනුව සිදු කළේද;

(iii) සමස්ත ආදායමින් එම ඒජන්තවරුන්ට මුදල් ගෙවනු ලබන ක්‍රමවේදය කවරේද;

(iv) එම ඒජන්තවරුන්ගේ කළමනාකාරිත්ව දුර්වලතා හා දූෂණ සොයා බැලීමට නිසි පසු විපරම් යන්ත්‍රණයක් ක්‍රියාත්මක වන්නේද;

(v) එසේ නම්, මේ වන විට වාර්තා වී ඇති සිද්ධි හා ඊට අදාළව ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත ව්‍යාපෘතියේ මූලික අරමුණු ළඟා කර ගෙන තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வாகனப் புகை பரிசோதனைக் கருத்திட்டத்தின் நோக்கங்கள் யாவை என்பதையும்;

(ii) மேற்படி புகைப் பரிசோதனையின் நடைமுறை யாதென்பதையும்;

(iii) 2011ஆம் ஆண்டில் புகை பரிசோதிக்கப்பட்ட வாகனங்களின் எண்ணிக்கையினையும் இதற்காக ஒவ்வொரு வாகனத்திற்குமென அறவிடப்பட்ட கட்டணங்கள் ஒவ்வொரு வாகனத்தினதும் வகைக்கு அமைவாக தனித்தனியே யாவை என்பதையும்;

(iv) 2011ஆம் ஆண்டில் புகை பரிசோதனையின் மூலம் ஈட்டிய முழுப் பணத்தொகை எவ்வளவென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) வாகன புகை பரிசோதனைக் கருத்திட்டத்தில் தனியார் முகவர்களினதும், பொது நிறுவனங்களினதும் பணிகள் தனித்தனியே யாவை என்பதையும்;

(ii) மேற்படி பரிசோதனையை மேற்கொள்ளும் தனியார் முகவர்களின் தெரிவானது ஏற்றுக்கொள்ளப்பட்ட கேள்விப் பத்திர நடைமுறைக்கு ஏற்ப மேற்கொள்ளப்பட்டதா என்பதையும்;

(iii) முழுமொத்த வருமானத்தில் மேற்படி முகவர்களுக்கு பணம் செலுத்துவதற்கான முறைமை யாதென்பதையும்;

(iv) மேற்படி முகவர்களின் முகாமைத்துவ பலவீனம் மற்றும் மோசடிகளை கண்டறிவதற்காக உரிய பின்னாய்வுப் பொறிமுறையொன்று அமுலாக் கப்பட்டுள்ளதா என்பதையும்

(v) ஆமெனின், இன்றளவில் அறிக்கையிடப் பட்டுள்ள சம்பவங்கள் மற்றும் அவை தொடர்பில் மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக் கைகள் யாவை என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) மேற்படி கருத்திட்டத்தின் அடிப்படை நோக்கங்கள் எய்தப்பட்டுள்ளனவா என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Transport:

(a) Will he state-

(i) the objectives of the project for testing vehicle emissions;

(ii) the procedure followed in conducting the aforesaid test;

(iii) separately on the basis of each type of vehicles, the number of vehicles subjected to emission test in the year 2011 and the amount charged from a single vehicle; and

(iv) the total income earned from vehicle emission tests in the year 2011 ?

(b) Will he inform this House-

(i) separately of the function performed by private agents and public institutions in relation to the project for testing vehicle emissions;

(ii) whether the private agents who conduct the aforesaid test were selected through an accepted tender procedure;

(iii) of the methodology adopted to make payments to the aforesaid agents, from the total income received;

(iv) whether proper follow-up mechanism is implemented to look into the management weaknesses and corrupt practices of the aforesaid agents; and

(v) if so, of the incidents reported up to now and the steps taken regarding them?

(c) Will he state whether main objectives of the aforesaid project have been achieved?

(d) If not, why ?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

(අ) (i) * 1998 ශ්‍රී ලංකාවේ වායු දූෂණය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලද අංක 568/98 දරන පෙත්සම විභාග කිරීමෙන් අනතුරුව දෙන ලද නියෝගය අනුව වාහනවලින් පිට වන දූෂ්‍යකාරක අවම කිරීම සඳහා ප්‍රකාශයට පත් කරන ලද ප්‍රමිතීන් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම.

* වැඩි වන වාහන සංඛ්‍යාවට සාපේක්ෂව අවට වායු තත්ත්වය නිසි ප්‍රමිතියට පවත්වා ගෙන යාම.

* වාහනවල තත්ත්වය නිසි ප්‍රමිතියට පවත්වා ගෙන යාම.

(ii) එම පරීක්ෂණ 2008 ජූලි මස 09 ගැසට් පත්‍රයේ ප්‍රකාශිත ප්‍රමිතීන් පහත සඳහන් ක්‍රියාපටිපාටිවලට අනුව ක්‍රියාත්මක කරයි.

<u>ඩීසල් මෝටර් වාහන</u>

- SAE Recommended Practice J1667 යන ජාත්‍යන්තර ක්‍රමවේදයක් (ප්‍රමිතියට) අනුව ක්ෂණික ත්වරනයේදී (වේගය වැඩි කිරීමේදී) ධූම පාරාන්ධතාවය පරීක්ෂා කරනු ලබයි. K සාධකය එනම් අවශෝෂක සංගුණකය ප්‍රකාශිත ප්‍රමිතියට අනුව 8ට අඩු විය යුතුය.

<u>පෙට්‍රල් වාහන පරීක්ෂා කිරීම</u>

| | HC (PPM V/V | CO (CO% V%) | වෙනත් කරුණු |
|---|---|---|---|
| යතුරු පැදි මෝටර් ට්‍රයිසිකල් හැර වෙනත් පෙට්රල් වාහන | 1200 | 4.5 | එන්ජිම පණ ගන්වා ධාවනය නොකර සහ 2500 RPM බර නොපටවා |
| පෙට්රල් යතුරු පැදි මෝටර් ට්‍රයිසිකල් | 9000 | 6 | එන්ජිම පණ ගන්වා ධාවනය නොකර සහ 2500 RPM බර නොපටවා |

* HC (PPM V/V) හයිඩ්‍රොකාබන් පරිමාව අනුව මිලියනයට කොටස්
* CO(co%V%)- කාබන්මොනොක්සයිඩ් පරිමා ප්‍රතිශතය

එම පරීක්ෂණ ඉන්ටර්නැෂනල් ඕගනයිසේෂන් ඔෆ් ලීගල් මෙට්රොලොජි (O.I.M.L.)සංවිධානයේ 1991 අංක R 99 යන ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව සිදු කරනු ලබයි.

(iii) 2011 වසරේ දුම් පරීක්ෂාව සිදු කරන ලද මුළු වාහන සංඛ්‍යාව 2,230,265ක් වේ.

මෙම වසරේ එක් වරක් වාහන පරීක්ෂණ මිල ගණන් සංශෝධනයට ලක් වී ඇති අතර අදාළ මිල ගණන් පහතින් දක්වා ඇත.

| වාහන වර්ගය | 2011.01.01 සිට 2011.11.30 දක්වා (රු.) | 2012 .12.01.සිට (රු.) |
|---|---|---|
| මෝටර් සයිකල් | 360.00 | 415.00 |
| මෝටර් ට්‍රයිසිකල් | 440.00<br>505.00 | |
| මෝටර් කාර් | 960.00 | 1110.00 |
| ද්විත්ව කාර්ය වාහන | 1040.00 | 1200.00 |
| මෝටර් ලොරි | 1360.00 | 1560.00 |
| මෝටර් කොච් | 880.00<br>1020.00 | |
| බස් | 880.00 | 1010.00 |
| ප්‍රයිම් මුවර් | 1440.00 | 1660.00 |

(iv) 2011වසරේදී දුම් පරීක්ෂාවෙන් උපයා ගත් මුළු මුදල රු. 105,211,997.00 කි.

(ආ) (i) පෞද්ගලික ඒජන්තවරුන්ගේ කාර්ය භාරය වනුයේ

* පරිසර අමාත්‍යාංශය මගින් 2008 ජූලි මස 09 දින අංක 1557/14 දරන ගැසට් පත්‍රයේ ප්‍රකාශිත ප්‍රමිතීන් අනුව වාහන පරීක්ෂා කර ආදායම් බලපත්‍රය ගැනීමට අවශ්‍ය වායු විමෝචන පරීක්ෂණ සහතිකය නිකුත් කිරීම ප්‍රමාදයකින් තොරව ඉටු කිරීම සඳහා පරීක්ෂණ මධ්‍යස්ථාන හා ජංගම පරීක්ෂණ ස්ථාන ඇති කිරීම.

* උතුරු පළාත හැර අනිකුත් පළාත් අටේ පරීක්ෂණ මධ්‍යස්ථාන අවශ්‍යතාව පරිදි පිහිටුවීම, යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම හා කාර්ය මණ්ඩලය නඩත්තු කිරීමයි.

මහජන ආයතනයන්ගේ කාර්ය භාරය වනුයේ

<u>මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව</u>

පරිසර අමාත්‍යාංශය මගින් 2008 ජූලි මස 09 දින අංක 1557/14 දරන ගැසට් පත්‍රයේ ප්‍රකාශිත ප්‍රමිතීන් අනුව වාහන පරීක්ෂා කර ආදායම් බලපත්‍රය ගැනීමට අවශ්‍ය වායු විමෝචන පරීක්ෂණ සහතිකය නිකුත් කිරීම ප්‍රමාදයකින් තොරව නිකුත් කිරීම හා වායු විමෝචන පරීක්ෂණ සහතිකය නිකුත් කිරීම නිසි ප්‍රමිතියට සිදු වන්නේ ද යන්න පරිසර අමාත්‍යාංශයේ ආයතනවල නිලධාරින් හා මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරින් සමඟ පරීක්ෂා කිරීම, අධීක්ෂණය කිරීම සහ විගණනය කිරීම හා වායු විමෝචන වැඩසටහනේ සියලුම කටයුතු සම්බන්ධීකරණය කිරීම.

<u>පරිසර අමාත්‍යාංශය</u>

ප්‍රමිතීන් ප්‍රකාශයට පත් කිරීම, වායු විමෝචන පරීක්ෂණ සහතිකය නිකුත් කිරීම නිසි ප්‍රමිතියට සිදු වන්නේ ද යන්න පරීක්ෂා කිරීම, අධීක්ෂණය කිරීම හා පරීක්ෂණ දත්ත විශ්ලේෂණය කිරීම.

මධ්‍යම පරිසර අධිකාරිය

වායු විමෝචන පරීක්ෂණ සහතිකය නිකුත් කරන මධ්‍යස්ථාන පරීක්ෂා කිරීම, ප්‍රමිතීන් ප්‍රකාශයට පත් කිරීමට සකස් කිරීම අධීක්ෂණය කිරීම හා අදාළ පරිසර සහතික නිකුත් කිරීම.

මිණුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

පරීක්ෂණ උපකරණ ක්‍රමාංකණය කිරීම සහ සහතික නිකුත් කිරීම හා මධ්‍යස්ථානවල උපකරණ පරීක්ෂා කිරීම සහ විගණනය කිරීම.

(ii) 1998 ශ්‍රී ලංකාවේ නාගරික වායු දූෂණය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලද අංක 569/98 දරන පෙත්සම විභාග කිරීමෙන් අනතුරුව වායු විමෝචන ප්‍රමිතීන් ප්‍රකාශයට පත් කරන ලෙස පරිසර අමාත්‍යවරයාට දුන් නියෝගය අනුව එම ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම සඳහා වායු විමෝචන මධ්‍යස්ථාන පිහිටුවීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඇතිව මිල නියම කිරීමේ කමිටුවක් හා ව්‍යාපෘති කමිටුවක් පත් කරන ලදී. ඉන් අනතුරුව ව්‍යාපෘති කමිටුව විසින් සකස් කරන ලද යෝජනා කැඳවීමේ ලියකියවිලි (Request for Proposal) මිල නියම කිරීමේ කමිටුව විසින් අනුමත කිරීමෙන් පසු විවෘත යෝජනා කැඳවන ලද අතර ඒ සඳහා යෝජනා 7ක් ඉදිරිපත් කරන ලදී. එයින් තෝරා ගන්නා ලද ක්ලින්කෝ ලංකා පුද්ගලික සමාගම හා ලාෆ් එකෝ ශ්‍රී පුද්ගලික සමාගම යන සමාගම්වලට වායු විමෝචන පරීක්ෂණ මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. ඉන් අනතුරුව වායු විමෝචන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව එම සමාගම් සමඟ නීතිපති දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලද ගිවිසුමක් අමාත්‍ය මණ්ඩලයේ ද අනුමැතිය ඇතිව අත්සන් කරන ලදී.

(iii) සමස්ත ආදායමෙන් සියයට අනූවක (90%ක) මුදලක් යෝජනා කැඳවීමේ ලියකියවිලි (Request for Proposal) හා ගිවිසුම් අනුව අදාළ ඒජන්තවරුන්ට ගෙවනු ලැබේ.

(iv) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය, මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව හා පරිසර අමාත්‍යාංශය පසු විපරම් යන්ත්‍රණයක් ක්‍රියාත්මක කරනු ලබයි.

ඒ අනුව පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

වායු විමෝචන පරීක්ෂණ මධ්‍යස්ථාන ක්‍රමවත් කිරීම, වැඩි දියුණු කිරීම හා ප්‍රමිතීන් පවත්වා ගෙන යාම සඳහා මධ්‍යස්ථාන පරීක්ෂා කිරීම.

* මධ්‍යස්ථාන විගණනය කිරීම හා පසු විපරම් කිරීමේ විමධ්‍යගත වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
* මාර්ගවල වාහන පරීක්ෂා කිරීම.
* මාර්ගවල අධික ලෙස දුම් පිට වන වාහන නිරීක්ෂණය කිරීම.

මෙම ඒකාබද්ධ පරීක්ෂණ වැඩසටහන අනුව එක් එක් දිස්ත්‍රික්කවලට අදාළ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් සෑම දිස්ත්‍රික්කයකම ඇති පරීක්ෂණ මධ්‍යස්ථාන මාසයකට වරක් පරීක්ෂාවට ලක් කරනු ලබයි. එසේම පරිසර අමාත්‍යාංශයේ වායු සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය විසින් මධ්‍යස්ථාන පරීක්ෂා කිරීමේ වැඩ පිළිවෙළක්ද ක්‍රියාත්මක වේ.

(v) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වායු විමෝචන කාර්යාලය වෙත ලැබෙන සියලුම මහජන පැමිණිලි හා වෙනත් ආයතන විසින් අප වෙත ඉදිරිපත් කරන ලද පැමිණිලිවලට අනුව

අප විසින් ඒ සඳහා ක්‍රියාමාර්ග ගනු ලබයි. ඒ අනුව පැමිණිලි අදාළ ආයතනයේ නිලධාරීන් ගෙන්වා පරීක්ෂණ පවත්වනු ලබන අතර ඒ සම්බන්ධව වැරදිකරු බව වාර්තා වුවහොත් එවැනි අවස්ථාවල ඔවුන්ට අදාළ දඬුවම් ලබා දීමට කටයුතු කර ඇත.

* 2011.05.12 දින ඔරුගොඩවත්ත ලාෆ් එකෝ ශ්‍රී මධ්‍යස්ථානය දුම් පරීක්ෂාව සඳහා නුපුහුණු සේවකයන් යොදා පරීක්ෂණය සිදු කිරීම නිසා තාවකාලිකව පරීක්ෂණ මධ්‍යස්ථානය අත්හිටුවා පුහුණු නිලධාරීන් අනුයුක්ත කර මධ්‍යස්ථානය නැවත විවෘත කිරීම.
* 2011 .05.13 දින වැලිසර ක්ලින්කෝ මධ්‍යස්ථානයේ නිලධාරීන් සඳහා වැඩිදුර පුහුණුවක් ලබා දී වෙනත් මධ්‍යස්ථානවලට අනුයුක්ත කිරීමට නිර්දේශ කිරීම.
* 2011.05.24 දින මොරටුව ක්ලින්කෝ මධ්‍යස්ථානයේ නිලධාරීන් සඳහා වැඩිදුර පුහුණුවක් ලබා දී වෙනත් මධ්‍යස්ථානවලට අනුයුක්ත කිරීමට නිර්දේශ කිරීම.
* 2011.05.26 කොස්වත්ත ලාෆ් එකෝ ශ්‍රී මධ්‍යස්ථානයේ නිලධාරීන් සඳහා වැඩිදුර පුහුණුවක් ලබා දී වෙනත් මධ්‍යස්ථානවලට අනුයුක්ත කිරීමට නිර්දේශ කිරීම.
* 2011.06.01 දින අනුරාධපුර ලාෆ් එකෝ ශ්‍රී මධ්‍යස්ථානයේ නිලධාරීන් සඳහා වැඩිදුර පුහුණුවක් ලබා දී වෙනත් මධ්‍යස්ථානවලට අනුයුක්ත කිරීමට නිර්දේශ කිරීම.
* 2011.07. 28 දින හොරණ ලාෆ් එකෝ ශ්‍රී ආයතනයේ ජංගම මධ්‍යස්ථානය නුසුදුසු ස්ථානයක පවත්වා ගෙන යෑම නිසා වෙනත් ස්ථානයකට මාරු කර යැවීම.
* 2011.12.28 මතුගම ලාෆ් එකෝ ශ්‍රී මධ්‍යස්ථානය නුසුදුසු ස්ථානයක පවත්වා ගෙන යාම නිසා වෙනත් ස්ථානයකට මාරු කර යැවීම.
* 2012.01.18 දින ත්‍රිකුණාමලය ලාෆ් එකෝ ශ්‍රී මධ්‍යස්ථානයේ පෙට්‍රල් වාහන පරීක්ෂා කිරීමේ උපකරණය ක්‍රමාංකණය කරන තෙක් පෙට්‍රල් වාහන පරීක්ෂා කිරීම අත්හිටුවීම.
* 2012.01.13 දින ත්‍රිකුණාමලය ක්ලින්කෝ මධ්‍යස්ථානයේ කළමනාකරුගේ රාජකාරි අවසන් කිරීමට නිර්දේශ කිරීම සහ පරීක්ෂණ ක්‍රමවේදය කඩ කිරීම සහ වාහන ලියාපදිංචි සහතිකය නොමැතිව වායු විමෝචන පරීක්ෂණ පැවැත්වීම සම්බන්ධව පරීක්ෂණ පැවැත්වීම.
* 2012.01.12 දින බකමූණ ක්ලින්කෝ ආයතනයේ ජංගම මධ්‍යස්ථානය නුසුදුසු ස්ථානයක පවත්වා ගෙන යාම නිසා වෙනත් ස්ථානයට මාරු කර යැවීම. ආයතනයේ ලොග් පොතෙහි සඳහන් වූ වාහන අංක සහ දුම් පරීක්ෂණ සහතිකවල නොගැළපීම පිළිබඳව විමර්ශනය සිදු කිරීම.
* 2012.01.07 දින වත්තේගම ලාෆ් එකෝ ශ්‍රී මධ්‍යස්ථානයේ වහාම ක්‍රියාත්මක වන පරිදි තාවකාලිකව මධ්‍යස්ථානයේ පරීක්ෂණ ක්‍රියාවලිය අත්හිටුවන ලදී.

[ගරු කුමාර වෙල්ගම මහතා]

ඉහත සඳහන් කරුණුවලට අමතරව

* මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව මගින් යන්ත්‍ර මුද්‍රා තබා රැගෙන විත් ක්‍රමාංකණය කර ඇති අතර මෘදුකාංග ගැටලුවලට ද පිළියම් යොදා ඇත.

* මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, පරිසර අමාත්‍යාංශය වායු සම්පත් කළමනාකරණ කේන්ද්‍රය, මධ්‍යම පරිසර අධිකාරිය හා මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව මගින් කරන ලද නිරන්තර පරීක්ෂණ අනුව අනාවරණය වූ තොරතුරු මත වාචික උපදෙස් ලබා දී නිවැරදි කිරීම් හා සේවකයන්ට පුහුණුව මෙන්ම දඬුවම් ද ලබා දී ඇත.

(ඈ) දැනට අප සතු දත්ත අනුව ව්‍යාපෘතියේ අරමුණු කරා ලඟා වී ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. මම ගරු ඇමතිතුමාගෙන් දැන ගන්නට කැමතියි, මෙරටට ගෙන්වන හැම වාහනයකම අවුරුදු පතා දුම් පරීක්ෂාවක් කරනවා ද කියා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

පරීක්ෂාවක් කරනවා.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ඒක නීතිගත කර තිබෙනවා ද?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

අවුරුද්දකට සැරයයි නේ. නීතිගත කර තිබෙනවා.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

2009 වර්ෂයෙන් පස්සේ මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ - ඔබතුමාගේ ආයතනයේ- බස්රථවලට දුම් පරීක්ෂාවක් කර නැහැ කියා ඔබතුමා පිළිගන්නවා ද?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

ඔව්. මම දැන් ඒකට ක්‍රමවේදයක් හදලායි තිබෙන්නේ.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ක්‍රමවේදයක් හදලා තිබෙනවා කිව්වාට ගරු ඇමතිතුමනි, 2009 ඉඳලා මේ වන තුරු SLTB එකේ බස් රථවල දුම් පරීක්ෂාව කෙරෙන්නේ නැහැ. හැබැයි දුප්පත් මිනිහාගේ motorcycle එකට, three-wheeler එකට මේ නීතිය වලංගුයි. මම ඔබතුමාගෙන් අහන්නේ, SLTB එකේ වාගේම යුද හමුදාවේ සහ ආරක්ෂක අංශයේ අනෙකුත් වාහනවලට මේ නීතිය වලංගු වන්නේ නැද්ද කියලායි.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

SLTB එකේ වාහනයක් කියන්නේ සාමාන්‍ය ජනතාවගේ වාහනයක්. ඒක දුම් පරීක්ෂාවට ලක් කරලා නැති එක ගැන මම කනගාටුවට පත් වෙනවා. ඒ ගැන මම ඇත්ත කථා කරන්න ඕනෑ. නමුත් මම දැන් ඒකට ක්‍රමවේදයක් හදන්නයි යන්නේ. දැන් අපි දුම් පරීක්ෂණයට ටෙන්ඩර් call කරන්න අපේ ආචාර්ය සරත් අමුණුගම ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් අමාත්‍ය මණ්ඩල අනුකාරක කමිටුවක් පත් කරලා තිබෙනවා. ඒකේ මමත් ඉන්නවා. ඒ කමිටුවේදී මම යෝජනාවක් කරන්න යනවා -පසු ගිය කාලයේ කරපු යෝජනාවක් නොවෙයි, මේක අලුත් යෝජනාවක් - SLTB එකටත් මේ අවස්ථාව දෙන්න කියලා. මොකද, SLTB එකේ depots හැම තැනම තිබෙනවා. වාහන දුම් පරීක්ෂණයට ලක් කරන එක පෞද්ගලික අංශයට දෙනවා හා සමානව SLTB එකටත් දෙන්න මම යෝජනා කරනවා. මොකද, SLTB එකේ වාහන 5,250ක් තිබෙනවා. මේ වාහන 5,250 පරීක්ෂාව SLTB එකටත් දුන්නොතින්, එකක් SLTB එකට අමතර ආදායමක් හම්බ වෙනවා. අපිට අලුත් machines ගෙනැල්ලා හොඳ ප්‍රමිතියකට මේක කරන්න පුළුවන්. මම ඒ යෝජනාව අපේ ගරු සභාපති, ආචාර්ය සරත් අමුණුගම මහත්තයාට මේ ගමන ඉදිරිපත් කරන්න යනවා, ඒ ගැන බලන්න කියලා.

CTB බස් දුම් පරීක්ෂාවට ලක් නොකළ එක වැරදියි. මම ඒක පිළිගන්නවා, වැරදියි කියලා. අපි ගියා නම් ඔය දුම අවම කර ගන්න තිබුණා. නමුත් ඒක කරලා තිබුණේ නැහැ. ඒක වැරදියි කියා මම පිළිගන්නවා. ඉදිරියේදී අනු කමිටුවට දමලා මම ඒක නිවැරදි කරනවාය කියන එක මේ අවස්ථාවේදී කියන්න ඕනෑ. [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

අතුරු ප්‍රශ්න තුනක් ඇහුවා. අවශ්‍ය නම්, ගරු ඇමතිතුමා කැමැති නම් ඉතින් තව එකක් අහන්න.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

මම ගරු ඇමතිතුමාට කියනවා, ඒ වාගේම ආරක්ෂක අංශයේ වාහනවලටත් මේ ක්‍රමයම අනුගමනය කළොත් හොඳයි කියා. මොකද, පරිසරය දූෂණය වෙන නිසායි මේ නීතිරීති පනවා තිබෙන්නේ. හැබැයි ගරු ඇමතිතුමනි, ඔබතුමාට මම එක පැත්තකින් ස්තුතිවන්ත වෙනවා, කල් ගිහින් හරි මේක පිළිගත්ත එක ගැන. ඒ එක්කම මේ අවුරුදු පහ, හය තුළ අහිංසක මිනිස්සුන්ගෙන් මුදල් ගත්ත එක අපරාධයක්ය කියා මම කියනවා. මොකද, CTB බස්වලින් පිට වෙන දුම ගැන බැලුවාම, අනික් වාහනවලින් පිට වෙන දුම එච්චර දුමක් නොවෙයි කියා කියන්නත් පුළුවන්.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පොඩ්ඩක් මේ ගැන පැහැදිලි කරන්න ඉඩ දෙන්න. [බාධා කිරීමක්] එතුමාත් මමත් හොඳ යාළුවෝ. එතුමා අපේ club එකේ නොවෙයි. ඒ වුණත් කියන්න ඕනෑ. [බාධා කිරීමක්] ඕනෑ නම් application එකක් පුරවා දුන්නාම එන්න පුළුවන්. පිටුපස්සෙන් ඉන්න මහත්මයා නම් life member කෙනෙක්. ඔය side එකෙන් ඉන්න මහත්මයා අපේ

ප්‍රධාන අනුශාසක, patron. ඒවාත් තිබෙන්න එපායැ නැත්නම් ඉතින් වැඩක් නැහැ නේ. ඒක නිසා මම කියන්නේ ගරු මන්ත්‍රීතුමා කියන කාරණය හරිය කියන එකයි. CTB එකට වාගේම අනික් ඒවා සම්බන්ධයෙනුත් අපේ ගරු සරත් අමුණුගම ඇමතිතුමාට මම කරුණු ඉදිරිපත් කරනවා. එතුමාත් දැන් මේ සභාවේ ඉන්න එක හොඳයි. දැනට මේක කරන්නේ ආයතන දෙකක් විතරයි. [බාධා කිරීමක්] අන්න හරි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා දැන් ප්‍රශ්න වැලක්-

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ආයතන දෙකයි තිබෙන්නේ. ඒ ආයතන දෙකට විතරක් මුළු ලංකාවම භාර දෙන එක වැරදියි. CTB එකත් දුන්නොත් එය අපට අමතර ආදායමක් ලබා ගන්න පුළුවන් රාජ්‍ය ආයතනයක්. [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
හොඳයි, පිළිතුර දුන්නා.

## මො/සි/කෝන්ගස්පිටිය කනිෂ්ඨ විද්‍යාලය : ගොඩනැඟිලි පහසුකම්

## மொ/சி/கோன்கஸ்பிட்டிய கனிஷ்ட வித்தியாலயம்: கட்டிட வசதிகள்

## MO/ SI/ KONGASPITIYA PRIMARY SCHOOL : BUILDING FACILITIES

1817/'11

7. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ,සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි මො/සි/ කෝන්ගස්පිටිය කනිෂ්ඨ විද්‍යාලය ප්‍රධාන මාර්ගයේ සිට කිලෝ මීටර් 12ක් පමණ දුරින් පිහිටි දුෂ්කර පාසලක් බවත්;

(ii) ගොඩනැඟිලි පහසුකම් නොලැබීම නිසා එම පාසලේ පංති කාමර තාවකාලිකව තනන ලද ටකරන් මඩුවල පවත්වා ගෙන යන බවත්;

(iii) එම තත්ත්වය සිසු දරුවන්ගේ සහ ගුරුවරුන්ගේ ජීවිතවලට අනතුරුදායක බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත තත්ත්වය යටතේ එම පාසලේ ගුරුවරුන්ගේ හෝ සිසුන්ගේ ජීවිතවලට යම් හානියක් වුවහොත් එහි වගකීම දරනු ලබන අය කවුරුන්ද;

(ii) පවතින අයහපත් තත්ත්වය මහහැර මො/සි/ කෝන්ගස්පිටිය කනිෂ්ඨ විද්‍යාලයේ පවතින ගොඩනැඟිලි අඩු පාඩු සපුරා ලීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iv) වෙන් කර ඇති මුදල කොපමණද;

(v) පාසල් ගොඩනැඟිලි ඉදි කිරීම් කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மொனறாகலை மாவட்டத்தின் சியம்பலாண்டுவ பிரதேச செயலகப் பிரிவில் அமைந்துள்ள மொ/ சி/கோன்கஸ்பிட்டிய கனிஷ்ட வித்தியாலயம் பிரதான வீதியிலிருந்து ஏறத்தாழ 12 கிலோ மீற்றர் தொலைவில் அமைந்துள்ள கஷ்டப் பிரதேச பாடசாலை என்பதையும்;

(ii) கட்டிட வசதிகள் கிடைக்காமையால் அப்பாட சாலையின் வகுப்பறைகள் தற்காலிகமாக அமைக்கப்பட்ட தகரக் கூடாரங்களிலேயே நடத்தப்பட்டு வருகின்றனவென்பதையும்;

(iii) மேற்படி நிலைமை மாணவர்களினதும் ஆசிரியர் களினதும் உயிர்களுக்கு ஆபத்தான தென்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி நிலைமையின் கீழ் அப்பாடசாலையின் ஆசிரியர்கள் அல்லது மாணவர்களின் உயிர் களுக்கு ஏதேனும் சேதம் ஏற்பட்டால் அதற்கான பொறுப்பினை வகிப்பவர் யார்;

(ii) நிலவுகின்ற பாதகமான நிலைமையைத் தவிர்த்து மொ/சி/கோன்கஸ்பிட்டிய கனிஷ்ட வித்தியாலயத்தில் நிலவுகின்ற கட்டிடக் குறை பாடுகளை நிவர்த்திசெய்ய நடவடிக்கை எடுப்பாரா;

(iii) ஆமெனில், அதற்கான நிதியேற்பாடுகள் செய்யப்பட்டுள்ளனவா;

(iv) ஒதுக்கப்பட்டுள்ள பணத்தொகை யாது;

(v) பாடசாலைக் கட்டிட நிர்மாணப் பணிகள் ஆரம்பிக்கப்படுகின்ற திகதி யாது

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education :

(a) Is he aware that-

(i) the Mo/Si/Kongaspitiya Primary School situated in the Siyambalanduwa Divisional Secretary's Division in the Monaragala District is a difficult school which is situated 12 kilometres away from the main road;

(ii) classes of this school are conducted in temporary huts built with iron sheets as is has not been provided with building facilities; and

(iii) the above-mentioned situation poses a threat to the lives of the students and the teachers?

[ගරු බුද්ධික පතිරණ මහතා]

(b) Will he inform this House-

(i) the persons who will take the responsibility if any harm is caused to the lives of teachers or students of this school under the aforesaid circumstances;

(ii) whether action will be taken to fulfil the need for building facilities that exists at Mo/Si/Kongaspitiya Primary School and remedy the unfavourable situation prevailing there;

(iii) if so, whether provisions have been allocated for this purpose;

(iv) the amount of money that has been allocated; and

(v) of the date on which the construction work of the school buildings will be commenced?

(c) If not, why?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා ( අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - கல்வி பிரதி அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Deputy Minister of Education)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) ඔව්.

(ආ) (i) මෙය ඌව පළාත් සභාවට අයත් පාසලකි. ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, විදුහල්පති වග කිව යුතුයි.

(ii) ඔව්. අඩි 60 x අඩි 20 තනි මහල් ගොඩනැඟිල්ලක් ඉදි කිරීමට පළාත් සභාව සැලසුම් කර ඇත.

(iii) ඔව්.

(iv) රුපියල් මිලියන 1.50කි.

(v) ඔව්. මේ වන විට ප්‍රසම්පාදන කටයුතු සිදු වෙමින් පවතින බවත් 2012 ජූලි 25වන දිනට පෙර වැඩ ආරම්භ කෙරෙන බවත් ඌව පළාත් සභාව දන්වා ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ පාසල, ගරු නියෝජ්‍ය අධ්‍යාපන ඇමතිතුමාත් නියෝජනය කරන මොනරාගල දිස්ත්‍රික්කයේ තිබෙන පාසලක්. ඒ වාගේම ගරු නියෝජ්‍ය අධ්‍යාපන ඇමතිතුමා මීට කලින් අධ්‍යාපන විෂය භාරව, ප්‍රධාන අමාත්‍යවරයා විධියට හිටපු පළාත් සභාවටත් මෙහි අයිතිය තිබෙනවා කියලා කිව්වා. ගරු නියෝජ්‍ය ඇමතිතුමාට කියන්න පුළුවන්ද, මම ප්‍රශ්නයේ (ආ) (v) යටතේ අහලා තිබෙන ගොඩනැඟිල්ලේ වැඩ ආරම්භ කරන්නට නියමිත දිනය සහ මේ ගොඩනැඟිල්ලේ වැඩ අවසන් කරන්නට නියමිත දිනය. ඔබතුමා මේ පාසල දැකලා ඇති. මගේ ළඟ ඡායාරූපත් තිබෙනවා. කටු මැටි ගහලා, ටකරන් කඩාගෙන වැටිලා, ටකරන් එහෙන් මෙහෙන් හේත්තු කරපු ගොඩනැඟිලි තමයි තිබෙන්නේ. ඒ නිසා කෝන්ගස්පිටිය කනිෂ්ඨ විද්‍යාලයේ ඒ ගොඩනැඟිල්ල ඉදි කිරීම පටන් ගන්නේත්, ගොඩනැඟිල්ල ඉදි කර අවසන් කරන්නේත් කවදාද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නයේ (අ) (i) කොටසින් මෙතුමාම කියලා තිබෙනවා, මේ පාසලට ප්‍රධාන මාර්ගයේ සිට දුර කිලෝමීටර් 12යි කියලා. නමුත් කිලෝ මීටර් 12 නොවෙයි, කිලෝමීටර් 16යි. ඒ කාලයේ කිලෝමීටර් 16ක් දුර මේ පාසලට යන්න පාරක් තිබුණේ නැහැ. මගේ කාලයේ පළමුව පාර හැදුවා. පාර හදන්න ලොකු causeway එකක් දැම්මා; බෝක්කු හතරක් දැම්මා. ඒක උඩින් තමයි මෙතුමා ගිහිල්ලා තියෙන්නේ. ඒ වාගේම ගුරුවරු හිටියේ හතර දෙනායි. මගේ කාලයේ ගුරුවරු 10ක් දැම්මා. ඊළඟට පුස්තකාල ගොඩනැඟිල්ල හැදුවා. විදුලිය නැති නිසා සූර්ය කෝෂ විදුලි පද්ධති තුනක් ලබා දුන්නා.

පරිගණක දහයක් දුන්නා. දැන් ටකරන් මඩු අටවා ගෙන ඉන්නවා. හැබැයි, ඒක කඩා ගෙන වැටුණොත් පළාත් අධ්‍යක්ෂ සහ විදුහල්පති වගකියන්න ඕනෑ. මොකද, අනාරක්ෂිත ගොඩනැඟිලි පවත්වාගෙන යෑමේ වගකීම පළාත් අධ්‍යක්ෂ සහ විදුහල්පති දරන්න ඕනෑ නිසා. එම නිසා ඒවා වහාම ඉවත් කරන්න කියලා මා නියම කරනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ටකරන් මඩුවල ද කොම්පියුටර් තියා ගෙන ඉන්නේ?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
නැහැ. කොම්පියුටර් කාමරයක් තියෙනවා. ඒවා පෙන්වන්න මට ඔබතුමාත් සමඟ යන්න වෙනවා. මේ කවුරු හෝ කියපු ඒවා, පින්තූර ගහලා ගෙනත් දීපු ඒවා ගැන නේ ඔබතුමා අහන්නේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා කියන විධියට මේ සභාවට තේරුම් යන්නේ, අපට තේරුම් යන්නේ, මේ ටකරන් මඩු දෙකක් අටවා ගෙන ඉන්නේ විදුහල්පතිටයි පළාත් අධ්‍යක්ෂටයි වුවමනා විධියට ඒවා පෙන්වලා ආධාර උපකාර ලබා ගන්නයි, එහෙමද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
මම එහෙම අදහසක් කිව්වේ නැහැ නේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
එහෙම නම් මොකක්ද මේ කියන්නේ, ඒ අය ඒවා තියා ගෙන ඉන්නවා කියලා?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
තමුන්නාන්සේගේ ප්‍රශ්නය මගෙන් අහන්න කෝ ඔය කථා, විවේචන නවත්වලා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඔබතුමා කිව්වා, මේ ටකරන් මඩු කඩා ගෙන වැටිලා ළමයින්ට හානියක් වුණොත් පළාත් අධ්‍යක්ෂ සහ විදුහල්පති වගකියන්න ඕනෑ කියලා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
සැබෑවටම.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මේ ටකරන් මඩු අටවා ගෙන ඉන්නේ, පවත්වා ගෙන යන්නේ ඒ ගොල්ලෝ කියලා දැන් ඔබතුමා කිව්වා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, මේක හරස් ප්‍රශ්න අහන තැනක් නොවෙයි. කරුණාකර අතුරු ප්‍රශ්න අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
සැබැවින්ම මේ ටකරන් මඩුවල පන්ති පවත්වන්නේ නියෝජ්‍ය ඇමතිතුමා කියන විධියට මෙතැන ඉදි කිරීම් සිදු වන තුරුද, නැත්නම් ඒ ගොල්ලන්ගේ ජීවන ක්‍රමයක් විධියටද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළමුවෙන්ම ගොඩනැඟිලි හදන්න පෙර පාර හදන්න ඕනෑ. අපි පාර හැදුවා. අපේ පාසල්වල පුරුද්දක් තිබෙනවා, දෙමවුපියෝ එකතු වෙලා හදපු සමහර ගොඩනැඟිලි, එහෙම නැත්නම් තාවකාලික මඩු කොච්චර කිව්වත් එකපාරට ඉවත් කරන්නේ නැති. ඒක වරදක්. ප්‍රමාණවත් පරිදි ඉඩ පහසුකම් ලැබුණත් ඒ ටකරන් මඩු ඉවත් කරන්නේ නැහැ. මා ඔබතුමාට නැවත මතක් කරනවා. මගේ කාලයේ ඌව පළාතේ පාසල් සඳහා ගොඩනැඟිලි 1111ක් මම හැදුවා. වර්තමාන මහ ඇමතිතුමා 60X20 ගොඩනැඟිල්ලක් හදන්න කටයුතු කරලා තිබෙනවා.

තමුන්නාන්සේ බලන්නේ රංජිත් මද්දුමබණ්ඩාර මන්ත්‍රීතුමා ඉන්නවාද කියලාද?

## ගිහි - පැවිදි පිරිවෙන් ශිෂ්‍යයන් : දීමනා
பிரிவெனா மாணவ பிக்குமார்/மாணவர்: கொடுப்பனவு
STUDENT MONKS/STUDENTS IN PIRIVENAS : ALLOWANCE

2060/'11

9. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යනු ලබන ලියාපදිංචි පිරිවෙන් සංඛ්‍යාව හා ඒවායේ දැනට ඉගෙනුම ලබන ශිෂ්‍ය ස්වාමීන්වහන්සේලා/ශිෂ්‍යයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ශිෂ්‍ය ස්වාමීන්වහන්සේලාට/ශිෂ්‍යයන්ට මාසිකව යම් ගෙවීමක් කරන්නේද;

(iii) එසේ නම්, එක් අයෙකු සඳහා ගෙවන මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් "මෙතෙක් පිරිවෙන් ශිෂ්‍යයන් සඳහා රජයෙන් ලබා දෙන ලද රුපියල් 1,000ක ප්‍රතිපාදනය රුපියල් 2,000 ක් දක්වා වැඩි කරන්නෙමි." යන පොරොන්දුව මේ වන විට ක්‍රියාත්මක කරන්නේද;

(ii) එසේ නම්, එය ක්‍රියාත්මක කිරීම ආරම්භ කළ දිනය කවරේද;

(iii) ඒ යටතේ ප්‍රතිලාභ ලබන සංඛ්‍යාව කොපමණද;

(iv) මේ වන විට එම පොරොන්දුව ක්‍රියාත්මක නොකරන්නේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் பேணிவரப்படும் பதிவுசெய்யப் பட்ட பிரிவெனாக்களின் எண்ணிக்கை மற்றும் அவற்றில் தற்போது கல்வி பயின்றுவரும் மாணவ பிக்குமார்களின்/மாணவர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) மேற்படி பிக்கு மாணவர்களுக்கு/மாணவர் களுக்கு மாதாந்தம் ஏதேனும் கொடுப்பனவு வழங்கப்படுகின்றதா என்பதையும்;

(iii) அவ்வாறாயின், ஒருவருக்கென செலுத்தப்படும் பணத்தொகை யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மஹிந்த சிந்தனை கொள்கைப் பிரகடனத்தில் குறிப்பிடப்பட்டுள்ள "இதுவரை பிரிவெனா மாணவர்களுக்கு அரசினால் வழங்கப்பட்டு வந்த ரூபா 1,000 நிதித் தொகையை ரூபா2,000 வரை அதிகரிக்கின்றேன்" எனும் வாக்குறுதி தற்போது நடைமுறைப்படுத்தப்படுகின்றதா என்பதையும்;

(ii) அவ்வாறாயின், அதனை நடைமுறைப்படுத்த ஆரம்பித்த திகதி யாதென்பதையும்;

(iii) அதன் கீழ் நலன்களைப் பெறுவோரின் எண்ணிக்கை யாதென்பதையும்;

[ගරු දයාසිරි ජයසේකර මහතා]

(iv) தற்போது மேற்படி வாக்குறுதி நடைமுறைப் படுத்தப்படாவிடின், அதற்கான காரணங்கள் யாவை என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education :

(a) Will he State-

(i) the number of registered Pirivenas maintained in Sri Lanka and the number of student monks/ students currently studying in them;

(ii) whether any payment is made monthly to those student monks / students; and

if so, the amount paid per person?

(b) Will he inform this House-

(i) whether the pledge "I will increase the provision of Rs. 1,000 provided to Privena students by the Government, up to Rs. 2,000" mentioned in the "Mahinda Chintana" manifesto, is being implemented now;

(ii) if so, the date on which its implementation was commenced;

(iii) of the number that benefit out of that; and

(iv) if that pledge has not been put into action, the reasons for that?

(c) If not, why?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ශ්‍රී ලංකාව තුළ පවත්වා ගෙන යන ලියාපදිංචි පිරිවෙන් සංඛ්‍යාව - 732

ඒවායෙහි ඉගෙනුම ලබන ශිෂ්‍ය ස්වාමීන්වහන්සේලා ගණන - 33,124

ගිහි ශිෂ්‍ය ගණන - 25,709

මුළු ගණන - 58,833

(ii) ශිෂ්‍යයන්ට වාර්ෂිකව ආධාර මුදලක් ගෙවන අතර, මාසිකව ගෙවීමක් කරන්නේ නැත.

(iii) මාසික ගෙවීමක් කරන්නේ නැත.

පැවිදි ශිෂ්‍යයන්ගේ පැමිණීමේ සාමාන්‍ය ඒකකයකට රුපියල් 2,500ක වාර්ෂික ආධාරයක්ද, ගිහි පැමිණීමේ සාමාන්‍ය ඒකකයකට රුපියල් 500ක වාර්ෂික ආධාරයක්ද ගෙවනු ලැබේ.

(ආ) (i) ඔව්. පැවිදි පැමිණීමේ එක් ඒකකයකට වසරකට රුපියල් 2,500ක්ද, ගිහි පැමිණීමේ එක් ඒකකයකට වසරකට රුපියල් 500ක්ද ගෙවනු ලැබේ.

(ii) 2007 ජනවාරි මස 01 දින සිට

(iii) පැවිදි ශිෂ්‍යයන් 33,124කි. (තිස්තුන්දහස් එකසිය විසිහතරකි)

ගිහි ශිෂ්‍යයන් 25,709කි. (විසිපන්දහස් හත්සිය නවයකි)

මුළු ගණන 58,833කි. (පනස් අටදහස් අටසිය තිස්තුනකි)

(iv) පොරොන්දු ඉටු කොට ඇත.

(ඇ) අදාළ නොවේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්න තිබේද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

පොරොන්දු වෙලා තිබුණේ, ලබා දෙන රුපියල් දාහ රුපියල් දෙදාහ කරනවා කියලායි. ඒ කියන්නේ සියලු දෙනාටම පොදුවේ. "මහින්ද චින්තන" පොතේ 26වැනි පිටුවේ සඳහන් කරලා තිබෙන්නේ මෙන්න මේ විධියටයි:

"මෙතෙක් පිරිවෙන් ශිෂ්‍යයන් සඳහා රජයෙන් ලබා දෙන රුපියල් 1,000ක ප්‍රතිපාදනය රුපියල් 2,000ක් දක්වා වැඩි කරන්නෙමි."

ඒ කියන්නේ ගිහි, පැවිදි කියලා බෙදන්නේ නැතුව දෙගොල්ලන්ටම පොදුවේ දෙනවා කියන එකයි. අපේ ගෞරවනීය ස්වාමීන්වහන්සේලාටත්, ඒ වාගේම ගිහි අයටත්. ඔබතුමා කවදාද ඒ දීමනාව සියලු දෙනාටම රුපියල් දෙදාහ දක්වා වැඩි කරන්නේ? එක්කෙනෙකු දෙන්නෙකු විතරක් නොවෙයි, සියලු දෙනාටම දෙන බවයි කිව්වේ. ඒකයි මම අහන්නේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා කියන්නේ, මහින්ද චින්තනයේ සඳහන් වෙලා තිබුණු කාරණාවක් ඉෂ්ට වෙලා නැහැ කියලායි. නමුත් මා එතුමාට කියන්නට කැමැතියි, මූල්‍යමය ආධාරවලට අමතරව මගේ ගරු ඇමතිතුමා පිරිවෙන්වලට භෞතික ආධාර ලබාදෙන වැඩ පිළිවෙළක් ආරම්භ කර තිබෙන බව. [බාධා කිරීමක්] ඒ ද්‍රව්‍යමය ආධාරත්, මූල්‍යමය ආධාරවලට පරිවර්තනය වනවා. තේරුණාද? දැන් අපි පිරිවෙන්වලට අවශ්‍ය පුස්තකාල පොත්, පෙළ පොත්, ගොඩනැඟිලි, පියානෝ, - [බාධා කිරීමක්] පියානෝ පවා ලබා දුන්නා සෞන්දර්ය ඒකකවලට. ඒක නිසා මේ මුදලේ වටිනාකම රුපියල් දෙදාහට වැඩියි. ඒ අනුව මහින්ද චින්තනයේ පොරොන්දු යාවත්කාලීන කරලා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා මා අහපු ප්‍රශ්නයට නොවෙයි උත්තර දුන්නේ. නිශ්චිත ප්‍රශ්නය විධියට මා අහන්නේ, රුපියල් දාහේ දීමනාව දෙදාහ කළාද කියන එකයි. ඒකට පිළිතුර නොවෙයි නේ එතුමා දුන්නේ. ගේ හදනවා, ගේ වටේ මල් පැළ

හඳනවා කියන, ඒ වාගේ පිළිතුරක් නේ දුන්නේ. ඒවා නොවෙයි නේ අපි අහන්නේ. රුපියල් දාහේ දීමනාව දෙදාහ කරනවාද, කවදාද ඒක කරන්නේ කියන එකයි අපි අහන්නේ. ඔබතුමා මේකටත් සමෘද්ධිලාභීන්ගේ දීමනාව ගැන කියන්නයි හදන්නේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
පොඩ්ඩක් ඉන්න, පොඩ්ඩක් ඉන්න. ඔබතුමා කියන්නේ, ස්වාමීන් වහන්සේ නමකට ගෙවනු ලබන රුපියල් දාහ දෙදාහ කරන්න කියලා නේ. දැන් රුපියල් දෙදහස් පන්සියයක් ගෙවනවා. මේ බලන්න කෝ පිළිතුර.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා කලබල වන්න එපා. විශාල පටලවා ගැනීමක් මේ තිබෙන්නේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඉන්න කෝ. "පැවිදි ශිෂ්‍යයන්ගේ පැමිණීමේ ඒකකයක් සඳහා රුපියල් 2,500ක් ගෙවනු ලැබේ" කියලා මේ උත්තරයේ තිබෙනවා. ඔබතුමා රුපියල් දාහ දෙදාහ කරන්න කියනවා. නමුත් දැනටත් අපි රුපියල් 2,500ක් ගෙවනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එතුමා කියන්නේ අඩු කරන්න කියලා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
අඩු කරන්න කියන්න එපා. [බාධා කිරීමක්] ඔබතුමා කේන්ති ගන්න එපා ඉතින්. අපි කථා කරමු.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා බන්දුල ගුණවර්ධන ඇමතිතුමා රවටන විධියට මා රවටන්න හදන්න එපා, මේ උත්තරය දීලා. [බාධා කිරීමක්] මම කියන්නේ, මේ රුපියල් දාහේ දීමනාව සියලු දෙනාටම රුපියල් දෙදාහ කරන එක ගැන. අපේ ගෞරවනීය ස්වාමීන් වහන්සේලාටත්, ඒ වාගේම ගිහි අයටත් - දෙගොල්ලන්ටම- දෙන්න. ඔබතුමා කියන්නේ අපේ ස්වාමීන් වහන්සේලා ගැන විතරයි. මම කියන්නේ ගිහි අයටත් මේ දීමනාව වැඩි කරලා දෙන්න කියලායි. ඒ අයට ලැබෙන්නේ රුපියල් 500යි. නමුත් මහින්ද චින්තනයේ තිබෙන්නේ "රුපියල් 1,000ක ප්‍රතිපාදනය පිරිවෙන් ශිෂ්‍යයන්ට" කියලා. ශිෂ්‍යයන් කියන්නේ ඔක්කොම අයට. මහින්ද චින්තනයේ ගිහි පැවිදි කියලා බෙදලා නැහැ.

දැන් ඔබතුමා උත්තර දෙනකොට, ගිහි-පැවිදි හැටියට බෙදලා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
තමුන්නාන්සේ පැවිද්දන්ගේ දීමනාව අඩු කරලා ගිහියන්ට දෙන්න කියනවා. තමුන්නාන්සේ කියන්නේ පැවිදි උන්නාන්සේලාට දෙන රුපියල් 2500, රුපියල් 2000 කරලා ගිහියන්ට තව රුපියල් 500ක් එකතු කරන්න කියලා. එහෙම කරන්නත් පුළුවන්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පිළිතුර දුන්නාද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඔව්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නයට පිළිතුරු දුන්නා. තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙසේයි. එතුමාට පිටුපසින් අපේ ගෞරවණීය එල්ලාවල මේධානන්ද ස්වාමීන් වහන්සේ වැඩ ඉන්නවා. උන්වහන්සේටත් කරන අපරාධයක් මේක. මම කවදාවත් කිව්වේ නැහැ පැවිදි ශිෂ්‍යයන්ට දෙන රුපියල් දෙදහස් පන්සියය, රුපියල් දෙදාහ කරන්න කියලා. ඔබතුමන්ලා සාමාන්‍යයෙන් කරන්නේ ඒක තමයි. පොඩි එකාගෙන් කපලා ලොකු එකාට දෙන එක තමයි කරන්නේ. මම අහන්නේ ඒක නොවෙයි. මම අහන්නේ මේ දෙගොල්ලන්ගේම දීමනාව රුපියල් දෙදාහ දක්වා වැඩි කරන්නේ කවදාද කියලායි. හාමුදුරුවරුන්ට දෙන මුදලින් රුපියල් පන්සියයක් කපලා ගිහි ශිෂ්‍යයන්ට දෙන එක නොවෙයි මම කියන්නේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
රුපියල් දාහේ දීමනාව දෙදාහ කරන්න කියලා ඔබතුමා කිව්වා. දැන් රුපියල් දාහේ දීමනාව රුපියල් දෙදහස් පන්සියය කරලා තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ, නැහැ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඉන්නකෝ කියන්න. ඔබතුමා කියනවා රුපියල් පන්සියයක් අඩු කරන්න කියලා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ, නැහැ. ඔබතුමා කියන එක වැරදියි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
රුපියල් දෙදාහ කරන්න කියන්නේ ඒක නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා කියන එක වැරදියි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඔබතුමා දැන් එහෙම කිව්වා නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා සභාව නොමඟ යවනවා. [බාධා කිරීමක්] එහෙම නොවෙයි, ගරු මන්ත්‍රීතුමනි සාධාරණව කථා කරන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
සාධාරණව තමයි කථා කරන්නේ. එක්කෝ ඔබතුමාට මේක තේරෙන්නේ නැහැ. නැත්නම්-

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පිරිවෙන්වල ඉලක්ක සහගත කණ්ඩායම වන්නේ ගෞරවණීය ස්වාමීන් වහන්සේලායි. උන්වහන්සේලාට අමතරව පාසල්වලින් නෙරපන ශිෂ්‍යයන් සහ වෙනත් ශිෂ්‍යයන් පිරිවෙන්වල ඉන්නවා. ඒ අයටත් පෙළපොත් සහ අනෙකුත් සියලු දේවල් ලබා දෙන අතර ශිෂ්‍යාධාරයකුත් දෙනවා. පාසලට යන ගිහි දරුවාට ශිෂ්‍යාධාරයක් ලැබෙන්නේ නැහැ. නමුත් පිරිවෙනට යන ගිහි ශිෂ්‍යයාට ශිෂ්‍යාධාරයක් ලැබෙනවා. [බාධා කිරීමක්] වැඩි කරන එක තමුන්නාන්සේලාගේ ආණ්ඩුවක් ආවාම වැඩි කර ගන්න. [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 10-2238/'12-(1), ගරු පී. හැරිසන් මහතා.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා (පළාත් පාලන හා පළාත් සභා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க - உள்ளூராட்சி, மாகாண சபைகள் பிரதி அமைச்சர்)
(The Hon. Indika Bandaranayake - Deputy Minister of Local Government and Provincial Councils)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## බිබිල - කොටබෝව වී ගබඩාව : ප්‍රතිසංස්කරණය
### பிபில - கொட்டபோவ நெற்களஞ்சியம் : புனரமைப்பு
### BIBILA-KOTABOWA PADDY STORE : REHABILITATION

1818/'11

12. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ, බිබිල, මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, කොටබෝව මාර්ගයේ එකේ කණුව ප්‍රදේශයේ ඉදිකර ඇති වී අළෙවි මණ්ඩලයට අයත් විශාල ප්‍රමාණයේ වී ගබඩාවක් වර්ෂ විස්සක පමණ කාලයක සිට කිසිදු ප්‍රයෝජනයකට නොගෙන වසා දමා ඇති බවත්;

(ii) එම ගබඩාව ප්‍රතිසංස්කරණය කර නැවත වී ගබඩා කිරීම සඳහා යොදා ගත හැකි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත ගබඩාව ප්‍රතිසංස්කරණය කරන්නේ නම්, ඊට ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(ii) නොඑසේ නම්, වෙනත් කර්මාන්තයක් හෝ මෙහි ආරම්භ කිරීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கூட்டுறவு, உள்நாட்டு வர்த்தக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மொனறாகலை மாவட்டத்தின் பிபில மெதகம பிரதேச செயலகப் பிரிவுக்குரிய கொட்டபோவ வீதியின் முதலாம் மைற்கல் பிரதேசத்தில் நிர்மாணிக்கப்பட்டுள்ள நெல் சந்தைப்படுத்தும் சபைக்குச் சொந்தமான பாரிய அளவிலான நெற்களஞ்சியமொன்று சுமார் இருபது வருட காலமாக எவ்விதமான பாவனைக்கும் எடுக்கப் படாமல் மூடப்பட்டுள்ளதென்பதையும்;

(ii) மேற்படி களஞ்சியத்தை புனரமைத்து மீண்டும் நெல்லைக் களஞ்சியப்படுத்தும்பொருட்டு பயன்படுத்த இயலுமென்பதையும்

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) (i) ஆமெனில் , இதன் பொருட்டு நிதியேற்பாடுகள் ஒதுக்கப்பட்டுள்ளனவா;

(ii) இன்றேல், வேறு ஏதெனுமொரு கைத்தொழிலை இங்கு ஆரம்பிக்க நடவடிக்கை எடுப்பாரா;

(iii) ஆமெனில் , அத்திகதி யாது

என்பதை இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Co-operatives and Internal Trade:

(a) Will he admit that-

(i) a large scale paddy store belonging to the Paddy Marketing Board built at the 1st Milepost area on the Kotabowa Road belonging to the Bibila Medagama Divisional Secretary's Division of the Monaragala District has remained closed for about 20 years, without being put to any use; and

(ii) the said store can be rehabilitated again and used for paddy storage?

(b) Will he inform this House-

(i) whether provisions have been allocated for that purpose;

(ii) if not, whether action will be taken to commence any other industry there; and

(iii) if so, the date for same?

(c) If not, why?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) වී අළෙවි මණ්ඩලය 2008 වර්ෂයේ නැවත දියත් කරන ලද වකවානුවේ සිට මෙම ගබඩාවේ වී මිල දී ගැනීම සිදු කළ අතර මෙම කන්නයේද එම ගබඩාවේ වී මෙට්‍රික් ටොන් 598ක (මෙට්‍රික් ටොන් පන්සිය අනූඅටක) ප්‍රමාණයක් ගබඩා කර ඇත.

(ii) වී තොග අස් කර ගබඩාව හිස් කළ පසු ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

(ආ) (i) ඔව්.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

## විශ්‍රාමික රජයේ සේවකයින් : රක්ෂණ ක්‍රමය
## ஓய்வுபெற்ற அரச ஊழியர்கள் : காப்புறுதித் திட்டம்
## RETIRED PUBLIC SERVANTS : INSURANCE SCHEME

2061/'11

13. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මේ වන විට විශ්‍රාම වැටුප් ලබන විශ්‍රාමික රජයේ සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් වෙනුවෙන් රජය විසින් ක්‍රියාත්මක කරන ප්‍රතිලාභ ලැබිය හැකි රක්ෂණ ක්‍රම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2010 මහින්ද චින්තනයේ සඳහන් "විශ්‍රාමික රජයේ සේවකයින්ට සෞඛ්‍ය පහසුකම් වෙනුවෙන් ඖෂධ සහ වෛද්‍ය ගාස්තු සඳහා වර්ෂයකට රුපියල් 10,000/-ක් වන සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දෙන්නෙමි." යන පොරොන්දුවට අනුව හඳුන්වා දී ඇති රක්ෂණ ක්‍රමය කවරේද;

(ii) ඒ යටතේ ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් ඇති විශ්‍රාමික සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වන විට ප්‍රතිලාභ ලබා ඇති විශ්‍රාමික සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(iv) මේ වන විට ප්‍රතිලාභ වශයෙන් ගෙවා ඇති මුදල කොපමණද;

(v) නො එසේ නම්, එම රක්ෂණ ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබා දීම ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பொது நிர்வாக, உள்நாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தற்போது ஓய்வூதியம் பெறும் இளைப்பாறிய அரச ஊழியர்களின் எண்ணிக்கை எவ்வள வென்பதையும்;

(ii) இவர்களுக்காக அரசினால் செயற்படுத்தப் படுகின்ற நலன்களைப் பெற்றுக்கொள்ளக்கூடிய காப்புறுதித் திட்டங்கள் யாவையென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) 2010 மஹிந்த சிந்தனையில் குறிப்பிடப்பட்டுள்ள ஓய்வுபெற்ற அரச ஊழியர்களுக்கு சுகாதார வசதிகளுக்காக மருந்துகள் மற்றும் மருத்துவ கட்டணங்களுக்கு வருடத்துக்கு ரூபா 10000/- பெறுமதியான சுகாதார காப்புறுதித் திட்ட மொன்றை அறிமுகப்படுத்துவேன்' என்ற வாக்குறுதிக்கமைய அறிமுகப்படுத்தப்பட்டுள்ள காப்புறுதித் திட்டம் யாதென்பதையும்;

(ii) இதன் கீழ் நலன்களைப் பெற்றுக்கொள்வதற்கு தகுதியுடைய ஓய்வுபெற்ற அரச ஊழியர்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(iii) தற்போது நலன்களைப் பெற்றுக்கொண்டுள்ள ஓய்வுபெற்ற ஊழியர்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(iv) தற்போது நலன்களாக செலுத்தப்பட்டுள்ள பணத் தொகை எவ்வளவென்பதையும்;

(v) இன்றேல், மேற்படி காப்புறுதித் திட்டத்தின் கீழ் நலன்களை பெற்றுக்கொடுத்தல் ஆரம்பிக்கப் படும் திகதி யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු දයාසිරි ජයසේකර මහතා]

asked the Minister of Public Administration and Home Affairs:

(a) Will he state-

(i) the number of retired public servants who draw pensions at present; and

(ii) the insurance schemes implemented by the government which are beneficial to them?

(b) Will he inform this House-

(i) of the insurance scheme introduced by the Government in terms of the promise made in the "Mahinda Chintana 2010" which read as "An insurance scheme with a value of Rs. 10,000 a year for drugs and other Medical expenses for retired public servants will be introduced";

(ii) the number of retired public servants who are entitled to receive benefits under that scheme;

(iii) the number of retired public servants who have received such benefits by now;

(iv) the amount of money paid as benefits so far; and

(iv) if not, the date on which the provision of benefits under that insurance scheme will be commenced?

(c) If not, why?

**ගරු විජය දහනායක මහතා (රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு விஜய தஹநாயக்க- பொது நிருவாக, உள்நாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Wijaya Dahanayake - Deputy Minister of Public Administration and Home Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 2012 මැයි මාසය වන විට රජයේ සේවයෙහි විශ්‍රාමික සංඛ්‍යාව 504,637ක් වේ.

(ii) විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ යනු සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ක්‍රමයකි. ඒ අනුව ඉහත සියලු විශ්‍රාමිකයන්ට මාසිකව විශ්‍රාම වැටුපක් හිමිගන්වනු ලැබේ. ඒ සඳහා වාර්ෂිකව රුපියල් බිලියන 108ක් පමණ වැය කෙරේ. ඊට අමතරව සෞඛ්‍ය වෛද්‍ය රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීලා තිබෙනවා.

(ආ) (i) ඉන් අදහස් වන්නේ දැනට ගෙවන විශ්‍රාම වැටුපට අමතරව සෞඛ්‍ය වෛද්‍ය රක්ෂණ ක්‍රමයක්ද විශ්‍රාමිකයන්ට ලබා දීමය.

(ii) මුළු විශ්‍රාමිකයන් සංඛ්‍යාවටම මෙම ප්‍රතිලාභ ලබා දීමට අපේක්ෂා කෙරේ.

(iii) මෙතෙක් ක්‍රියාත්මක කොට නැත. එය සකසමින් පවතිනවා.

(iv) නැත. මේ වන විට ගණනය කරමින් පවතිනවා. එය අවසන් වන කොට ඒ අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරනවා.

(v) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව හා අග්‍රහාර රක්ෂණ අරමුදල ඒකාබද්ධව යෝජිත රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව රුපියල් 10,000 ඉක්ම වන ලද ප්‍රතිලාභ යෝජනා ක්‍රමය මේ වන විටත් කෙටුම්පත් කර අවසාන අතර ඊට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන කඩිනමින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. එතුමා කිව්වේ, විශ්‍රාම වැටුප් ක්‍රමය රක්ෂණ ක්‍රමයක් විධියට තිබෙනවාය කියලායි.

එහෙම එකක් නැහැ නේ. විශ්‍රාම ක්‍රමය කිව්වාම කෙළින්ම විශ්‍රාමික පඩිය විතරයි හම්බ වන්නේ. වෙන මොකක්වත් හම්බ වෙන්නේ නැහැ. ඒකට රක්ෂණ ක්‍රමයක් නැහැ.

**ගරු විජය දහනායක මහතා**
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)

ගරු මන්ත්‍රීතුමා, විශ්‍රාම වැටුපට අමතරව නව හඳුන්වා දීමක් හැටියට තමයි මේ ආරක්ෂණ වෛද්‍ය රක්ෂණ ක්‍රමයක්-

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මේ mike එක දාන්න කෝ.

මේ වන විට ප්‍රතිලාභ වශයෙන් ගෙවා ඇති මුදල කොපමණද කියලා අහපුවාම ඔබතුමා කිව්වේ බලලා කියන්නම් කියලා. ඒ කියන්නේ, තවම මේ කටයුත්ත පටන් අරගෙනත් නැහැ, මේකට කැබිනට් අනුමැතියක් අරගෙනත් නැහැ. ඔබතුමන්ලා මහින්ද චින්තනයේ බොහොම පැහැදිලිව කිව්වා, රුපියල් දහදාහක සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දෙනවා කියලා. ඒ සඳහා ක්‍රියා මාර්ග ගණනාවක්ම අරගෙන නැහැ කියලායි මා ඔබතුමාට කියන්නේ. ඒකයි මා ඇහුවේ, ඇත්ත වශයෙන්ම ගෙවන ලද මුදල කොච්චරද කියලා.

**ගරු විජය දහනායක මහතා**
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)

ගරු මන්ත්‍රීතුමා, තවම ගෙවන්න පටන් අරගෙන නැහැ. මේක දැන් කෙටුම්පත් කරලා අවසානයි. කැබිනට් අනුමැතියට ඉදිරිපත් කරලා තිබෙනවා. අනුමැතිය ලැබුණු විගස ලබා දීමට අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරන්න සූදානමින් ඉන්නවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඒ වාගේම මා අහන්න කැමැතියි-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

තුන්වැනි අතුරු ප්‍රශ්නය.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය. විශ්‍රාම වැටුප් ලබා ගන්න තිබෙන දුෂ්කරතාව පිළිබඳ ප්‍රශ්නය අවසන් කරන්න ඔබතුමන්ලා මහින්ද චින්තනයෙන්ම යෝජනා කළා, ඒක ගෙදරට එවන්න පුළුවන් විධියේ වැඩ පිළිවෙළක් සකස් කරනවා කියලා; විශ්‍රාම ගත් අයට ඒ මුදල ගෙවල්වලට එන ක්‍රමවේදයක් සකස් කරනවා කියලා. රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු නියෝජ්‍ය ඇමතිතුමා හැටියට ඔබතුමාට කියන්න පුළුවන්ද, විශ්‍රාමික අය සඳහා මේ ක්‍රමය පටන් ගන්නේ කවදා ඉඳලාද කියලා.

**ගරු විජය දහනායක මහතා**
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)
ගරු මන්ත්‍රීතුමා, ඒ සියලු කටයුතු දැනට සූදානම් කර ගෙන යනවා. මට මේ අවස්ථාවේ කියන්න බැහැ, අසවල් දිනයේ ඉඳලා මේක ගෙවන්න පුළුවන්ය කියලා. නමුත් මේ වන විට අමාත්‍යාංශය හැටියට ඒ සියල්ලම සකසමින් පවතිනවා .

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔව්, අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු නියෝජ්‍ය ඇමතිතුමා විධියට කටයුතු කරන ඔබතුමාගෙන් මා ඉතාමත් වැදගත් ප්‍රශ්නයක් අහනවා. මෙය රාජ්‍ය පරිපාලනයට - ඔබතුමාට- සම්බන්ධ එකක්. පසු ගිය දිනවල, උපාධිධාරීන්ට රැකියා ලබා දීමේ දෙවැනි ලැයිස්තුව අර ගත්තා. පළමුවැනි ලැයිස්තුවේ අයට -2010 අයට- කැඳවීම් කරලා පත්වීම් ලබා දුන්නා. නමුත් දැන් මේ දෙවැනි ලැයිස්තුව ගන්න කොට 2010 අයට මේ පත්වීම් දෙන්න බැහැ කියලා හැම දිස්ත්‍රික් කාර්යාලයකම විශාල ප්‍රශ්නයක් මතු වෙලා උපාධිධාරීන් විශාල අපහසුතාවකට පත් වෙලා තිබෙනවා. මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, පළමුවැනි වතාවට ගන්න කොට -පළමුවැනි බඳවා ගැනීමේදී- 2010 උපාධිධාරීන්ට පත්වීම් දුන්නා නම්, මේ දෙවැනි බඳවා ගැනීමේදී ඒ අයව හළලා තිබෙන්නේ ඇයි කියලා, ඒ අයට කර තිබෙන අසාධාරණය පිළිබඳව ඔබතුමා ගන්නා පියවර මොකක්ද කියලා.

**ගරු විජය දහනායක මහතා**
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උපාධිධාරීන් හැටියට සිටින සියල්ලන්ටම රැකියා ලබා දෙන්න අවශ්‍ය කටයුතු කර ගෙන යනවා. ගරු මන්ත්‍රීතුමා කියන 2010 අය සම්බන්ධව විස්තර කියන්නට මා මේ අවස්ථාවේ සූදානම් වෙලා ආවේ නැහැ. නමුත් මා දන්නා හැටියට සම්මුඛ පරීක්ෂණ පවත්වපු ඒ සියලු උපාධිධාරීන්ට රැකියා ලබා දෙන්නට අමාත්‍යාංශය හැටියට අපි මේ වන විට-

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
දැනට නවත්වලා තිබෙනවා-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ගරු නියෝජ්‍ය ඇමතිතුමා විසින් පිළිතුර ලබා දුන්නා.

**ගරු විජය දහනායක මහතා**
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ඒ සම්බන්ධයෙන් වෙනම ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න. එවිට ඒ සියලු විස්තර සොයලා ලබා දෙන්න පුළුවන්.

## ජන සංගණන සංඛ්‍යා ලේඛන : විස්තර
சனத்தொகைக் கணிப்பீடு : விபரம்
CENSUS AND STATISTICS : DETAILS

1066/'11

1. **ගරු ජෝන් අමරතුංග මහතා (ගරු රවි කරුණානායක මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு ரவி கருணாநாயக்க சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Ravi Karunanayake)
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2) :

(අ) (i) මෙරට ඇති ගම්මාන සංඛ්‍යාව කොපමණද;
(ii) එක් ගම්මානයක සාමාන්‍යයෙන් වාසය කරන පවුල් සංඛ්‍යාව කොපමණද;
(iii) මෙරට ඇති ග්‍රාම නිලධාරි කොට්ඨාස සහ ග්‍රාම නිලධාරි තනතුරු සංඛ්‍යාව කොපමණද;
(iv) මෙරට සිටින ප්‍රාදේශීය ලේකම්වරුන් සංඛ්‍යාව කොපමණද;

යන්න මෑතකදී ලබා ගත් ජන සංගණන සංඛ්‍යා ලේඛන ආශ්‍රයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එක් එක් පළාත, දිස්ත්‍රික්කය, මැතිවරණ කොට්ඨාසය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ පිහිටා ඇති ගම්මාන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;
(ii) එක් එක් දිස්ත්‍රික්කයේ මුළු ජනගහනය කොපමණද;
(iii) මීළඟ නිල ජන සංගණනය පැවැත්වීමට නියමිතව ඇති දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) அண்மைய சனத்தொகைக் கணிப்பீடு, புள்ளி விபரங்கள் ஆகியவற்றை மையமாகக் கொண்டு,
(i) நாட்டில் எத்தனை கிராமங்கள் உள்ளன என்பதையும்;
(ii) ஒரு கிராமத்தில் சராசரியாக எத்தனை குடும்பங்கள் வாழ்கின்றன என்பதையும்;
(iii) நாட்டில் எத்தனை கிராம சேவகர்கள் பிரிவுகள் மற்றும் கிராம சேவகர் பதவிகள் உள்ளன என்பதையும்;

[ගරු ජෝන් අමරතුංග මහතා]

(iv) நாட்டில் எத்தனை பிரதேச செயலாளர்கள் உள்ளனர் என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) ஒவ்வொரு மாகாணத்திலும், மாவட்டத்திலும், தேர்தல் தொகுதியிலும், பிரதேச செயலாளர் பிரிவுகளிலும் கிராம சேவகர் பிரிவுகளிலும் எத்தனை கிராமங்கள் உள்ளன என்பதை தனித்தனியாகவும்;

(ii) மாவட்ட அடிப்படையில் மொத்த சனத்தொகை எவ்வளவு என்பதையும்;

(iii) அடுத்த உத்தியோகபூர்வ சனத்தொகை கணிப்பீடு எப்பொழுது நடைபெறும் என்பதையும்

அவர் தெரிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning:

(a) Will he inform this House, based on the recent census and statistics -

(i) the number of villages in the country;

(ii) the number of families who live on an average in a village;

(iii) the number of Grama Niladari Divisions and Grama Niladari posts in the country; and

(iv) the number of Divisional Secretaries in the country ?

(b) Will he state-

(i) the number of villages per each Province, District, Electorate, Divisional Secretary's Division and Grama Niladari Division separately;

(ii) the total population per district; and

(iii) as to when the next official census is going to take place?

(c) If not, why?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතා අමාත්‍යතුමා)**

(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சர்)

(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation )

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:**

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) මෙරට ඇති ගම්මාන සංඛ්‍යාව 36,807කි.

(මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව)

(ii) එක් ගම්මානයක සාමාන්‍යයෙන් වාසය කරන පවුල් සංඛ්‍යාව 123කි.

(iii) ග්‍රාම නිලධාරි කොට්ඨාස සංඛ්‍යාව - 14,022

ග්‍රාම නිලධාරි තනතුරු සංඛ්‍යාව - 14,022

(මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය)

(iv) ප්‍රාදේශීය ලේකම් කාර්යාල සංඛ්‍යාව - 313

දැනට සිටින ප්‍රාදේශීය ලේකම්වරු සංඛ්‍යාව - 309

උප දිසාපති කාර්යාල/ උප ප්‍රාදේශීය ලේකම් කාර්යාල සංඛ්‍යාව - 19

දැනට සිටින උප දිසාපති /උප කාර්යාල ප්‍රධානීන් සංඛ්‍යාව - 17

(මූලාශ්‍රය : රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය)

(ආ) (i) එක් එක් පළාත, දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ මැතිවරණ කොට්ඨාසය තුළ පිහිටා ඇති ගම්මාන සංඛ්‍යාව පිළිවෙළින් වගු අංක 1, 2, 3 සහ 4 හි සඳහන්ය.

එක් එක් ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ පිහිටා ඇති ගම්මාන සංඛ්‍යාව වගු අංක 5හි සඳහන්ය. වගු අංක 5 ඇතුළත් සංයුක්ත තැටිය* පුස්තකාලයේ තබා ඇත.

(ii) වගු අංක 6 හි සඳහන්ය.

(iii) ජන හා නිවාස සංගණනයේ තුන්වන අදියර වන පුද්ගලයන් සහ නිවාස ඒකක ගණන් ගැනීම 2012 පෙබරවාරි 27 සිට මාර්තු 21 දක්වා සිදු කරන ලදී.

(ඇ) පැන නොනඟී.

**Table 1: Number of villages by Province - 2011**

| Province Code | Province- Sinhala | Province- Tamil | Province | Villages |
|---|---|---|---|---|
| 1 | බස්නාහිර | மேற்கு | Western | 4273 |
| 2 | මධ්‍යම | மத்தி | Central | 5369 |
| 3 | දකුණු | தெற்கு | Southern | 5461 |
| 4 | උතුරු | வடக்கு | Northern | 3307 |
| 5 | නැගෙනහිර | கிழக்கு | Eastern | 2286 |
| 6 | වයඹ | வடமேற்கு | North-western | 5861 |
| 7 | උතුරු මැද | வடக்கு-மத்தி | North-central | 3262 |
| 8 | ඌව | ஊவா | Uva | 3305 |
| 9 | සබරගමුව | சப்ரகமுவா | Sabaragamuwa | 3683 |
| | | | Total | 36807 |

Note: Number of GN Divisions - 14022
Number of Divisional Secretariats - 330

Source:MRCB(Master Register of Census Blocks)-Department of Census and Statistics

**Table 2: Number of villages by District - 2011**

| District Code | District Sinhala | District Tamil | District | Villages |
|---|---|---|---|---|
| 11 | කොළඹ | கொழும்பு | Colombo | 357 |
| 12 | ගම්පහ | கம்பஹா | Gampaha | 1565 |
| 13 | කළුතර | களுத்துறை | Kalutara | 2351 |
| 21 | මහනුවර | கண்டி | Kandy | 2828 |
| 22 | මාතලේ | மாத்தளை | Matale | 1342 |
| 23 | නුවරඑළිය | நுவரெலியா | Nuwara Eliya | 1199 |
| 31 | ගාල්ල | காலி | Galle | 2420 |
| 32 | මාතර | மாத்தறை | Matara | 1661 |
| 33 | හම්බන්තොට | அம்பாந்தோட்டை | Hambantota | 1380 |
| 41 | යාපනය | யாழ்ப்பாணம் | Jaffna | 1249 |
| 42 | මන්නාරම | மன்னார் | Mannar | 680 |
| 43 | වව්නියාව | வவுனியா | Vavuniya | 432 |
| 44 | මුලතිව් | முல்லைத்தீவு | Mullaitivu | 596 |
| 45 | කිලිනොච්චිය | கிளிநொச்சி | Kilinochchi | 350 |
| 51 | මඩකලපුව | மட்டக்களப்பு | Batticaloa | 947 |
| 52 | අම්පාර | அம்பாறை | Ampara | 737 |
| 53 | ත්‍රිකුණාමලය | திருகோணமலை | Trincomalee | 602 |
| 61 | කුරුණෑගල | குருணாகலை | Kurunegala | 4533 |
| 62 | පුත්තලම | புத்தளம் | Puttalam | 1328 |
| 71 | අනුරාධපුර | அநுராதபுரம் | Anuradhapura | 2633 |
| 72 | පොළොන්නරුව | பொலன்னறுவை | Polonnaruwa | 629 |
| 81 | බදුල්ල | பதுளை | Badulla | 1960 |
| 82 | මොණරාගල | மொனராகலை | Moneragala | 1345 |
| 91 | රත්නපුර | இரத்தினபுரி | Ratnapura | 2101 |
| 92 | කෑගල්ල | கேகாலை | Kegalle | 1582 |
| | | | Total | 36807 |

Source:MRCB(Master Register of Census Blocks)-Department of Census and Statistics

---

**** පුස්තකාලයේ තබා ඇත.***

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

Table 3 Number of villages by DS Division - 2011

| DistrictCode | District | DSCode | DSDivisionSinhala | DSDivisionTamil | DSDivision | Villages |
|---|---|---|---|---|---|---|
| 11 | Colombo | 3 | කොළඹ | கொழும்பு | Colombo | |
| 11 | Colombo | 6 | කොලොන්නාව | கொலன்னாவ | Kolonnawa | 59 |
| 11 | Colombo | 9 | කඩුවෙල | கடுவல | Kaduwela | |
| 11 | Colombo | 12 | හෝමාගම | ஹோமாகம | Homagama | 142 |
| 11 | Colombo | 15 | සීතාවක | ஹங்வெல | Seethawaka | 86 |
| 11 | Colombo | 18 | පාදුක්ක | பாதுக்கை | Padukka | 70 |
| 11 | Colombo | 21 | මහරගම | மஹரகம | Maharagama | |
| 11 | Colombo | 24 | ශ්‍රී ජයවර්ධනපුර කෝට් | ஸ்ரீஜயவர்தனபுர கோட் | Sri Jayawardanapura Kotte | |
| 11 | Colombo | 27 | තිඹිරිගස්යාය | திம்பிரிகஸ்யாய | Thimbirigasyaya | |
| 11 | Colombo | 30 | දෙහිවල | தெஹிவலை- கல்கிஸ் | Dehiwala | |
| 11 | Colombo | 31 | රත්මලාන | றத்மலானை | Ratmalana | |
| 11 | Colombo | 33 | මොරටුව | மொரட்டுவ | Moratuwa | |
| 11 | Colombo | 36 | කැස්බෑව | ஹெஸ்பாவ | Kesbewa | |
| 12 | Gampaha | 3 | මීගමුව | நீர்கொழும்பு | Negombo | |
| 12 | Gampaha | 6 | කටාන | கந்தானை | Katana | 109 |
| 12 | Gampaha | 9 | දිවුලපිටිය | திவுலுப்பிட்டிய | Divulapitiya | 215 |
| 12 | Gampaha | 12 | මීරිගම | மீரிகம | Mirigama | 273 |
| 12 | Gampaha | 15 | මිනුවන්ගොඩ | மினுவாங்கொட | Minuwangoda | 179 |
ඒ වෙනුවෙන් නිලධාරින්ව පෙළ ගස්සවන්න පුළුවන්; ආයතන ප්‍රධානින් දැනුවත් කරන්න පුළුවන්; ඒ අයගේ ඉලක්ක පිළිබඳව අවබෝධයක් ඇති කර ගන්න පුළුවන්; ඒ ඉලක්ක ක්‍රියාත්මක වනවාද කියලා ගරු ඇමතිතුමාට, එහෙම නැත්නම් අමාත්‍යාංශයට සොයා බලන්න පුළුවන්. ඒ තුළින් අමාත්‍යතුමාගේ සහ අමාත්‍යාංශයේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කර ගන්න පුළුවන් වෙනවා. ඒ තුළින් පැහැදිලිව අමාත්‍යාංශයේ වැඩ පිළිවෙළ වැඩිදියුණු කර ගැනීම සඳහා ඊළඟ වසරට කරුණු ඉදිරිපත් කරද්දි අවබෝධයක් ලබා ගන්න පුළුවන් වෙනවා. එතකොට මේ රටේ මුදල් පිළිබඳව අවසාන වශයෙන් තීන්දු ගන්නා, ඒ වාගේම වග කියන ආයතනය වන පාර්ලිමේන්තුවට පැහැදිලිවම ඒ වග කීම ගැන සම්පූර්ණ අවබෝධයක් ඇතුව ක්‍රියාත්මක කරන්න පුළුවන් කියලා මා විශ්වාස කරනවා. ඒ නිසා අය වැය කාරක සභාවක් - Budget Committee එකක්- මේ පාර්ලිමේන්තුවේ ස්ථාපිත කරන්න මා යෝජනා කරනවා.

මේ වසරේ තව ටික කාලයයි ඉතිරි වෙලා තිබෙන්නේ. අපට මේ ක්‍රමවේදය පිළිබඳව පක්ෂ සියල්ල සමඟම සාකච්ඡා කරන්න පුළුවන්. සියලුම පක්ෂ නායකයින් එක්ක සාකච්ඡා කරන්න පුළුවන්. විශේෂයෙන්ම මේ පිළිබඳව අපේ වර්තමාන කථානායකතුමා ඉතාම උනන්දුවෙන් හා කැමැත්තෙන් අපත් එක්ක සාකච්ඡා කළා. මෙවැනි කතිකාවක් ඇති කරන්න අපව උනන්දු කළා. මෙවැනි කතිකාවක් තුළින් අදහස් හුවමාරු කර ගන්න පුළුවන් වාගේම, හුවමාරු කර ගන්නා අදහස් තුළින් අපේ පාර්ලිමේන්තුව තුළ තිබෙන විනිවිදභාවය සහ ජනතාවගේ විශ්වාසය තහවුරු කර ගන්න පුළුවන්. දේශපාලනයේ නියැළී සිටින පාර්ලිමේන්තු සභා ගැබේ සිටින මන්ත්‍රීවරුන්ට, මැති ඇමතිවරුන්ට ඒ විශ්වාසය තහවුරු කිරීම සඳහා මෙවැනි කර්තව්‍යයක් ඉතාම කාලෝචිතයි වාගේම යෝග්‍ය නිසා ගරු කථානායකතුමාත්, ඒ වාගේම පක්ෂයක් හැටියට, සන්ධානයක් හැටියට අපේ රජයත් මේ යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා මට සහයෝගය දැක්වූවා, මාව උනන්දු කෙරෙව්වා. මම ඒ ගැනත් සඳහන් කරමින්, අය වැය කාරක සභාවක් ස්ථාපිත කිරීමට මෙම උත්තරීතර සභාවට යෝජනා කරමින් මම නිහඬ වනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 2.46]

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අය වැය කාරක සභාවක් ස්ථාපිත කිරීම පිළිබඳව ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා. විශේෂයෙන්ම මුදල් අමාත්‍යාංශය මඟින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන විසර්ජන පනත් කෙටුම්පත එහෙම නැත්නම් වාර්ෂික අය වැය ඇස්තමේන්තුව පිළිබඳව, රාජ්‍ය මූල්‍ය පාලනය ගැන පූර්ණ වගකීම තිබෙන උත්තරීතර ආයතනය හැටියට විශේෂයෙන්ම අපි පුළුල් කතිකාවතක් ඇති කර ගත යුතුයි. විශේෂයෙන් නවක මන්ත්‍රීවරු වශයෙන් මේ පාර්ලිමේන්තුවට ආපු අය විධියට අපි දන්නවා, සමහර අමාත්‍යාංශ පිළිබඳව විවාද කරන්න වෙන් කරන කාලය තුළදී සාකච්ඡා කරන්න අවස්ථාවක් ලැබෙන්නේ නැති බව. ඒ නිසා මේ වාගේ කාරක සභාවකට යොමු කිරීම මඟින් එක් එක් අමාත්‍යාංශ කෙරෙහි පුළුල් අවධානයක් යොමු කිරීමටත්, ඒ වාගේම අප සියලු දෙනාට පුළුල් අවබෝධයක් ලබා ගන්නත් විශේෂයෙන්ම හැකියාව ලැබෙනවා. අපි දන්නවා, මුදල් අමාත්‍යවරයා හැටියට අතිගරු ජනාධිපතිතුමා පසු ගිය අය වැය ලේඛනය සකස් කරද්දී ඉතිහාසයේ පළමුවන වතාවට පවතින සියලුම අමාත්‍යාංශ ගෙනැල්ලා අමාත්‍යාංශ එකින් එක අරගෙන සාකච්ඡා පවත්වලා, ඒවායේ තිබෙන අඩු පාඩුකම්, ඒ වාගේම ඉදිරි සැලසුම් පිළිබඳව හොඳ අවධානයක් යොමු කරලා එම අය වැය සකස් කරන්න කටයුතු කළා විතරක් නොවෙයි, විවිධ වෘත්තීය සමිති ගෙනැල්ලා, ඒ අය එක්ක සාකච්ඡා කරලා, ඒ වාගේම පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සමඟත් සාකච්ඡා කළ බව. මොකද අමාත්‍යාංශ කැඳවද්දී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහභාගි වෙන්නේ නැති නිසා ඒ අමාත්‍යාංශ නොදරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුනුත් කැඳවලා, විශේෂයෙන්ම අපේ අදහසුත් අරගෙන ඒ අය වැය ලේඛනය සකස් කළා. එහෙම සකස් කරලා ඒ අය වැය කෙටුම්පත ඉදිරිපත් කළත්, අපට පුළුල් සාකච්ඡාවක් කරන්න අවස්ථාවක් ලැබුණේ නැහැ. ඒ නිසා අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට විතරක් නොවෙයි, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් මේවාට මැදිහත් වෙලා මේ පිළිබඳව පුළුල් අවබෝධයක් ඇතිව කථා කරන්නත්, ඒ වාගේම ඒ සම්බන්ධව අදහස් යෝජනා ඉදිරිපත් කරලා යම් යම් සංශෝධනයන් කරන්නත් මේ තුළින් විශාල ඉඩකඩක් ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව නියෝජනය කරන සාමාජිකයන් හැටියට විවිධ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවල යම් යම් අඩු පාඩු සහ ගැටලු අපි දකිනවා. ඒ වාගේම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තාවන් දිහා බැලුවාම එම ආයතනවල විවිධ අඩු පාඩුකම් දකිනවා. ඉතින්, මේවා පිළිබඳව අවබෝධයක් තිබෙන මේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට මෙවැනි කාරක සභාවක පුළුල් විධියට සාකච්ඡා කරන්න පුළුවන්. ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා කිව්වා වාගේ, ඉතාම විනිවිදභාවයක් ඇතිව, ඒ වාගේම ප්‍රජාතන්ත්‍රවාදී විධියට, ඉතාම ශුභ වාදී විධියට ජනතාවාදී අය වැයක් ඉදිරිපත් කරන්න විශේෂයෙන්ම අපට ඒක පිටිවහලක් වෙනවා.

මා දීර්ඝව කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. මේක ඉතාම හොඳ යෝජනාවක්. ඒ නිසා මේ යෝජනාව ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීම සඳහා ඔබතුමාගේ, ඒ වාගේම අපේ ගරු කථානායකතුමාගේ අවධානය යොමු වෙලා, මෙවැනි

තත්ත්වයකට අය වැය කාරක සභාවක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු කඩිනමින් ඉටු කරලා, ඊළඟ අය වැය අවස්ථාවේ දීම එම අත් දැකීම් අප සියලු දෙනාටම ලබා ගන්නට අවස්ථාව සලසන්නය කියලා ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

[අ. භා. 2.49 ]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මුදල් පිළිබඳව පාර්ලිමේන්තු අධීක්ෂණ කමිටුවක් ඇති කරන්න කියලා, තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා විසින් සභාව කල් තැබීමේ යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒකට අපේ විරුද්ධත්වයක් නැහැ. අපි එයට සහයෝගය දෙනවා. ඒ එක්කම විරුද්ධ පක්ෂය හැටියට අපි කියන්නේ, සම්පූර්ණ පාර්ලිමේන්තු අධීක්ෂණ කමිටු ක්‍රමයක් මේ පාර්ලිමේන්තුවේ ඇති කරන්න කියලා යි. ඒක ආණ්ඩුවටත් හොඳයි; පාර්ලිමේන්තුවටත් හොඳයි; පසුපෙළ මන්ත්‍රීවරුන්ටත් සුදුසු එකක්. අද සඳහන් කළා, අපේ තිබෙන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ගැන. ඇත්ත වශයෙන්ම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව කියලා කියන්නේ, රජයේ මුදල් වියදම් කිරීම සම්බන්ධව විගණකාධිපතිගේ වාර්තාවෙන් පසුව ඒ පිළිබඳව සාකච්ඡා කරන post-auditing committee එකක්. එතකොට ඔක්කොම කාරණා කටයුතු සිදු වෙලා ඉවරයි. ඒවාගේම තමයි අපේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවත්.

අය වැය විවාදයේ කාරක සභා අවස්ථාවේ දී වැඩිපුර වෙලාව වෙන් කරලා තිබෙන්නේ විරුද්ධ පක්ෂයටයි. විශේෂයෙන්ම අමාත්‍යාංශ ගණනාවක් පිළිබඳ විවාද කිරීමට තිබෙන නිසා ඒක දිගටම කර ගෙන යන්න අපහසුයි. ඒ නිසා 2009 වර්ෂයේ දී අප යෝජනා කළා, මේ කාරක සභා අවස්ථාවේ දී එක් එක් අමාත්‍යාංශ සඳහා පාර්ලිමේන්තු අධීක්ෂණ ක්‍රමයක් ඇති කරමු කියලා. අත් දැකීමක් ලබා ගැනීමක් හැටියට යම් කිසි අමාත්‍යාංශ කිහිපයක් සඳහා පමණක් ඇති කරමු කියලා යෝජනා කළා. දැන් එය සාර්ථකව කරලා තිබෙනවා. එය සාර්ථකව කරලා තිබෙන නිසා, ඊළඟට සම්පූර්ණ පාර්ලිමේන්තු අධීක්ෂණ ක්‍රමයකට යනවාද කියන එකයි අපි අහන්නේ. මොකද, අපේ පාර්ලිමේන්තුවේ දැනට එහෙම ක්‍රමයක් නැහැ.

අපි උපදේශක කාරක සභා ආරම්භ කළේ, 1978දී. එදා මට මතකයි, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා, ආර්. ප්‍රේමදාස මැතිතුමා විශේෂයෙන් කථා කළේ රාජ්‍ය මන්ත්‍රණ සභාවේ තිබුණු විධායක කමිටු ගැනයි. ඇමතිවරුන් සිටියේ නැහැ. විධායක කමිටුවේ සභාපති සහ අනෙකුත් සාමාජිකයන් ඇතුළු හත් දෙනෙකු තමයි සියලුම තීරණ ගත්තේ. කැබිනට් මණ්ඩලයක් තිබුණා. කැබිනට් මණ්ඩලයක් තිබුණු නිසා එහෙම විධායක තීරණ ලබා ගන්නා එක පාර්ලිමේන්තු කමිටුවලට භාර දෙන්න බැහැ. එහෙත් එය පාර්ලිමේන්තු කොමිටියකට භාර දුන්නා, ඇමතිතුමාට එම කොමිටියෙන් උපදෙස් ලබා ගැනීම සඳහා. ඒකයි එතැන තිබෙන තත්ත්වය. තමන් කැමැති වැඩ කටයුත්තක් කරන්නට බැහැ, ඇමතිතුමා තමයි තීරණය කරන්නේ මොකක්ද එතැනදී කරන්නේ කියලා. එහෙනම් ඒ පරණ ඩොනමෝර් ක්‍රමයේ විධායක කමිටු ක්‍රමය; -අද කොළඹ මහ නගර සභාවේ තිබෙන්නේ- එතැනින් මන්ත්‍රීවරුන් මෙතැනට සම්බන්ධ කරන එක; -ඒ ක්‍රියා කරන තැන ඒක හොඳයි. එහෙත් සැම තැනම එය ක්‍රියාත්මක වෙලාත් නැහැ. ඒ ක්‍රමය අහෝසි කරන්නය කියලා කියන්නේ නැහැ.- තිබෙන ගමන් අපි අධීක්ෂණ ක්‍රමයකට යමු. ඒකයි මා යෝජනා කරන්නේ. මොකද, පාර්ලිමේන්තු අධීක්ෂණය කියලා කිව්වාම, ප්‍රශ්න අහන එක, විවාද කරන එක කියන ඒ හැම එකම පාර්ලිමේන්තු අධීක්ෂණ.

අද පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු වැඩි වෙලා තිබෙනවා. ආණ්ඩුවක වැඩ කටයුතු වැඩි වනවා. නීති වැඩියෙන් සම්මත කරනවා. වැඩියෙන් නීති ක්‍රියාත්මක කරන්න සිදු වෙලා තිබෙනවා. එහෙම නම් අද ලෝකයේ රටවල් ගණනාවක ඒ නීති ක්‍රියාත්මක කිරීම ගැන එක එක ක්ෂේත්‍ර නැත්නම් අමාත්‍යාංශ යටතේ ඒවා අධීක්ෂණය කරන්න කියලා පාර්ලිමේන්තු කමිටු පත් කරලා තිබෙනවා. ඒ කමිටුවල සභාපතිවරුන් වන්නේ ඇමතිවරුන් නොවෙයි; නියෝජ්‍ය ඇමතිවරුන් නොවෙයි. විරුද්ධ පක්ෂයේ නායකයාවත් නොවෙයි. එහි සිටින සාමාන්‍ය පසු පෙළ මන්ත්‍රීවරුන්ට විතරයි එම වැඩ කටයුත්ත කරන්නට පුළුවන්. අන්න ඒකයි මෙතැන තිබෙන වටිනාකම. එතකොට පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් නීතිය ක්‍රියාත්මක කළේ කොහොමද? උපදේශක කාරක සභාව විසින් යම් කිසි පියවරක් ගන්න ඉස්සරවෙලා ඇමතිවරයාගෙන් අහන්න පුළුවන්. ඒ කාලයේ මන්ත්‍රීවරුන්ට යම් වැඩක් කර ගන්න වුවමනා වුණාම හැමදාම ගිහින් ඇමතිවරයාගේ කාමරය වට කර ගෙන ඉන්න සිදු වෙනවා. දැන් එහෙම නොවෙයි, උපදේශක කාරක සභාවේ දී එම ප්‍රශ්න ටික විසඳා ගන්නට පුළුවන්. ඒක මන්ත්‍රීවරුන්ගේ ගරුත්වය ආරක්ෂා කරන දෙයක්. මේක වෙන එකක්. විධායකය අධීක්ෂණය කරන එක මේ ගරු සභාවේ කරන එකක්. අපි උපදේශක කාරක සභාවේ දී විධායකයට උපදෙස් දෙනවා ඒ අය එක්ක වැඩ කරන්න. අපි ස්වාධීනව කටයුතු කරනවා. විධායකය අපිට ඕනෑ නම් විවේචනය කරන්නටත් පුළුවන්, ප්‍රශංසා කරන්නටත් පුළුවන්. මේ සභාව හැටියට කොමිටිවලට බෙදිලා ඒක කරන්න පුළුවන්.

ගරු මන්ත්‍රීතුමා කරන පළමුවැනි යෝජනාව තමයි, පාර්ලිමේන්තුවේ අය වැය කමිටුවක් පත් කිරීම. ඒ කියන්නේ දැනට පත් කර තිබෙන අය වැය කමිටුවලින් අපි කරන්නේ, එක් එක් අමාත්‍යාංශවලට අදාළ ඇස්තමේන්තු කිහිපයක් ගැන සාකච්ඡා කිරීම පමණයි. අපි කියන්නේ එහෙම නොවෙයි. ඇස්තමේන්තු සියල්ලම විතරක් නොවෙයි, රජයේ මූල්‍ය කටයුතු පිළිබඳ සම්පූර්ණ පාර්ලිමේන්තු අධීක්ෂණයක් මුළු අවුරුද්ද තුළම කරන්න කියලා යි. අන්න ඒකයි ඇමෙරිකාවේ Congressional Budget Office කියලා මෙතුමා සඳහන් කළේ. මීට අමතරව කැනඩාවේ තිබෙනවා, ඕස්ට්‍රේලියාවේ තිබෙනවා, කොරියාවේ තිබෙනවා. ඒ රටවල වෙනම කොමිටියකුත්, ඒකට ආධාර කරන කාර්යාලයකුත් තිබෙනවා. අන්න ඒ වාගේ කාර්යාලයක්, එහෙම අංශයක් ඇති කරන්නයි අපි යෝජනා කරන්නේ.

අපි -විරුද්ධ පක්ෂයෙන්- ඒ වාගේ රාජ්‍ය මූල්‍ය පිළිබඳ කාරක සභාවක් ඇති කරන්න යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ආදායම් ටික බලන්නත්, වියදම් ටික බලන්නත් ඒ කමිටුව ක්‍රියාත්මක කරන්නේ කොහොමද? මේ හැම එකක්ම කරන්නේ රටේ නීතිය අනුවයි. මූල්‍ය නීතිය ක්‍රියාත්මක කරන එක වෙනම කොමිටියකට භාර දීලා තිබෙනවා. ඒක හොඳයි. පසු ගිය අවුරුදු කිහිපය තුළ ඇස්තමේන්තු කමිටු පත් කරලා තිබුණා. අපි යෝජනා කරන්නේ ඒ ඇස්තමේන්තු කමිටුවේ වැඩ කටයුතුත්, රාජ්‍ය මූල්‍ය පිළිබඳ කාරක සභාවේ යෝජනාවත් දෙකම අර ගෙන, ඒ දෙක ඒකාබද්ධ කරලා එක කමිටුවක් ක්‍රියාත්මක කරමු කියලායි. මම හිතන්නේ ඇමෙරිකාවේ, ඕස්ට්‍රේලියාවේ, කොරියාවේ, දකුණු කොරියාවේ වාගේ රටවල එහෙම කරනවා. කෙන්යාවේත් මම දැකලා තිබෙනවා. ඒක ක්‍රියාත්මක කරන්නට පුළුවන්. එතැනදී ක්‍රියාත්මක කරන්නේ විශේෂයෙන්ම මුදල් පිළිබඳව තිබෙන නීති.

ඒ රටවල තිබෙනවා අමාත්‍යාංශ, නැත්නම් විෂයයන් පිළිබඳව අධීක්ෂණ කමිටු. ඒ අධීක්ෂණ කමිටුවලින් නීතිය ක්‍රියාත්මක කරන්නේ කොහොමද? මුදල් සම්බන්ධ වැඩ කටයුතු ගැන ඒ

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

නීතිය ක්‍රියාත්මක කරනවා. ඒ වාගේම වෙනත් වාර්තා පිළිබඳව, රෙගුලාසි පිළිබඳව සාකච්ඡා කරනවා පමණක් නොවෙයි, ඒ රටවල කෙටුම්පතක් ඉදිරිපත් කළොත් ඉස්සර වෙලා අධීක්ෂණ ස්ථාවර කාරක සභාවට යවලා මාසයකින් දෙකකින් ඒ වාර්තාව ගන්නවා. එහෙම නැතිව ඒක ඉදිරිපත් කරන්න බැහැ. එතකොට මේ සභාව තුළ කෙරෙන සාකච්ඡා හුඟක් දුරට අඩු වෙනවා. කමිටුවේ තිබෙන සාකච්ඡා වැඩි වෙනවා. අන්න ඒ නිසා අපිත් යෝජනා කරලා අධීක්ෂණ ස්ථාවර කාරක සභාව පිළිබඳ යෝජනා 2010 දී භාර දීලා තිබෙනවා. එකක් න්‍යාය පුස්තකයේ යෝජනා අංක 67. අනෙක යෝජනා අංක 66. එතැන අපි අධීක්ෂණ ස්ථාවර කාරක සභා 9ක් යෝජනා කරලා තිබෙනවා. අමාත්‍යාංශ ගණනාවක් තියෙන කොට ඒ ඒ ක්ෂේත්‍රයේ මොකක්ද වෙන්නේ කියලා දන්නේ නැහැ. සමහර අමාත්‍යාංශ අතර ප්‍රශ්න තිබෙනවා. අධීක්ෂණ කාරක සභා 9ක් තිබෙනවා. මුදල් අමාත්‍යාංශයේ කාරක සභාවත් එක්ක 10ක් වෙනවා. මේවා ක්‍රියාත්මක කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒවාට තිබෙන්නේ පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද නීති භාවිතය, පරිපාලනය ක්‍රියාත්මක කිරීම, ඒවායේ ඵලදායිතාව යෝජනා කිරීම. මේ අනුව තමයි හැම නීතියක්ම ක්‍රියාත්මක කරන්නේ. නීතියක් නැතිව ඇමතිවරයෙකුට මේවා ක්‍රියාත්මක කරන්න බැහැ. ඒ නීතිය වෙනස් කරන්න ඕනෑ. ඒක පටන් ගත්තේ ඇමෙරිකාවෙන්. සම්පූර්ණයෙන්ම විධායක ජනාධිපති ක්‍රමය තිබෙන රටක්. අද ප්‍රංශයේත් තිබෙනවා. අපේ රටේ වාගේ විධායක ජනාධිපති ක්‍රමය කොරියාවේ තිබෙනවා. එංගලන්තයේ තිබෙනවා. ඉන්දියාවේ තිබෙනවා. මම හොඳම උදාහරණයක් කියන්නම්. Rupert Murdoch ගේ News International සමාගමට ආණ්ඩුව විශේෂ පහසුකම් දුන්නා කියන චෝදනාව එද්දී ආණ්ඩුව වෙනම කොමිසමක් පත් කළා. එහිදී පාර්ලිමේන්තුව කළේ මොකක්ද?

පාර්ලිමේන්තුවේ තිබෙනවා මාධ්‍ය පිළිබඳ අධීක්ෂණ ස්ථාවර කාරක සභාවක්. ඒකෙන් වැඩ කටයුතු කරන්න පටන් ගත්තා. ජෙරමි හන්ට් කියන ඇමතිතුමා පිළිබඳව තිබුණ චෝදනා ගැන, ආණ්ඩුවේ ඇමතිවරුන්ගේ ක්‍රියාදාමය පරීක්ෂා කරන්න උපදේශකවරයාට දමන්නේ නැහැයි කියලා අගමැති කිව්වාම ඒ කමිටුවේ සභාපති කිව්වා, අගමැතිතුමා ඒක කිව්වේ නැති වුණත් අපි කිව්වොත් ඒක කරන්න ඕනෑ කියලා. ඒක කිව්වේ ඒ කමිටුවේ හිටපු කොන්සර්වේටිව් පක්ෂයේ සභාපති. අන්න එහෙමයි ක්‍රියා කළේ. ඇත්ත වශයෙන්ම අද කොන්සර්වේටිව් පක්ෂයේ මුදල් ඇමති, චාන්සලර්. අය වැය පිළිබඳ කාරක සභාවේ දී මුදල් පිළිබඳ කාරණා කිහිපයක් විවේචනය කළා. කවුද විවේචනය කළේ? කොන්සර්වේටිව් පක්ෂයේ මන්ත්‍රීවරු. ඒ ගොල්ලන් කරුණු සොයා ගෙන ගිහින් සමහර ඒවා කමිටුවේ ගන්න බැරි නිසා තමන්ගේ පාර්ලිමේන්තු කණ්ඩායම් රැස්වීමේ දී ගත්තා. ඒ අනුව යෝජනා කිහිපයක් වෙනස් කරන්න චාන්සලර්ට සිදු වුණා. ඒ නිසා ආණ්ඩුව බේරුණා. ඒ නිසා කියන්නේ මේ කොමිටි ක්‍රමය නිසා පසු පෙළ මන්ත්‍රීවරුන්ට ආණ්ඩුව බේරන්න පුළුවන් වුණා කියලා. නැත්නම් සමහර බදු යෝජනා ඒ විධියට ක්‍රියාත්මක කළා නම් ජනප්‍රියභාවය තවත් අඩු වෙනවා. මම දැක්කා ළඟදී "වින්ඩ්මිල්" සඳහා විශාල මුදලක් වෙන්කර දෙනවා. මෙය විශාල මුදල් නාස්ති කිරීමක් කියලා පසුපෙළ මන්ත්‍රීවරු කෑ ගැහුව නිසා ඒක අඩු කරලා තිබෙනවා. අන්න එහෙම තමයි එක එක රටවල කරන්නේ.

ඒ නිසා අපි කියන්නේ මේ ක්‍රමය මෙහෙත් ඇති කරන්න කියලායි. එහෙම නම් තවත් එකක් වුවමනා වෙනවා. ඒ මොකක්ද? පාර්ලිමේන්තු අය වැය කාර්යාලයක් - Parliamentary Budget Office එකක් - අවශ්‍ය වෙනවා. ඒ ගැනත් අපි හිතන්න ඕනෑ. ඒකට තුන්-හතර දෙනකුට වඩා වුවමනා වන්නේ නැහැ. ඒ ගැන අපි අලුතින් යෝජනා කරන්න ඕනෑ නැහැ.

පසුගිය අවුරුද්දේ ඕස්ට්‍රේලියාවේ පාර්ලිමේන්තුව, එතැන තේරීම් කාරක සභාව "Australian Parliament Budget Office" කියලා වාර්තාවක් ඉදිරිපත් කළා. ඊට පස්සේ දැන් පනත් කෙටුම්පතක් සම්මත කරලා තිබෙනවා, Parliamentary Services Amendment Act, 2011 කියලා. ඒක තිබෙනවා. අපි ලබා දෙන්නම්. ඒ පිළිබඳව සාකච්ඡා කරලා අපට පුළුවන් මේක ක්‍රියාත්මක කරන්න. අනික අපි යෝජනා කරන්නේ, කොංග්‍රස් සභාව වාගේ Congressional පර්යේෂණ සේවයක් -Congressional Research Service එකක්- ඇති කරන්න කියලායි. ඒ පර්යේෂණ සේවයෙන් කරුණු සොයා දෙනවා හැම මන්ත්‍රීවරයෙකුටම. අන්න ඒ පර්යේෂණ සේවය ඇති කරන්න. අද හතර-පස්දෙනෙක් ඉන්නවා. ඒ මදි. මා හිතන්නේ ඒ ගණන අටක් නවයක් විතර කරන්න ඕනෑ කියලායි. ඒක ලෝක් සභාවෙත් තිබෙනවා. හැම රටකම තිබෙනවා. ඇමෙරිකාව මෙහෙම එකක් කරලා තිබෙනවා. කොච්චර "පර්යේෂණ සේවය" කියලා කිව්වත්, මන්ත්‍රීවරු ගිහිල්ලා කියන්නේ මේ කරුණු අරගෙන ඒ ගොල්ලන්ට ඕනෑ විධියට හදලා දෙන්න කියලායි. රිපබ්ලිකන් පක්ෂයට ඕනෑ විධියට, ඩිමොක්‍රටික් පක්ෂයට ඕනෑ විධියට හදලා දෙන්න කියලායි. ඒක කරන්න බැහැ, Congressional පර්යේෂණ සේවයට. ඒක අපක්ෂපාතියි.

ඒත් ඒ එක්කම මන්ත්‍රීවරුන්ට ඒ උපදෙස් වුවමනායි කියලා පිළිගෙන ඊට අමතරව යොදවලා තිබෙනවා, Minority Research Service, Majority Research Service එකක්. ඒ කියන්නේ, පාර්ලිමේන්තුවේ බහුතරය, හෙවත් ආණ්ඩු පක්ෂයේ -අප කියන්නේ ආණ්ඩු පක්ෂයේ කියලායි- අයටත්, පසු පෙළ මන්ත්‍රීවරුන්ටත් පර්යේෂණ සේවයක් තිබෙනවා. විරුද්ධ පක්ෂයේ පසු පෙළ මන්ත්‍රීවරුන්ටත් ඒ යටතේ ඒ සේවය ලැබෙනවා. එතකොට Congressional Research Service එක, එනම් කොංග්‍රස් එකේ පර්යේෂණ සේවය යටතේ මේ කණ්ඩායම් දෙකම ක්‍රියාත්මක වෙනවා. අන්තිමට වග කියන්නේ පාර්ලිමේන්තුවේ පර්යේෂණ නිලධාරින්. එහෙම නම් පාර්ලිමේන්තුවේ අය වැය නිලධාරින් - Parliamentary Budget Officersලා - ඉන්නවා. ඒ අය ස්වාධීනවයි එවන්නේ. ඒ වාගේ අංශයක් ඇති කරන්න. ඒ පිළිබඳ යෝජනා කීපයක් අපි ගරු කථානායකතුමා එක්ක සාකච්ඡා කළා.

මේ කාර්යය සඳහා විශේෂයෙන්ම ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය ප්‍රයෝජනයට ගන්න පුළුවන්. විශාල ලෙස ගොඩනැඟිලි තිබෙනවා. දැන් අපේ මහ ලේකම්තුමා ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය පාර්ලිමේන්තු හා පළාත් සභා පර්යේෂණ මධ්‍යස්ථානයක් බවට පත් කරන්න යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. ඒක හොඳයි. අපේ අධ්‍යාපනය දියුණු වෙනවා. අන්න ඒ නිසා තමයි අපි කියන්නේ මෙන්න මේ යෝජනාව අපි සම්පූර්ණයෙන් අරගෙන සාකච්ඡා කරමු කියලා. සාකච්ඡා කරලා මාසයක් තුළදී අපි බලමු මේවායෙන් කොටස් හැටියට, අදියර හැටියට ක්‍රියාත්මක කරන්න පුළුවන් මොනවාද කියලා. මේවා ඔක්කොම එක සැරේ කරන්න බැහැ. ඒක අපට වැදගත් කියලායි මා කියන්නේ. ආපසු තේරීම් කාරක සභා වුවමනා නැහැ.

මා අද උදේ ඉදිරිපත් කළ ප්‍රශ්නයට සරත් අමුණුගම ඇමතිතුමා පිළිතුරු දුන්නා. පාර්ලිමේන්තුවේ අධීක්ෂණ කොමිටියක් තිබෙනවා නම් මේක මේ තරම් දුර යන්නේ නැහැ. මොකක්ද මෙතැන තිබෙන්නේ? Standard and Poor's වාර්තාවේ සඳහන් කරලා තිබෙනවා අපේ බැංකු ඉහළ අවදානම්කාරි තත්ත්වයක කියලා. මහ බැංකුව 'නැහැ' කියනවා. IMF යෝජනා ඉදිරිපත් කරලා තිබෙනවා. ඉතින් අන්න එහෙම අවස්ථාවක තමයි පාර්ලිමේන්තු අධීක්ෂණයක් වුවමනා වන්නේ. ඒ Standard and Poor's වාර්තාවේ තව කොටසක් තිබුණා. ඒ ගැන කවුරුත් කියලා නැහැ. එහි කියන්නේ, "මහ බැංකුවෙහි කාර්ය භාරය විෂයෙහි අභිලාෂයන් අතර ගැටුමක් නිරීක්ෂණය කිරීම - බැංකු

පිළිබඳ ප්‍රතිපත්ති සකස් කිරීම හා අධීක්ෂණය කිරීමට අමතරව මහ බැංකුවේ මුදල් මණ්ඩලය සේවක අර්ථසාධක අරමුදල ආයෝජනය අධීක්ෂණය කරයි. මේ අරමුදල ශ්‍රී ලංකා බැංකු කොටස් ප්‍රාග්ධනය විශාල වශයෙන් ආයෝජනය කර ඇත." කියලායි. ඒ ගොල්ලෝ කියන්නේ, මහ බැංකුවෙන්ම මුදල් දානවා නම් පුද්ගලික බැංකුවලට, බැංකු අධීක්ෂණය කරන්නේ කොහොමද කියායි. ඒක වැදගත් කාරණයක්. අප ඒක පාර්ලිමේන්තුවේදි අහලා විසඳන්න තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද තව එකක් කිව්වා. අද කිව්වා ආයෝජන ප්‍රතිපත්ති දෙන්න බැහැ කියලා. මම ඒකට නම් එකඟ වෙන්නේ නැහැ. පාර්ලිමේන්තුවට ආයෝජන ප්‍රතිපත්ති ඉදිරිපත් කරන්න ඕනෑ. මෙතැන මහා විස්තරයක් කරලා මේක වහගෙන යන්න හදනවා මහ බැංකුව. අද ලංකාවේ තිබෙනවා සමාගම් ගණනාවක්. මෙතුමන්ලා ඒ ගැන දන්නවා. අපේ මුදල් අරගෙන -අපි මුදල් දුන්නොත්- ඒවා කොටස් වෙළෙඳ පොළේ ආයෝජනය කරනවා. ඒ ගොල්ලෝ මුණ ගැහුණොත් ඒ ගොල්ලන්ගේ ආයෝජන ප්‍රතිපත්තිය අපට කියනවා. අපට කියනවා, අධික ලාභයක් ලබා ගන්න පුළුවන් කෙටි කාලයකට, ඒත් ඒ වාගේම අධික අලාභයක් ලබා ගන්නත් ලෑස්ති වෙන්න කියලා. ඒක අවදානම්කාරි එකක් -risk investment- බව කියනවා. ඕනෑ නම් එතැනට එන්න කියා කියනවා. තමන්ගේ ආයෝජනය ස්ථාවරභාවයේ තියා ගන්න ඕනෑ, මුදල්වල වටිනාකම තියා ගන්න ඕනෑ, අධික ලාභයක් ලබා දෙන්න ඕනෑ, ඒත් අපි ඒවා කරලා දෙනවා කියා අපට කියනවා. මේවා ඒ ගොල්ලන්ගේ ප්‍රතිපත්ති බව කියනවා. අපට තීරණය කරන්න කියනවා. ඒවායේ රහසක් නැහැ. ඒත් මොකක්ද රහස වෙලා තිබෙන්නේ? ඒ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ උපක්‍රමය රහසක්. ඒක අපි අහන්නේ නැහැ. ඒත් පාර්ලිමේන්තුවේදී "මොකක්ද ප්‍රතිපත්ති ටික?" කියලා මන්ත්‍රීවරයෙක් ඇහුවාම, ඒක කියන්න බැහැ කියා කියනවා. ඕක ලොකු දෙයක් නොවෙයි. අන්තිමට මහ බැංකුව කෙළින් ගිහින් ඕක කරන්නේ නැහැ. මොකද අද විශාල චෝදනා තිබෙනවා. ඒකයි අප කියන්නේ. පාර්ලිමේන්තුවේ තේරීම් කාරක සභාව තිබුණා අපේ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ඔය ප්‍රශ්න ඇති වෙන්නේ නැහැ.

දැන් කියනවා අර්ථ සාධක අරමුදලින් රුපියල් මිලියන 5,000ක් කොටස් වෙළෙඳ පොළට යොදවා තිබෙනවා කියලා. මේකෙන් සියයට 1ක් කියන්නේ, රුපියල් මිලියන 10000ක්. සියයට 4ක් කියන්නේ, රුපියල් මිලියන 40,000ක්. ඉතින් මේ දෙකම එකතුව රුපියල් මිලියන 45,000ක් කොටස් වෙළෙඳ පොළට යොදවනවා කියන්නේ ඊට වඩා විශාල ආයෝජකයකු නැහැ. මෙතැනින් ලාභයක් හෝ අලාභයක් ඇති වෙන්න පුළුවන්. සියයට 1ක් යොදවනවාද, සියයට 5ක් යොදවනවාද, ඒකෙදී අලාභයක් වෙනවාද කියන එක අපි තීරණය කරන්න ඕනෑ මෙතැනදීයි. අන්න ඒකයි අපි මෙතැනදී කරන්න ඕනෑ. මේක අපට වෙලාව යන එකක් නොවෙයි. අපි දන්නවා මෙතැන මුදල් ගනු දෙනු කරපු සමාගම් මොනවාද කියලා. ඒ තමයි Taprobane Securities (Pvt.) Limited, Ceylinco Securities and Financial Services Limited කියන සමාගම්. ඩිනාල් විජේමාන්නට එන්නය කියලා ශ්‍රියාන් ගුරුසිංහට එන්නය කියලා එය භාරව හිටපු සමාධි ජයසිංහට එන්නය කියලා අපට අහන්න පුළුවන් මොකද වෙන්නේ කියලා. ඒ ගොල්ලන්ට නොකියා ඉන්න බැහැ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ඒ කරුණු කියන්න ඕනෑ. එතැන වෙන සෙල්ලම ගැන අපි දන්නවා. ඒවා වහ ගන්න වැඩක් නැහැ. ඒවා පාර්ලිමේන්තුවට වහන්න බැහැ. මම ඒවා මෙතැන කියන්න යන්නේ නැහැ. සමාධි ජයසිංහ තමයි මේක ඇති කළේ. ඒ නෝනා මහත්මයාගෙන් අහන්න ඕනෑ, මොකක්ද කළේ කියලා. එතුමියට පිළිතුරු නොදී ඉන්න බැහැ. ඒ වාගේම ශ්‍රියාන් ගුරුසිංහට පිළිතුරු නොදී ඉන්න බැහැ. මේවා අපට නිදහසේ සාකච්ඡා කරන්න ඕනෑ. සමහර කොටස් වෙළෙඳ පොළේ අය හිතනවා නම් මේකෙන් බලපෑම් කරන්න පුළුවන්; අපව භය කරන්න පුළුවන් කියලා, ඒක නම් සිදු වෙන්නේ නැහැ. අපේ පැත්තේ අය භය කරන්නත් බැහැ. මෙතැන සිටින පසු පෙළ මන්ත්‍රීවරුන් ගණනාවකුත් භය කරන්න පුළුවන් කියලා මා හිතන්නේ නැහැ. මේකෙදි ජාතිවාදය ඒ එකක්වත් අදින්න උවමනා නැහැ.

අපි කියන්නේ මෙතැනට පාර්ලිමේන්තු අධීක්ෂණ කමිටුවක් ඕනෑය කියන එකයි. සැප්තැම්බර් මාසයේ අපේ පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු කණ්ඩායමේ රැස්වීම තිබෙනවා. අපෙන් ඇහුවාම අපට කියන්න තිබෙන්නේ මේවා නැහැ කියලායි. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත් ඉන්න අවස්ථාවේ සභානායකතුමාට යෝජනා කරනවා මේ සියල්ලම අරගෙන පක්ෂ නායකවරු මුණ ගැහිලා මේවා යෝජනා කරපු අයත් එක්ක සාකච්ඡා කරලා අපි අලුත් ක්‍රමයක් දමලා මෙය ක්‍රියාත්මක කරමු කියලා. දැන් පාර්ලිමේන්තු අය වැය කමිටුවයි, අධීක්ෂණ කමිටුවයි කොහොමද ක්‍රියාත්මක කරන්නේ කියලා බලමු. ඒ වාගේම කාර්යාල ඇති කරන එක ගැන දැනට මහ ලේකම්තුමා යෝජනා කරපු පර්යේෂණ මධ්‍යස්ථානයක් ඇති කිරීමේ වාර්තාව තිබෙනවා. ඒවා අපි ක්‍රියාත්මක කරන්න ආරම්භ කරමු. ආණ්ඩුව කැමැති නම් අපි ඊළඟ පාර්ලිමේන්තු සතියේදී අපි රැස්වෙලා මේවා ගැන සාකච්ඡා කරමුය කියා යෝජනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ. භා. 3.06]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**

(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகால மைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)

(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින ඉතාම වැදගත් කාරණාවක් සාකච්ඡාවට භාජනය වන අවස්ථාවේදී එය ඉදිරිපත් කිරීම ගැන මම ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. රජයත්, විපක්ෂයත් විපක්ෂ නායකතුමාත් සඳහන් කළ ආකාරයට අපට මෙවැනි කමිටුවක අවශ්‍යතාව මතු වෙන්නේ ඇයිද කියන එක පිළිබඳ අදහස් කිහිප වතාවක් පක්ෂ නායක කමිටුවේදී සාකච්ඡා කළා. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148වැනි වගන්තිය යටතේ අපේ මූල්‍ය පාලනය පාර්ලිමේන්තුවට හිමි වන බව සඳහන් වනවා. එය පසු ගිය අවුරුදු ගණනාවක් තිස්සේ ක්‍රමානුකූලව පාර්ලිමේන්තුවෙන් විවිධ ආකාරයෙන් ඉවත් වී ගියද, ඒ මූලධර්මය එසේම පවතින බවට අපි කවුරුත් -දෙපාර්ශ්වයෙන්ම- කරුණු කියනවා.

අපට ව්‍යවස්ථාදායක බලය තිබෙනවා. මේ කාරණා නිසායි අපි රැස් වෙන්නේ. විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා මගෙත් එක්ක එකඟ වේවි. පාර්ලිමේන්තු ඉතිහාසයේ පාර්ලිමේන්තු උල්පතත් එයයි. රජතුමා හා මහජන නියෝජිතයන් අතර ඇති වෙච්ච ගැටුම මහජනයාට බදු පනවනවා නම්, මහජනයාගේ නියෝජිතයන්ට එය පැනවීමේ බලය තිබෙනවා නම්, එයට උත්තර දෙන්න ඕනෑය කියන එකයි. ඉතින් අපි විවිධ බදු පනවනවා; ආදායම් හදනවා. ඒ සියල්ල කැටි කරගෙන තමයි වර්ෂයකට වතාවක් අය වැය ලේඛනයක් හැටියට තමන්ට යන වියදම්, තමන්ට ලැබෙන ආදායම්, තමන්ට හිමි වන ණය, තමන්ට හිමි වන හිඟ ඉදිරිපත් කරමින් තමන්ගේ සංවර්ධන වැඩ කටයුතු රටවැසියා වෙනුවෙන් ඉටු කිරීමට ඉදිරිපත් වෙන්නේ. එවැනි වැදගත් ක්‍රියාදාමයක් අය වැය ලේඛනයෙන් සිදු වන කොට අය වැය ඇස්තමේන්තු සාකච්ඡා කිරීමේ කාලය ක්‍රමානුකූලව අඩු වෙලා තිබෙනවා. විපක්ෂ නායකතුමා මට වඩා දීර්ඝ කාලයක් මේ පාර්ලිමේන්තුවේ ඉඳලා තිබෙනවා.

ජෝන් අමරතුංග මැතිතුමාත් ඉඳලා තිබෙනවා. මමත් ඉඳලා තිබෙනවා. ඒ නිසා අපි දන්නවා, අද කාරක සභාවක ඇස්තමේන්තුවක් සාකච්ඡා වෙන්නේ නැහැ කියලා. මන්ත්‍රීවරු

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

නියෝජනය කරන ප්‍රදේශවල ප්‍රශ්න තමයි සාකච්ඡා වෙන්නේ. මේ නිසා ඇස්තමේන්තු සම්පූර්ණයෙන් සාකච්ඡාවට භාජනය නොවී අනුමත වීමක් කරා ගමන් කරන සම්ප්‍රදායකට යෑම නිසා පසු පෙළේ මන්ත්‍රීවරු ඉදිරි පෙළේ අමාත්‍යවරු සියලු දෙනාට ඇස්තමේන්තු පිළිබඳ සාකච්ඡා කොට එය ඇති වුණේ කෙසේද, එය ඉටු කර ඇත්තේ කුමක්ද, එහි ප්‍රතිඵලය කුමක්ද, මීළඟ වසරේ ඒ ආකාරයෙන්ම සිදු විය යුතුද, නැත්නම් ඒ අනුපාතයන් වෙනස් විය යුතුද කියන කාරණා ඉතාම වැදගත් වනවා. මෙය අනෙක් පාර්ලිමේන්තුවල තිබෙන බව අපි කවුරුත් දන්නවා. ඇමෙරිකා එක්සත් ජනපදයේ මීට වඩා වෙනස්. ලෝක් සභාවේ විශේෂ කාරක සභා තිබෙනවා. ඒ කාරක සභාවලට ප්‍රධාන පනත් යනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අය වැයක් සකස් වන විට Finance and Planning Ministry එකෙන් නිකුත් කරන ලද "A Guide - The National Budget Making Process" නැමැති පොත කියවා බලා එය අනුගමනය කරන ලෙස ඉල්ලා සිටිනවා.

According to that, the issuance of the Budget Call with guidelines and directions for budget preparation is the first step. Then, comes the submission of Cabinet Memorandum on Formulation of Budget, the submission of budget requests to the Department of National Budget by spending agencies - ඒ කියන්නේ, by ministries and departments - reviewing of budget requests with spending agencies, finalization of budget requests submitted by spending agencies, the submission of Cabinet Memorandum on the next year's Appropriation Bill to the Cabinet and then, the presentation of the Appropriation Bill to Parliament - the First Reading. So, before the presentation of the Appropriation Bill, we go through a long process. Then follows the Budget Speech - the Second Reading of the Budget - the Second Reading Debate, the Committee Stage Debate, expenditure authorization - issue of warrants by the Hon. Minister of Finance and Planning - and the preparation of Cash-Flow Statement for the year concered by the Treasury based on the cash forecast and approved Budget Estimate.

මේ ආකාරයෙන් යන ගමනේදී, Budget Monitoring ගැන විපක්ෂ නායකතුමාගේ අවධානය යොමු වුණා. අපිත් ඒ ගැන අපේ අවධානය යොමු කරනවා. Budget Estimate approval විතරයි අද තිබෙන්නේ. ඒ ගැන තිලංග සුමතිපාල මන්ත්‍රීතුමාත් සඳහන් කළා. Budget Monitoring යටතේ මෙසේ සඳහන් වෙනවා:

1. Monthly expenditure summaries are prepared and sent to the State Accounts Department (SAD) of the Treasury by each Ministry.
2. Direct Transactions by funding agencies and projects are also reported monthly to the State Accounts Department.
3. End of every month, SAD publishes expenditure details under each and every Expenditure Head in the Website.

මේ ගැන අපේ අවධානයක් යොමු වෙනවාද නැද්ද කියන කාරණය තමයි දැනුත් සඳහන් කළේ. ප්‍රශ්නයක් ඇති වුණාම පමණක් අපි ඒක අවධානයට ගැනීමට වඩා

මේ සියලු දේ Budget Committee එකක සාකච්ඡා කිරීම හොඳ දෙයක්. ඒ කාරක සභාවට කිසිම දෙයක තොරතුරු නොදෙන්න හේතුවක් නැහැ. එසේ කරුණු සාකච්ඡාවට ලක් කිරීමෙන් මන්ත්‍රීවරුන්ට දැන ගන්න හැකියාව ඇති වෙනවා, විවිධ දෙපාර්තමේන්තුවල, අමාත්‍යාංශවල වැය ශීර්ෂ හා ඇස්තමේන්තු මාස තුනකට වතාවක්, හයකට වතාවක් ආදී වශයෙන් කොයි ආකාරයෙන්ද සකස් වන්නේ, කොහොමද ඒ කටයුතු කරන්නේ කියා. කලින් නම්, the Planning Ministry had the Department of Foreign Aid and Budget Monitoring. Now, that has been done away. That was an important Department which engaged in Budget monitoring. ඒ නිසා අද අපි සාකච්ඡා කරන කාරණාව තව අඩියක් ඉදිරියට ගෙන යන්න නම්, අපි කලින් ගත්ත තීරණය අනුව පසු ගිය අය වැය ලේඛනයේදී අමාත්‍යාංශ කීපයක ඇස්තමේන්තු සාකච්ඡා කළා වාගේ ඉදිරියටත් ඒ විධියට කටයුතු කළ යුතුයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙහි තිබෙන වැදගත්කම මේකයි. ඒ අදාළ නිලධාරීන් අපේ ඉදිරියට එනවා. ඒ නිලධාරීන්ගෙන් සෑම වැය ශීර්ෂයක් පිළිබඳවම අපට අහන්න පුළුවන්, මොකද මෙහෙම මුදලක් වෙන් කළේ, ඇයිද, මේකට අඩුවෙන් වෙන් කළේ, පසු ගිය අවුරුද්දේ ප්‍රතිඵලය මොකක්ද, මේ අවුරුද්දේ ප්‍රතිඵලය මොකක්ද කියලා. ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ මන්ත්‍රීවරුන් සහභාගි වන මෙවැනි කාරක සභාවකදී අය වැය ඇස්තමේන්තුවක ප්‍රගතිය හා ඵලදායකත්වය පිළිබඳව සාකච්ඡා කරන්න පුළුවන්කම ලැබෙනවා.

මා එකඟ වෙනවා විපක්ෂ නායකතුමා සඳහන් කරපු කාරණයට. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ඒ කාරක සභා ඉතාම සාර්ථක, ඵලදායකත්වයෙන් වැඩි කාරක සභා බවට ඔප්පු වෙලා තිබෙනවා. අවුරුදු 75ක් පමණ පරණ වුණත් ලංකාවේ කම්කරු නීතිය අරගෙන බලන්න. මේ සියල්ල හැදුණේ ඒ රාජ්‍ය මන්ත්‍රණ සභාවෙන්; ඒ කමිටුවෙන්. ඒ වාගේම අපේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නීති, නිදහස් අධ්‍යාපනයේ නීති පිළිබඳව විරුද්ධ වන අය විරුද්ධ වුණාට, අනික් කවුරුත් හවුල් වෙලා, අඩු පාඩුකම් සම්බන්ධයෙන් ඵලදායි තත්ත්වයෙන් සාකච්ඡා කරලා, ජාතික වශයෙන් රටට ප්‍රයෝජනවත් යම් කිසි ඵලදායි දෙයක් නිර්මාණය කරලා තිබෙනවා. අය වැය ඇස්තමේන්තු මෙලෙස විමර්ශනය කිරීමත්, අය වැයේ ප්‍රගතිය සමාලෝචනයට භාජන කිරීමත්, අය වැය කාරක සභාවල ඇති වන ගැටලු යළිත් සැලකිල්ලට ගැනීමත් මෙවැනි අය වැය කාරක සභාවකින් සිදු වනවා. ඒ හරහා පාර්ලිමේන්තුව මඟින් ජනතාවට විශාල සේවාවක් ඉටු වනවා. මා විශේෂයෙන් කියන්න කැමැතියි, - [බාධා කිරීමක්] උත්තර දෙන්න පුළුවන් නම් මා උත්තර දෙන්නම්.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ඊළඟට ඉදිරිපත් වන අය වැයේදී සියලුම අමාත්‍යාංශවලට අදාළ වැය ශීර්ෂ පිළිබඳව අය වැය කාරක සභාවේදී සාකච්ඡා කරන්න තමුන්නාන්සේලා සූදානම්ද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

විපක්ෂ නායකතුමා කිව්වේ, එන සුමානේ දිහාවට අපි එකතු වෙලා ඒ පිළිබඳව සාකච්ඡාවක යෙදෙමු කියලායි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

මා හිතන්නේ, ඊළඟ පාර්ලිමේන්තු සතියේ වෙලාවක් යොදා ගෙන අපට රැස් වෙලා කථා කරන්න පුළුවන්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මේ සම්බන්ධයෙන් ගරු කථානායකතුමා උනන්දුවක් දැක්වූවා. එතුමා අප දෙපාර්ශ්වයටම කිව්වා, මේ කාරණය සාකච්ඡාවට භාජන කරන්න කියලා. ඉතින් කථානායකතුමාගේත් මැදිහත් වීමෙන් මේ කාරණාව ගැන අපට සාකච්ඡා කරන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අවස්ථාවේදී මා කැමැතියි, 1788 දී ජේම්ස් මැඩිසන් ජනාධිපතිතුමා කරපු ප්‍රකාශයක් ඉදිරිපත් කරන්න. මොකද, මේ ප්‍රකාශය බොහොම වැදගත්. එතුමා මෙසේ ප්‍රකාශ කරනවා:

> "If angels were to govern men, neither external nor internal controls on government would be necessary. In framing a government which is to be administered by men over men, the great difficulty is this: You must first enable the government to control the governed; and in the next place, oblige it to control itself."

මෙය බොහොම ගැටලු සහගත අභියෝගයක්. ඒ ප්‍රකාශය මා සිංහලෙන් කියවන්නම්:

"සුර දූතයන් මිනිසුන් පාලනය කරනු ලබන්නේ නම්, රාජ්‍ය පාලනය පිළිබඳ බාහිර හෝ අභ්‍යන්තර හෝ පාලනයක් අවශ්‍ය නොවනු ඇත. මිනිසුන් විසින් මිනිසුන් පාලනය කරනු ලබන රජයක් නිර්මාණය කිරීමේදී ඇති වන ප්‍රධාන දුෂ්කරතාව වනු ඇත්තේ මෙයයි. පළමුව ඔබ, පාලනයට යටත් වන පුද්ගලයන් පාලනය කිරීමට රජයට හැකියාව ලබා දිය යුතුය. ඉන් පසුව එයට, එයම පාලනය කිරීමට බල කළ යුතුය."

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

අන්තිම වාක්‍යය තමයි අමාරු.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඔබතුමන්ලාට නම් අන්තිම වාක්‍යයත් අමාරු නැහැ. ඒක තමයි ඔබතුමන්ලා අපට එකතු කරලා තිබෙන අත් දැකීම.

මේ කාරණය සාකච්ඡාවට භාජන වුණු අවස්ථාවල අපි ආණ්ඩු ක්‍රමවල විවිධ විකාශන පිළිබඳව සාකච්ඡා කරලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් වෙනසක් ඇති කරන්න පුළුවන් වනවා නම් යම් ස්ථාවර නියෝග පවා වෙනසකට භාජන කරන්න සිද්ධ වනවා.

විශේෂයෙන් ඇස්තමේන්තු පිළිබඳව අපි ගන්නා ක්‍රියාමාර්ග ගැන කියන කොට, ගරු විරුද්ධ පක්ෂ නායකතුමාට රසවත් කථාවක් කියන්න මා කැමැතියි. එය කියලා මගේ කථාව නවත්වන්නම්.

රසවත්භාවයක් තිබෙනවා නම්, රසවත් ඇස්තමේන්තු ගෙනෙනවාට දේශපාලනඥයෝ එකඟයි. එහෙම කථාවක් කියලා තිබෙනවා. එතකොට රජයේ නිලධාරින් බොහොම සතුටින් ඇස්තමේන්තු හදලා ගෙනෙනවා. ඇස්තමේන්තු හොඳට හදන තරමට දේශපාලනඥයන් සතුටු වනවා නම්, රාජ්‍ය නිලධාරින් හොඳට ඇස්තමේන්තු හදනවා.

Bureaucrats will like to please the politicians with their estimates, but the politicians have to have double thoughts and study the estimates.

මම හිතන විධියට ඒක තමයි අපි බලන්න ඕනෑ වැදගත්ම පැත්ත. මොකද, අපට වරදින්න ඇස්තමේන්තු හදන්නේත් නිලධාරින්; අපට හරියන්න ඇස්තමේන්තු හදන්නේත් නිලධාරින්. ඒ නිසා අය වැය කාරක සභාවක් හදලා මේ කරුණු විමර්ශනයට භාජන කළ යුතුය කියන දේ ඉතාම වැදගත් දෙයක්.

සියලු දේ සදාතනික නැහැ. ගරු විපක්ෂ නායකතුමා සඳහන් කළ විධියට ධනවාදය එක තැන නැවතෙන්නේ නැහැ. ලෝකයේ ධනවාදය අර්බුදයෙන් අර්බුදයට පත් වෙලා, ඒ අර්බුදයෙන් යළිත් හිස ඔසවලා, අනෙක් බලවේග යට කර ගෙන කොහොම හරි ඉස්සරහට ගමන් කරනවා. ධනවාදයේ ඉහළ හා පහළ තැන් දෙකම තිබෙනවා. Stock Exchange එකත් අන්න ඒ වාගේ තැනක්. ඒක ගරු විපක්ෂ නායකතුමාත් පිළිගන්නවා. කොටස් වෙළෙඳ පොළේ රසවත් කාලයකුත් තිබෙනවා; අමිහිරි කාලයකුත් තිබෙනවා. ඒ තත්ත්වය ඇමෙරිකාවේත් තිබෙනවා, පැරීසියේත් තිබෙනවා, එංගලන්තයේත් තිබෙනවා.

දැන් යුරෝපයේ සාකච්ඡා වෙන්නේ, ඒ පාර්ලිමේන්තු අහන්නේ, "අපේ ආර්ථිකය බංකොලොත් වී ගෙන යනවා. මොකද කරන්නේ?" කියන කාරණයයි. අය වැයෙන් වියදම් කපනවාද කියලායි අහන්නේ. ඉතින් පාර්ලිමේන්තු රැස් වෙලා පාර්ලිමේන්තුවලින් ඒ තීරණ ගන්න වෙලා තිබෙනවා. ලංකාව නිසා අද ග්‍රීසිය බංකොලොත් වෙලා නැහැ. ලංකාව නිසා ස්පාඤ්ඤය බංකොලොත් වෙලා නැහැ. ඒ අය විසින් කර ගන්නා වැඩ පිළිවෙළවල් යටතේ සහ දියුණුවේ මාවතේ අන්ධාකාරයෙන් ගමන් කිරීමේ ක්‍රියාදාමවලට අවතීර්ණ වීම යටතේ ඒ රටවල් ඒ තත්ත්වයට මුහුණ දෙනවා. ධනවාදී ආර්ථික ක්‍රමයේ ස්වභාවය ඒකයි. ගරු විපක්ෂ නායකතුමා ඒ ගැන ඉතාම හොඳට කිව්වා. යමක් ලැබෙනවා නම් තමයි ආයෝජනය කරන්නේ කියලා එතුමා කිව්වා. ඉතින් යමක් ලැබෙනවා කියලා හිතා ගෙන ඒ රටවල් ආයෝජනය කරලා, හිර වෙලා, දැන් අර්බුදයකට වැටිලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නව යුගයේ ඒ පිළිබඳව සාකච්ඡා කරන්න අය වැය පිළිබඳ විශේෂ කාරක සභාවක් අවශ්‍යයි කියන කාරණාව ගැන යෝජනාවක් ඉදිරිපත් කිරීම ගැන ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමාට මා ස්තුතිවන්ත වෙනවා. සාකච්ඡා කරලා -ආණ්ඩුවයි, විපක්ෂයයි- ගරු කථානායකතුමාගේ ආශිර්වාදය ඇතිව අපට මෙවැනි දෙයක් නිර්මාණය කර ගන්න පුළුවන් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

The next speaker is the Hon. M.A. Sumanthiran. Before that, will an Hon. Member propose the Hon. Alhaj A.H.M. Azwer to take the Chair?

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා (විද්‍යාත්මක කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண - விஞ்ஞான அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Prof.) Tissa Vitarana - Minister of Scientific Affairs)

I propose that the Hon. Alhaj A.H.M. Azwer do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

[ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා]

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! I call upon the Hon. M.A. Sumanthiran to start his speech.

[3.23 p.m.]

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Thank you, Mr. Presiding Member. Before I stood up to speak I was looking for a personality very close to the back of the Government Benches and was relieved not to see that person but now I see him only too well in a prominent place in the House.,

I am happy today to participate in this Debate in support of the Adjournment Motion moved by the Hon. Thilanga Sumathipala. I am very much in support of the suggestion that has been made that there must be a Budget Committee established so that detailed Estimates that are presented to us, year in and year out, can actually be examined in the context of a committee meeting rather than the Parliament meeting as a whole committee at the Committee Stage. With just two years experience that I have had, I am firmly convinced that the Committee Stage Debates do not deliver anything.

The obligation to exercise full control over public finance is an important function of Parliament. Perhaps, next to its legislation making function, all Parliaments around the world have been vested or most Parliaments around the world have been vested with this very important function. Even under a system of Executive Presidency, our Constitution has continued to vest in Parliament, the total control over public finance and even the finances that are allocated to the Office of the President. So, this is one area in which even though many of its powers have been taken away by the Executive Presidency, Parliament still retains - or at least, the theory is that the Parliament retains control. I say "theory" because, more and more, we have seen that control reducing and Parliament becoming irrelevant in terms of its actual control over public finance. One of the reasons for that is that the Budget Proposals are presented in the House and the main debate or the Second Reading Debate takes place. Then, when we move into the Committee Stage, there is hardly a difference between the Second Reading Debate and the Committee Stage Discussion. There is a difference but there is very little that you can actually figure out. As I said before, the detailed estimates are seldom gone into. Only if someone raises an issue, then to counter that, those figures are looked at. It is a token cut that is proposed and all information that the 225 Members here are supposed to study and debate, are never gone into. As we work in Committees in Parliament, we have also had the experience: the atmosphere is very different; there is less acrimony; there is less consciousness of party divides and the subject matter is taken up for discussion far more.

Hon. Presiding Member, you have been in the centre of the storm with regard to insisting that Members speak only on the subject matter even if you breach that all the time when you speak, but that is an important issue. We have had situations where the subject matter is something but if anybody sat in the Gallery and listened, he would not really know what the subject matter on paper was because anything and everything is generally spoken to the Galleries. That is not a healthy trend, I do agree with you. It is not a healthy trend because one has to contain himself or herself to the subject matter at hand and do justice to the matter at hand.

The Budget Debates that go on for 26 days, as the Mover has stated, is one that people of the country follow with great interest. They are interested because increase/decrease in prices, changes in cost of living, all those are matters that drastically affect their lifestyle. And, little do we realize that there is a very detailed examination by most of our people on the contributions that are made in Parliament with regard to Budget Proposals. Their expectations are generally not met fully because of this present system that we have, which is not efficient to say the least.

We have a lot of issues that the Parliament must deal with and it is dealt with most efficiently in Committees than in the House. I can give various examples. There are minute and very detailed matters which are generally discussed at the Consultative Committees, COPE or PAC but with regard to the Budget, there is hardly any opportunity to go into detailed matters. That is not only with regard to Budget, but also with regard to other matters.

The Hon. Presiding Member will appreciate that presently we have a situation of various developmental programmes that are undertaken, particularly in the North and the East. Various assistances are being given and are being handed out to people. Our constant complaint in this Parliament has been that the people's representatives are not consulted with regard to this process as to who the beneficiaries are of housing projects, as to who should be the recipients of the distribution of bicycles. There was one instance when I raised the issue about tractors. Today, we have an issue in the Mannar District where the Indian Government is offering boats to fishermen. The recipients had been identified and were to receive those

but at the last minute, that list was withdrawn and a particular Minister concerned is now about to give those boats to his supporters.

Now, these are all detailed matters with regard to which there must be a system where in Committees, the matter must be discussed. It is only in Committees that such details as to who a better recipient is, can be determined. It is also an opportunity for people's representatives to participate. Even if the meetings are held in Colombo, people's representatives should participate in those detailed discussions, rather than leave it entirely at the whims and fancies of persons who have power in those areas and who disregard the elected members' wishes and their participation, their views in conducting or getting on with developmental work.

So, I would like to endorse the Motion and would like to thank the Hon. Member who has proposed it. I think this is one Motion on which there will be consensus on both sides of the House today. So, there is nothing that should prevent us, nothing that should prevent the Hon. Speaker, to take this on board and perhaps form a committee to discuss further how this Budgetary Estimation Committees or other committees can be formed and, if necessary, amend the Standing Orders also in that regard. That is, if it is necessary at all.

If we move in that direction, by November this year itself when the Budget Proposals are to be placed, we will have a new system in place and as has been said by many people already, this is a trend that we see worldwide. We can draw many lessons from other countries as to how these things happen, that the wisdom there can be used with attendant results - even bad experiences.

There have been many Parliamentary Delegations that have visited many countries, even from this Parliament, in the last two years. All those observations the Hon. Members have gathered from their visits to other places: how these committee systems work in other places, how it does not work, all that can be pooled together and we can have an efficient system to debate the Budget Proposals.

Thank you very much.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

The next speaker is the Hon. (Prof.) Tissa Vitarana. You have 15 minutes.

[3.36 p.m.]

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)

Hon. Presiding Member, I am very happy to support the Adjournment Motion which has been brought in by the Hon. Thilanga Sumathipala, to set up a separate Committee for Budgetary Proposals because I think it is a vital need to discharge the responsibilities of this House to the people of our country. We all know that besides legislative functions, we have the task of approving the Budget and based on that approval, to make sure that what is being proposed by the various ministries is fully implemented.

In this connection, I am happy to say that we, along with the Speaker, went to China and the Hon. John Amaratunga also was a part of our team. One of the things that we learnt there was that they have an Economic Affairs Committee at the highest level in their Parliament. They have this set up and it meets regularly round the year.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

There is a difference. There is no Opposition in that set up.

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)

Whether there is an Opposition or not, they are going ahead because they have a system that works. So, let us learn from that experience. But, even countries which have an Opposition have resorted to this type of thing. So, I think that this Committee that is going to be set up should not be something that only meets occasionally, it should meet right through the year, where it gets an input from the various planning authorities. But, here I must say that this is a very weak area in our system. There is no - shall we say - adequately-staffed Planning Commission like there is in India, which is operating right round the year. I visited the Planning Commission in India, the Scientific Affairs Committee. They had seven PhD holders who were heading various divisions and this was a fully-fledged office with adequate staff and which was getting in data right through the year and then coming out with information which could be used not only for planning purposes but also for monitoring what was going on. So, I think we need to have a Committee which will function in that way. If we can do it to that extent, then we can effectively ensure that the public funds are properly utilized in the way that is approved by Cabinet and by Parliament.

We have had a brief experience of a Select Committee which was put into operation before the last Budget. This was headed by the Hon. Nimal Siripala de Silva and the Opposition also participated in it. During that process - I am giving my own experience - it performed an extremely useful function.

We, as Senior Ministers, have been given a certain mandate, which I will read out. Firstly, coordination of activities in Ministries related to subject areas such as science, research, technology, education, information

[ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා]

technology, industry, skills development and engineering services with the objective of scientific development in Sri Lanka. Secondly, cooordination and review of programmes implemented by relevant institutions aiming to utilize scientific research and technology sectors for national development. This is a very important function in my view, especially in the context of a weak planning mechanism. I am not finding fault here with those who are in the planning mechanism. It is not their fault if they are not adequately staffed and not provided with the resources to perform their functions properly. But, in this context, what has been given to us is an important task. To implement this task, I submitted a proposal and when it went up, I am sorry to say, it was not included in the Budget Proposals. I do not know for what reason. Thereafter, the situation was such that if I was to exercise my mandate with the limited amount of funds that were given to a Senior Minister, it was impossible to carry out this task. Therefore, I worked out a project and in terms of that project requested Rs. 60 million to be earmarked for the setting up of a framework, which would also have a backup of information technology to get up-to-date information from all these ministries and institutions so that it could be tied up with the national development objectives. But, what happened? It was not included in the Budget Proposals. Fortunately, this Select Committee was there and I was able to bring it up there. The Select Committee accepted that this was a necessity and they advocated inclusion of this Rs. 60 million in the Budget but if it cannot be included from the Consolidated Fund, that the funds be made available for this purpose. But, I am sorry to say that up to this moment - six months have lapsed - I have not received even one cent of that money. I was prepared to go ahead with this whole programme: we had got everything ready; we had a task force, worked out the details of what should be done but it was not possible to implement this. So, when we took this matter up at the Committee Stage Discussion of the Budget, this was approved and when we took it up subsequently with the Treasury, they said that the scheme of recruitment of the people whom we require for this has to be approved by the Salaries and Cadre Commission as well as by the MSD before they could release any funds.

Now, Sir, the responsibility of the Treasury is not micromanagement. Micromanagement is the task of the concerned ministry. Macroeconomic management is what they should be concerned with. Once Parliament has agreed to release that amount of money, then it should be given to us so that we can proceed with what Parliament has mandated. So, I think even if we set up this type of a Budget Committee, it should have powers to make sure that what is approved by that Committee is implemented in a timely fashion and effectively. So, I make this suggestion to the House.

I agree with what the Hon. Leader of the Opposition said that there should be a committee set up which will look into these matters and work out as to how this whole mechanism should be put into practice. I am very glad that the Opposition is supportive of this very good Motion which has been moved by the Hon. Thilanaga Sumathipala. And, through this, I am sure, that we will be able to make effective use of such a Committee especially where a new set of ministers like the Senior Ministers, who have a new function of co-ordinating, monitoring and reviewing, is coming up. That also needs to be put into effect. It needs to be provided for in the Committee that will be set up.

I would like to state that we have to work out some way in which - while we look at the national allocation of funds - the division of funds among different sectors, different ministries, could be done. Within each sector, there has to be some process by which the needs of that sector are adequately dealt with. For this purpose, there maybe a system of subcommittees which will be set up in terms of the whole Committee so that these subcommittees can meet and look into particular sectoral needs of individual ministries and institutions. So, if it is done in that matter, I am sure that we will be able to work out an effective system which will meet the needs of our country.

Thank you.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
The Hon. Joseph Michael Perera, please. Twenty five minutes has been allotted to you.

[අ. භා. 3.48]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක දිගටම අවුරුදු 35ක් මෙම පාර්ලිමේන්තුව නියෝජනය කළ මන්ත්‍රීවරයෙක් හැටියට මා කියන්නට ඕනෑ, පාර්ලිමේන්තු ඉතිහාසයේ විශාල පෙරළියක් ඇති කරන දිනයක් හැටියට අද දිනය ගැන මට සඳහන් කරන්නට පුළුවන්ය කියන එක. ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ මේ යෝජනාවට එක්සත් ජාතික පක්ෂයේ නායකතුමාත්, අප හැම දෙනාමත් ඉතාමත් සන්තෝෂයෙන් එකඟතාවය දක්වා තිබෙනවා. මේ වාගේම දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව පනත් කෙටුම්පතක් එදා මේ පාර්ලිමේන්තුවේ සම්මත කළා. ජනතාවට අවශ්‍ය දෙයක්, ජනතාව ඉල්ලූ දෙයක් පාර්ලිමේන්තුවේ එකඟතාවය ඇතිව සම්මත කළා. ඒ වාගේ දෙයක් හැටියට මෙය පත් නොවී ඉදිරියට මෙය තවත් සංශෝධනය වෙලා, නියම මහජන මන්ත්‍රීවරුන්; ජනතාව වෙනුවෙන් පෙනී සිටින මන්ත්‍රීවරුන් ගෙන යන ජනතා අවශ්‍යතා සපුරාලන වැඩ පිළිවෙළක් හැටියට මෙය ක්‍රියාත්මක කරන්නට පුළුවන්ය කියා මා විශ්වාස කරනවා.

"Budget Committee" කියන නමින් කොමිටියක් හදා ගෙන අමාත්‍යාංශ කිහිපයක් ඒකට යොමු කරලා පළමුවෙන්ම අපි මේ ගැන සාකච්ඡා කළා. අපට එතැනදී අලුත් අත් දැකීමක් ලැබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙච්චර කාලයක් එක එක්කෙනා විවේචනය කර ගන්න, ප්‍රතිපත්ති විවේචනය කර ගන්න අප පාර්ලිමේන්තුවේ කාලය නාස්ති කර තිබෙනවා. නමුත් එදා මන්ත්‍රීවරුන් සියලු දෙනාම හිටියේ එක පැත්තකයි. එක අදහසක හිටියා. නිලධාරීන් එනවා, නිලධාරීන් අපේ ප්‍රශ්නවලට උත්තර දෙනවා, නිලධාරීන්ගේ අපහසුකම් අපට කියනවා. ඇමතිවරුන්ට කියන්නට බැරි කාරණා පවා ඒ නිලධාරීන් අපට ඒ කමිටුවේදී ඉදිරිපත් කළා. මට මතකයි, එක අවස්ථාවකදී සිමෙන්ති සංස්ථාවේ Chairman කිව්වා, "අපට මේක දියුණු කරන්න බැරි අප කොන්ක්‍රීට් කණු හදනවා, ඒ කොන්ක්‍රීට් කණු ටික විදුලිබල මණ්ඩලය සල්ලිවලට ගන්නේ නැහැ, පිටින් ගන්නවා" කියා. මේ වාගේ අත් දැකීම් අපට ලැබුණා.

ඒ වාගේම අපේ ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරු කොයි විදියේ තත්ත්වයකද හිටියේ කියන එක ඒ කමිටුවේදී අප දැක්කා. ඒ ගොල්ලන්ට භාර දී තිබුණු වැඩ කටයුතු පිළිබඳව, අධීක්ෂණය කරන්නට තිබෙන රාමුව කොයි ආකාරයෙන් ද සකස් වෙලා තිබුණේ කියන එක පිළිබඳව අපට පැහැදිලි වුණා. එතුමන්ලාත් යම් යම් යෝජනා මේ කමිටුවට ඉදිරිපත් කළා. ඒකයි මම කිව්වේ, පළමුවන වතාවට මේ අවස්ථාව පාර්ලිමේන්තු ඉතිහාසයේ ගෞරවණීය වෙනසක් ඇති වන අවස්ථාවක්ය කියන එක. ඒ අවස්ථාව අපට ඇති කර දෙන්නට මේ යෝජනාව ඉදිරිපත් කළ ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමාත් අපේ ඉතිහාසයේ ලියැවෙන කෙනෙක් හැටියටයි මා නම් දකින්නේ. ඉතාම හොඳ හිතින්, අප බලාපොරොත්තු වුණාටත් වඩා, එතුමාගේ යෝජනාවේ තිබෙනවාටත් වඩා වෙනත් කරුණු රාශියක් එතුමා මතු කළා. අප හැම දෙනාගේම ස්තුතිය එතුමාට පුද කරනවා. මා උත්සාහ කළේ මේ යෝජනාව අනුව කථා කරන්නයි. එතුමා එම පරාසය තවත් පුළුල් කළා. පුළුල් කරලා අප ඔක්කෝටම එන්න පුළුවන් තැනක් නිර්මාණය කරන්නට මේ යෝජනාව තුළින් එතුමා උත්සාහ කළා.

අපට මතක් වෙන කරුණු කීපයක් තිබෙනවා. ඉන් එකක් තමයි, අය වැයක් ඉදිරිපත් කළාම පාර්ලිමේන්තුවට තිබෙන බලතල පිළිබඳව ඇත්ත වශයෙන්ම මේ රටේ මහජනතාව දැන ගෙන හිටියේ නැහැ කියන එක. ඒ වාගේම සමහර විට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුත් ඒ පිළිබඳ දැන ගෙන හිටියේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අමාත්‍ය මණ්ඩලයට තිබෙන වගකීම් පිළිබඳව අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 42වැනි ව්‍යවස්ථාව ඉතාම පැහැදිලිව අපට පෙන්නුම් කර දෙනවා. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 42වැනි ව්‍යවස්ථාවේ මෙසේ සඳහන් වෙනවා:

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ද මහජන ආරක්ෂාව සම්බන්ධයෙන් තත්කාලයේ බලපවත්නා නීතිය ඇතුළු වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ ද ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය යථා පරිදි ක්‍රියාත්මක කිරීම සහ යථා පරිදි ඉටු කිරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වගකිව යුත්තේ ය."

ඊළඟට එහි 43 (1) අනුව්‍යවස්ථාවේ මෙසේ සඳහන් වෙනවා:

"ජනරජයේ පාලනය මෙහෙයවීම සහ ඒ පාලනය පිළිබඳ විධානය භාර අමාත්‍ය මණ්ඩලයක් වන්නේ ය. අමාත්‍ය මණ්ඩලය පාර්ලිමේන්තුවට සාමූහිකව වගකීමට සහ උත්තර දීමට බැඳී සිටින්නේ ය."

මා හිතනවා මේක මේ උත්තරීතර පාර්ලිමේන්තුව සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අපට පැහැදිලි කරන කරුණක් ක්‍රියාවට නංවන්න අප උත්සාහ කරන අවස්ථාවක් කියලා. මේක තමයි ඉතා වැදගත්. ඉතාම පැහැදිලි අර්ථ කථනයක්, ක්‍රියාත්මකභාවයක් මේ යෝජනාව තුළින් අද අපට ක්‍රියාවට නඟන්න පුළුවන් වෙයි. ඒ විශ්වාසය මට තිබෙනවා. එදා අප යෝජනා කළා තිබෙන සියලුම අමාත්‍යාංශ එදා තිබුණු ඒ අය වැය කමිටුවට ගන්න කියලා. නමුත් ආණ්ඩුව ඒකට එකඟ වුණේ නැහැ. වේලාව අඩු කිරීමේ පරමාර්ථයෙන් අමාත්‍යාංශවලින් කොටසක් විතරක් ගත්තා. නමුත් දැන් මේ යෝජනාවෙන් අපට පෙනෙනවා ආණ්ඩුව එක ස්ථාවරයකට ඇවිත් තිබෙන බව. Group එකේත් කථා කරලා තිබෙනවා, පළමුවෙන්ම ඒ කොමිටියට සියලුම අමාත්‍යාංශවල වැය ශීර්ෂ ඉදිරිපත් කරන්න. මේක අප හැම දෙනාටම සුබ කාරණයක් හැටියටයි මම සලකන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව සියලුම මුදල් පාලනය කිරීමේ බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවටයි. ඒ මුදල් පාලන බලය තිබෙනවා කියලා කිව්වාට අය වැය ඉදිරිපත් කළාම අප ඒකට විරුද්ධව කථා කළා. එක්කෝ පක්ෂව කථා කළා. එහෙම නැත්නම් දේශපාලන වශයෙන් කථා කළා. ඊට පස්සේ ඒ අය වැයට පක්ෂව ඡන්දය දුන්නා. නැත්නම් විරුද්ධව ඡන්දය දුන්නා. ඊට පස්සේ ඒක සම්මත වුණා. ඒ මුදල් බලය පාර්ලිමේන්තුවට තිබෙනවාය කියන එක සහතික කර ගන්න ඊට පස්සේ එතැනින් එහාට යමක් සිද්ධ වුණේ නැහැ. දැන් මේ කරන යෝජනාව අනුව ඒකට සුවිශේෂීව අපේ පාර්ලිමේන්තුවට බලය ලැබෙනවා. පාර්ලිමේන්තුවට ඒ බලය ලැබුණාම සියලු දෙනාටම එකට ඉඳ ගෙන ඒ කටයුත්ත කරන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන්ම මේ කාරණය මතක් කරන්න කැමැතියි. මම හුඟක් කල් මේ පාර්ලිමේන්තුවේ ඉඳලා තිබෙනවා. පාර්ලිමේන්තු රැස්වීම් ඉවර වෙනකනුත් මම ඉන්නවා. මට කථානායක හැටියටත් ඉන්න සිද්ධ වුණා. අපේ ජෝන් අමරතුංග මන්ත්‍රීතුමාට දැන් තිබෙන කාර්යය වාගේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායක හැටියටත් මට ඉන්න සිද්ධ වුණා. ඒ හැරුණාම අනික් හැම වේලාවෙමත් මම හිටියා. අද මේ වැදගත් යෝජනාව සාකච්ඡා කරන වෙලාවේ මේ ගරු සභාවේ සිටින මහජන නියෝජිතයන් සංඛ්‍යාව ගැන අප කනගාටු වෙනවා. මහජන නියෝජිතයන් හැටියට මන්ත්‍රීවරු කී දෙනෙක් දැන් මේ ගරු සභා ගැබේ ඉන්නවාද කියලා කල්පනා කර බලන්න.

අද විශේෂයෙන්ම කථා කරන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වගකීම් පිළිබඳවයි. ඒ හරහා ගරු කථානායකතුමාට, මේ පිළිබඳව උනන්දු වුණු සියලුම දේශපාලන පක්ෂවල මන්ත්‍රීවරුන්ට වගකීම් සම්භාරයක් පැවරෙනවා. මට මතකයි, අප ඒ කොමිටියට සහභාගි වන කොට සමහර මන්ත්‍රීවරු ඒකට සහභාගි වෙන්න ආවෙත් නැති බව. අප කීප දෙනෙක් තමයි ඒකට සම්බන්ධ වුණේ. ඒ නිසා මේ ප්‍රයෝජනය ගන්නට මේ සියලුම මන්ත්‍රීවරුන් නැවත වරක් ඒ සඳහා යොමු කිරීමේ වැඩ පිළිවෙළක් ඇති කරන්න ඕනෑ. ඒක වැදගත්. ඒ වාගේම අප දන්නවා දැනට තිබෙන ක්‍රමයේ හැටියට උපදේශක කාරක සභාවලට - Consultative Committeesවලට - සමහර විට COPE එකට, සමහර විට Public Accounts Committee එකට පත් කරලා තිබෙන ගරු මන්ත්‍රීවරු ටික දෙනාගෙනුත් කීප දෙනෙක් තමයි ඒවාට සහභාගි වෙන්නේ කියන එක. එක්කෝ ඒ වගකීම ඒ ගොල්ලන්ට දරන්න බැහැ. එහෙම නැත්නම් නිකම් ඔහේ පත් වෙලා එතැන ඉන්නවා. එතකොට අපට තිබෙන මේ මුදල් බලය පාර්ලිමේන්තුවේ අපට හැඩ ගස්වා ගන්න බැරිව යනවා.

COPE එකේත්, Public Accounts Committee එකේත් අපි මෙච්චර කල් කර ගෙන ගියේ මරණ පරීක්ෂණය තියන එකයි. මරණ පරීක්ෂණය තියලා විගණකාධිපතිතුමා අපට යම් කිසි කරුණක් පෙන්නුම් කරලා දුන්නාම ඒ අනුව විභාගයක් කරන එකයි. ඒක තමයි අපි කළේ. නමුත් COPE එකටවත්, Public Accounts Committee එකටවත් බලයක් තිබුණේ නැහැ, ඒ ආයතන අරගෙන වෙනම පරීක්ෂණ කරන වැඩ පිළිවෙළක් හදන්න. ඒ නිසා අද මේ යෝජනාව සම්මත වෙන කොට මේ ප්‍රධාන Committees දෙකට වඩා මේ Committees බලවත්. ඒක තමයි අධීක්ෂණ කමිටු - Oversight Committees - කියලා කිව්වේ. එතකොට විශාල බලයක් මේ Committeesවලට

[ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා]

පැවරෙනවා. විගණකාධිපතිතුමා දෙන වාර්තාව විතරක් නොවෙයි, අපි හොයා ගත්ත දේවලුත් විගණකාධිපතිතුමාට දීලා ඒවා පිළිබඳව පරීක්ෂණය කරලා ඒවා පවා ක්‍රියාත්මක කිරීමේ වැඩ පිළිවෙළකට අපිට යන්න පුළුවන්කම තියෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාර්යය ඉෂ්ට කරන කොට කාර්ය මණ්ඩලයක අවශ්‍යතාව අපට විශේෂයෙන්ම පේනවා. මා හිතනවා ඒක ගැන දැනට විශාල වශයෙන් හිතන්නේ නැතිව මේ තියෙන කාර්ය මණ්ඩලයම අපි ශක්තිමත් කරලා කටයුතු කළ යුතුයි කියලා. දැනටත් අපේ research division එකට තවත් කිහිප දෙනකු ගන්න කටයුතු කරලා තිබෙනවා. අපි ඒ ගැන ස්තුතිවන්ත වෙනවා. ඊටත් වඩා පුළුල් විධියට මේ Committeesවල වැඩ කටයුතු කරන්න අවශ්‍ය වන නිලධාරි පිරිස හොයා ගත්තොත් හොඳයි කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාත් මේ අවස්ථාවේ ඉන්න නිසා මම ප්‍රකාශ කරන්න කැමැතියි, සැකයෙන් භයෙන් තමයි අපි අමාත්‍යාංශ කිහිපයක් හෝ කමිටුවලට යොමු කළේ කියන එක. නමුත් එහි සාර්ථක ප්‍රතිඵල අපි දැක්කා. එතුමා බොහොම අමාරුවෙනුයි ඒ කටයුත්ත කළේ. එදාත් එතුමාගේ එකඟතාව තිබුණා ඒ කමිටුවලට මේ අමාත්‍යාංශ ඔක්කෝම ගන්න. ඒ වාගේම මේ Oversight Committees පත් කරන්නත් එතුමාගේ කැමැත්ත තිබුණා. ඒ වාගේම නීති ගෙනෙන කොට ඒවා පිළිබඳව පරීක්ෂණය කරන්න Committees පත් කරන්නත් එතුමාගේ කැමැත්ත තිබුණා. නමුත් මොකක් හෝ හේතුවක් නිසා ක්‍රියාත්මක කරන්න බැරිව ගියා.

අද අපි ඔක්කෝටම එකට එකතු වෙලා, සාමූහිකව, දේශපාලන භේදයෙන් තොරව, මේ රට සංවර්ධනය කිරීමේ වැඩ පිළිවෙළේදී එකට ගමන් කරන්නට අවස්ථාවක් ලැබී තිබෙනවා කියන එකයි මම කල්පනා කරන්නේ. මේ අවස්ථාවේ ගරු මන්ත්‍රීවරුන් හුඟක් නොසිටියත්, මේකට ඡන්දයක් නොගත්තත් ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා මේ ඉදිරිපත් කරපු යෝජනාවට ආණ්ඩු පක්ෂයේ එකඟත්වය තිබෙන බව රජයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කථාවෙන් අපට පැහැදිලි කරලා දුන්නා. එහෙනම් අපට සන්තෝෂ වෙන්න පුළුවන්. අද මේ ගෙනාපු යෝජනාව ඉතා පුළුල් පරමාර්ථයක් ඇතිව, මේ රටේ ජනතාවගේ බලාපොරොත්තු ඉෂ්ට වන ආකාරයට සකස් වෙච්ච යෝජනාවක් හැටියටත්, මේ පාර්ලිමේන්තුවේම කැමැත්ත ප්‍රකාශ වන වැඩ පිළිවෙළක් හැටියටත් අපට සඳහන් කරන්න පුළුවන්.

අවසානයේදී මේ යෝජනාව ගැන තීරණයක් වෙන්නේ අපේ පක්ෂ නායකයින්ගේ රැස්වීමේදී මේ පිළිබඳව ගන්න තීන්දුව අනුවයි. එතුමන්ලා සාකච්ඡා කරලා ඉතා ඉක්මනින්, ඒ කියන්නේ මේ අය වැයට පෙර අපට මේ පිළිබඳව කටයුතු කරන්න පුළුවන් නම් වඩා වැදගත් වනවා. ඒ සඳහා වෙනස් කර ගත යුතු ස්ථාවර නියෝග කිහිපයක් තිබෙනවා. කාගේත් එකඟත්වය තිබෙනවා නම් ඒකට අපට වැඩි වෙලාවක් යන්නේ නැහැ. අද මේ ගෙනාපු යෝජනාවේ තිබෙන කරුණු තවදුරටත් ශක්තිමත් වෙන්න, තවත් විස්තරාත්මකව සාකච්ඡා කරලා මේ අය වැයට කලින් මේ කටයුත්ත ක්‍රියාත්මක කරන්න සම්මත කර දෙන්නය කියලා අපි ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම එදා -අපේ ගරු සභානායකතුමා තමයි එදා මූලාසනය දැරුවේ- අපි ගෙනාපු යෝජනා සාකච්ඡා කළා; ඔක්කෝම පිළි ගත්තා. නමුත් එදා ඒවා ක්‍රියාත්මක කරන්න විධියක් තිබුණේ නැහැ. අය වැය ඉදිරිපත් කරලා ඉවර නිසා ඒක වෙනස් කරන්න විධියක් තිබුණේ නැහැ. නමුත් එදා ගෙනාපු යෝජනා ඊට පස්සේවත් ක්‍රියාත්මක කරන ක්‍රමයක් තිබුණේ නැහැ. ඒ නිසා අපි කල්පනා කරන්නට ඕනෑ, මේ කමිටු පත් කරන කොට, ඒ වෙනස්කම් යෝජනා කරන කොට, එකඟ වෙන කොට ඒවා ඒ අය වැය තුළ ක්‍රියාත්මක කරන්න පුළුවන් වාතාවරණය අපට ඇති කර ගන්න පුළුවන්ද කියන කාරණය. අය වැය සම්මත වෙන කොට ඒ වෙනස්කම් ඇති වෙන්නේ නැත්නම් අපි ගිහිල්ලා වැරදි හොයලා, අපේ අදහස් දීලා, නිකම් කථා කරලා සියලු දෙනාම එකඟ වුණත් අපට ඒකෙන් ප්‍රයෝජනයක් වන්නේ නැහැ. ඒ නිසා අද ඉදිරිපත් කරන මේ යෝජනාව ගැන අපි සියලු දෙනාම ඉතාම සතුටු වෙනවා.

අපි කවුරුත් දන්නා පරිදි, අපට අවශ්‍ය වෙලා තිබෙන ඉතා උතුම් වැඩ කටයුත්තක් ඉෂ්ට කර ගන්න පුළුවන් වෙයි කියලා තමයි අපි මෙයින් බලාපොරොත්තු වන්නේ.

පසු ගිය වසරේ අය වැය, එනම් 2012 වර්ෂය සඳහා ඉදිරිපත් කළ අය වැය අවස්ථාවේදී 2012 වසරේ අය වැය ඇස්තමේන්තු අතරින් තෝරා ගත් අමාත්‍යාංශවල වැය ශීර්ෂ සාකච්ඡා කිරීමට විශේෂ කාරක සභාවක් පත් කිරීම සඳහා යෝජනාවක් සභානායකතුමා ඉදිරිපත් කළ බව ඔබතුමාට මතක ඇති. විශේෂ කාරක සභාවක් පත් කරනු ලදුව, එම විශේෂ කාරක සභාවේදී පහත සඳහන් අමාත්‍යාංශ 21 පිළිබඳව සාකච්ඡාවට ගනු ලැබුවා. මම ඒ අමාත්‍යාංශවල නම් කියවන්නට යන්නේ නැහැ. එම නාම ලේඛනය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

ඉන් පසුව ඒ කාරක සභාව පාර්ලිමේන්තුවට වාර්තා කළා. විසංවාදයක් පිළිබඳ බියකින් තොරව මෙම නව්‍ය ක්‍රියා පටිපාටිය මන්ත්‍රීතුමන්ලා දැඩිසේ අගය කළ බව පැවසීමට හැකියි. මෙම ක්‍රමය, එකී එක් එක් අමාත්‍යාංශයක අය වැය කාරක සභා අවස්ථාව අතර තුරදී කෙටි කථා පැවැත්වීමට වඩා ප්‍රයෝජනවත් හා ඵලදායී බව අපට පෙනුණා. මෙම සන්දර්භය තුළ මෙකී ක්‍රියා පටිපාටිය තෝරා ගත් අමාත්‍යාංශ කීපයකට සීමා කරනු වෙනුවට, සියලු අමාත්‍යාංශ ඇතුළත් වන පරිදි පුළුල් කළ යුතුය යන්න එක්සත් ජාතික පක්ෂයේ අදහසයි. එදාත්, අදත් ඒකට අපි එකඟයි. අප ඉස්මතු කළ යුතු වන අනෙක් කාරණය නම් රාජ්‍ය මූල්‍ය පිළිබඳ ස්ථාවර කාරක සභාවක් ඇති කිරීමයි. ඔබතුමා දන්නා පරිදි උපදේශක කාරක සභා යම් පමණකට ඒ ඒ අමාත්‍යාංශයේ කාර්ය සාධනය ඇගැයීමට සීමා වී තිබෙනවා. කෙසේ වෙතත්, එහිදී ඒ ඒ අමාත්‍යාංශයේ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ගැඹුරු සමාලෝචනයක් හා තක්සේරු කිරීමක් කෙරෙන්නේ නැහැ. මෙම සන්දර්භය තුළ තමයි රාජ්‍ය මූල්‍ය පිළිබඳ ස්ථාවර කාරක සභාවක් පිහිටුවීමට අපි යෝජනා කරන්නේ. මෙම කාරක සභාවේ කාර්යයන් පහත පරිදි වනු ඇත.

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වන ව්‍යවස්ථාව යටතේ ආදායම් එකතු කිරීමද;

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 (1) වන ව්‍යවස්ථාව යටතේ ඒකාබද්ධ අරමුදලින් ගෙවීම් කිරීමද;

(ඇ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 (1) වැනි ව්‍යවස්ථාව යටතේ නීතිය ප්‍රකාරව විශේෂිත පරමාර්ථ සඳහා රාජ්‍ය මුදල් උපයෝජනය කිරීමද;

(ඈ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 (1) සහ 150 (2) වන ව්‍යවස්ථා යටතේ රාජ්‍ය අරමුදල් භාවිත කිරීමද;

(ඉ) විසර්ජන පනතේ ඇතුළත් වන විසර්ජනයන් ප්‍රවර්තන වර්ෂය සඳහා ආපසු ගැනීම්, විසර්ජනයන් මාරු කිරීම් සහ අනපේක්ෂිත ශේෂය මාරු කිරීමද;

---

**** කථාව අවසානයේ පළ කර ඇත.***
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

(ඊ) ප්‍රවර්තන වර්ෂය සඳහා විසර්ජන පනත ක්‍රියාත්මක කිරීමද;

(උ) රාජ්‍ය ණය සහ ණය පොලී ගෙවීමද; සහ

(ඌ) 2003 අංක 02 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත යටතේ වාර්තා සහ ප්‍රකාශ පරීක්ෂා කිරීම.

"අධීක්ෂණ ස්ථාවර කාරක සභා" ලෙස නම් කෙරෙන කාරක සභා කීපයක් පිහිටුවීම අපගේ යෝජනාවේ තුන්වන පාර්ශ්වයට අදාළ වේ. මෙම කාරක සභාවල කාර්යයන් පහත පරිදි වනු ඇත:

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (ඇ) සහ 45 (1) ව්‍යවස්ථා යටතේ අමාත්‍යාංශවලට පවරා ඇති විෂයයන්, කාර්යයන් දෙපාර්තමේන්තු හා ආයතන, ව්‍යවස්ථාදායක අධීක්ෂණ කාර්යය.

(ආ) පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන නීති ක්‍රියාත්මක කිරීම, භාවිතය හා පරිපාලනය හා නව නීති පැනවීමේ අවශ්‍යතාව හෝ යෝග්‍යතාව දැක්විය හැකි අවස්ථා හා නීති හා අතිරේක නීති සැකසීමෙහි, සලකා බැලීමෙහි, පැනවීමෙහි හෝ වෙනස් කිරීමෙහි පොදු අධීක්ෂණ වගකීම් දැරීම.

(ඇ) කාරක සභාවල බල සීමාවට ඇතුළත් විෂයයන්ට අදාළ ව්‍යවස්ථා සම්පාදන හා ව්‍යාපෘති වැඩ සටහන් නිසි ලෙස ක්‍රියාත්මක වන්නේද, ඒවා පවත්වා ගත යුතුද හෝ සීමා කළ යුතුද හෝ බැහැර කළ යුතුද යන්න පිළිබඳ අධීක්ෂණ වගකීම් දැරීම.

(ඈ) සිය වගකීම් ඉටු කිරීමේ දී අවශ්‍ය යයි හැඟෙන පරීක්ෂණ හෝ අධ්‍යයන සිදු කිරීම.

(ඉ) පාර්ලිමේන්තුවේ පළමු සැසිවාරය ආරම්භයෙන් පසු සති නවයකට නොවැඩි කාලයදී එම පාර්ලිමේන්තුව සඳහා වන සිය අධීක්ෂණ සැලසුම් සකස්කොට එය පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කිරීම.

පශ්චාත් මරණ පරීක්ෂණ ලෙස නම් කළ හැකි කාර්යයන් සහිත උපදේශක කාරක සභා සම්බන්ධ තත්ත්වය මෙන් නොව, මෙම කාරක සභා සැබවින්ම මෙකී අමාත්‍යාංශවල බලතල, කාර්යයන්, රාජකාරි හා කාර්ය සාධනයන්හි සියලු පාර්ශ්ව ඇතුළත් වන වඩාත් පුළුල් හා සවිස්තර පරීක්ෂණයක යෙදෙනු ඇත. ඒ වාගේම කාරක සභාව ඉන්පසුව පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුය.

මෙන්න මේ විධියට අපට පෙනෙන පැහැදිලි කරුණු කීපයක් තමයි තමුන්නාන්සේලාට මේ අවස්ථාවේ මා ඉදිරිපත් කළේ. අවසාන වශයෙන් මා ඉල්ලා සිටින්නේ, මේ කාරණා පිළිබඳව දැඩි අවධානය යොමු කරලා, ඉතා ඉක්මනින් පක්ෂ නායකයන්ගේ රැස්වීමක් කැඳවලා, අද මේ දෙපාර්ශ්වයම එකඟ වුණු කාරණා ටික ඉක්මනින් ක්‍රියාත්මක කරන්නට අවශ්‍ය පියවර ගන්න කියල යි. ඒ සඳහා අවශ්‍ය වන පරිදි ස්ථාවර නියෝග වෙනස් කිරීමට රජයේ කැමැත්තත් මේ පාර්ලිමේන්තුවට ලබා දෙනවා නම් ඒක ඉතා වැදගත් කියන කාරණයත් මතක් කරමින් මා නිහඬ වනවා. ස්තුතියි.

***සභාමේසය මත තබන ලද නාම ලේඛනය:**

** சபாபீடத்தில் வைக்கப்பட்ட பெயர்ப் பட்டியல்:*

* *List of Names tabled:*

1. යහපාලනය හා යටිතල පහසුකම් අමාත්‍යාංශය
2. නාගරික කටයුතු අමාත්‍යාංශය
3. පාරිභෝගික සුබසාධන අමාත්‍යාංශය
4. ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍යාංශය
5. ග්‍රාමීය කටයුතු අමාත්‍යාංශය
6. ජාතික සම්පත් අමාත්‍යාංශය
7. මානව සම්පත් අමාත්‍යාංශය
8. සමාජ සුබසාධන අමාත්‍යාංශය
9. විද්‍යාත්මක කටයුතු අමාත්‍යාංශය
10. ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය
11. පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
12. රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
13. ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය
14. තැපැල් සේවා අමාත්‍යාංශය
15. මහජන සම්බන්ධතා හා මහජන කටයුතු අමාත්‍යාංශය
16. ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
17. රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය
18. සමාජ සේවා අමාත්‍යාංශය
19. පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශය
20. සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
21. තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය

[අ. භා. 4.08]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ආණ්ඩු පක්ෂයේ ඇමති ධුරයක් නොදරන, එහෙත් මන්ත්‍රීතුමකු හැටියට කටයුතු කරන තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා විසින් මේ මුළු පාර්ලිමේන්තුවේ අපි කාටත් බලපාන, රටටම බලපාන ඉතා වැදගත් මාතෘකාවක් තමයි අද අපේ අවධානයට යොමු කරලා තිබෙන්නේ. ඒ ගැන ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වන අතරම, මේ යෝජනාව මීට වඩා වැදගත් බරක් තබා සාකච්ඡාවට ලක් කළා නම් හොඳයි කියලා මා විශ්වාස කරනවා. ඇත්තටම මේ යෝජනාව කැබිනට් මණ්ඩලයේ සාකච්ඡා වෙලා, විධායකයේ තීරණයක් හැටියට - මා විධායකය කියලා අදහස් කරන්නේ ජනාධිපතිතුමා විතරක් නොවෙයි - මුළු මහත් කැබිනට් මණ්ඩලයම වග කියන යෝජනාවක් හැටියට මේ ගරු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න තිබෙන යෝජනාවක්. එහෙම වුණා නම් තමයි පාර්ලිමේන්තුව රටේ මූල්‍ය පාලනයට වග කියනවාය කියන රාජ්‍යමය වග කීමක් ඇති ස්වරූපයෙන් මේ යෝජනාව ඉදිරිපත් වන්නේ. නමුත් ශෝක යෝජනාවක් වෙනුවෙන් කථා කරන දවසක ස්වභාවය තමයි අද අපට මේ පාර්ලිමේන්තුවේ පෙනෙන්න තිබෙන්නේ. ඒ තරම්වත් උනන්දුවක්, අවධානයක් මේ යෝජනාව කෙරෙහි නැති මට්ටමක් තමයි තිබෙන්නේ. හරියට නාඳුනන කෙනෙකුගේ මළ ගෙදරක කථා කරනවා වාගේ තමයි අපි කථා කරන්නේ.

ආණ්ඩු පක්ෂයේ කැබිනට් ඇමතිවරුන්ගේ අමාත්‍යාංශවල විෂයයන්ට අදාළ අය වැය ඇස්තමේන්තු සාකච්ඡා කිරීම සඳහා කාරක සභාවක් පත් කර ගැනීම සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබෙන වැදගත් යෝජනාවක් තමයි මේක. නමුත් අද ඒ වෙනුවෙන් කථා කරන මන්ත්‍රීතුමන්ලා කථා කරලා යනවා. ඊට පස්සේ මේ විවාදයට ඇහුම්කන් දෙන්න ආණ්ඩු පක්ෂයේ කෙනෙක් නැහැ. මෙන්න මෙවැනි තත්ත්වයක් අද මේ සභාවේ තිබෙන්නේ. ඉතින් ඒකෙන්ම තේරෙනවා මෙවැනි යෝජනාවක්, මෙවැනි සාධනීය දෙයක්, මේ තිබෙන ව්‍යුහයට ගැළපෙන්නේ නැති බව.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේගේ දැන ගැනීමට කියන්න ඕනෑ. තමුන්නාන්සේ මේ ප්‍රකාශ කරන දේවල් පිළිබඳව අද ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් රැස්වීමක් පැවැත්වෙනවා. ඒකයි මේ ගරු සභා ගර්භයේ මන්ත්‍රීවරුන් අඩු.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මම හිතන්නේ ඇත්තටම-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Presiding Member)
මේ පිළිබඳව බලධාරින්ගේ සාකච්ඡාවක්.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
**(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)**
(The Hon. Sunil Handunnetti)
ඒක තමයි ප්‍රශ්නය. ඔබතුමා කියන දෙය තමයි, ප්‍රශ්නය. දැනෙන දේ තමයි, අය වැය, fiscal policy එක, රාජ්‍ය මූල්‍ය පාලනය පිළිබඳව අය වැය කාරක සභාවක් කැඳවීම පිළිබඳ යෝජනාවක් මේ පාර්ලිමේන්තුවේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ගෙනෙන කොට ආණ්ඩු පාර්ශ්වයේ ගරු ඇමතිවරුන්ට ගරු මන්ත්‍රීවරුන්ට ආර්ථික සංවර්ධන ඇමතිතුමාගේ රැස්වීම ඊට වඩා වැදගත් වීමයි. මොකද, ඒ රැස්වීමෙන් තමයි ඒ එක එක මන්ත්‍රීවරුන්ට ඇමතිවරුන්ට කීයක් හෝ හම්බ වෙන්නේ; කීයක් හෝ වෙන් වෙන්නේ. දැන් ඇත්තටම වැදගත් දේ, වෙන් වෙන ගණන ගන්න යන එක; ඒකෙන් කීයක් හෝ වෙන් කර ගන්න එක.

ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා මේ යෝජනාව ගරු සභාවට ගෙනැත් තිබෙන්නේ, මේ වෙන් කරන මුදල් ප්‍රතිලාභී විධියට, රටට යහපත් විධියට, පාර්ලිමේන්තුවට වග කියන විධියට පාවිච්චි කරන්නේ කොහොමද කියන එක සාකච්ඡා කිරීමටයි. අර කට්ටියට ඒක වැඩක් නැහැ. වෙන් කරන ලද මුදල පාවිච්චි කරන්නේ කොහොමද කියලා මෙතැන සාකච්ඡා කරලා තීන්දු තීරණ ගැනීම සම්බන්ධයෙන් මේ කරන විවාදය නාඳුනන පුද්ගලයාගේ මළ ගෙදරක කරන කථාවක් වාගේයි. එතුමන්ලාට මීට වඩා වැදගත් වන්නේ ඒ මුදල් වෙන් කර ගන්නා එක. මේ සම්බන්ධයෙන් හොඳම පැහැදිලි කිරීම කළා; ඇත්තටම මේ යෝජනාවට ගෞරවනීය, සාධනීය තත්ත්වයක් ලබා දුන්නා, අපේ තිස්ස විතාරණ ජ්‍යෙෂ්ඨ අමාත්‍යතුමා. එතුමා කිව්ව දේ මොකක්ද? එතුමා කිව්වේ, එතුමා අමාත්‍යාංශ ඇස්තමේන්තු යටතේ යෝජනාවක් ඉදිරිපත් කළා; නමුත් ඒක ගැනුණේ නැහැ. පස්සේ වෙනත් ක්‍රමයකට ඒ යෝජනාව ඉදිරිපත් කළා. එය සාධනීයයි කියලා පිළිගත්තා; සම්මත වුණා; මුදල් වෙන් වුණා. මේ මොහොත දක්වා - up to this time - ඒ වෙනුවෙන් අඩු තරමින් සතයකවත් වැඩ කටයුතු කෙරිලා නැහැ කියලා. ඒක තමයි ප්‍රශ්නය.

සමහර අමාත්‍යාංශවලට ඇස්තමේන්තු ඉදිරිපත් කරලා, අය වැයෙන් මුදල් වෙන් කරලා ඒ මුදල් ප්‍රායෝගික භාවිතාවට නැඟෙන කොට, වාරය ඉවර වෙන කොට, ඊළඟ අය වැය කාල සීමාව එන කොට, වර්ෂය අවසාන වන කොට අපි මෙතැන ඇස්තමේන්තු කරපුවා, අනුමත කරපුවා නොවෙයි ක්‍රියාත්මක වන්නේ. ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරයකුම කියනවා, ආණ්ඩු පාර්ශ්වයේ පක්ෂයක්ම නියෝජනය කරන අමාත්‍යවරයකු කියනවා, "මට වුණේ මෙහෙමයි" කියලා. තිලංග සුමතිපාල ගරු මන්ත්‍රීතුමා මේ යෝජනාව ගෙනැත් තිබෙන්නේ අන්න ඒ තත්ත්වය වළක්වන්න. කවුරු හෝ මන්ත්‍රීවරයෙක්, විෂය භාර කවුරු හෝ අමාත්‍යවරයෙක්, තවත් ඇමතිතුමකුගේ පස්සෙන් ගිහින් කීයක් හෝ ඉල්ලා ගන්න තත්ත්වය වළක්වන්න; ඇමති ධුරයේ, මන්ත්‍රී ධුරයේ තිබෙන ගෞරවනීය තත්ත්වය රකින්න; මූල්‍ය පිළිබඳව පාර්ලිමේන්තුවට වග කියන තත්ත්වයක් හදන්න; පාර්ලිමේන්තුවේ අපි කවුරුත් රාජ්‍ය මූල්‍ය පාලනයට දායක කර ගන්න තමයි මේ ගරු මන්ත්‍රීතුමා ඉතාම සද්භාවයෙන් මේ යෝජනාව ගෙනාවේ කියලා මම විශ්වාස කරනවා. හැබැයි ඒ යෝජනාව ගෙනෙන කොට, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ඇමතිතුමාගේ සාකච්ඡාව මීට වඩා වැදගත් වෙයි කියලා හිතලා, කීයක් හෝ ඉල්ලා ගන්න ඇමතිවරු ගිහිල්ලා නම් එය කනගාටුදායක තත්ත්වයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි යෝජනාවක් අපි බලන්න ඕනෑ, සංකල්පීය තත්ත්වයෙන්, මූලධාර්මික තත්ත්වයේ සිට යථාර්ථයට ගෙනෙන්නේ කොහොමද කියලායි. මූලධාර්මික යෝජනාවක් හැටියට, "හොඳයි,හොඳයි, මේ යෝජනාව මරු" කියලා සාකච්ඡා කරනවාට වඩා මේ යෝජනාව යථාර්ථයට කිට්ටු කරන්න, මේ යෝජනාව ප්‍රායෝගික ක්‍රියාකාරිත්වයට ගෙනෙන්න අපි කොහොමද කටයුතු කරන්නේ? එතැනදී තමයි දැන් මේ තිබෙන ගැටලු කථා කරන්න වෙලා තිබෙන්නේ. මම ඒ ගැටලු සාකච්ඡා කරන්නේ ඇත්තටම මේ යෝජනාවට සහාය පළ කරමින්; මේ යෝජනාව අගය කරමින්; මේ යෝජනාව යථාර්ථයට, ප්‍රායෝගික ක්‍රියාකාරිත්වයට ගෙන ඒම සඳහා.

උදාහරණයක් ගත්තොත් අපි දන්නවා, මේ කැබිනට් මණ්ඩලයේ අපේ ගරු ඩිව් ගුණසේකර ඇමතිතුමා ඇතුළු ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරු ඉන්නවා. ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන්ගේ යෝජනාව තමයි "අපට වැඩ කරන්න අවස්ථාව දෙන්න" කියන එක.

මම දැක්කා, පසු ගිය කාලයේ කාටූන් ශිල්පීන් කාටූන් පවා ඇන්දා, ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරු වැඩ කරන්න ඉල්ලන කොට ඔවුන්ගේ නෝනා මහත්වරු ඒ ගැන කියන දේවල් ගැන කියලා. ප්‍රශ්නය, එලෙස වැඩ කරන්න ඉල්ලන්නේ ඇයි? ඒ අයගේ තිබෙන දක්ෂතාව, කාලයක් දේශපාලනයේ නියැලිලා තිබෙන හැකියාව අනුවයි. හැබැයි දැන් පාර්ලිමේන්තු ඇමති ධුරයට අනුව නොවෙයි ඇස්තමේන්තු හැදෙන්නේ; විෂයයට නොවෙයි ඇස්තමේන්තු හැදෙන්නේ.

මේ යෝජනාව භාවිතාවට නඟන්න නම්, කාරක සභා තත්ත්වයක් හදලා අධීක්ෂණය හදලා, මේවා අපි ඔක්කොම එකතු වෙලා සාකච්ඡා කරන්න හදනවා නම් පළමු භාවිතාව එන්න ඕනෑ ආණ්ඩු පාර්ශ්වය පැත්තෙන්. විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් හැටියට අපට කිව්වොත්, "මෙන්න අය වැය කාරක සභාවක් තිබෙනවා, ඇවිල්ලා සහභාගි වන්න" කියලා, අපට එන්න පුළුවන්. නිලධාරින් කැඳෙව්වොත් මම කියන්නේ නිලධාරිනුත් එයි. යම් විවේචනාත්මකව විවෘත ස්වරූපයකින් අපට ඒවා ගැන කථා කරන්නත් පුළුවන්. හැබැයි ප්‍රශ්නය තිබෙන්නේ ඊට වඩා ප්‍රායෝගික භාවිතාවෙන් මේවා කරන්න තමන් සූදානම්ද කියන දේ දැනෙන්න ඕනෑ, කැබිනට් මණ්ඩලය පැත්තෙන්; ආණ්ඩුව පැත්තෙන්.

හේතුව, විෂයයන් වෙන් කරන කොට හා මුදල් වෙන් කරන කොට ඇමති ධුර බෙදීම අනුව නොවෙයි වෙන් කළ යුත්තේ. විෂයයන් බෙදලා ඇමති ධුර දෙන්න ඕනෑ. ඉස්සෙල්ලා විෂයයන් බෙදන්න ඕනෑ, විද්‍යා ක්ෂේත්‍රයේ විෂයයන් ටික මොනවාද, කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයේ විෂයයන් ටික මොනවාද, කාර්මික ක්ෂේත්‍රයේ විෂයයන් ටික මොනවාද, අධ්‍යාපන හා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විෂයයන් ටික මොනවාද කියලා. එතකොට ඇමති ධුර ප්‍රමාණයක් එයි. විෂයයන් අනුව බෙදුවාට පස්සේ එන්නේ ඇමති ධුර 30ද, 40ද, කීයක් හෝ කමක් නැහැ කියමු කෝ. ඒවාටයි ඇමති ධුර දෙන්න ඕනෑ. දැන් එහෙම නොවෙයි නේ. ඉස්සර වෙලා බලනවා ඉන්න පිරිස කොහොමද, මොන පක්ෂයේද ඉන්නේ කියලා. කවුරුත් පක්ෂය යටතේ තියා ගන්න ඕනෑ. ඒ හින්දා බෙදනවා විෂයයන්. දැන් පුද්ගලයාටයි විෂයයන් බෙදන්නේ. ඊට පස්සේ තමන්ගේ කැමැත්ත, අකැමැත්ත අනුව මුදල් වෙන් කරනවා. එහෙම මුදල් වෙන් කළාම සමහර ඇමතිවරුන්ට ලැබෙනවා සොච්චමක්. එහෙම නැත්නම් සමහර ඇමතිවරුන්ට හම්බ වෙන්නේ කොඩියයි, කාර් එකයි විතරයි. විෂයයක් නැහැ. අමාත්‍යාශයක් නැහැ. කරන්න රාජකාරියක් නැහැ. අපි හිතමු කරන්න රාජකාරියක් නැතුව, -ගරු තිස්ස විතාරණ ඇමතිතුමාගේ දුක්ගැනවිල්ල වාගේ- අමාත්‍යාංශයක් හම්බ වුණා කියලා. එහෙම අමාත්‍යාංශයක් හම්බ වෙලා ඒ

අමාත්‍යාංශයට මේ අය වැය කාරක සභාව පත් කළොතින්, මේ කාරක සභා තත්ත්වය ගෙනාවොතින් මොනවාද අපිට කථා කරන්න තිබෙන්නේ? මම කියන්නේ, දැන් අපි ප්‍රායෝගික භාවිතයෙන් ගත්තාම ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන්ගේ විෂයයන් අනුව ගිහිල්ලා මේ කාරක සභාවම ප්‍රායෝගික යථාර්ථයට ගෙනාවොත් ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරු කියයි, "අපිට මුකුත් කරන්න සල්ලි නැහැ" කියලා. දැන් අපි මොනවාද කරන්නේ? එතැන තමයි ගැටලුව තිබෙන්නේ. ඒ ගැටලුව විසඳන්න ඕනෑ. ඒ ගැටලුව විසඳලා අය වැය කාරක සභාව ගෙනෙනවා නම්, මම හිතන්නේ මේක ඉතාම ප්‍රායෝගික, සාධාරණ යෝජනාවක් කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊ ළඟට අපි මේ අය වැය කාරක සභා තත්ත්වය ගැන කථා කළොත්, අපි අය වැය සම්මත කරනවා නේ. අපි පාර්ලිමේන්තුවේ දවස් 26ක් විතර විවාද කරලා, කාරක සභා අවස්ථා කැඳවලා, අය වැය සම්මත කරනවා. ඊට පස්සේ සම්මත කරපු අය වැයට අනුව රටේ වැඩ කටයුතු සිද්ධ වෙනවාද කියලා කවුද අධීක්ෂණය කරන්නේ? කවුද හොයලා බලන්නේ? කාටද වග කියන්නේ? කවුරුත් කාටවත් වග කියන්නේ නැහැ. ඊ ළඟට නැවත සිද්ධ වෙන්නේ සම්මත කරපු අය වැය පැත්තකින් තියලා, ඊට පිටින් තමයි කටයුතු සිද්ධ වෙන්නේ. මම ඒකට ඔබතුමාට උදාහරණයක් කියන්නම්. දැන් මේ පාර්ලිමේන්තුවට අමාත්‍යාංශවලින් වෙනම පරිපූරක ඇස්තමේන්තු ගෙනෙනවා. ඒ පරිපූරක ඇස්තමේන්තු අතිවිශාල මුදලක්, මිලියන ගණනක් වෙන්නේ ඇයි?

සමහර අමාත්‍යාංශවලට අය වැයෙන් වෙන් කළාට වඩා වැඩියි පරිපූරක ඇස්තමේන්තුවෙන් වෙන් කරන ප්‍රමාණය. මොකද, ඒකට හේතුව? ඇස්තමේන්තුව යථාර්ථවාදී නැහැ. ජූලි මාසය අවසාන වන කොට, අගෝස්තු මාසය මුල විතර වන කොට මුදල් අමාත්‍යාංශයෙන් අමාත්‍යාංශවලට කියනවා, ඇස්තමේන්තු එවන්න කියලා. එතකොට ලේකම්තුමා කලින් ඇස්තමේන්තුව බලලා, ඒකට සියයට 5ක්, 10ක් එකතු කරලා යවනවා. හැබැයි ඇස්තමේන්තු ඇතුළේ තිබෙනවාද ව්‍යාපෘති? ඇස්තමේන්තු ඇතුළේ තිබෙනවාද මහ ජනතාවගෙන් ආපු යෝජනා? ගම්බිම් මට්ටමෙන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන්, විපක්ෂයෙන් ආපු අදහස්? ඒවා නැහැ. තිබෙන්නේ මොකක්ද? පසු ගිය වසරේ ඇස්තමේන්තුවට සියයට 10ක් එකතු කරලා යවන එකයි. මේ මොකටද? ඇයි, මුදල් අමාත්‍යාංශයෙන් ඇස්තමේන්තු ඉල්ලනවා නේ. ඉල්ලන හින්දා යවනවා. හැබැයි ඊට පස්සේ වැඩ කර ගෙන යන කොට අන්න අර දේශපාලන බලය අනුව, ආණ්ඩුවේ තමන්ට තිබෙන තනතුර අනුව, ඒ ඇමති ධුරයට තිබෙන බලය - powers - අනුව පුළුවන්කම තිබෙනවා නම් කරනවා, බැරි නම් ඉන්නවා. සමහර ඇමතිවරු අපට ඒ දුක් ගැනවිල්ල කියනවා. සමහර ඇමතිවරු කියනවා, "ඉතින් අපි ඔහේ ඉන්නවා. අපට කරන්න දෙයක් නැහැ" කියලා. අද ජ්‍යෙෂ්ඨ අමාත්‍යතුමන්ලා කියන්නේ ඒකයි. ගරු තිස්ස විතාරණ ඇමතිතුමා බොහොම වැදගත් විධියට, අවංකව කිව්වේ ඒකයි. සමහර තැන්වලට ඕනෑවටත් වඩා වෙන් වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මම පරිපූරක ඇස්තමේන්තු පිළිබඳ විස්තරයක් **සභාගත*** කරනවා. මම මේ විස්තරය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන්න කියලා මා ඉල්ලා සිටිනවා.

2009 අවුරුද්දේ මැයි මාසයේ 29 ඉඳලා නොවැම්බර් මාසයේ 17 වන දා දක්වා, අය වැය ඉදිරිපත් කරන දවස දක්වා අනුමත වෙච්ච පරිපූරක ඇස්තමේන්තු ප්‍රමාණය මෙහි සඳහන් වනවා. රුපියල් මිලියන හැත්තෑදෙදහස් තුන්සිය තිස්තුනකුත්, හය ලක්ෂ තුන්දහස් නවසිය තිස්අටක -මිලියන හැත්තෑදෙකක- පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කරලා තිබෙනවා. එතකොට ඒ අය වැයට පිටින්. ඒ කියන්නේ ඇත්තටම ගත්තොත් මූල්‍ය දුර්වලතාවක්. මූල්‍ය පාලනයේ දුබලතාවක්. අය වැයට පිටින් පරිපූරක ඇස්තමේන්තුවලට 2009 අවුරුද්දේ විතරක් රුපියල් මිලියන හැත්තෑදෙදහස් තුන්සියතිස් ගණනක්. එතකොට සමහර අමාත්‍යාංශ ගත්තොත්, ඇත්තටම රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වාගේ ගත්තොත් ඒ වෙලාවේ තිබුණු තත්ත්වයත් එක්ක මේ ගණන සාධාරණ වෙන්න පුළුවන්.

අනපේක්ෂිත යුද්මය වියදම් දරන්න සිද්ධ වෙනවා. සුනාමිය වාගේ ස්වාභාවික විපත්තියක් ආවොත් එතකොට එතැන අනපේක්ෂිත තත්ත්වයක් තිබෙනවා. හැබැයි සමහර අමාත්‍යාංශ එහෙම නොවෙයි. අපනයන සංවර්ධන අමාත්‍යාංශය සඳහා රුපියල් මිලියන 8016යි. ප්‍රවාහන අමාත්‍යාංශය, වැවිලි අමාත්‍යාංශය - Ministry of Plantation Industries, Ministry of Water Supply and Drainage වැනි අමාත්‍යාංශ හැමදාම ඇස්තමේන්තු කරන්න පුළුවන් ඒවායි. ඒවා මහා දැවැන්ත වෙනස්කම් සිදු වෙන ඒවා නොවෙයි. හැබැයි ඒවාටත් පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කරනවා.

ඒ තත්ත්වයන් වළක්වන්න තමයි මේ ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව වැදගත් වෙන්නේ. ඒ තත්ත්වය වළක්වා, ඇස්තමේන්තුව ගෙනල්ලා මේ කියන ඉලක්කම යථාර්ථවාදීද නැද්ද, මේක ප්‍රායෝගිකව ලබන අවුරුද්දේ ක්‍රියාවට නඟන්න පුළුවන්ද බැරිද, ඒක ප්‍රායෝගිකව ක්‍රියාවට නඟන්න ලේකම්තුමන්ලා ළඟ තිබෙන යෝජනා මොනවාද, නිලධාරින් මේ ඇස්තමේන්තුව පිළිඅරගෙනද තිබෙන්නේ, මේ ඇස්තමේන්තුවට අනුව වැඩ කරනවාද කියන කරුණු ගැන එකඟතාවක් හදන්න ඕනෑ. එහෙම බැඳීමක් හදන්න ඕනෑ. මම කියන්නේ ඒකයි. විපක්ෂයේ අපේ විතරක් නොවෙයි.

විපක්ෂයේ, නිලධාරින්ගේ, ජනතාවගේ බැඳීමක් හදන්න ඕනෑ, මෙන්න මේ ඉලක්කය සම්පූර්ණ කරන්න අපි කවුරුත් වැඩ කරනවාය කියා. ප්‍රශ්නය තිබෙන්නේ දැන් එහෙම නොවෙන එකයි. ආණ්ඩු පක්ෂයෙන්වත් ඒකට සහයෝගයක් ලැබෙන්නේ නැති ස්වභාවයක් තමයි මේ විවාදයේදී තිබෙන කම්මැලි ස්වභාවයෙන් පෙනෙන්නේ. කම්මැලි ස්වභාවයයි කියා මම කියන්නේ ඒක වෙනස් කරන්න ඕනෑ නිසයි. ඒක වෙනස් කිරීම දක්වා ගෙන යන්නේ කොහොමද? ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා කළ ප්‍රකාශයෙන් කොටසක් කියා මගේ කතාව අවසන් කරනවා. එතුමා ඉතා වැදගත් ප්‍රකාශයක් කළා. එතුමා කිව්වා, "සුර දූතයින් විසින් මිනිසුන් පාලනය කරනවා නම් රාජ්‍ය අවශ්‍ය වෙන්නේ නැහැ; මිනිසුන් විසින් මිනිසුන් පාලනය කරන නිසා තමයි රාජ්‍ය අවශ්‍ය වෙන්නේ, පාලනයක් අවශ්‍ය වෙන්නේ" කියා. ඒකයි ඇත්ත. ඒ වාගේම එතුමා කිව්වා, මිනිසුන් විසින් මිනිසුන් පාලනය කරනවාය කියා. දැන් ඒක එහෙම නොවෙයි වෙලා තිබෙන්නේ. මිනිසුන් විසින් මිනිසුන් පාලනය කරන එක නොවෙයි දැන් වෙන්නේ. ඉතාම අතළොස්සක් දෙනා විසින් - රටවැසියන් කියන ආකාරයට නම් පවුලක් විසින්- මිනිසුන් පාලනය කිරීමයි. එහෙම වෙන්න ගියාම තමයි පස්සෙන් යන්න වෙන්නේ. එතකොට තමයි ඇස්තමේන්තුවට කීයක් හරි ඉල්ලා ගන්නත් යන්න වෙන්නේ. අන්න ඒ තත්ත්වය වළක්වන්න මේ ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව ඉවහල් වේවිය කියා ඒ සඳහා එතුමාගේ ධෛර්යයට, මෙවැනි යෝජනාවක් ගෙන ඒමට මැදිහත් වීම ගැන ස්තුතිවන්ත වෙමින් මගේ අදහස් ප්‍රකාශ කිරීම නවත්වනවා. බොහොම ස්තුතියි.

---

***** කථාව අවසානයේ පළ කර ඇත.**

** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*

** Produced at end of speech.*

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

***සභාමේසය මත තබන ලද ලේඛනය :**
*சபாபீடத்தில் வைக்கப்பட்ட கூற்று :*
*Statement tabled:*

**Supplementary Estimates - 2009**

| Date | Supp. No. | Ministry | Amount |
|---|---|---|---|
| 2009.05.29 | 1 | Plantation | 450,000,000 |
| 2009.06.12 | 2 | Transport | 2,299,830,000 |
| 2009.06.12 | 3 | Industrial Development | 200,000,000 |
| 2009.06.23 | 4 | Export Development | 8,016,400,000 |
| 2009.06.23 | 5 | Finance | 350,000,000 |
| 2009.06.24 | 6 | Finance | 1,500,000,000 |
| 2009.07.07 | 7 | Agriculture | 2,500,000,000 |
| 2009.07.08 | 8 | Finance | 1,079,280,000 |
| 2009.07.16 | 9 | Sports | 50,000,000 |
| 2009.08.06 | 10 | Power and Energy | 2,400,000,000 |
| 2009.08.18 | 11 | Agriculture | 685,393,938 |
| 2009.08.18 | 12 | Nation building | 900,000,000 |
| 2009.09.08 | 13 | Re-settlement | 350,000,000 |
| 2009.09.24 | 14 | Urban Dev. | 1,715,000,000 |
| 2009.10.08 | 15 | Nation building | 7,877,500,000 |
| 2009.10.08 | 16 | Defence | 570,800,000 |
| 2009.10.08 | 17 | Defence | 19,681,000,000 |
| 2009.10.08 | 18 | Defence | 7,374,300,000 |
| 2009.10.08 | 19 | Defence | 2,950,000,000 |
| 2009.10.08 | 20 | Defence | 1,640,000,000 |
| 2009.10.08 | 21 | Defence | 1,630,500,000 |
| 2009.10.08 | 22 | Water Supply | 2,145,000,000 |
| 2009.10.09 | 23 | Highway | 408,000,000 |
| 2009.10.13 | 24 | Finance | 10,600,000 |
| 2009.11.03 | 25 | Re-settlement | 750,000,000 |
| 2009.11.17 | 26 | Agriculture | 50,000,000 |
| 2009.11.17 | 27 | Transport | 4,750,000,000 |
| Total Supplimentary Estimates for 2009 | | | **72,333,603,938** |
| Total Approved budget Estimate 2009 | | | 1,806,729,000,000 |

[අ. භා. 4.23]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා )**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා විසින් ගෙන එන ලද යෝජනාව පිළිබඳව වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව මම ඉතාම සතුටු වෙනවා. මෙම යෝජනාවේ සඳහන් අය වැය කාරක සභාව පිළිබඳව යම් අත් දැකීම් රාශියක් අවුරුදු දෙකකදී අපි අත් වින්දා. පසුගිය අවුරුදු දෙකේදී අය වැය යෝජනා සම්බන්ධයෙන් සමහර සීමිත අමාත්‍යාංශ ගණනාවක් පිළිබඳව අපි යම් ආකාරයක වැඩ පිළිවෙළක් සකස් කළා. විපක්ෂයේත් සහයෝගය ඇතිව ඒවා පුළුල් වශයෙන් සාකච්ඡා කිරීමට අවස්ථාවක් ලබා දුන්නා. මම හිතනවා, ඒ තුළින් අපි අත් දැකීම් රාශියක් ලබා ගෙන තිබෙනවාය කියා. ඒ අත් දැකීම් සියල්ලම ඉතාම ධනාත්මක වූ තත්ත්වයක් වෙත තමයි අපි තල්ලු කරලා තිබෙන්නේ. විශේෂයෙන් පාර්ලිමේන්තුව තුළ අපට සාකච්ඡා කිරීමට ඉඩ නොලැබෙන අවස්ථා රාශියක් නිලධාරින් සමඟ, අමාත්‍යතුමා සමඟ පුළුල් ලෙස සාකච්ඡා කරලා, යම් යම් දේවල් පිළිබඳව කරුණු කාරණා දැනගැනීමටත්, එම යෝජනා ක්‍රියාත්මක කිරීම පිළිබඳව පමණක් නොව පෙර වසරේ කරන ලද වියදම් පිළිබඳව හා එසේ ලබා දුන් මුදල් වියදම් නොකිරීම පිළිබඳව යම් යම් ප්‍රශ්න හා ගැටලු තිබුණා නම් එය මතු කර පෙන්වීමටත්, ඒ තුළින් ඉදිරි වර්ෂ තුළදී ඒ වැඩ කටයුතු වඩාත් කාර්යක්ෂම ලෙස කිරීම සඳහාත් නිලධාරින් මෙන්ම අමාත්‍යාංශ යොමු කිරීමටත් ඒ කමිටුව උපකාරී වුණාය කියා මා හිතනවා. නමුත් මා අද ඊට ඩවා පුළුල් වූ තලයකට මේ විවාදය ගෙන යාමට කැමැතියි.

අය වැය කමිටුව - Budget Committee - කියන එක ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට අලුත් සංකල්පයක් වුණත් ලෝකයේ බොහෝ පාර්ලිමේන්තුවලට මෙය අලුත් සංකල්පයක් නොවෙයි. විශේෂයෙන්ම අපේ පාර්ලිමේන්තුවේ මූලික කාර්යභාරයක් ලෙස රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ අනුමැතියට හා අධීක්ෂණයට ලක් වන අය වැය කමිටුවක් පැවතීමේ කාලීන අවශ්‍යතාවක් තිබෙනවා.

ඒ වාගේම, එහිදී වෙන් කළ යුතු මුදල් ප්‍රමාණයන් පිළිබඳ නියමයක් නොපැවතියත්, ආණ්ඩුවක් විසින් වියදම් කිරීමට යෝජිත මුදල් ප්‍රමාණය පිළිබඳ පාර්ලිමේන්තුවට අය වැය ඇස්තමේන්තු ලෙස ඉදිරිපත් කළ යුතු වන අතර, පාර්ලිමේන්තුව සෑහීමට පත් වන අයුරින් යෝජිත වියදම් සාධාරණීකරණය කළ යුතු වෙනවා. මූල්‍ය ක්‍රියාමාර්ග තුළින් සැලසුම් කිරීම පාලනය හා වගකීම ආවරණය කරනු ලබන අතර, එයට ඇස්තමේන්තු, නව වියදම් හා බදු අය කිරීම් ඇතුළත් වෙනවා. රාජ්‍ය මුදල් පාලනය කරනු ලබන්නේ මුදල් පනත් කෙටුම්පත්, වාර්ෂික අය වැය, පරිපූරක ඇස්තමේන්තු, පොදු ආයෝජන ගිවිසුම් හා කාරක සභා පරීක්ෂාවද තුළින් වේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය මුදල් පිළිබඳ ප්‍රධාන වගකීම් වනුයේ, කිසියම් නිශ්චිත සේවාවක් වෙනුවෙන් වෙන් කළ මුදල් වෙනත් සේවාවක් වෙනුවෙන් වියදම් නොකළ යුතුය; වෙන් කරන මුදල, වෙන් කළ හැකි උපරිම මුදල් ප්‍රමාණය විය යුතුය; වෙන් කරන ලද මුදල් අදාළ මුදල් වර්ෂය තුළ වියදම් කළ යුතුය; මුදල් නිසි පරිදි උපයෝගී කර නොගතහොත්, එය නැවත භාණ්ඩාගාරයට හරවා යැවිය යුතුය යන කාරණායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපට ඉතාමත්ම වැදගත් වෙනවා, අය වැය කාරක සභාවක් ස්ථාපිත කිරීම. මේ පිළිබඳව අපේ අල්ලපු රට වන ඉන්දියාවේ පාර්ලිමේන්තුව තුළ 1950 වර්ෂයේදී පළමු වතාවට ඇස්තමේන්තු කමිටුවක් පත් කරන ලද අතර, ලෝක් සභා සාමාජිකයන් අතුරින් තිස් දෙනෙකු එහි සාමාජිකයන් ලෙස පත් කර ගත්තා. කථානායක විසින් එහි සභාපති පත් කරනු ලබන අතර, අමාත්‍යවරයෙකුට අදාළ කමිටුවේ සාමාජිකයකු ලෙස පත් විය නොහැකියි. මේ ක්‍රමය තමයි 1950 වර්ෂයේ පටන් දශක ගණනාවක් තිස්සේ ඉන්දියාවේ තිබෙන්නේ.

ඉන්දියානු අය වැය ඇස්තමේන්තු කමිටුවේ මූලික කාර්ය භාරයන් වන්නේ, ඇස්තමේන්තුවෙන් ස්ථාපිත කරන ලද ප්‍රතිපත්තීන්ට අනුකූලව කවර ආර්ථිකයන් සහ ආයතනයන් වැඩි දියුණු කිරීම සහ කාර්යක්ෂම කිරීම සිදු කරනු ලැබේද; ආර්ථිකයේ පරිපාලනමය කාර්යක්ෂමතාව ඇති කරලීම උදෙසා කවර ආකාරයේ ප්‍රතිපත්ති යෝජනා කළ යුතුද යන්න; ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමට වෙන් කළ මුදල් අදාළ සීමාව තුළ යෙදවූයේ ද යන්න සොයා බැලීම හා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරෙන්නේ කවර ආකාරයේ ඇස්තමේන්තු ද යන්න පිළිබඳව අවධානය යොමු කිරීමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා ඉන්දියාව දැනට අප විසින් ක්‍රියාත්මක කරන ලද කාරක සභා ක්ෂේත්‍රයට වඩා ඉතා පුළුල් වූ මුදල් කාරක සභාවක් 1950 වර්ෂයේ සිටම ක්‍රියාත්මක කර ගෙන එනවා. ඒ වාගේම ඒ පිළිබඳව දීර්ඝ සහ විස්තරාත්මක කරුණු කථා කිරීමට අවශ්‍ය වන්නේ නැහැ.

Page 3 of the document on Estimate Committee under the heading "Achievements" states, I quote:

> "Since its inception in April, 1950, the Committee has presented 922 Reports covering almost all the Ministries/ Departments of the Government of India. Out of these 480 are the Original Reports and 442 are Reports on Action Taken by the Government on earlier Reports of the Committee. "

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙයින් පෙනෙනවා ඉන්දියාවේ මොන තරම් පුළුල් ආකාරයට Estimate Committee එක, එහෙම නැත්නම් Budget Committee එක ස්ථාවර කමිටුවක් වශයෙන් කටයුතු කරලා තිබෙනවාද කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට ඇමෙරිකා කොංග්‍රසයේ -පාර්ලිමේන්තුව- අය වැය කාරක සභාවේ ආරම්භය 1974 තරම් අතීතයට දිවෙන අතර, ජනාධිපති විසින් වාර්ෂිකව ඉදිරිපත් කරනු ලබන ෆෙඩරල් අය වැය රටේ සංවර්ධන ප්‍රතිපත්තීන්ට අනුකූල වෙමින් රජයේ ණය ප්‍රමාණය ඉක්මවා නොයන දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් මත පවතින්නක්ද යන්න අධීක්ෂණයට ලක් වීමත්, සෙනෙට් සභිකයන් සහ නියෝජිත මන්ත්‍රී මණ්ලයේ සාකච්ඡාවට භාජනය කොට තව දුරටත් යෝජනා මඟින් සංවර්ධනයට ලක් කිරීමත් මෙකී කාරක සභාවේ කාර්ය භාරය වේ.

ඔබතුමාට පෙනෙනවා, ඇමෙරිකා එක්සත් ජනපදය වාගේ රටවල ජනාධිපතිතුමා ඉදිරිපත් කරනු ලබන අය වැය ලේඛනය සංවර්ධන ප්‍රතිපත්තිවලට කොච්චර අනුකූලද, රජයේ ණය ප්‍රමාණය ඉක්මවා නොයන දීර්ඝකාලීන වැඩ පිළිවෙළක් මත ඒක පවත්වා ගෙන යනවාද කියන කාරණය. මෙන්න මෙවැනි දේවල් මේ කාරක සභාව තුළ සාකච්ඡා වෙනවා. මේ සඳහා පාදක වූ නීතිමය තත්ත්වයක් වනුයේ Congressional Budget and Impoundment Control Act of 1974. විශේෂ පාර්ලිමේන්තු පනතක් මඟින් මේ කමිටුවට ලබා දෙන බලතල හා සීමාවන් නිර්ණය කරලා තිබෙනවා. මේ අය වැය කාරක සභාව විසින් අය වැය අංශ පහක් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනවා. ඒවා නම් අය වැය රාමුව, රාජ්‍ය ආයතන, රාජ්‍ය ආදායම, අතිරික්තය සහ හිඟයන් මෙන්ම රාජ්‍ය ණය යන අංශ වේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේකෙන් පෙන්වනවා, මේ න්‍යාය එහෙම නැත්නම් මේ අදහස අද ලෝකයේ දියුණු පාර්ලිමේන්තුවල කොයි තරම් දුරට උපයෝගී කර ගෙන තිබෙනවාද කියන එක.

ඊළඟට මම කියන්න කැමැතියි, European Parliament's Committee on Budgets කියන එක ගැන. ඒ කියන්නේ යුරෝපා පාර්ලිමේන්තුවේ මේ වාගේ Budget Committee එකක් තිබෙනවා.

According to the European Parliament's Committee on Budgets, the 2012 European Voice states, I quote:

> "Budgetary powers were among the first to be acquired by the Parliament and have been further strengthened with the entry into force of the Treaty of Lisbon. The European Parliament now approves, on an equal footing with the Council, all the expenditure contained in the annual budget of the European Union.
>
> With 43 members and the same number of substitute members, the Committee on Budgets is mainly responsible for drafting the Parliament's position on the EU's annual budget (EUR 147.2 billion in commitments and EUR 129.1 billion in payments for the financial year 2012).
>
> In addition to that, the Budgets Committee is also in charge of preparing the negotiations of the Multiannual Financial Framework (or financial perspective) which determines the framework for the annual budgetary procedures for a period
>
> of 7 years. Following the entry into force of the Treaty of Lisbon, where it was once again reiterated that the EU Budget has to be fully financed by own resources, the Budgets Committee is now working on some important legislative
>
> proposals aiming at reintroducing genuine revenue into the EU public purse."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා ඔබතුමාට පෙනෙනවා ඇති විශේෂයෙන්ම යුරෝපා පාර්ලිමේන්තුවේ දීර්ඝකාලීන ආර්ථික වැඩ පිළිවෙළ ගැනත්, මුදල් ලබා ගැනීම පිළිබඳව වූ කරුණු ගැනත් මේ කමිටුව මඟින් සුවිශේෂ වූ අධ්‍යයනයක් හා ප්‍රවේශයක් ඇති කරලා රටේ දීර්ඝකාලීන ආර්ථික සංවර්ධනය සඳහා විශාල දායකත්වයක් ලබා දී තිබෙන බව. ඒ රටවල සිදු වෙලා තිබෙන, ඒ පාර්ලිමේන්තු තුළ ඉටු වන මේ කාරණා පිළිබඳව අපේ අවධානය යොමු කර මේ යෝජනාව වඩාත් පුළුල් ලෙස සාකච්ඡා කරලා, අපි කුමන ආකාරයකින් ශ්‍රී ලංකාවේ බිම් මට්ටමේ තත්ත්වයන්ට ගැළපෙන පරිදි මෙය සකස් කළ යුතුද කියා කල්පනා කිරීමට අපට අවස්ථාව ලැබෙනවා.

ඊළඟට මම විශේෂයෙන්ම කියන්නට කැමැතියි, "International Symposium on The Changing Role of Parliament in the Budget Process" කියලා සුවිශේෂ වූ සම්මන්ත්‍රණයක් පැවතුණු බව.

The printed version of the above symposium states, I quote:

> "Budget Reforms and Parliament's Role in the Process: Experiences in Turkey and Selected EU Member Countries"

මේ පිළිබඳව අද ලෝකයේ බොහෝ රටවල අවධානය යොමු වෙලා තිබෙනවා. විවිධ රටවල නීති සම්පාදනයට අදාළ වූ ප්‍රධාන පුද්ගලයින් එකතු වෙලා අද මේ පිළිබඳව සාකච්ඡා කරනවා. එවැනි වකවානුවක තමයි අපේ ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ.

විශේෂයෙන්ම එහි දී යුරෝපා පාර්ලිමේන්තුවේ එම Budget Committee එකේ සභාපති වූ Herbert Boesch මහතා විසින් කරන ලද ප්‍රකාශ කිහිපයක් උපුටා දැක්වීම ඉතාම වැදගත් කියලා මම හිතනවා.

He states, I quote:

> "A Committee for Budget and another for Budgetary Control:
>
> The increasing complexity - and workload - as regards both the establishment and the control of the budget for a modern society makes it necessary for a parliament to have a specific committee for the two different functions.

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

Parliaments are free to organize the work as they find best and the absence of a constitutional provision for the creation of a specific control committee cannot be seen as a hindrance. On the contrary, a Parliamentary initiative to create a separate control committee would be a strong signal to the public showing that Parliament cares about the use of public money. "

මේ අනුව ඒ පිළිබඳ යම් යම් මහ පෙන්වීම් අපට ඉතා පැහැදිලිව දකින්නට තිබෙනවා.

He further states, I quote:

"A parliamentary control committee should not be too big. The Committee on Budgetary Control in the European Parliament has 40 Members which some consider being a bit too many."

“Matters mainly depending on the committee's own decisions"; "Focus"; "Accept the role"; "Relations with the sector specific committees", මේ වාගේ කාරණා රාශියක් පිළිබඳව ඔවුන්ගේ අවධානය යොමු කර තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම මේ Committee system එක පිළිබඳව විශේෂයෙන්ම P.D.T. Achary, Editor in his "Practice and Procedure of Parliament" කියන පුස්තකයේ පරිච්ඡේදයක දැක්වෙන සුවිශේෂ කොටස් කිහිපයක් මම කියවන්නට කැමැතියි.

In page 867 under the heading "Committee on Estimates" states, I quote:

"The Lok Sabha, even though it discusses the estimates for a sufficiently long period, nevertheless finds that it has neither the time nor the flexibility to discuss the details and the technical aspects of the estimates. The Lok Sabha has, therefore, set up a Committee called the Committee on Estimates for this purpose."

It further states, I quote:

"It was in 1937 that an enquiry was first made in the Central Assembly whether the Government had any proposal for the setting up of an Estimates Committee on the lines of the Select Committee on Estimates of the House of Commons."

අපි ශ්‍රී ලංකාවේ දැනට අවුරුදු දෙකකට පෙර අය වැය කාරක සභාව පටන් ගත්තා වාගේම 1937දී ඉන්දීය පාර්ලිමේන්තුව තුළත් මෙවැනි කොමිටියක් පත් කිරීම පිළිබඳ කරුණු මතු වුණා.

It goes on to state, I quote:

"In 1949, the Secretary of the Constituent Assembly (Legislative), in a Memorandum on the reform of Parliamentary Procedure in India, emphasized the need for subjecting the estimates, presented to Parliament to a detailed examination. Since sufficient parliamentary time could not obviously be made available for examining in detail the estimates ...."

මෙවා පිළිබඳ සාකච්ඡා කිරීමට සාමාන්‍යයෙන් පාර්ලිමේන්තු තුළ ප්‍රමාණවත් කාල සීමාවක් ලැබෙන්නේ නැති නිසා මෙවැනි කොමිටියක අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සඳහා 1949 දී මේ Constituent Assembly එකට Memorandum එකක් ඉදිරිපත් කළා. ඊට පස්සේ මොකද වුණේ?

It further states, I quote:

"......... House endowed with necessary powers to examine both the appropriation accounts and the estimates. The proposal was 'strongly supported' by Speaker Mavalankar. The Government accepted this recommendation and the Minister of Finance referred to it in his Budget speech on 28 February 1950."

මේ තමයි, ඉන්දීය පාර්ලිමේන්තුව තුළ මෙම Budget Committee එක විකාශනය වූ ආකාරය, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ශ්‍රී ලංකාව තුළ මේ අදහස ක්‍රියාත්මක කරන්න අපට ප්‍රමාදයක් ඇති වෙලා තිබෙනවා. මීට පෙරයි මේ ප්‍රශ්නය පිළිබඳව අපට සාකච්ඡා කරන්න තිබුණේ. නමුත් අද ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා මේ කාරණය සුවිශේෂ ලෙස අපේ අවධානයට යොමු කරලා තිබෙනවා. අද ලෝකයේ වෙනත් රටවල්වල, වෙනත් පාර්ලිමේන්තු තුළ මුදල් පිළිබඳ වගකීම නිසි ලෙස ඉෂ්ට කරමින්, රටේ ජාතික ආර්ථිකය වඩාත් සංවර්ධනය කරමින් ඉදිරියට යාම සඳහා ගරු මන්ත්‍රීතුමා කියනවාටත් වඩා පුළුල් ආකාරයේ ස්ථාවර කමිටුවක් ස්ථාපනය කිරීමෙන් සුවිශේෂී ලාභ රාශියක් අපට ලබා ගන්න පුළුවන් බව මගේ අදහසයි.

අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා තමයි මේ රටේ ජනතාවගේ නියෝජිතයන් වශයෙන් ඉන්නේ. මුදල් පරිපාලනය කිරීමත්, එයින් නිසි ලෙස ප්‍රතිලාභයක් රටේ ජනතාවට ලබා දීමත් පාර්ලිමේන්තුවේ වග කීමයි. මේ කමිටුවේ වැදගත්කම පිළිබඳව, මෙවැනි කමිටුවක් ස්ථාපිත කිරීමට තිබෙන අවශ්‍යතාව පිළිබඳව, කමිටුවේ වැඩ පිළිවෙළ, කමිටුවේ වපසරිය, කමිටුව මඟින් කළ යුතු කාර්ය භාරයන් හා කමිටුවේ බලතල පිළිබඳව ලෝකයේ වෙනත් පාර්ලිමේන්තු රාශියකින් පූර්වාදර්ශ රාශියක් අපට ලබා ගන්න පුළුවන්. එම පූර්වාදර්ශ ලබා ගනිමින් අපට මෙය ඉටු කිරීමට අවස්ථාවක් ලැබේවායි කියා මා ප්‍රාර්ථනා කරනවා.

ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා මෙම යෝජනාව ඉදිරිපත් කරමින් අපගේ අවධානය ඒ සඳහා යොමු කරවීම පිළිබඳව එතුමාට ස්තුතිවන්ත වනවා. ඒ තුළින් අපට ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් අදහස් රාශියක් ගොනු කර ගන්න පුළුවන් වුණා. මෙම විවාදය පැවැත්වීමේ අරමුණ වුණේ, මෙම කාරණය පිළිබඳව අපේ නවක පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ මෙන්ම දීර්ඝ කාලයක් මේ පාර්ලිමේන්තුව තුළ සේවය කළ මන්ත්‍රීතුමන්ලාගේ, ඇමතිතුමන්ලාගේ අදහස් උකහා ගෙන ඒ තුළින් යම් ක්‍රමවේදයක් සකස් කිරීම බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 4.42]

**ගරු ජෝන් අමරතුංග මහතා**
**(மாண்புமிகு ஜோன் அமரதுங்க)**
(The Hon. John Amaratunga)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තිලංග සුමතිපාල මන්ත්‍රීතුමාගේ යෝජනාව කාලෝචිතයි; ප්‍රායෝගිකයි. මම එහෙම කියන්නේ ඇයි? මා ටිකක් හොයලා බැලුවා. අපි මේ පාර්ලිමේන්තුව දුවවන්න පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරු පත් කරන්න පසු ගිය මහා මැතිවරණයේදී රුපියල් මිලියන 1,954ක් වියදම් කරලා තිබුණා. ඒ, මහා මැතිවරණයක් තියලා මේ පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරු ගෙනෙන්නයි; දෙපැත්තේම 225 පත් කර ගන්නයි. ජනාධිපතිවරණයට රුපියල් මිලියන 1,857ක් වියදම් කරලා තිබුණා. මේවා ඔක්කොම මේ රජය, පාර්ලිමේන්තුව කරවන්න යන වියදම්.

ඒ තත්ත්වය එහෙම තියෙද්දී අපි බැලුවා, මේ පාර්ලිමේන්තුවේ වාර්ෂික පුනරාවර්තන වියදම ගැන. රුපියල් මිලියන 1,500යි. ඒ විතරක් නොවෙයි, ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 150ත්, 200ත් අතර ප්‍රමාණයක් වනවා. පාර්ලිමේන්තුව දින 100ක් රැස් වෙනවා නම් විශේෂයෙන්ම පුනරාවර්තන වියදම සියයෙන් බෙදුවාම, අප මේ රැස් වන දිනයක වියදම ලෙස රුපියල් මිලියන 15ක් එනවා. මේ යථාර්ථය මඟින් මා පෙන්නුම් කරන්න හදන්නේ මොකක්ද? මේ සා විශාල මුදලක් අපි මේ රටේ වියදම් කරනවා. මේ පාර්ලිමේන්තු ක්‍රමය තුළින් -දැන් පවතින ක්‍රමය අනුව- මේ වියදම් කරන මහා මුදලේ අගය -value for money - අපට අද ලබා ගන්න පුළුවන් වෙලා තිබෙනවාද කියලා දැන් අපි බලන්න ඕනෑ.

පසු ගිය සැරේ අපේ නායකතුමා ගෙන ආ අය වැය කමිටුව - ඇස්තමේන්තු කමිටුව- පිහිටුවලා අමාත්‍යාංශ 21ක් සමඟ සාකච්ඡාවක් කිරීමේ යෝජනාවට අපේ නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාත්, දිනේෂ් ගුණවර්ධන මැතිතුමාත් එකඟ වුණු එක ගැන අපි සන්තෝෂ වනවා. දැන් අපේ නායකතුමා එතුමාගේ කථාවේදී කිව්වේ මොකක්ද? එතුමා තිලංග සුමතිපාල මැතිතුමා ගෙනැල්ලා තිබෙන මේ යෝජනාවෙන් ඔබ්බට ගිහින් තිබෙනවා. අය වැය ඇස්තමේන්තු කමිටුව පමණක් නොවෙයි. මීට අමතරව අධීක්ෂණ කමිටුවක් -මේ මුළු රටේම පරිපාලනයේ තිබෙන සියලු අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ආයතනවල ක්‍රියා දාමය පරීක්ෂා කරන්න, එහෙම නැත්නම් ඒවා නිරීක්ෂණය කිරීම සඳහා වන කමිටුවක්- සහ මුදල් අධීක්ෂණ කමිටුවකුත් කියන ඔය කමිටු තුනම ගැන තමයි එතුමා කථා කරන්නේ. අඩු තරමින් පාර්ලිමේන්තු ඇස්තමේන්තු කමිටුවවත් පසු ගිය අය වැය විවාදයට ඉස්සෙල්ලා පත් කර ගෙන ඒ අධීක්ෂණ කටයුතු කරන්න අපට අවස්ථාව ලැබිච්ච එක ගැන අපි සතුටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහිදී අපි දැක්ක දෙයක් තමයි, ඒ ඒ අමාත්‍යාංශයේ වැය ශීර්ෂයේ මුදල් වෙන් කරලා තිබෙන ප්‍රමාණය, පසු ගිය කාලයේ ඒවා වියදම් කරපු ආකාරය. විෂය භාර ඇමතිවරයා පමණක් නොවෙයි, නිලධාරිනුත් ඒ රැස්වීම්වලට සහභාගි වුණා. නිලධාරින් ඒ කොමිටි රැස්වීම්වලට පැමිණිය යුතුයි කියලා අපි අනිවාර්ය කෙරුවා. ඒ නිසා අපි කොමිටියේ ඉන්න මන්ත්‍රීවරුන් හැටියට පමණක් නොවෙයි, මේ සභාවේ ඉන්න සියලු මන්ත්‍රීවරුන්ට ඒ කොමිටිවලට ඇවිල්ලා ඒවායේ තිබෙන වග විස්තර දැන ගැනීමට පවා, එහෙම නැත්නම් නිලධාරින්ගෙන් ප්‍රශ්න කිරීමට පවා අවස්ථාව ලැබුණා. ඒකයි එහි වටිනාකම. දැන් අපි මේ පාර්ලිමේන්තුවේ කාරක සභා අවස්ථාවේදී අය වැය ඇස්තමේන්තු ගැන සාකච්ඡා කරද්දී මෙතැන ඉඳ ගෙන විවිධ ප්‍රශ්න පිළිබඳව කථා කරනවා. නමුත් කිසිම නිලධාරියෙකුගෙන් ප්‍රශ්නයක් අහන්න අපට අවස්ථාවක් නැහැ. අපට ප්‍රශ්න අහන්න පුළුවන් ඇමතිවරයාගෙන් පමණයි. පැය දෙකක් විතර කථා කරලා, අපේ ආසනවල තිබෙන ප්‍රශ්න කථා කරලා එහෙම නැත්නම් ලෝකයේ නැති අනම් මනම් අනවශ්‍ය ප්‍රශ්න කථා කරලා, - තමුන්නාන්සේ දන්නවා නේ මෙතැන කැ කෝ ගහ ගන්න කොට තමුන්නාන්සේ කැ ගහලා එළියට දාන්න හදනවා. ඉතින් ඒවා වුණා මිසක්-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
කාවද, කාවද?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
හැම දාම වෙන සිද්ධියක් නේ තමුන්නාන්සේ ඒ පැත්තේ ඉඳන්

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
තමුන්නාන්සේ මූලාසනය ගැනද ඔය සඳහන කළේ?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
නැහැ, නැහැ. ඒක දැන් අවශ්‍ය නැහැ. මගේ කාලය ගන්න එපා. තමුන්නාන්සේ කලබල වෙන්න එපා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Chief Opposition Whipට මට ආපසු සැරයක් මතක් කරන්න වෙනවා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
කෙසේ වෙතත් මම අහන්නේ මේකයි. අපි මේ සා විශාල මුදලක් වැය කරලා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පත් කර ගන්නවා. පාර්ලිමේන්තුවේ අවුරුද්දකට රුපියල් මිලියන 1,500ක්, ඒ වාගේම රුපියල් මිලියන 1,700ක් වියදම් කරනවා. ඒ කරන වියදමේ වටිනාකමක් අද මේ රටට ලැබිලා තිබෙනවාද කියන එකයි මම අහන්නේ. අපේ ඩිව් ගුණසේකර ඇමතිතුමාගෙන් මම එක ප්‍රශ්නයක් අහන්න කැමැතියි. අවුරුද්දකට මෙසේ මුදල් වෙන් කරද්දී මොකද වෙන්නේ කියලා මේ ඇමතිවරු දන්නවාද කියා මම අහනවා. ජනාධිපති ලේකම් සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම් එක්කාසු වෙලා තමයි මේ මුදල් වෙන් කරන කටයුත්ත කරන්නේ.

ඒ කටයුත්ත කරලා අහවල් මන්ත්‍රීවරයාට මෙච්චරයි; අහවල් ඇමතිවරයාට මෙච්චරයි කිව්වාම ඔක්කෝම කර බාගෙන ඒක භාරගෙන නිකම් ඉන්නවා. මේ ක්‍රමය නැති කරන්න තමයි අපි උත්සාහ කරන්නේ. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ බොහොම පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා "පාර්ලිමේන්තුවේ මූලික වගකීම මූල්‍ය කටයුතු පිළිබඳවයි" කියලා. මම ඒ වගන්තිය ඔක්කොම කියවන්නට යන්නේ නැහැ. ඒක කවුරුත් දන්නා දෙයක්. ඒ මූලික වගකීම ඉෂ්ට කරන්න මාර්ගය හරියට පැදිලා නැත්නම් මේ මන්ත්‍රීවරු පත් කරන්න ඡන්ද පැවැත්වීමෙන්වත්, ඒ වාගේම මේ විශාල පාර්ලිමේන්තු මාළිගාවේ ලයිට් දාලා, loudspeakers දාලා, කන්න බොන්න දී ගෙන කරන වියදමේවත් කිසිම තේරුමක් නැහැ. ඒක අර්ථවත් කරන්න තමයි අපේ ගරු නායකතුමා ගිය වතාවේ මේ යෝජනාව කළේ. එතුමා තමයි මුලින්ම කිව්වේ මේ පාර්ලිමේන්තුවේ අය වැය ඇස්තමේන්තු කමිටුවක් ගෙනැල්ලා අපි මේ අය වැය ලිහිල් කරමු කියලා. අද ඒ පිළිබඳව යෝජනාව ගරු තිලංග සුමතිපාල මැතිතුමා ගෙනාව එක හොඳයි. එතුමා ඒ යෝජනාව නොගෙනාවා නම් අපි හරි ඒ යෝජනාව කරන්නයි බලා ගෙන හිටියේ. අපි එතුමාට ඒ පිළිබඳව ස්තුතිවන්ත වෙනවා.

අපි පසු ගිය අය වැයේදී අමාත්‍යාංශ 21ක ඇස්තමේන්තු ගැන පමණයි කථා කළේ. මේ අවුරුද්දේ අය වැය විවාදයට ඉස්සෙල්ලා හැම අමාත්‍යාංශයක්ම මේ කමිටුවට ගේන්න කියලා අපි යෝජනා කරනවා. ඒ සඳහා කිසිම අපහසුවක් නැහැ. ඒක තමයි හොඳම ක්‍රමය මේ වැඩ පිළිවෙළ ආරම්භ කරන්න. හැම අමාත්‍යාංශයක්ම ගෙනැල්ලා, නිලධාරින් එක්ක ඒ ඇස්තමේන්තු පරීක්ෂා කරලා, ඒ පිළිබඳව වාර්තාවක් හදලා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරමු. සමහර රටවල අය වැය විවාදයක් නැහැ. අය වැය ඉදිරිපත් කරනවා. ඉන් පසුව ඒවා ක්‍රියාත්මක කරන්න පටන් ගන්නවා. ඒවා අධීක්ෂණය කරන්න කටයුතු කරන්නේ මේ කමිටු මාර්ගයෙන්

[ගරු ජෝන් අමරතුංග මහතා]

තමයි. ඉන්දියාව ගැන කථා කළත්, මහා බ්‍රිතාන්‍යය ගැන කථා කළත් එහෙමයි. විශේෂයෙන්ම ඇමෙරිකාවේ මේ කමිටු ක්‍රමය ඉහළින්ම ක්‍රියාත්මක වෙනවා. ඇමෙරිකාවට ගිය වෙලාවට ඒ කමිටු වැඩ කරන ආකාරය බලන්න අද අපට අවස්ථාව ලැබිලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි ඒවායේ වැඩ කටයුතුවලට පුළුල් ප්‍රචාරයකුත් දෙනවා. ඒක තමයි අපි ප්‍රවෘත්ති නිදහස දෙන්න කියලා පනතක් ගේන්න කිව්වේ. "Freedom of Information" කියන පනත් කෙටුම්පත ගෙනැල්ලා මහ ජනතාවට පෙන්නුම් කරන්න හැදුවේ මේ රජය තුළත්, පාර්ලිමේන්තුව තුළත්, දෙපාර්තමේන්තු තුළත් වෙන කටයුතු පිළිබඳවයි. ඒවා පිළිබඳව පූර්ව ප්‍රචාරයක් ලබා දීලා මහ ජනයා දැනුවත් කිරීමේ අවස්ථාව ලබා දෙන්න කියලා පනතක් ගේන්න අපි ඉල්ලුම් කළේ ඒකයි. නමුත් ඒකත් වහලා දැම්මා. ඒකට අවස්ථාවක් දුන්නේ නැහැ. අපි ඒ ගැන කනගාටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රජාතන්ත්‍රවාදය සම්පූර්ණ වෙන්න නම් මේ සභාවේ වාඩි වෙන මන්ත්‍රීවරු 225 දෙනාට මූල්‍ය කටයුතු පිළිබඳව දායකත්වයක් දීලා හවුල්කාරයෝ හැටියට කටයුතු කරන්න අවස්ථාවක් තිබෙන්න ඕනෑ. ඒක තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148වෙනි ව්‍යවස්ථාවේ සඳහන් කරලා තිබෙන්නේ. එහි බොහොම පැහැදිලිව කියනවා මේ පාර්ලිමේන්තුවේ මූල්‍ය වගකීම මොකක්ද කියන එක. ඒකේදී බොහොම විස්තරව මූල්‍ය කටයුතු පිළිබඳව කථා කරලා තිබෙනවා. රාජ්‍ය මූල්‍ය පිළිබඳ පාලනය පාර්ලිමේන්තුව සතු බව තමයි 148වන ව්‍යවස්ථාවේ බොහොම පැහැදිලිව සඳහන් කරන්නේ.

දැන් මෙතැන සිදු වෙලා තිබෙන තවත් අඩු පාඩුවක් තිබෙනවා. ඩිව් ගුණසේකර මහත්මයා ඒ බව පිළිගනීවි. ආණ්ඩුවේ විගණකාධිපතිගේ audit system එකක් තිබෙනවා. විගණකාධිපති දෙපාර්තමේන්තුව අද අන්තිම දුර්වල දෙපාර්තමේන්තුවක් බවට පත් වෙලා තිබෙනවා. ඒකේ වැඩ කරන්න වුවමනා කරන නිලධාරින් නැහැ. ඒ ඉන්න නිලධාරින්ට ඒ පිළිබඳව දක්ෂකමක් තිබෙනවාද කියන එක පිළිබඳවත් මට සැකයක් ඇති වෙලා තිබෙනවා. ඒවා දුර්වල වුණාම තමයි අඩු තරමින් අපට post-mortem එකේ විභාගයවත් හරියට කර ගන්න බැරිව යන්නේ.

Public Accounts Committee එක තිබෙනවා. ඒ වාගේම Committee on Public Enterprises එක තිබෙනවා. මේවායින් සිදු වන්නේ අශ්වයා ගියාට පසුව ඉස්තාලය වහනවා වාගේ කටයුත්තක්. ඒක බොහොම කනගාටුදායක තත්ත්වයක්. මේ රජය පසු ගිය අය වැයේදී අමාත්‍යාංශ 21ක් හරි ගෙනැල්ලා සාකච්ඡා කිරීම අපි ඉදිරියට යන ගමනේ හොඳ සලකුණක් හැටියට මම දකිනවා. ඒ නිසා මම අපේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගෙනුත්, ඒ වාගේම සභානායකතුමාගෙනුත් ඉල්ලීමක් කරනවා, ඊ ළඟට පාර්ලිමේන්තුව රැස් වන දිනයේදී විපක්ෂයේ කිහිප දෙනෙකුත්, ආණ්ඩුවේ ප්‍රධානීන් කිහිප දෙනෙකුත් එකතු වෙලා තිලංග සුමතිපාල මැතිතුමා ගෙනාව යෝජනාවට අමතරව අපේ විපක්ෂ නායකතුමා විසින් යෝජනා කළ ඒ කමිටු තුනම ක්‍රියාත්මක කරන්න පුළුවන්ද කියලා බලන්න, එහෙම නැත්නම් ආරම්භයක් කරන්න කියලා. මම හිතන්නේ බොහොම ලේසියෙන්ම ඒ කටයුත්ත කරන්න පුළුවන් වනවා. මේ සියලු අමාත්‍යාංශවල වැය ශීර්ෂ, අය වැය ලේඛනය ඉදිරිපත් කරන්න ඉස්සර වෙලා විමර්ශනය කරලා, ඒ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළොත් ලොකු කාල වේලාවක් අපට ඉතිරි කර ගන්න පුළුවන් වෙනවා. අය වැය විවාදය සුමාන දෙකකින් අවසන් කරන්නට පුළුවන් වුණොත් ඒ සඳහා වැය වන මුදල් ප්‍රමාණයත් අවම කර ගන්න අපට පුළුවන් වනවා. දැන් අය වැය විවාදය මාස එකහමාරක් තිස්සේ පැවතෙනවා. අස්වර් මන්ත්‍රීතුමාත් මූලාසනයේ වාඩි වෙලා දීර්ඝ වේලාවක් ඉන්නවා. ඒ කිසි දෙයක් ඕනෑ නැහැ, මේ ක්‍රමය තුළ නිලධාරින් ඉදිරිපිට තියා ගෙන, ඒ අයගෙන් ප්‍රශ්න කරමින්, ඒ අයගේ අදහස් අරගෙන, ඒ අයගේ මූල්‍ය වගකීම හරියාකාරව ප්‍රායෝගිකව ඉෂ්ට කර ගන්න පුළුවන්.

මම කලින් කිව්වා වාගේ ආණ්ඩුවේ මන්ත්‍රීවරුන් 160 දෙනකු සිටියාට ඒ ඒ අංශවලට කොච්චර මුදලක්ද වෙන් කරන්නේ, කොහොමද වෙන් කෙරෙන්නේ කියලා ඒ කිසි කෙනෙක් දන්නේ නැහැ. ඒක දන්නේ මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමායි, ජනාධිපති ලේකම්තුමායි විතරයි. ඒ ගොල්ලන් කියන හැටියට තමයි මේ කටයුතු සියල්ලක්ම සිද්ධ වෙන්නේ. ඉතින් ඊට පස්සේ මේ අය කර බාගෙන ඉන්නවා. දෙන මුදලක් අරගෙන පුළුවන් දෙයක් කරනවා. තිස්ස විතාරණ ඇමතිතුමා කිව්වා, එතුමාගේ යෝජනාවක් ප්‍රමුඛ කටයුත්තක් හැටියට තිබුණාලු. තව වෙන තෙක් ඒකට සල්ලි දීලා නැතිලු.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉක්මනට මේ කමිටුව පිහිටුවන්න කියලා අපි යෝජනා කළොත් තමුන්නාන්සේට ඔය පුටුවේ වැඩිය වාඩි වෙන්න හම්බ වෙන්නේ නැහැ. අපි රුපියල් කෝටි ගණනක මුදල් වැය කරනවා මැතිවරණ පවත්වන්න. ඒ වාගේම මේ පාර්ලිමේන්තුව පවත්වා ගෙනයන්නත් රුපියල් කෝටි ගණනක් වැය කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Presiding Member)
මම මූලාසනයේ සිටින නිසා තමයි ඔබතුමාට විනාඩි දෙකක් වැඩිපුර දුන්නේ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
**(மாண்புமிகு ஜோன் அமரதுங்க)**
(The Hon. John Amaratunga)
අද සවස හය හමාර වෙන තෙක් සභාව පැවැත්වෙන්න තිබෙනවා. නමුත් කථිකයෝ බොහොම ටික දෙනායි ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ සාකච්ඡා කරන්නේ මේ රටේ බදු ගෙවන ජනතාව කෝටි ගණනක් වියදම් කරන මුදලේ වටිනාකම ඒ මහජනතාවටත් රටටත් ලබා දෙන ක්‍රමයක් හදන්නයි. මම හිතන හැටියට මේ යෝජනාව පිළිබඳව හෙට එළි වන තෙක් කථා කළත් කමක් නැහැ. මොකද, මහජනයා හිතන්නේ බොරුවක් කරන පිරිසක් තමයි මේ පාර්ලිමේන්තුවේ ඉන්නේ කියලා. අපි වැඩක් කරන්නේ නැහැ, අපෙන් වැඩක් වෙන්නේ නැහැ කියලා ඒ අය හිතනවා. ඇමතිවරු පඹයෝ කියලාත් කියනවා. මම දන්නේ නැහැ ඒක කොහොමද කියලා. නමුත් ඒක තමයි තත්ත්වය. අද කලබල නොකර මට කථා කරන්නට අවස්ථාව දීම ගැන තමුන්නාන්සේට මම ස්තුතිවන්ත වනවා.

[අ. භා. 4.55]

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා (සමාජ සේවා අමාත්‍යතුමා)**
**(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா - சமூக சேவைகள் அமைச்சர்)**
(The Hon. Felix Perera - Minister of Social Services)
මම ස්තුතිවන්ත වනවා මේ යෝජනාව ගෙනා ගරු තිලංග සුමතිපාල තරුණ මන්ත්‍රීතුමාට. එතුමා ව්‍යාපාර ක්ෂේත්‍රයේත් බොහෝ අත් දැකීම් තිබෙන කෙනෙක්; කාර්යශූර කෙනෙක්. ඒ වාගේම අපි දන්නවා, එතුමාගේ හැකියාව. ඉතාම කාලෝචිත යෝජනාවක් විධියටයි මම මේ යෝජනාව දකින්නේ.

පසු ගිය අය වැය අවස්ථාවේදීයි, මේ කාරක සභා ක්‍රමයට අපි පළමුවන වරට ඉඩ දුන්නේ. මගේ අමාත්‍යාංශය වන සමාජ සේවා අමාත්‍යාංශය ඇතුළු අමාත්‍යාංශ 21ක් ඒ කාරක සභාවට සහභාගි

වුණා. අය වැය විවාදයේදී පැය දෙකක කාල සීමාවක් අපේ අමාත්‍යාංශයට දුන්නා. නමුත් අපි ඊට වඩා දීර්ඝ වශයෙන් කථා කෙරුවා, ඒ තිබුණු Budget Committee එකේදී. මම ඒ Budget Committee එකේදී ඉතාම සන්තෝෂයට පත් වුණා. එහිදී පැයක් පැය එක හමාරක් තර්ක විතර්ක පමණක් තිබුණා. පැය හතරකට වැඩියෙන් අපට කථා කරන්නට පුළුවන් වුණා; නිලධාරින් උත්තර දුන්නා; අපි උත්තර දුන්නා. අන්තිමේදී විරුද්ධ පාර්ශ්වය මේ ක්‍රියාදාමය ගැන ඉතාම සතුටින් හිටියා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඇයි, ආණ්ඩු පාර්ශ්වයත් ඊට වඩා සතුටු වුණා.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ඔව්. ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා කියපු කාරණය ඇත්තයි. මෙච්චර ගණනක් වියදම් කරලා මෙතැනට ඇවිල්ලා පැයකින් දෙකකින් මේ ප්‍රශ්න කථා කරනවාට වඩා පුළුල් වශයෙන් සාකච්ඡා කිරීම අවශ්‍යයි. මේවාට නිලධාරින් වග කියන්න ඕනෑ. සමහර විට ඇමතිවරු දන්නේත් නැහැ, නිලධාරින් වග කියන්න ඕනෑ කියලා. අශ්වයා පැනලා ගියාට පස්සේ ඉස්තාලය වහන්නේ නැතුව, ඒ නිලධාරින් සිටියදීම කථා කරලා මේ කටයුතු නිමා කර ගන්න පුළුවන් වුණොත් බොහොම හොඳයි.

නිදහසින් පස්සේ, දේශීය ආර්ථිකය ශක්තිමත් කර ගැනීම ගැන බොහෝ දෙනෙක් කථා කළා. දේශීය ආර්ථිකය හරියට කළමනාකරණය කෙරුවොත් විතරයි රටක් ශක්තිමත් වන්නේ කියලා තියෙද්දීත් තවදුරටත් අත්‍යවශ්‍ය ආහාර විදේශයෙන් ගෙන්වීම නිසා අපට ඇති වන පාඩුව ගැන පළල් ලෙස මේ කාරක සභාවේදී කථා කරන්නට පුළුවන්. උදාහරණ ඕනෑ තරම් තිබෙනවා.

කිරි ගොවියාට තම නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් නොලැබෙනවාය කියලා පසු ගිය කාලයේදී උද්ඝෝෂණය කෙරුවා. නමුත් අපේ රටේ කිරි අවශ්‍යතාවෙන් සියයට 90ක්ම ගෙන්වන්නේ පිටි වශයෙන්. ඒ කියන්නේ කිරි වියළා පිටි වශයෙන් තමයි ගෙන්වන්නේ.

අපි මේ ප්‍රශ්න ගැන කථා කරන්නේ නැහැ. කථා කෙරුවත් තේරුමක් නැහැ. මේ වෙනුවෙන් ඩොලර් මිලියන 346ක් වැය වෙනවා.

පාර්ලිමේන්තු කාලය අවුරුදු පහකට, හයකට සීමා කර තිබෙන නිසා පාරිභෝගික ජනතාව තෘප්තිමත් කිරීමේ මූලික චේතනාවක් අප කා ළඟත් තිබෙනවා. ඕනෑම ආණ්ඩුවකට එය තිබෙනවා. පාරිභෝගිකයා සන්තෝෂ කෙරුවේ නැත්නම් ආණ්ඩුව වැටෙනවා, ඊළඟ අවස්ථාවේදී තමන්ට බලයට එන්න බැරි වෙයි කියන නිගමනය තිබෙනවා. එම නිසා තමයි මේ පාරිභෝගිකයාගේ ආර්ථිකයට වැඩියෙන්ම සල්ලි දෙන්නේ. ණය දෙන්නේත් එහෙමයි; උදවු කරන්නේත් එහෙමයි. නමුත් දේශීය ආර්ථිකය නැංවීමට උදවු කරන්නේ නැහැ. බොහොම අඩුවෙන් තමයි බැංකුවලින් වුණත් මුදල් දෙන්නේ. ඒ ගැනත් මට කරුණු රැසක් කියන්න තිබෙනවා. නමුත් මේවා පිළිබඳව අපි නිගමනයකට එන්න ඕනෑ.

දැන් බලන්න, පිට රට අය කවදාවත් වියළන ලද කිරි බොන්නේ නැහැ නේ. ඒ ගොල්ලෝ බොන්නේ දියර කිරි. අපි විතරක් ඒවා පාවිච්චි කරනවා. ඊයේ -පෙරේදාත් පුංචි ළමයින්ගේ කිරි පිටිවල මිල අඩු කළා. එක පැත්තකින්; අපි කිරි පාරේ හළනවා. සමහර විට මේවා රජයට විරුද්ධව කරන කුමන්ත්‍රණ වෙන්නත් පුළුවන්. කිරි දෙනුන් ගෙනැල්ලා කිරි නිෂ්පාදනය වැඩි කරන්න කටයුතු කරද්දී, කිරිවලට වැඩි මිලක් දීලා ඒ ගොවියෝ උනන්දු කරද්දී ඒවා අධෛර්යය කරන්න කරන කුමන්ත්‍රණ වෙන්නත් පුළුවන් ඒවා. ඒවායින් අපි මේ රට බේරා ගන්න ඕනෑ. ඒ පිළිබඳ පළල් අවබෝධයකින් අපි කථා කරන්න ඕනෑ.

ඊළඟට අපේ සීනි නිෂ්පාදනය දෙස බලන්න. ලංකාව කියන්නේ සියයට 30ක් සීනි නිෂ්පාදනය කරපු රටක්. නමුත් දැන් නිපදවන්නේ සියයට 5යි. අපි දැන් සීනි නිෂ්පාදනයෙන් සියයට 25ක්ම අත් හැර දමා තිබෙනවා. ඇයි මෙහෙම වෙලා තිබෙන්නේ? මේකට හේතුව අපි සොයා බලන්න ඕනෑ. මේකට හේතු තිබෙනවා. බොහොම ලේසියි L/C එකක් ඇරලා බඩු ගෙන්වන්න. බැංකුවලින් ණය දෙන්නේ L/C ඇරලා බඩු ගෙන්වන අයට. [බාධා කිරීමක්] ඒක පැත්තකට දමන්නකෝ. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, මේ කථාවට බාධා කරන්න එපා. නමුත් මේක තමයි ඇත්ත කතන්දරය. ඒ කොම්පැනිවලින් කෙරුවේ මොනවාද කියන එකත් ඔබතුමා දන්නවා නේ. ඒ කොම්පැනිවලින් මොනවාද කෙරුවේ? [බාධා කිරීමක්] දවස් තුනක්, හතරක් තිබ්බාම උක් වේලෙනවා. ඊට පස්සේ සීනි නිෂ්පාදනය කෙරුවොත් රුපියල් 60යි ලැබෙන්නේ. මොලැසස් නිෂ්පාදනය කෙරුවොත් රුපියල් 360ක් හම්බ වෙනවා. බලන්න වෙනස කොහොමද කියලා. [බාධා කිරීමක්] ඉන්න, මම කියලා දෙන්නම්. මම දන්නවා ඒ ගැන. ව්‍යාපාරිකයා තමන්ට ලාභ දේ තමයි කරන්නේ. නමුත් අපි රාජ්‍යය පරිපාලනය කරන්න ඕනෑ. [බාධා කිරීමක්] නැහැ, එහෙම එකක් වන්නේ නැහැ. ඔබතුමා බය වෙන්න එපා. කිසි දවසක,- [බාධා කිරීමක්] මට කාලය දෙන්න ඕනෑ. ඔබතුමා ඉක්මනට කියන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඇත්තටම ලංකාවේ හමුදාවට මස් සැපයීම වෙනුවෙන් අපේ මස් සැපයුම්කරුවන් හැත්තෑ දෙනෙකුට විතර විශාල මුදලක් ගෙවන්න තිබෙනවා. ඒක කෝටි ගණනක්. මිලියන දාහක් දෙදාහක් විතර ගෙවන්න තිබෙනවා. මේ මුදල් ගෙවන්නේ නැතිව තියාගෙන ඉන්නවා. කුකුළු මස් කිලෝ එක රුපියල් 300යි කිව්වාම, රුපියල් 225ට මස් සපයන්න කියලා බලහත්කාරයෙන් කියනවා. ඔබතුමා මොකක්ද ඒක ගැන කියන්නේ? එතැනත් ලොකු ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ඒක මම දන්නේ නැහැ. හැබැයි මෙහෙම දෙයක් තිබෙනවා. හමුදාව දැන් අවුරුදු 20ක් තිස්සේ ගව මස් පාවිච්චි කරන්නේ නැහැ. ඒකත් මතක තියා ගන්න. දළුවත්ත මහත්තයා ඉන්න කොට බාරයක් වෙලා, අවුරුදු 20ක්, 25ක් තිස්සේ දැන් ඒවා කන්නේ නැහැ. ඒ නිසා දැන් හමුදාව කුකුළු මස් වාගේ දේවල් තමයි පරිභෝජනය කරන්නේ. ඒක වෙනම කථාවක්. ඒක පැත්තකට දමන්නකෝ. හමුදාව මේ රට බේරා ගත්තාට පස්සේ ආණ්ඩුව ඒ ගොල්ලන්ට කන්න නොදී ඉන්නේත් නැහැ, කන්න දීපුවාට සල්ලි නොදී ඉන්නේත් නැහැ කියන එක ඔබතුමාට මතක් කරන්න ඕනෑ. ඒ කථාව පැත්තකට දමන්න.

අපි සීනි ආනයනයට ඩොලර් මිලියන 440ක් වියදම් කරනවා. අපි කොහොමද මේ මුදල් ඉතුරු කර ගන්නේ? මේ කරුණු තමයි අපි මේ කාරක සභාවලදී කථා කරන්න ඕනෑ. ඒ වාගේම ඖෂධවලට වැය කරන මුදල බලන්න. ඒ වෙනුවෙන් ඩොලර් මිලියන 324ක් වැය කරනවා. අප බොරුවට ආණ්ඩුවට බැණලා වැඩක් නැහැ. එයාට මෙයාට බැණලා වැඩක් නැහැ. අප දෙගොල්ලෝම එකට එකතු වෙලා කථා කරලා ඖෂධ දේශීයව

[ගරු ෆීලික්ස් පෙරේරා මහතා]

නිෂ්පාදනය කරන්න කටයුතු කරන්න ඕනෑ. මේවා තමයි අපි සාකච්ඡා කරන්න ඕනෑ. අපි මෙතැන නොයෙක් දේවල් ගැන කථා කරනවා; විවේචනය කරනවා; අඩු පාඩු කියනවා. අඩු පාඩු කියලා ඒ අඩු පාඩු මත බලයට පත් වෙන්න තමයි උත්සාහ කරන්නේ. මේකෙන් වැටෙන්නේ අපි නොවෙයි. අප අවුරුදු පහක්, නැත්නම් හයක් ඉන්නවා. අපි නැත්නම් වෙන කට්ටියක් බලයට එනවා. මෙයින් වැටෙන්නේ ජනතාව. අපි ඕනෑම කෙනෙක් පාර්ලිමේන්තුවට එන්නේ ජනතා සේවය පිළිබඳ කැප වෙනවා කියන මතය උඩ. නමුත් එහෙම කැප වෙනවාද? තර්ක විතර්ක කිරීම, චෝදනා කිරීම, අවඥාවට ලක් කිරීම, සිනහ වීම තමයි අපි මෙතැනට ඇවිල්ලා කරන්නේ. ඒ නිසා මේ යෝජනාව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් තිලංග සුමතිපාල මැතිතුමාට මම බොහොම ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ පූගොඩ, වත්තේගම, මින්නේරිය වැනි ප්‍රදේශවල තිබුණු කම්හල් සියල්ලම අද අභාවයට ගොස් තිබෙනවා. ඒ කාලයේ අපි විවෘත ආර්ථිකය එහෙම පිටින්ම වැළඳ ගත්තා; බදා ගත්තා. ඒ විවෘත ආර්ථිකය බදා ගත්ත නිසා තමයි මේ ප්‍රශ්නය මතු වුණේ. නිෂ්පාදනය එක පැත්තකින් තියලා අපි ආනයනය පැත්තට ගියා.

ආනයනය සඳහා දෙන මුදල් දිහා බලද්දීත් පෙනෙනවා බොහොම විශාල මුදල් ප්‍රමාණයක් දෙන බව.

අපනයනය කරන අයට සොච්චම් මුදලක් දෙන්නේ. අපේ තිබෙන ණයවලින් සියයට 28ක් සම්පූර්ණයෙන්ම ආනයනය සඳහා අප පාවිච්චි කරනවා. මේ ගැන අප කථා කරන්න ඕනෑ. මොකද, මේවා අප කාටත් පොදුයි. විදුලිබිල වැඩි වුණාම අප කාටත් පොදුයි. පෙට්‍රල් මිල වැඩි වුණාම අප කාටත් පොදුයි. අප සාමූහික වග කීමක් ඇතිව මේ ප්‍රශ්න ගැන කථා කරන්න ඕනෑ. දේශයෙන් තොරව, රට වෙනුවෙන් කථා කළොත් රට වෙනුවෙන් අපට මේ දෙය කරන්නට පුළුවන්.

ඉස්සර මම ධීවර ඇමති වශයෙන් කටයුත් කරද්දී අපට මුහුදෙන් තුනෙන් දෙකයි තිබුණේ. අද සම්පූර්ණයෙන්ම අපට මුහුද තිබෙනවා. සියයට 40ක්ම මත්ස්‍ය නිෂ්පාදනය වෙන්නේ ඒ පැත්තේ. නමුත් ධීවර කර්මාන්තයට ණය දෙන්නේ කීය ද? සියයට දශම ගණනයි. සියයට දශම ගණනක් තමයි ඒ දේශීය නිෂ්පාදනය දිරි ගන්වන්නට ණය දෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් ටින් මාළු ආනයනය කරනවාය, ටින් මාළු නිෂ්පාදනය කරනවාය කියා අප කියමු. මොකක් ද වෙන්නේ? පිට රටින් මාළු ගේනවා. ටින් එකත් ගේනවා. මෙතැනින් ටින් එකට දාලා අපට දෙනවා. බලන්න මේක මොකක් ද කියා. අප එළවලු ටිකත් ගෙනැල්ලා pack එකක දමා හැදුවාම ඒක දේශීය නිෂ්පාදනයක් වෙන්නේ නැහැ නේ. අප මේවා සාකච්ඡා කරන්නේ කා එක්ක ද? මේවාගේ කාරක සභාවකදී අප පුළුල් ලෙස මේවා ගැන සාකච්ඡා කරන්නට ඕනෑ. අප නොදැනුවත්ම අපේ විදේශ විනිමය හීන වෙනවා. එම නිසා මුදල් සංචිතයේ පරතරයක් ඇති වෙනවා. ආනයනය හා අපනයනය අතර පරතරය වැඩි වීමෙන් තමයි මේ රටට ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙන්නේ. ඒක අපට අවම කර ගන්නට ඕනෑ.

පසු ගිය කාලයේ -රටෙන් තුනෙන් දෙකක යුද්ධයක් තිබෙන කාලයේ- නිෂ්පාදන ක්‍රියාවලියට වෙච්ච අහේනිය අපේ ජනාධිපතිතුමා නැති කළා. අප ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වන්නට ඕනෑ. මේ රටේ ආර්ථිකය ශක්තිමත් කරන්නට නම් රටට සාමය ඇති කරන්නට ඕනෑ. යුද්ධය නැති කර දමන්නට ඕනෑ. යුද්ධය තිබෙන රටවල සාමය නැහැ නේ. උදාහරණයක් වශයෙන් ඉරාකය ගනිමු. බලන්න, කොච්චර ස්වයංපෝෂිත රටක් ද කියා. යුප්‍රටිස්, ටයිග්‍රිස් ගංගා දෙපැත්තෙන් ගලා ගෙන යනවා. ඒ කාලයේ ශක්තිමත් රටක්ව තිබුණා. යුද්ධය ආවා. දැන් බෝම්බ පිපිරෙනවා; මැරෙනවා. නිෂ්පාදන ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම ඇණ හිටලා. ආනයනය පැත්තකට ගිහිල්ලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම නිසා මේවා ගැන අප කථා කරන්න ඕනෑ. ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමාගේ යෝජනාව පාර්ලිමේන්තුවට ගෙනා හොඳම යෝජනාව විධියටයි අප සලකන්නේ. මේවා ගැන අප කථා කරමු. මන්ත්‍රී කෙනෙකුට, ඇමති කෙනෙකුට නිලධාරින් ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් අමාත්‍යාංශයක් දැරුවා. ඇස් පණහක් නැහැ. අත් පණහක් නැහැ. නමුත් බලන්න පුළුවන් ප්‍රමාණයක් තිබෙනවා. බලන්න පුළුවන් සීමාවක් තිබෙනවා. නිලධාරින් තමයි අප විශ්වාසයට ඒ කටයුතුවලට දාන්නේ. නමුත් විශ්වාසය කඩ කළායින් පස්සේ වගකීම අපට එනවා. එතකොට මේකෙන් මිදෙන්නේ කොහොම ද? ඒ අයත් ගෙනැල්ලා ප්‍රශ්න කරන්නට ඕනෑ. කවුද ඒකට වග කියන්නට ඕනෑ? කවුද මේක කළේ? මෙන්න මේ ටික අහන්න පුළුවන් මේ කාරක සභාවේදී. මේ යෝජනාව ගෙන ඒම ගැන මා ඉතාමත්ම සන්තෝෂ වෙනවාය කිව්වේ ඒකයි.

එදා පැවැති අය වැය කාරක සභා රැස්වීමේදී ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා, සමාජසේවා ඇමතිවරයා වශයෙන් මගෙන් ප්‍රශ්න ඇහුවා. එක්සත් ජාතික පක්ෂයේ අය ප්‍රශ්න වැඩියෙන් ඇහුවා. තවත් අය ප්‍රශ්න ඇහුවා. නමුත් අන්තිමේදී මොනවා ද කිව්වේ? අප මේ වැඩ පිළිවෙළ ගැන සන්තෝෂ වෙනවාය කියා ගිහිල්ලා අය වැය විවාදයේදී පැය දෙකක් ඇතුළත කිසිම චෝදනාවක් නැතිව වැය ශීර්ෂ සම්මත වුණා. ඒ ගොල්ලන් තව යෝජනා ටිකක් ඉදිරිපත් කළා මිස චෝදනා ඉදිරිපත් කළේ නැහැ. එම නිසායි ඔබතුමාට මා කියන්නේ මේ ගැන කල්පනා කර බලන්නටය කියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම වාහන ආනයනය ගැනත් කිවයුතු වෙනවා. මේ රටේ මාර්ග කිලෝ මීටර් එක්ලක්ෂ ගණනයි තිබෙන්නේ. Class "A" පාරවල් සහ Class "AB" පාරවල්; ප්‍රධාන පාරවල් හැටියට තිබෙන්නේ කිලෝ මීටර් දහතුන්දාහක් විතරයි. පසු ගිය අවුරුදු දෙකේදී - 2010 සහ 2011 වර්ෂවලදී- විතරක් වාහන මිලියනයක් ගෙනැවිත් තිබෙනවා. සිංගප්පූරුවේ නම් වාහන ගෙන්වන්නේ කොහොමද? ඒ රටේ ජාතික ප්‍රතිපත්තිය මොකක් ද? භූමියේ ප්‍රමාණයට තමයි වාහන ආනයනය කරන්න දෙන්නේ. අපේ රටේ එහෙම වුණේ නැහැ නේ. අපේ රටේ යුද්ධය අවසන් වුණා. සන්තෝෂය වැඩි වුණා. මිනිසුන්ට පොඩ්ඩක් සහන දුන්නා. අනවශ්‍ය ප්‍රමාණයට වාහන ගෙනාවා. ගොඩ ගහගත්තා. ඒකෙන් ඉන්ධන වැඩිපුර ප්‍රමාණයක් යනවා. ඒකෙන් ඉන්ධන waste වෙනවා. traffic එකේදි ඉන්ධන සියයට 10ක 15ක ප්‍රමාණයක් පිච්චෙනවා. මේ ටික පරිපාලනය කරන්නට නම් ඇමතිවරයා එක්ක විතරක් නොවෙයි නිලධාරින් එක්කත් කථා කරන්නට ඕනෑ. දවස් දෙකක් විතර කාරක සභාවක් තිබෙන්නට ඕනෑ, ආර්ථිකය මෙහෙය වන අමාත්‍යාංශයත් එක්ක. එක දවසකුත් මදිය කියන එකයි මම කියන්නේ. එහෙම නම් මේවා නිවැරදි වෙලා, ශක්තිමත් වෙලා එනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ බලශක්තිය ගැන බලමු. අපේ බලශක්තිය, current එක දෙන්න, දෙන්න, ජල විදුලි බලයෙන් ගන්න පුළුවන් ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. මේ නිසා mini-hydro power projects වලට අප තව ටිකක් තැන දෙන්නට ඕනෑ. තව ටිකක් යෝජනා කරන්නට ඕනෑ. යෝජනා හුඟක් තිබෙනවා. තමුන්ට නොපෙනෙන දෙයක් තව කෙනෙකුට පෙනෙන්න පුළුවන්. ඒක අහ ගන්න. මේ සියල්ලම එකතු වුණාම තමයි හරි දේ අපට කරන්න පුළුවන්. මේ රටේ ව්‍යාපාර ක්ෂේත්‍රයේ

තනි මතයට වැඩ කරන කිසිම කෙනෙක් කවදාකවත් සාර්ථක වෙන්නේ නැහැ කියලා කියමනක් තිබෙනවා. එතුමාත් දැන ගන්න ඕනෑ. එතුමාත් අහන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොම්පැනියක අයිතිකාරයා accountant කෙනෙක් වුණොත්, තමන් accountant වුණාය කියලා තව accountant කෙනෙක් ගන්නේ නැතුව ඉන්නේ නැහැ. තවත් එක් කෙනෙකු දා ගන්නවා. ඉතින් මේකෙන් මොකක්ද තේරෙන්නේ? කළමනාකාරිත්වය. කළමනාකාරිත්වය කියන එකට අපි වග කියන්න ඕනෑ. මොකද, අපි ගන්නා තීන්දු උඩ තමයි රට දුවන්නේ. අපි ගන්නා ප්‍රතිපත්ති උඩ තමයි රට දුවන්නේ. ඉතින් අපි ගන්නා ප්‍රතිපත්ති තීන්දු වැරදි වුණොත් ඒකෙන් බැට කන්නේ අපි නොවෙයි, අනාගත පරම්පරාව. දැන් අපිට උදාහරණයකට චීනය ගන්න පුළුවන්. දැන් චීනයේ පවුලක එක දරුවයි හදන්න දුන්නේ. අද මොකද වෙලා තිබෙන්නේ? අද දරුවෙකුගේ දෙපැත්තෙන් ඉන්නවා අම්මාත්, තාත්තාත්. එක පැත්තක තාත්තාගේ අම්මාත්, තාත්තාත් ඉන්නවා. අනෙක් පැත්තේ අම්මාගේ අම්මාත්, තාත්තාත් ඉන්නවා. එක දරුවෙකු හුරතල් කරන්න ඒ පවුල් දෙකෙන් හතරයි, මේ පවුලේ දෙකයි, හය දෙනෙක් ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊ ළඟ කාරණය, අද අපි ජනතාවට දීලා තිබෙන සහන නිසා -සෞඛ්‍ය සහන නිසා- අපේ ජීවිත අපේක්ෂාව අවුරුදු 76 දක්වා වැඩි වෙලා තිබෙනවා. කාන්තාවන්ගේ ජීවිත අපේක්ෂාව අවුරුදු 76යි. පිරිමි කෙනෙකුගේ නම් අවුරුදු 73යි. ඊ ළඟට, නොදැනීම නිසා අද පිළිකා රෝගයට ගොදුරු වෙලා තිබෙනවා. මේවා අපි සාකච්ඡා කරන්න ඕනෑ. දැන් ඩෙංගු රෝගය බහුලව තිබෙනවා. අපේ ගරු ඇමතිතුමාට විතරක් ඩෙංගු මර්දනය කරන්න පුළුවන්ද? බැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
කාන්තාවන්ගේ ජීවිත අපේක්ෂාව කීයද?

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
අවුරුදු 76යි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
පිරිමින්ගේ?

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ඇයි, ඔබතුමා ඒ පිළිබඳව උනන්දු වෙනවාද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
දැන ගැනීම පිණිස ඇහුවේ.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
බොහොම ස්තුතියි. මුස්ලිම් අයට නීතියෙන් විවාහ පහක් හෝ හයක් කර ගන්න පුළුවන් නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
නැහැ, නැහැ. හතරයි.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
හතරද? මම හිතන්නේ දෙකක් අඩු කරන්න ඇති.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, අපේ රටේ නිෂ්පාදනය ශක්තිමත් නොකර උද්ගතවන ආර්ථික අභියෝගවලින් කවදාවත් ජය ගන්න හම්බ වෙන්නේ නැහැ කියලා. ඒක තමයි ඇත්ත තත්ත්වය. මට තිබෙන කාල වේලාව බොහොම අඩුයි. නමුත් මම මේ කාරණයත් කියන්න ඕනෑ. දැන් උදාහරණයක් වශයෙන් අපි හිතමු, මාළු මිල ඉහළ යනවා කියලා. එතකොට අපි මොනවාද කරන්න ඕනෑ? ලංකාවේ හෙක්ටයාර් හතකට, හෙක්ටයාර් එකක් තිබෙනවා අභ්‍යන්තර ජලාශ. ඒ අභ්‍යන්තර ජලාශවල සිදු කරන නිෂ්පාදනය කඩිනමින් පාරිභෝගිකයන් අතට ලබා දුන්නොතින් cost එක අඩු වෙනවා. එක පැත්තකින් ආර්ථිකය දියුණු වෙනවා. අනෙක් පැත්තෙන් ප්‍රෝටීන් ඌනතාව අඩු කර ගන්න පුළුවන්. ඉතින් අපි මේවා ගැන කථා කරන්න ඕනෑ.

ඊ ළඟට අධිවේගී මාර්ගය ගනිමු. කොච්චර විවේචන තිබුණත් අතිගරු ජනාධිපතිතුමා අධිවේගී මාර්ගය හැදුවා. අන්න පැය ගණනක් අඩු කර ගත්තා. ඒ කාලයේ මේ පාර්ලිමේන්තුව හදද්දී අපි විපක්ෂයේ ඉඳ ගෙන විවේචනය කළා, "මොකටද මෙච්චර ලොකු පාර්ලිමේන්තුවක්" කියලා. එදා මේ පාර්ලිමේන්තුව හැදුවේ නැත්නම් අද මේ මන්ත්‍රීවරු 225දෙනා දාන්නේ කොහේද? පරණ පාර්ලිමේන්තුවේ දාන්න පුළුවන්ද? එදා මේවා කළේ නැත්නම් වැඩිවන ජනගහන ප්‍රතිශතය අනුව කුමක්ද වෙන්නේ? එදා මහවැලිය හැදුවේ නැත්නම් අද මොකක්ද වෙන්නේ? මේ ඇත්ත කථා කරන්න ඕනෑ. එම නිසා මම කියන්නේ, පොදු ප්‍රතිපත්තිවලට පක්ෂයක් ඕනෑ නැහැ කියලායි.

මම දැන් මගේ අමාත්‍යාංශය මෙහෙය වන්නේ, ආබාධිත අය, වයසක අය, තනි මව්පියෝ වෙනුවෙන්. අපි පක්ෂ භේදයෙන් තොරව තමයි ඒ ගොල්ලන්ගේ ප්‍රශ්න විසඳන්නේ. අපට පුළුවන් වුණා අපේ අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවට මුදල් අමාත්‍යාංශයේ නිලධාරින් ගෙන්වලා මේ අයගේ දුක්ගැනවිලි ගැන කථා කරන්න. හැබැයි එකක් තිබෙනවා. අය වැය ලේඛනය ඉදිරිපත් කිරීමට ප්‍රථම මහ භාණ්ඩාගාරයෙන් team එකක් එනවා. ඇවිල්ලා සාකච්ඡා කරනවා. ඒක අපට නැහැයි කියලා කියන්න බැහැ. එදා අපේ උපදේශක කාරක සභාවට පී.බී. ජයසුන්දර මහත්මයා ඇවිල්ලා සාකච්ඡා කළා. අපට මේ මේ දේවල් අවශ්‍යයි කියලා අපේ දුක්ගැනවිල්ල එතුමාට කිව්වා. අතිගරු ජනාධිපතිතුමත් ඒවා පිළිගත්තා. පිළිඅරගෙන තමයි රුපියල් සියයේ ඉඳලා දෙසිය පනහට, තුන්සියයට තිබුණු මහජන ආධාරය -අවුරුදු 70ට වැඩි අයට දුන්නු ආධාරය- රුපියල් දාහ දක්වා වැඩි කරලා, දෙලක්ෂ එකොළොස් දාහකට මේ මාසේ ඉඳලා දෙන්නේ. බලන්න කොහොමද තත්ත්වය කියලා. ඇත්තටම එදා තිබුණෙත් කාරක සභාවක්. එදා එතුමන්ලා අපේ කාරක සභාවට ආවේ නැත්නම් මේ දුක්ගැනවිල්ල අපිට ඉදිරිපත් කරන්න ලැබෙන්නේ නැහැ. අපේ අමාත්‍යාංශයේ නිලධාරින් මගේ ප්‍රධානත්වයෙන් භාණ්ඩාගාරයේ නිලධාරින් සමඟ සාකච්ඡාවක් කළා. ඒ සාකච්ඡාවේදී ගන්නා නිගමන අය වැය ලේඛනයට අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගන්න පාවිච්චි කළාය කියන එක අපි සඳහන් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බලන්න අපේ ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා. එතුමා ආර්ථිකය නංවන්න එළවලු වගාව හැම තැනම පටන් ගත්තා. වගාවෙන් ප්‍රතිඵල ලැබුණා. ඊට පසුව ඒවා විකුණ ගන්න බැහැ කියා කෑ ගැහුවා. මොකක්ද ඒකේ තේරුම? මේ වැඩ පිළිවෙළ කඩාකප්පල් කරන්නයි. උදාහරණයක් වශයෙන් ඒ කාලයේ අපි බඩ ඉරිඟු ආනයනය කළා. විශාල ප්‍රමාණයක් ආනයනය කළා. බඩ ඉරිඟු කිලෝ ග්‍රෑම් දෙක හමාරක් කුකුල් පැටියෙකුට දීලා තමයි කුකුල් මස් කිලෝ එකක් හදා ගන්න ඕනෑ. අපි ඒවා ආනයනය කළා. ඒ සඳහා විශාල විදේශ

[ගරු ෆීලික්ස් පෙරේරා මහතා]

විනිමය ප්‍රමාණයක් වැය කරන්නට සිදු වුණා. අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද අපි බඩ ඉරිඟු ටොන් 1000ක් අපනයනය කළා. කවුද මේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළේ? ජනාධිපතිතුමාගේ මහින්ද චින්තනය අනුව දේශීය ආර්ථිකය නංවන්න අපේ ආර්ථික සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යතුමාත්, අපේ පිරිසත් ගත්තු තීන්දුව නිසා තමයි අද අපට බඩ ඉරිඟු සඳහා වැය කරන්නට වෙන විදේශ විනිමය මේ රටේ නවත්වා ගන්නට පුළුවන් වෙලා තිබෙන්නේ.

අද කිරි පිටි සඳහා යන විදේශ විනිමය නවත්වා ගන්නට පුළුවන් නම්, මාළු සඳහා වැය වෙන විදේශ විනිමය නවත්වා ගන්නට පුළුවන් නම්, අපට අවශ්‍ය රෙදි පිළි අපේ රටේම නිෂ්පාදනය කර ගන්න පුළුවන් නම් අපට විශාල විදේශ විනිමය ප්‍රමාණයක් ඉතිරි කර ගන්නට පුළුවන් වෙනවා. අද බොහෝ දෙනෙක් පාවිච්චි කරන්නේ කපු - cotton - රෙදි පිළියි. ඉස්සර අපේ රටේ කපු වගාවක් තිබුණා. ඉන්දියාව ආදී උෂ්ණාධික කලාපවල මිනිස්සු වඩාත් කැමැති වෙන්නේ කපු රෙදිවලින් මැසූ ඇඳුම්වලටයි. ඉතින් අපි මේවා නැවතත් පටන් ගන්න ඕනෑ. මොනවා නැති වුණත් අපේ ආර්ථිකය කළමනාකරණය කරන්නට පුළුවන් දක්ෂ නිලධාරින් පිරිසක් ඉන්නවා. අපි ඒ ටික කියන්න ඕනෑ. ආර්ථිකය වැටිලාය කියා කිව්වත් ඒවා තාවකාලිකව එන දේවල්. අපට ඒවා කළමනාකරණය කරලා හදා ගන්න පුළුවන්. උදාහරණයක් වශයෙන් ඇමෙරිකාවේ ආර්ථිකය වැටුණා. දැන් ඒ අය ඒ තත්ත්වයෙන් පොඩ්ඩක් ගොඩ වෙලා තිබෙනවා. කොරියාවේ ආර්ථිකයත් බින්දුවටම වැටුණා. දැන් ඔන්න ඒ අයත් ඒ තත්ත්වයෙන් ගොඩ වෙලා තිබෙනවා. ඉතින් එහෙම ආර්ථික කඩා වැටුණාය කියලා ආණ්ඩු පෙරළුවේ නැහැ නේ. මිනිස්සු ටික එකතු වෙලා ගෙවල්වල තිබුණු රත්රන් බඩු ටික ගෙනල්ලා දුන්නා, ඔන්න මේ රට ගොඩ ගන්නය කියා. අද අපේ රටේ මිනිස්සු අලියෙක් ගැහැව්වත් පාරට බැහැලා උද්ඝෝෂණය කරනවා. බඩු මිල පොඩ්ඩක් වැඩි වුණත් පාරට බහිනවා. ටයර් ටිකක් පුච්චනවා; එහෙම නැත්නම් පාර හරස් කරනවා. ධීවරයොත් කෑ ගහනවා. ඒක නොවෙයි විය යුත්තේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපි මේ කාරක සභාව ශක්තිමත් කරලා නිලධාරින් ගෙන්වා ප්‍රශ්න කරන්න ඕනෑ. ඇමතිවරු මාරු වෙනවා, ඡන්දයෙන් පරදිනවා. නමුත් නිලධාරින් පරදින්නේ නැහැ නේ. නිලධාරින්ට වරදින්නෙත් නැහැ. තොප්පිය මාරු කරන එක විතරයි තිබෙන්නේ. "කොහොමද මේවා කරන්නේ, ඇයි මේකට හේතුව, ඔබතුමාගේ වගකීම මොකක්ද, ලේකම්තුමාට නේද මේ මුදල් පිළිබඳ බලය තිබෙන්නේ, ඔබතුමා හරියට මේක කෙරුවාද, මේ සල්ලි ටික කොහාටද ගෙනිච්චේ, කී වතාවක් රට ගියාද, ඒවාට කොච්චර සල්ලි පාවිච්චි කළාද" කියා ඒ අය ගෙන්වා ප්‍රශ්න කරන්නට ඕනෑ. ඒවා අහන්න මේ කාරක සභාව තිබෙනවා නම් ඒක ඉතාමත් සුදුසුය කියන එක මතක් කරනවා. [බාධා කිරීමක්] මට නියමිත වෙලාව ඉවරද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහෝ දුරට ඉවරයි.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
එහෙම නම් තව ටිකක් කථා කරන්නම්.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
තවත් කථිකයන් ඉන්නවා නේ. අවසන් කරමු.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මම අවසාන වශයෙන් අපේ ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා ගැනත් කියන්න කැමැතියි. එතුමා ගැනත් පොඩ්ඩක් කියන්න ඕනෑ. එතුමා ඉතා දක්ෂ කෙනෙක්. පොඩි කාලයේ ඉඳන්ම මම එතුමා ගැන දන්නවා. එතුමාගේ අම්මත් බොහෝ බෞද්ධ කටයුතු කරන කෙනෙක්. තාත්තාගේත්, අම්මාගේත් බෞද්ධ කටයුතු මැද්දේයි එතුමා හැදුණේ. එතුමා ඉදිරිපත් කළ මේ යෝජනාව ඉතා හොඳ යෝජනාවක්ය කියන එක ප්‍රකාශ කරනවා. ගරු ඩිව් ගුණසේකර ඇමතිතුමාත් COPE එක තුළින් හොඳ කාර්යභාරයක් කළා. මේ කාරක සභාව තුළින් කළ යුතු දෙය එතුමා ටිකක් කරලා පෙන්නුවා. මේ ශක්තිය පාර්ලිමේන්තුවට දීලා, විපක්ෂයත් එකතු වෙලා ඒක ශක්තිමත් කරන්නය කියා ඉල්ලා සිටින අතර ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමාගේ අදහස්වලටත් ගරු කරන බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ. භා. 5.17 ]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වන ව්‍යවස්ථාවේ මේ විධියට සඳහන්ව තිබෙනවා:

"රාජ්‍ය මූල්‍යය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතු වන්නේය. පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ නීතියක හෝ පවත්නා යම් නීතියක හෝ අධිකාරය අනුව හෝ ඒ යටතේ හෝ මිස කිසිම පළාත් පාලන ආයතනයක් විසින් හෝ වෙනත් පොදු අධිකාරයක් විසින් හෝ කිසිම බද්දක්, වරිපනමක් හෝ වෙනත් යම්කිසි බදු විශේෂයක් නියම කිරීමට බලයක් නොමැත්තේය."

ඒ අනුව බොහොම පැහැදිලියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ බලය -සියයට සියයක් බලය- මේ ගෞරවණීය පාර්ලිමේන්තුවට පවරා තිබෙන බව. 1978 මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිර්මාණය කරන විට විධායක බලය සහිත ජනාධිපති ධුරයක් නිර්මාණය කළත්, ඒ විධායක බලය සහිත ජනාධිපතිවරයකු විසින් විධායක බලය ක්‍රියාත්මක කරන ව්‍යුහයක් අලුතින්ම නිර්මාණය කළත් රාජ්‍ය මූල්‍ය පිළිබඳ බලය නීති සම්පාදනය කරන පාර්ලිමේන්තුව වෙත පවරා දී තිබුණේ අසීමිත ලෙසයි. ඒකෙන් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නිර්මාතෘවරුන් අදහස් කරපු දේ බොහොම පැහැදිලියි. එක අතකින් ශක්තිමත් විධායකයක් පවතින අතර, ජනතාවගේ බදු මුදල්, ජනතාවගේ ධනය ජනතාවගේ යහපත උදෙසා යොදවන, ඒ වාගේම ඒ ජාතික සම්පත් ප්‍රයෝජනවත්, තර්කානුකූල, දුර දක්නා නුවණින් යුතු ආයෝජනයක් ලෙස යොදවන්නට ඒ බලය පැවරුණේ මේ ශ්‍රේෂ්ඨ පාර්ලිමේන්තුවටයි.

අපි ඒක දැක්කා, මේ ව්‍යවස්ථාව නිර්මාණය කිරීමට මූලික වෙච්ච දිවංගත ජේ.ආර්.ජයවර්ධන ජනාධිපතිතුමා මුදල් අමාත්‍ය ධුරය පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු වෙත හැම වෙලාවේම පවරා දී තිබීම තුළ. එතුමාගේ වසර එකොළහක ජනාධිපති ධුර කාලය තුළ මුදල් අමාත්‍ය ධුරය පාර්ලිමේන්තුවට වග කියන, පාර්ලිමේන්තුවට නිතිපතා සහභාගී වන, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ ප්‍රශ්නවලට පිළිතුරු දෙන මුදල් අමාත්‍යවරයකු වෙත පවරා දී තිබුණා. හැබැයි පසු කාලයක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ආකෘතිය තුළ දීලා තිබෙන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් බලාපොරොත්තු වන්නා වූ පරමාර්ථවලට පටහැනිව ගිහිල්ලා මුදල් අමාත්‍යාංශයේ බලය ව්‍යවස්ථාදායකයේ සාමාජිකයකුට භාර නොදී විධායක ජනාධිපතිවරයා තමා වෙතම රඳවා ගැනීම තුළ සහ ඒ හරහා මහා භාණ්ඩාගාරය, මුදල් අමාත්‍යාංශය කියන ආයතන සෘජුව, ප්‍රායෝගිකව බලන විට

පාර්ලිමේන්තුවට වග නොකියන තත්ත්වයකට පත් කිරීම හරහා මුල්‍ය පාලනය පිළිබඳව මේ ගෞරවණීය පාර්ලිමේන්තුවට තිබුණු බලය හීන වී ගියා. දැන් එවැනි පසුබිමක් තුළ ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා සභාව කල් තැබීමේ යෝජනාවක විලාසයෙන් මේ ඉදිරිපත් කරපු යෝජනාව ඒ අහිමි වී ගිය ව්‍යවස්ථානුකූල බලය නැවත තහවුරු කර ගැනීමේ උත්සාහයක් ලෙස හඳුන්වන්නට පුළුවන්. මට බොහොම සතුටුයි ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමාගේ යෝජනාව ගරු රනිල් වික්‍රමසිංහ විපක්ෂ නායකතුමා අනුමත කිරීම ගැන. ඒ වාගේම එතැනින් ඔබ්බට වඩා ඵලදායී සහ පුළුල් කාරක සභා ක්‍රමයක් ගැන එතුමා අදහස් පළ කළා. අද මේ ගරු සභාවේ කථා කරපු සියලුම මන්ත්‍රීවරු ඔවුන්ගේ ප්‍රවේශයන් කුමක් වුවත් අවසාන විග්‍රහයේදී මේ යෝජනාවට කැමැත්ත පළ කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු විධියට තේරී පත් වෙලා වසර දෙකක කාලයක් ගත වෙනවා. ඒ වසර දෙකක කාලය තුළ, මගේ වෘත්තිය තුළ ලැබූ දැනුම, සමාජය තුළ ලැබූ දැනුම, බොහෝ දේ කියවා ලැබූ දැනුම ඇසුරෙන් සැලකිය යුතු අන්දමට මා මේ පාර්ලිමේන්තුවේ කථා කරලා තිබෙනවා. අප ශිෂ්‍යයන් ලෙස පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ඉගෙන ගන්නා කාලයේ අප ඉගෙන ගත්තේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ අදහසුත් රාජ්‍ය පාලනයේදී වැදගත් වෙනවා කියලායි.

ඒවා රජය විසින් සැලකිල්ලට භාජනය කරනවා කියලායි අපි ඉගෙන ගත්තේ. හැබැයි, අවාසනාවට වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැක්වෙන්නා වූ ඒ මුඛ්‍ය පරමාර්ථවලට පරිබාහිරව ක්‍රියාත්මක වන වර්තමාන ක්‍රමය තුළ, විසර්ජන පනත් කෙටුම්පත දෙවන වර කියවීම වෙන්න පුළුවන්, එහෙම නැත්නම් කාරක සභා අදියර වෙන්න පුළුවන් ඇතැම් විට විපක්ෂ මන්ත්‍රීවරුන් මේ සභා ගර්භය තුළ කරන්නා වූ කථාවලට ඒ අදහස්වලට වාචික අගය කිරීම් ලැබුණත් ප්‍රායෝගිකව එම අදහස් ක්‍රියාවට නැංවීම උදෙසා මුදල් අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරය සහ මුල්‍ය පාලනය පිළිබඳව සත්‍ය ලෙසම තීරණය කරන්නා වූ පාර්ලිමේන්තුවෙන් පරිබාහිරව සිටින නිලධාරින් කැමැත්ත දක්වන්නේ නැහැ.

අපි අත් හදා බැලීමක් විධියට කාල වේලාව ඉතිරි කර ගැනීමේ උපක්‍රමයක් වශයෙන් සලකා අමාත්‍යාංශ කිහිපයක වැය ශීර්ෂ සාකච්ඡා කිරීමට කාරක සභාවක් පත් කළා. මේ ගෞරවණීය පාර්ලිමේන්තුවේ පළපුරුදු මන්ත්‍රීවරු එහිදී අදහස් දැක් වූවා. ඒ කාරක සභාවේදී බොහොම වැදගත් විධියට, පුළුල් විධියට කරුණු සාකච්ඡා කරන්න අවස්ථාව ලැබුණා. විශේෂයෙන්ම ඉතිහාසයේ කරන ලද ආයෝජනයන්හි ඵලදායිතාවය සහ ප්‍රමාණාත්මකභාවය ගැනත්, අනාගතය උදෙසා කොපමණ ආයෝජනයක් කළ යුතුද යන්න ගැනත් අය වැය ඇස්තමේන්තු සකස් කරන රාජ්‍ය නිලධාරීන්ව ප්‍රශ්න කිරීමේ අවස්ථාව ලැබුණා. වැදගත්ම දේ මේකයි. සාමාන්‍යයෙන් රජයේ නිලධාරින් සහ රාජ්‍ය ප්‍රතිපත්තිය විවේචනය කිරීම කරන්නේ විපක්ෂයෙන් වුණත් මාධ්‍යයන්ට විවර නොවූ මෙවැනි කාරක සභාවකදී රජයේ අමාත්‍යවරුන්ට සහ රජය නියෝජනය කරන ධුර නොදරන මන්ත්‍රීවරුන්ට, රජයේ නිලධාරින් සහ රජයේ ප්‍රතිපත්තිය පිළිබඳව හෘදය සාක්ෂියට එකඟව විවේචනාත්මකව කථා කරන්නත්, ඵලදායි යෝජනා ඉදිරිපත් කරන්නත් මේ තුළින් කදිම අවස්ථාවක් ලැබෙනවා. මේ පාර්ලිමේන්තු සභා ගර්භය තුළ කරන කාරක සභා විවාදයකදී ඒ නිදහස ප්‍රායෝගිකව ලැබෙන්නේ නැහැ. මොකද, රජය හෝ අදාළ අමාත්‍යවරයා හෝ රජයේ විශ්වාසවන්ත නිලධාරින් හෝ අභියෝගයට ලක් කිරීම තුළ රජයට යම් වූ ආකාරයක අවදානමක් ඇති වෙයි කියන විශ්වාසයෙන් ඒ විවේචනයන් කිරීමට පැකිළෙනවා. මේ අනුව තිලංග සුමතිපාල මන්ත්‍රීතුමාගේ යෝජනාව ඉතා අනර්ඝ කදිම යෝජනාවක් බව කියන්නට කැමැතියි.

ඇත්ත වශයෙන්ම දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා මතක් කළා, මේ රටේ අදටත් අපි ආඩම්බරයෙන් කථා කරන සුවිශේෂ පනත් - නිදහස් අධ්‍යාපන ආඥා පනත, නිදහස් සෞඛ්‍ය පිළිබඳ නීති- සියල්ලම මේ රටට දායාද වුණේ ඩොනොමෝර් ව්‍යවස්ථාව තුළ ක්‍රියාත්මක වූ කාරක සභා ක්‍රමය නිසයි කියා. දීර්ඝ කාලයකට කලින් වුණත් පාර්ලිමේන්තුවේ බහුතර බලය දරන පක්ෂයටත්, විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන්ටත්, රාජ්‍ය පාලනයට ඵලදායි ලෙස දායක වෙන්න අවශ්‍ය කරන වාතාවරණය ඩොනොමෝර් ව්‍යවස්ථාව යටතේ විධායක කාරක සභා ක්‍රමය තුළ අන්තර්ගත වෙලා තිබුණා. වර්තමානයේ සමස්ත රාජ්‍ය තන්ත්‍රය ඩොනොමෝර් ව්‍යවස්ථාවේ ආකෘතිය තුළට අරගෙන එන්න අදහස් කිහිපයක් පළ වුණත් අප දැන් ඇවිත් තිබෙන දුර අනුව නැවත එතැනට ආපහු යන්න පුළුවන්ද කියන කාරණය ගැන අපට සැකයක් මතු වෙනවා. නමුත් විධායක ජනාධිපති ක්‍රමය තවදුරටත් පැවතීමට අවශ්‍යයි කියන වර්තමාන ආණ්ඩුවේ ප්‍රතිපත්තිය තුළ සිට වුණත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාවෙන් පැවරී තිබෙන රාජ්‍ය මූල්‍ය පිළිබඳ පරම බලය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට අවස්ථාවක් අපට ලැබෙනවා, සියලුම අමාත්‍යාංශ උදෙසා මෙවැනි කාරක සභා අපට පත් කර ගන්න පුළුවන් වුණොත්.

මේ ගෞරවණීය සභාවේදී අදහස් ප්‍රකාශ වුණා කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් වෙයිද; අදාළ පුහුණුව ලැබූ නිලධාරින් සිටින්නේද කියන කාරණා ගැන. හැබැයි, මේ මූලධර්මය පිළිබඳව ආණ්ඩුවෙත් විපක්ෂයෙත් තිබෙන එකඟතාව ගැන අපි හොඳ හිතින් සිතලා මේ කාරණය ආරම්භ කළොත් මුල් අවස්ථාවේදී යම් දුෂ්කරතා ඇති වුණත් ඵලදායි නොවන දීර්ඝ කාරක සභා විවාදයන් වෙනුවෙන් මේ ගෞරවණීය සභාව වැය කරන්නා වූ අසීමිත මුදල ගැන හිතන විට අපට වසරක් දෙකක් ඇතුළත අදාළ සම්පත් පිළිබඳ ප්‍රශ්නය සහ සේවක පුහුණුව පිළිබඳ ප්‍රශ්නය විසඳා ගැනීමට හැකියාව ලැබෙනවා.

මෙම යෝජනාවෙන් සිදු වන යහපත ගැන කථා කරන ගමන් මේ ගෞරවණීය පාර්ලිමේන්තුව වඩා ඵලදායි තැනක් බවට පත් කර ගන්නට කටයුතු කළ යුතු ආකාරය ගැන අදහස් කිහිපයක් දක්වන්න මා කල්පනා කරනවා. මේ ගෞරවණීය පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගැනීමට පවත්වන මැතිවරණ සඳහා වැය වන විශාල මුදල ගැන විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා සඳහන් කළා. ඒ වාගේම මේ පාර්ලිමේන්තුව නඩත්තු කර පවත්වා ගෙන යාමට විශාල මුදලක් වැය කරනවා. හැබැයි, අඩුම ගණනේ මේ රටේ අද පවත්නා සීමිත ප්‍රජාතන්ත්‍රවාදය තුළ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට තමන්ගේ හඬ නඟන්නට තිබෙන නිදහසක් සහිත එකම ස්ථානය මේ පාර්ලිමේන්තුවයි. ඒ නිසා මේ පාර්ලිමේන්තුවේ වටිනාකම මේ තිබෙන වාතාවරණය තුළ වුණත් අපට දැනෙනවා, තේරෙනවා. මේ පාර්ලිමේන්තුවේ නඟන හඬ, මේ පාර්ලිමේන්තුවේ විවාදයන්හි මහජන නියෝජිතයන් ඉදිරිපත් කරන සාරගර්භ කාරණා රටේ ජනතාවට දැන ගන්නට සැලැස්විය යුතුයි. රටේ ජනතාව ඉදිරියේදී මහජන නියෝජිතයන් මේ ගෞරවණීය පාර්ලිමේන්තුවට තෝරා පත් කර එවීමට කටයුතු කරන්නේ එම අදහස් දැන ගත්තොත් පමණයි. ඒ නිසා මේ ගෞරවණීය පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් කරන කථා, ඔවුන්ගේ අදහස්, අඩුම තරමින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කටයුතු මේ රටේ ජනතාවට කපා දැමීමකින් තොරව සම්පූර්ණ වශයෙන් අසලා, දැකලා ඔවුන්ගේ අදහස් සකස් කර ගන්නට ඇති අයිතිය තහවුරු කළ යුතුයි.

මේ පාර්ලිමේන්තුවේ විවෘතභාවය පිළිබඳ වඩා ඉදිරි පියවරක් තබමින් මන්ත්‍රීවරුන් දක්වන අදහස් සජීවී රූපවාහිනී විකාශනයක් හරහා සමාජගත කරන්නට ඉක්මනින්ම කටයුතු කළ යුතු කාලය දැන් එළැඹිලා තිබෙනවා. අපි දන්නවා, මේ වන විට ඒ පිළිබඳව

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

කමිටුවක් පත් කරලා යම් යම් ඉදිරි පියවර අරගෙන තිබෙනවා කියලා. මෙම කාරණයේදී අපි ලෝකයේ අනෙක් රටවලට වඩා බොහොම පිටුපසින් ඉන්නේ. අපි දන්නවා, ඉන්දියාවේ විතරක් නොවෙයි තුන්වැනි ලෝකයේ බොහෝ රටවල පාර්ලිමේන්තුවේ කටයුතු ජනතාවට සජීව ලෙස නැරඹීමට අවස්ථාව ලබා දී තිබෙන බව. ඒ වාගේම ප්‍රධාන කාරක සභාවල කටයුතු ජනතාවට සජීව ලෙස නැරඹීමට අවස්ථාව ලබා දී තිබෙනවා. එහි වාසි කිහිපයක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඊයේ දින මට කිව්වා දවස අවසාන වන විට ඔබතුමාත් මමත් පමණයි මේ පාර්ලිමේන්තුවේ ඉන්නේ කියලා. ඒ වාගේම තවත් මන්ත්‍රීවරු කිහිප දෙනෙක් මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. මන්ත්‍රීවරු 225ක් සිටින පාර්ලිමේන්තුවේ මේ තරම් වැදගත් යෝජනාවක් සාකච්ඡා කරන මොහොතේ ගණපූරණයවත් නොමැති වීම ගැන අප කනගාටු විය යුතුයි. අප ගණපූරණය පිළිබඳ ප්‍රශ්නය නඟන්නේ නැහැ. මොකද, මේ පාර්ලිමේන්තුවේ කටයුතු ප්‍රායෝගිකව ගෙන යා යුතු යැයි අප සිතන නිසා. හැබැයි, අනෙක් අතට ජනතාව ලබා දීලා තිබෙන වරම මොකක්ද? අප ප්‍රායෝගිකත්වය සලකා සභාව කල් තැබීමේ විවාද කර ගෙන යැමට අවශ්‍ය පසු බිම සකස් කර ගන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වලා තිබෙන "අවම සාමාජිකයන් විසි දෙනෙකුවත් සිටිය යුතුයි" කියන ගණපූරණය පිළිබඳ මූලධර්මය නොතකායි ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ නම් අදහස මේ සම්ප්‍රදාය ඉතාම නරක සම්ප්‍රදායයක් බවයි. මේ පාර්ලිමේන්තුවට එදිනෙදා පැමිණෙන මන්ත්‍රීවරු කවුද කියලා අප ලෝකයට කිව යුතුයි. මේ රටේ ජනතාව අදාළ දවසට පසුව පුවත් පතින්, අන්තර්ජාලයෙන් දැන ගත යුතුයි කලින් දවසේ පාර්ලිමේන්තුවට පැමිණි මන්ත්‍රීවරු කවුද කියලා ඒ අයගේ නම්වලින් දැන ගත යුතුයි. මොකද, මේ රටේ ජනතාවගේ බදු මුදල්වලින් අසීමිත මුදලක් වැය කරලා තමන්ගේ මහජන නියෝජිතයෝ පාර්ලිමේන්තුවට පත් කරලා එවන්නේ මේ ගෞරවණීය පාර්ලිමේන්තුවේ කටයුතුවලට, ප්‍රධාන සභා ගර්භයේ තිබෙන විවාදවලට සහ කාරක සභාවලට -ඒක උපදේශක කාරක සභාවක් වන්නට පුළුවන්, ස්ථාවර කාරක සභාවක් වන්නට පුළුවන්- අනිවාර්යයෙන් සහභාගි වනවාය යන හැඟීමෙන්.

පසු ගිය වසරේ අය වැය විවාදයේ දී අත් හදා බැලීමක් විධියට කාරක සභා අවස්ථාවට අදාළ අමාත්‍යාංශ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම උදෙසා පත් කරපු අය වැය කාරක සභාවටත් සමහර මන්ත්‍රීවරුන් සහභාගි වුණේ නැහැ යි කියලා මෙම විවාදයේ දී අදහස් දැක්වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සඳහා පුවත් පත්වල වැඩි ඉඩක් වෙන් කරන්නට අවශ්‍ය නැහැ. මේ සඳහා අන්තර්ජාලයේ වැඩි ඉඩක් වෙන් කරන්ට අවශ්‍ය නැහැ. ලොකු මුදලක් වැය කරන්නට වන්නේ නැහැ. පාර්ලිමේන්තු රැස්වීම් පැවැත් වුණු සෑම දවසකටම පසු දින, කලින් දවසේ පාර්ලිමේන්තුවට ආපු මන්ත්‍රීවරුන් කවුද, ආවේ නැති මන්ත්‍රීවරුන් කවුද, එදා දවසේ පැවැති කාරක සභාවලට සහභාගි වුණු මන්ත්‍රීවරුන් කවුද, සහභාගි නොවුණු මන්ත්‍රීවරුන් කවුද කියලා එළිදරවු කරනවා නම්, එම මන්ත්‍රීවරුන් අනිවාර්යයෙන්ම මේ සභා ගර්භයට පැමිණෙනවා.

ඒ විතරක් නොවෙයි. පාර්ලිමේන්තුවේ පැවැත්වෙන විවාද රූපවාහිනියෙන් පෙන්වන්නට පුළුවන්කම තිබෙනවා නම්, පාර්ලිමේන්තුව තුළ මන්ත්‍රීවරුන් කරන කථාවල ගුණාත්මක භාවය වැඩි වනවා; එතුමන්ලා ඒ සඳහා සූදානම් වී පැමිණෙනවා. ඒ වාගේම තමන්ගේ දැනුවත්භාවය සහ තමන් විසින් ඉදිරිපත් කරන අදහස්වල තිබෙන වැදගත්කම පිළිබඳව වැඩි අවධානයක් යොමු කරනවා. ඒ වාගේම ගුණාත්මක භාවයෙන් පහළ, පාර්ලිමේන්තුවේ මූලධර්මවලට පටහැනිව කටයුතු කරන මන්ත්‍රීවරුන්ව සමාජය තුළ එළිදරවු වෙලා ඔවුන්ව ඊළඟ මැතිවරණයේ දී ප්‍රතික්ෂේප කිරීමේ අවස්ථාව මේ රටේ ජනතාවට ලැබෙනවා.

මේ අනුව මම කල්පනා කරනවා, මේ අනර්ඝ යෝජනාව ක්‍රියාත්මක කිරීම හරහා මූල්‍ය පාලනය පිළිබඳව පාර්ලිමේන්තුවට තිබෙන බලය නැවත උපරිම තත්ත්වයකට ගෙන එන්නට අපට පුළුවන් කියලා. විධායක ජනාධිපති ක්‍රමයක් තුළ පාර්ලිමේන්තුවට සාපේක්ෂව අඩු වටිනාකමක් ලැබුණත්, ඒ අඩු වටිනාකම තුළ පවා උපරිම තත්ත්වයකට යන්නට, එක්සත් ජාතික පක්ෂය හැටියට අප මේ කාරක සභා පිළිබඳව යෝජනාව ස්ථිර කරනවා. ඒ වාගේම මේ රටේ ජනතාවට වග කියන ආයතනයක් හැටියට පාර්ලිමේන්තුවේ ප්‍රධාන සභා ගර්භයේ සහ කාරක සභා කටයුතු සඳහා ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ සහභාගිත්වය වඩාත් වැඩි කරන, වඩාත් දායක කරන යම් ප්‍රායෝගික ක්‍රියා මාර්ගයකට ක්ෂණිකව යැමට ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන්ට කල්පනාව උදා වේවා කියලා මා ප්‍රාර්ථනා කරනවා.

[අ. භා. 5.36]

**ගරු ඩිව් ගුණසේකර මහතා (මානව සම්පත් පිළිබඳ අමාත්‍යතුමා)**

(மாண்புமிகு டியூ குணசேகர - மனித வளங்கள் அமைச்சர்)

(The Hon. DEW Gunasekara - Minister of Human Resources)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව අනුමත කරමින් වචන ස්වල්පයක් කථා කිරීමට මා බලාපොරොත්තු වනවා. අය වැය ඇස්තමේන්තු කමිටුවක් අවශ්‍යයි කියලා යෝජනාවක් ඉදිරිපත් කළේ ඇයි? අපි කවුරුත් දන්නවා, මීට පෙර කථා කරපු විපක්ෂයේ මන්ත්‍රීවරුත්, ඒ වාගේම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුත් සඳහන් කළ ආකාරයටම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් රටේ මූල්‍ය පාලනය හා මූල්‍ය විනය පිළිබඳ බලතල පාර්ලිමේන්තුව වෙත පැවරී තිබෙන බව. මෙය පාර්ලිමේන්තු ඉතිහාසයේ, නැත්නම් ව්‍යවස්ථාදායක ඉතිහාසයේ ක්‍රමානුකූලව විධායකයෙන් ව්‍යවස්ථාදායකයට පවරනු ලැබූ බලයක්.

මුල් අවස්ථාවේ දී -අපි වැඩි ඈතට නොගියත්- යටත්විජිත යුගයේ දී ඩොනමෝර් කොමිෂන් සභාවේ නිර්දේශයන් හරහාත්, ඊට පසුව සෝල්බරි කොමිෂන් සභාවේ නිර්දේශයන් හරහාත් මූල්‍ය පාලනය හා මූල්‍ය විනය විධායකයෙන් ව්‍යවස්ථාදායකයට ක්‍රමානුකූලව පරිවර්තනය වුණා. අංග සම්පූර්ණ ලෙස බලය පවරනු ලැබුවේ 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පසුවයි. ඒ අනුව අපේ රටේ විතරක් නොවෙයි, මුළු ලොව පුරාම පාර්ලිමේන්තු සම්ප්‍රදායන් ගොඩනැඟුණා.

විධායක ජනාධිපති ක්‍රමයක් තිබෙන රටවල, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තිබෙන රටවල, විශේෂයෙන්ම මේ කමිටු හරහා එම බලය ආරක්ෂා කර ගැනීම සඳහා විශේෂ විධි විධාන සලසා තිබෙන බව අපි දන්නවා. මට පෙර කථා කරපු ගරු මන්ත්‍රීතුමන්ලා කිව්ව ආකාරයට ඇමෙරිකානු කොංග්‍රසයේ කමිටුවලට විශාල බලතල තිබෙනවා.

අපේ රටේ ගත වූ වසර 179ක කාලය තුළ -1833 ගත්තත්- අපට පෙනෙනවා, මේ විධායක බලයෙන් ව්‍යවස්ථාදායක බලයට මූල්‍ය පාලනය පැවරුණේ විශාල අරගලයක් තුළින් කියලා. ලොව පුරා පාර්ලිමේන්තු සම්ප්‍රදායන් තිබෙන හැම රටකම නිකම්ම නොවෙයි, විශාල අරගල තුළින් තමයි ඒ බලය ක්‍රමානුකූලව ව්‍යවස්ථාදායකයට පැවරුණේ. ඒ නිසා න්‍යායාත්මකව අපේ මූල්‍ය

පාලනය සහ මූල්‍ය විනය ව්‍යවස්ථාදායකය සතුව තිබුණත්, ප්‍රායෝගිකව ඒ ආකාරයෙන්ම සිදු වන්නේ නැහැයි කියන චෝදනාව තමයි දෙපැත්තේම ගරු මන්ත්‍රීවරුන් මේ අවස්ථාවේ දී ඉදිරිපත් කරනු ලැබුවේ. ඒ නිසා ඒ පිළිබඳව යම් නිවැරදි කිරීමක් කළ යුතුය කියලා අදහස් කරමින් මා මිත්‍ර ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙනවා. එය කාලෝචිත යෝජනාවක්.

විශේෂයෙන්ම මූල්‍ය පාලනය පැත්තෙන් ගන්න කොට අපට අවස්ථා තුනක් තිබෙනවා. එක අවස්ථාවක් තමයි අය වැයට පෙර ඇස්තමේන්තු ඉදිරිපත් කරන අවස්ථාව. මේ ගැන අපේ අතීත අත් දැකීම් අනුව ඇස්තමේන්තු ඉදිරිපත් කළාට, ඇත්ත වශයෙන්ම ඇස්තමේන්තු පිළිබඳව විවාදයක්, සාකච්ඡාවක් සිදු වන්නේ නැහැ. එය සිදු වන්නේ දෙවැනි අවස්ථාව වන අය වැය යෝජනා ඉදිරිපත් කළ අවස්ථාවේයි. ඒ අවස්ථාවේ පවත්වන විවාදයේදී තමයි ඇස්තමේන්තු ගැනත් සාකච්ඡා වන්නේ. ඒක තමයි අපේ අත් දැකීම. ඉන් පසුව තුන්වැනි අවස්ථාවේ තමයි, ගරු මන්ත්‍රීතුමන්ලාට පසු විපරම් කිරීමට අවස්ථාව ලැබෙන්නේ. මුදල් වෙන් කරලා, වැය කරලා අවුරුද්දක් ගත වුණාට පස්සේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අනුව විගණකාධිපතිතුමා - Auditor-General - පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන වාර්තාව සාකච්ඡා කරන අවස්ථාව වෙන කොට පසු විපරම් කිරීමට අපට අවස්ථාවක් ලැබෙනවා. මූලික වශයෙන් - ප්‍රධාන වශයෙන්- මූල්‍ය පිළිබඳව සාකච්ඡා කිරීමට ලැබෙන්නේ මේ අවස්ථා තුන පමණයි. නමුත් මුල් ඇස්තමේන්තු පිළිබඳව සාකච්ඡාවක් කිරීමට විවාදයක් ඇති වන්නේ නැහැ. මම හිතන්නේ ඒ නිසාම තමයි, කමිටුවක් මාර්ගයෙන් මේ ඇස්තමේන්තු පිළිබඳ සාකච්ඡාවක් ඇති කිරීමට විධිවිධාන සැලැස්විය යුතුයි කියලා මේ යෝජනාවෙන් අදහස් කරන්නේ.

මෙහිදී ඇස්තමේන්තු පිළිබඳව තිබෙන වැදගත්කම කුමක්ද? සමහර විට අපි මේවා නිකම් සංඛ්‍යාලේඛන ගොඩක් කියලා කල්පනා කරලා පැත්තකට දමනවා. මම කියන්නේ ඒ සංඛ්‍යාලේඛනවලට වඩා මෙහිදී මුදල් වෙන් කිරීමේ දී යම් ප්‍රතිපත්තියක් අනුගමනය කරනවා කියලායි. නිදර්ශනයක් වශයෙන් ගත්තොත් අධ්‍යාපනයට යම් සියයට ගණනක ප්‍රමාණයක් වැය කරනවා. අපේ මේ විවාදවලදී මතු වන ප්‍රශ්නයක් තමයි අධ්‍යාපනයට වෙන් කරන මුදල් ප්‍රමාණය - ඒ ප්‍රතිශතය- මදි කියන එක. එහෙම නම් එතැන ප්‍රතිපත්ති පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. විද්‍යාව සඳහා වෙන් කරන මුදල් ප්‍රතිශතය මදි කියනවා. අපට ඒක සවිස්තරව, ගැඹුරට ගිහින් වාද විවාද කිරීමට අවස්ථාව ලැබෙන්නේ ඒ ඇස්තමේන්තුව සාකච්ඡා කරන අවස්ථාවේදීයි. ඒ අවස්ථාවට නිලධාරීනුත් ඇවිල්ලා සහභාගි වෙනවා. එතැනදී අධ්‍යාපනයට මේ තරම් අඩු මුදල් ප්‍රමාණයක් වෙන් කරන්නේ ඇයි කියන එක සාකච්ඡා වෙනවා. විශේෂයෙන්ම විද්‍යාව ගැන හරියට කථා කරනවා.

අපේ අතිගරු ජනාධිපතිතුමා කියුබාවට ගිහින් කියුබානු ආණ්ඩුවත් එක්ක නැනෝ තාක්ෂණය පිළිබඳ ගිවිසුමක් අත්සන් කරනවා මම දැක්කා. නමුත් මේ නැනෝ තාක්ෂණය පිළිබඳව අපි කථා කළාට සමහර විට ඒක භාණ්ඩාගාරයට කිට්ටු කර ගන්නවත් බැහැ. ඒවා සාකච්ඡා කරන්නවත් සූදානම් නැහැ. ඒක ප්‍රතිපත්ති පිළිබඳ ප්‍රශ්නයක්. ඒ නිසා නැනෝ තාක්ෂණයට මුදල් වෙන් කරලා නැත්තේ ඇයි කියලා පැහැදිලිව අහන්න අර ඇස්තමේන්තු කමිටුවේදී ගරු මන්ත්‍රීවරුන්ට අවස්ථාව ලැබෙනවා. ඒකට කරුණු ඉදිරිපත් කරන්න අවස්ථාවක් ලැබෙනවා. අධ්‍යාපනයට මුදල් වෙන් කිරීමේ අඩු ප්‍රතිශතයක් තිබෙන්නේ ඇයි, සෞඛ්‍යයට මුදල් වෙන් කිරීමේ දී අඩු ප්‍රතිශතයක් තිබෙන්නේ ඇයි කියලා අහන්න ගරු මන්ත්‍රීවරුන්ට අවස්ථාව ලැබෙනවා. මේ ඇස්තමේන්තු පිළිබඳව පාර්ලිමේන්තුව තුළ කිසිම සාකච්ඡාවක් වන්නේ නැහැ.

අය වැය විවාදයේ දී පුරා මාසයක් තිස්සේ අය වැය ගැන කථා කරනවා. නමුත් නිශ්චිත වශයෙන් ඇස්තමේන්තු සකස් කරන්න කලින් මුල් අවස්ථාවේදී සාකච්ඡා කරලා ඊට පෙර වර්ෂයේ අත් දැකීම් පදනම් කර ගෙන අතිරේක මුදලක් වෙන් කරනවාද, නැද්ද කියන කාරණා පිළිබඳව සාකච්ඡා කරන්න මේ ඇස්තමේන්තු කමිටු සාකච්ඡාවේදී ගරු මන්ත්‍රීතුමන්ලාට අවස්ථාවක් ලැබෙනවා. මේකෙන් අලුත් අත් දැකීමක් ලැබෙනවා. අපි පසු ගිය වතාවේ අමාත්‍යාංශ 21ක් සම්බන්ධයෙන් යම් ප්‍රමාණයක සාකච්ඡාවක් කළා. නමුත් එය ප්‍රමාණවත් වන්නේ නැහැ. සමස්ත අය වැයේ ඇස්තමේන්තු පිළිබඳව විපක්ෂයේ හා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට සවිස්තරව, ගැඹුරින්, නිලධාරීන් එක්ක සාකච්ඡා කිරීමට අවස්ථාවක් ලබා දීම මා හිතන විධියට ඉතාම ප්‍රජාතන්ත්‍රවාදී දෙයක්. මොකද, පාර්ලිමේන්තුවට තමයි මූල්‍ය පාලනය හා විනය තිබෙන්නේ, විධායකයට හෝ වෙනත් ආයතනයකට නොවෙයි. ව්‍යවස්ථාදායකටයි ඒ බලය තිබෙන්නේ.

ව්‍යවස්ථාදායකයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් විශාල වශයෙන් පවරා තිබෙන්නේ මූල්‍ය පාලනය පිළිබඳ බලයයි. මූල්‍ය පාලනය පිළිබඳ බලය පාවිච්චි කිරීමට ව්‍යවස්ථාදායකයට ඉඩකඩ, පහසුකම් හා අවශ්‍ය සියලු වාතාවරණය කොන්දේසි නැතුව, සීමාවක් නැතුව ඇති කරලීමේ අවශ්‍යතාවක් තිබෙනවා. එය තමයි මේ යෝජනාවේ ප්‍රධාන සංකල්පය වන්නේ.

මෙම යෝජනාවේ පිටුපස තිබෙන සංකල්පය තමයි මූල්‍ය පාලනය හා මූල්‍ය විනය පිළිබඳ සංකල්පය. එය පාර්ලිමේන්තුව සතු දෙයක්. එය වෙනත් ආයතනයකට අයිති දෙයක් නොවෙයි. එය ජනතාවගේ ඡන්දයෙන් පත් වෙලා සිටින ව්‍යවස්ථාදායකය සතු මූලික හා ප්‍රධාන වග කීමක්. ඒ නිසා ඒ වග කීමට තිබෙන බාධා ඉවත්කරලීම අවශ්‍යයි. මේ යෝජනාව ක්‍රියාත්මක කිරීම තුළින් ඒ අවස්ථාව සැලසෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රතිපත්ති පිළිබඳව කාරණා පමණක් නොවෙයි මේ ඇස්තමේන්තු තුළ තිබෙන්නේ. මෙහිදී ප්‍රමුඛත්වය පිළිබඳ ප්‍රශ්නයකුත් මතු වෙනවා. නමුත් අද අවශ්‍ය ප්‍රමුඛත්වය දෙනවාද? ගරු මන්ත්‍රීවරු තමයි ජනතාවට සමීපව සිටින්නේ. ජනතාවගේ හඬ, හද ගැස්ම තේරෙන්නේ මන්ත්‍රීවරුන්ට. ඒ නිසා ප්‍රමුඛත්වය සලකා, ප්‍රමුඛත්වය අනුව මුදල් වෙන් කර තිබෙනවාද කියන කාරණය පිළිබඳව ප්‍රශ්න කිරීමේ අයිතිය ඇස්තමේන්තු පරීක්ෂා කිරීමෙන් අපට ලබා ගන්න පුළුවන් වෙනවා. ඒ මුදල් ප්‍රමාණයත්, ප්‍රතිපත්තියත්, ප්‍රමුඛතාවත් වැදගත් වෙනවා. ඒ කාරණා තුනම වැදගත් වෙනවා. ඒ නිසා තමයි ඇස්තමේන්තු සාකච්ඡා කිරීමට කොමිටියක් පැවැත්වීමේ වැදගත්කම තිබෙන්නේ.

දෙවන අවස්ථාවට එන්නේ අය වැය යෝජනා. බදු පනවන හැටි, ආදායම් වැඩි කර ගන්නා හැටි, සල්ලි වෙන් කිරීම පිළිබඳව තමයි අය වැය යෝජනාවලදී වැඩි වශයෙන් සාකච්ඡා වන්නේ. නමුත් ඇත්ත වශයෙන්ම ඇස්තමේන්තු කරන අවස්ථාවේ තමයි මුදල් වෙන් කරන්නේ, මුදල් වෙන් කිරීමට ඉඩකඩ ලැබෙන්නේ. ඒ නිසා සංකල්පමය වශයෙන් පළමුවන අවස්ථාවේදී මුදල් වෙන් කරලීමේදී, වෙන් කරන අයුරු, ප්‍රමුඛතාව, ඒ වෙන් කිරීමට පදනම් වෙන්නා වූ ප්‍රතිපත්තිය, ඒ වාගේම මුදල් කොපමණ ප්‍රමාණයක් වෙන් කරනවාද කියන එක පිළිබඳව ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් ලබා ගැනීමට ඉඩකඩ ලබා දිය යුතුයි කියන එකයි ප්‍රධාන කාරණය වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විධායක ජනාධිපති ක්‍රමයක් තිබෙන අවස්ථාවක ඒ පාර්ලිමේන්තුව හැල්ලුවට පත් වෙනවා. ඒක පිළිගත යුතු දෙයක්. ඒ නිසා තමයි අපි සංකල්පමය වශයෙන් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න ඕනෑ කියන ස්ථාවරයේ තවමත් ඉන්නේ. නමුත් ඒක පවතින තාක් කල් අපිට වැඩ කිරීමට අවශ්‍ය ඉඩකඩ සොයා ගැනීම අවශ්‍ය වෙලා තිබෙනවා. සියලු බලතල පාර්ලිමේන්තුවට, ව්‍යවස්ථාදායකයට සතු වන ක්‍රමය තමයි හොඳම ක්‍රමය. නමුත් මේ ක්‍රමය 1978 ඉඳලා

[ගරු ඩිව් ගුණසේකර මහතා]

ක්‍රමානුකූලව ඇවිත්, ඒකට ඇබ්බැහි වෙලා, ඒක ඉවත් කර ගන්න උත්සාහ ගත්තු අවස්ථා අසාර්ථක වෙලා පවතින තත්ත්වයක් යටතේ අතුරු ඵල වශයෙන් නොයෙක් ප්‍රශ්න විටින් විට මතු වෙනවා. ඒ නිසා තමයි තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළ ඒ ඉඩකඩ නිර්මාණය කරලීමේ තිබෙන අවශ්‍යතාව තේරුම් අරගෙන, පසු ගිය අවුරුද්දක් දෙකක් තුළ මේ ගරු සභාව තුළ විටින් විට මතු වූ ප්‍රශ්නයක් යෝජනාවක් හැටියට ගෙනැල්ලා තිබෙන්නේ. ඒ යෝජනාවට පක්ෂ විපක්ෂ දෙපාර්ශ්වයේම පොදු එකඟතාවක් පවතින මේ අවස්ථාවේ ඊළඟ අය වැයට පෙර ඒ යෝජනාව ක්‍රියාවට නැංවීමට අපට අවස්ථාව ලැබෙයි කියා අපි කල්පනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේ යෝජනාවේ තවත් වැදගත්කමක් තිබෙනවා. විධායක ජනාධිපති ක්‍රමයක් මේ රටේ පවතිනවා. ජනාධිපතිවරයා මුදල් ඇමතිවරයා වශයෙන් ඉන්න කොට එහි තිබෙන වැදගත්කම තවත් වැඩියි. එම නිසාමත් වැදගත්කම වැඩි වනවා. එම නිසා මේ අලුත් ඉඩ කඩ ලබා දීමේ කමිටු ක්‍රමය ස්ථාපිත කරලීමේ දැඩි අවශ්‍යතාව අපේ අත් දැකීම් තුළින්ම පැන නැඟී තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු තිස්ස විතාරණ ඇමතිතුමාත් මේ අවස්ථාවේදී එතුමාගේ අදහස් ප්‍රකාශ කළ බව දැන ගන්නට ලැබුණා. අද පවතින ආර්ථික ප්‍රතිපත්ති රාමුව තුළ මුදල් වෙන් කිරීමේදී හුදෙක් නිලධාරින්ට පමණක් ඉඩ කඩ දීම නොවෙයි අවශ්‍ය වන්නේ. ජනතාවගේ ඡන්දයෙන් පාර්ලිමේන්තුවට තෝරා පත් කර ගත් අයට ඉඩ කඩ ලබා දීමයි අවශ්‍ය වන්නේ. අපේ අත් දැකීම් පදනම් කර ගෙන, අය වැය ඇස්තමේන්තු ඉදිරිපත් කරන අවස්ථාවේම ඒ ගැන සාකච්ඡා කිරීමට ඉඩ කඩ ලබා දීම අනිවාර්ය අවශ්‍යතාවක් බවට පත්ව තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාවට මගේ සම්පූර්ණ සහාය දෙමින්, මෙය යථාර්ථයක් බවට පත් කර ගැනීමට අපට අවස්ථාව ලැබේවා!යි ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[பி.ப. 5.50]

**ගරු හුනෛයිස් ෆාරූක් මහතා**
(மாண்புமிகு ஹுனைஸ் பாறூக்)
(The Hon. Hunais Farook)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ உறுப்பினர் திலங்க சுமதிபால அவர்களால் கொண்டுவரப்பட்ட வரவுசெலவுத் திட்டக் குழு தொடர்பான இந்த முன்மொழிவானது வரவேற்கத்தக்க ஒன்றாக இருக்கின்றது. பொதுவாக அமைச்சுக்களின் Committee Stage விவாதத்தின்போது 5-10 நிமிடங்களென மிகவும் குறைவான நேரமே எங்களுக்கு ஒதுக்கப்படுகின்றது. சிலவேளைகளில் ஒரேநாளில் பல அமைச்சுக்களின் குழுநிலை விவாதம் நடைபெறுகின்றது. அந்த நேரத்தில் எமது முன்மொழிவுகளை அல்லது கருத்துக்களைக் குறிப்பிட்ட அந்தக் கால அவகாசத்துக்குள் கூற முடியாமல் இருக்கின்றது. இது ஒரு குறைபாடாகும். ஒரு குறித்த அமைச்சின் வரவுசெலவுத் திட்ட ஒதுக்கீடு தொடர்பாக விவாதிக்கும்பொழுது, அந்த அமைச்சினதும் அதன் கீழ் வரும் திணைக்களங்களினதும் உத்தியோகத்தர்களும் அந்த இடத்தில் ஒன்றாக இருந்து கலந்துரையாடல்மூலம் விடயங்களை ஆராய்ந்தால் உண்மையான பிரதிபலனை எதிர்பார்க்கலாம். அதாவது, குறிப்பிட்ட ஓர் அமைச்சு சம்பந்தமான விடயங்களை ஆலோசனைக் குழுக் கூட்டம் போன்று கலந்துரையாடும்போது அந்த இடத்தில் எமது கருத்துக்களையும் தெரிவிக்கக்கூடிய சந்தர்ப்பம் கிடைக்கும். அது ஆக்கபூர்வமான முடிவுகளை எடுப்பதற்கும் தேவைக்கேற்ப நிதிகளை ஒதுக்குவதற்கும் நல்லதொரு சந்தர்ப்பமாக அமையும்.

பொதுவாக வரவு செலவுத்திட்டக் குழுநிலை விவாதத்தின்பொழுது எதிர்க்கட்சியைச் சேர்ந்த பெரும்பாலான உறுப்பினர்கள் குறித்த அமைச்சு தொடர்பாகப் பேசாது, அரசியல் பேசுவதை எங்களால் காணக்கூடியதாக இருக் கின்றது. பாராளுமன்ற உறுப்பினர்களுக்கு குழுநிலையில் பேசுவதற்கு எதற்காகச் சந்தர்ப்பம் வழங்கப்படுகின்றதோ, அந்த நோக்கத்தை எதிர்க்கட்சியினர் மறந்து செயற்படுவதை எங்களால் அவதானிக்கக்கூடியதாக இருக்கின்றது. தங்களது பிரதேச மக்களைக் கவர்வதற்காகவும் தொடர்ந்தும் தங்களது அரசியல் இருப்பை மற்றும் பாராளுமன்ற இருக்கைகளைத் தக்கவைத்துக் கொள்வதற்காகவும் எதிர்க்கட்சி அரசியல்வாதிகள் இந்த விவாதத்தைப் பயன்படுத்தும் ஒரு நிலை காணப்படுகின்றது. அதேநேரத்தில் அந்த விவாதத்தின்போது ஆக்கபூர்வமான கருத்துக்களைக் கூறுவதற்கு ஆளுங்கட்சி உறுப்பினர்களுக்கு நேரம் போதாமல் இருக்கிறது. தற்போதைய பாராளுமன்றத்தை எடுத்துக்கொண்டால், ஆளுங்கட்சியில் 162 இற்கும் மேற்பட்ட உறுப்பினர்கள் இருக்கின்றார்கள். ஆனால், எதிர்க்கட்சியில் குறைவான உறுப்பினர்களே இருக்கின்றார்கள். இருந்தாலும், நேர ஒதுக்கீட்டில் ஆளுங்கட்சியினருக்கு குறைவான நேரமே ஒதுக்கப்படுகின்றது. பல அமைச்சுக்களின் குழுநிலை விவாதங்கள் ஒரேநாளில் எடுக்கப்படுகின்ற சந்தர்ப்பங்களின்போது எமக்கு மிகச் சொற்ப நேரமே ஒதுக்கப்படுவதால் குறித்த அமைச்சுக்கள் தொடர்பான விடயங்களை எங்களால் விவாதிக்க முடியாத நிலை ஏற்படுகிறது. ஒருசில அமைச்சர்களும் உறுப்பினர்களும் குறிப்பிட்ட துறைகளில் தேர்ச்சிபெற்றவர்களாகக் காணப்பட்டாலும், அவர்களுடைய அனுபவங்களைப் பகிர்ந்துகொள்வதற்கும் ஆக்கபூர்வமான கருத்துக்களைத் தெரிவிப்பதற்கும் போதிய நேரம் ஒதுக்கப்படுவதில்லை. எனவே, கௌரவ உறுப்பினரின் ஆலோசனைக்கமைய இந்த வரவு செலவுத் திட்டக் குழு அமைக்கப்பட்டால், நிச்சயமாக அது மிகவும் பிரயோசனமாக அமையும் என்ற எனது கருத்தை முன்வைத்து, சந்தர்ப்பம் அளித்தமைக்கு நன்றிகூறி, விடைபெற்றுக்கொள்கின்றேன். வஸ்ஸலாம்.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! Will an Hon. Member propose the Hon. Hunais Farook to take the Chair?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
I propose that the Hon. Hunais Farook do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු හුනෛයිස් ෆාරූක් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் அக்கிராசனத்திினின்று அகலவே, மாண்புமிகு ஹுனைஸ் பாறூக் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. ALHAJ A.H.M. AZWER *left the Chair, and* THE HON. HUNAIS FAROOK *took the Chair.*

[අ. භා. 5.55]

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Lakshman Yapa Abeywardena - Deputy Minister of Economic Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අය වැය කාරක සභාවක් ස්ථාපිත කරලා මූල්‍ය පාලනය පිළිබඳ වඩාත් විධිමත් වැඩ පිළිවෙළක් මේ පාර්ලිමේන්තුව තුළින් ක්‍රියාත්මක කිරීම අදහස් කර ගෙන, අපේ හිතමිත්‍ර තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා විසින් අද මේ සභාවට ඉතාමත් වැදගත් යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. අපේ රටේ පාලන ක්‍රමවේදයේදී මහජන මුදල් පාලනය අද ව්‍යවස්ථාදායකයට හිමි වෙලා තිබෙනවා. නමුත් ව්‍යවස්ථාදායකයේ යුතුකම නිසි ආකාරව මේ පාර්ලිමේන්තුව තුළ ඉෂ්ට වෙලා තිබෙනවාද කියලා අපි නැවත හැරී බැලිය යුතුයි. මොකද අද ව්‍යවස්ථාදායකයේ බලය තුළ ව්‍යවස්ථාදායකයේ යුතුකම අපි නිසි ආකාරව -මහ ජනතාවට ගැළපෙන ආකාරයට, මහ ජනතාව බලාපොරොත්තුවන ආකාරයට- ඉෂ්ට කරලා තිබෙනවාද කියලා අපට නැවතත් හැරිලා බලන්න කාලය ඇවිල්ලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මන්ත්‍රීවරයකු මේ පාර්ලිමේන්තුවට තේරී පත් වුණාට පස්සේ, මේ උත්තරීතර පාර්ලිමේන්තුව තුළ මහ ජනතාවගේ හැම සුබ සිද්ධියක් සඳහාම ප්‍රතිපත්තිමය තීන්දු ක්‍රියාත්මක කිරීම සහ මූල්‍ය පාලනය ඇති කිරීම තමයි ඔහුගේ ඉතාමත් වැදගත් කාර්ය වන්නේ. නමුත් අද මන්ත්‍රීවරයාගේ කාර්ය භාරය වෙන තැනකට තල්ලු වෙලා තිබෙනවා. ව්‍යවස්ථාදායකය තුළ තිබෙන මන්ත්‍රීවරයාගේ බලය, මහ ජනතාවට ගැළපෙන ආකාරයට, මහ ජනතාව බලාපොරොත්තු වන ආකාරයට ඒ යුතුකම් ඉෂ්ට වෙන තැනට තල්ලු වෙලා නැති බවයි අපට පෙනෙන්නේ. ඒකට හේතුව, මන්ත්‍රීවරයකු විසින් නොකළ යුතු දේවලට වැඩි පුර මන්ත්‍රීවරයකුට යොමු වෙන්න සිදු වෙලා තිබීමයි. මේ සභාවේදී කථා කළත් ඒ වාගේම ප්‍රාදේශීය මට්ටමෙන්, දිස්ත්‍රික්ක මට්ටමෙන්, ආසන මට්ටමෙන් ගිහිල්ලා ක්‍රියාත්මක කළත් ඒ සියල්ලම හුඟාක් වේලාවට අපේ දේශපාලන හේතූන් මත ක්‍රියාත්මක කරන ඒවා බවට පත් වෙලා තිබෙනවා. නමුත් අපි මේ පාර්ලිමේන්තුවට එවීමේදී මහ ජනතාවගේ බලාපොරොත්තුව වන්නේ විශේෂයෙන්ම රටේ මහ ජනතාවගේ අනාගතය - දරුවන්ගේ අනාගතය, රටේ අනාගතය- පිළිබඳ ප්‍රතිපත්තිමය තීන්දු ගන්න ගමන් මූල්‍යමය පාලනය පිළිබඳව අපේ යුතුකම ඉෂ්ට කරනවා දකින එකයි.

ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු මේ ඉතාමත්ම වැදගත් යෝජනාව ගැන අද අපට ඉතාමත් කැමැත්තෙන් සාකච්ඡා කරන්න පුළුවන්. මොකද ඒ යුතුකම අප විසින් ඉෂ්ට කළ යුතු නිසා. ඒ නිසා අය වැය කාරක සභාවක් පත් කිරීම අද ඉතාමත්ම කාලෝචිතයි. මේ පාර්ලිමේන්තුවේදී අය වැය විවාද තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේදී කාරක සභා විවාද තිබෙනවා. නමුත් මේ හැම අවස්ථාවකදීම මන්ත්‍රීවරයා විසින් කළ යුතු කාර්ය භාරය ඔහු විසින් ඉදිරිපත් කරන ප්‍රතිපත්ති, ඔහුගේ දර්ශනය මේ සඳහා යොමු කිරීමට අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. නමුත් මේ කාරක සභාවක් පත් කිරීම තුළ ඉතාමත් වැදගත් විධියට ඒ යුතුකම අපට ඉෂ්ට කරන්න පුළුවන්. ඒකට හේතුව මෙයයි. ලෝකයේ විවිධ රටවල් තිබෙනවා. අපි විවිධ කාලවල ප්‍රශ්න අරගෙන බැලුවාම සමහර අමාත්‍යාංශවලට විශාල මුදලක් එක එක කාලවලදී වෙන් කරලා තිබෙනවා. උදාහරණයක් හැටියට ගත්තොත් ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ කාලයේ විශාල මුදල් ප්‍රමාණයක් මහවැලි අමාත්‍යාංශයට වෙන් කළා. ප්‍රේමදාස මහත්මයාගේ කාලයේ ගත්තොත් නිවාස වැඩ පිළිවෙළට විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කළා. අද ඒ කාල සීමාවන් හා සසඳා බලන කොට ඊට වඩා වැඩි මුදල් ප්‍රමාණයක් මේ රටේ හැම අමාත්‍යාංශයක් හරහාම වියදම් කරන්නට වෙන් කෙරෙනවා.

මේ හැම එකක්ම අරගෙන බැලුවොත්, ඒ වෙන් කරන ලද මුදල් වියදම් කිරීමේදී එහි නියම ප්‍රතිලාභය මහ ජනතාවට ලැබෙනවාද කියන එක පිළිබඳව ඕනෑම කෙනෙකුට ප්‍රශ්නයක් තිබෙනවා. එකක් ඇස්තමේන්තුව වෙන්න පුළුවන්. එකක් ගැටීම් වෙන්න පුළුවන්. අද මේ රටේ බලය විමධ්‍යගත කරලා තිබෙනවා. පළාත් සභාවලට බලය විමධ්‍යගත කරලා තිබෙනවා. ඒ වාගේම ප්‍රාදේශීය සභා ක්‍රියාත්මක වනවා. එකම විෂයට මුදල් විශාල ප්‍රමාණයක් වැය වනවා. ඒ වාගේම එකම විෂය ආයතන කිහිපයක් මඟින් ක්‍රියාත්මක වනවා. මේ ක්‍රියාත්මක වීම තුළ නිසි ආකාරව මුදල් පරිහරණයක් සිදු වන්නේ නැහැ. හැබැයි අය වැය කාරක සභා අවස්ථාවක සාකච්ඡා කිරීමේදී වැදගත් වන්නේ මේ හැම එකක් පිළිබඳවම අපට තීන්දුවකට එන්න පුළුවන් වීමයි. සමහර විට පළාත් සභාවල තිබෙන විෂයන් එක්ක ගැටෙන්නේ නැති වන්න පුළුවන්. ඒ සඳහා මුදල් වැය කිරීමේදී විශාල මුදලක් ඒ පැත්තට තල්ලු නොවී, මේ දෙකම එකට එක්කාසු කරලා යම් කිසි සාධාරණ විධියකට මේ කටයුතු ක්‍රියාත්මක කරන්න පුළුවන්. ඒ ආකාරයෙන් විවිධ අංශවලින් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අපට අවස්ථාවක් ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධයෙන් අපට උදාහරණ කිහිපයක් ගන්න පුළුවන්. අප්‍රිකාව තුළ ශීඝ්‍රයෙන් දියුණු වන රටක් තමයි කෙන්යාව. කෙන්යාවේ මීට සමාන ක්‍රමයක් පවත්වා ගෙන යනවා. ඔවුන් පාර්ලිමේන්තුවේ අය වැය කාර්යාලය Parliament Budget Office නමින් ස්වාධීන ආයතනයක් ලෙස පවත්වා ගෙන යනවා. 2007 මැයි මාසයේ එම ආයතනය පිහිටුවලා තිබෙනවා. කෙන්යාවේ ජාතික අය වැයයි, ආර්ථිකයයි පිළිබඳ ඉදිරි දැක්ම මේ වන විට ඉතාමත්ම සාර්ථක වෙලා තිබෙනවා. ඒකට හේතුව කෙන්යාවේ පාර්ලිමේන්තුව තුළ මේ Budget Office එකේදී අය වැය ඇස්තමේන්තුවේ එක එක විෂයයන් පිළිබඳව මන්ත්‍රීවරු ඉතාමත් පැහැදිලිව අදහස් දක්වා, එතැනට නිලධාරින් ගෙන්වා, එම නිලධාරින්ගෙන් ඇස්තමේන්තු ලබා ගෙන, ඇස්තමේන්තුවල වැඩි, අඩු ඒවා පිළිබඳව සාකච්ඡා කරලා, ඒවා කොපමණ ඵලදායී ලෙස යොදා ගන්න පුළුවන්ද කියන එක පිළිබඳව සාකච්ඡා කිරීමේ වැඩ පිළිවෙළ අද කෙන්යාව තුළ ඉතාමත් හොඳින් ක්‍රියාත්මක වන තත්ත්වයකට පැමිණ තිබෙනවා. ඒකෙන් අතිවිශාල මුදල් සම්භාරයක් නිසියාකාරව පරිහරණය කරන ගමන් ඒවායේ ප්‍රතිඵල මහ ජනතාවට ඉතාමත් හොඳින් ලැබෙන ක්‍රමයකට තල්ලු කර ගන්න පුළුවන්.

කෙන්යාවේ තිබෙන Parliament Budget Office එක වෘත්තීමය ස්වාධීන කාර්යාලයක් වෙලා තිබෙනවා. එහි මූලික කාර්යය ජාතික අය වැය හා ආර්ථිකය පිළිබඳ කාලීන හා අදාළ තොරතුරු විශ්ලේෂණය කර සැපයීමයි. මේක තමයි ඉතාමත් වැදගත් වන්නේ. ව්‍යවස්ථාදායකයේ ප්‍රධාන යුතුකම වෙලා තිබෙන්නේ, ඒවා හරියාකාරව විශ්ලේෂණය කරලා, මහ ජනතාවට ඵලදායී ලෙස කොයි ආකාරයට ක්‍රියාත්මක කරනවාද යන්න පිළිබඳව තීන්දු, තීරණ ගැනීමයි. එහිදී නිලධාරින් ගෙන්වන්න පුළුවන්, නිලධාරින් එක්ක සාකච්ඡා කරන්න පුළුවන්, ඇස්තමේන්තු පිළිබඳ ඔවුන්ට දැනුම් දෙන්න පුළුවන්.

අපි ඇස්තමේන්තුවක් සම්මත කර ගෙන, ටික දවසක් ඒ කටයුතු ක්‍රියාත්මක කර ගෙන ගිහින්, ඒ කාර්යයට Supplementary Budget එකක් එක්කාසු කරනවා. එතකොට අපිට මුලදීම නිලධාරින්ගෙන් අහන්න පුළුවන්, මේ විෂය සඳහා කොච්චර ප්‍රමාණයක් වැය වෙනවාද, ඉදිරි මාස ගණන ඇතුළත මෙය නිම කරන්නට බැරි වුණොත් කොපමණ ප්‍රමාණයක වැඩි වීමක් වෙනවාද කියලා. මේ ආකාරයෙන් තර්ක, විතර්ක කරලා

[ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා]

අපට මේකට එක සීමාවක් ඇති කර ගන්න පුළුවන්. ඒ නිසා තමයි මහජන මූල්‍ය කළමනාකරණය සම්බන්ධ සියලුම කටයුතු සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට දෙපාර්තමේන්තු කමිටු හා තෝරා ගැනීම් කමිටු හරහා ඉදිරි දැක්මක් සැපයීමට කෙන්යාවේ කාර්යාලය මඟින් සිද්ධ කරන්නේ. මේ විධියට රටවල් රාශියක උදාහරණ තිබෙනවා. ඒ රටවල මේ පාර්ලිමේන්තු කාරක සභා හොඳට ස්ථාපිත කරලා -විශේෂයෙන්ම අය වැය කාරක සභාව- විශාල සේවයක් කරනවා.

කෙන්යාවේ Parliament Budget Office එකේ තිබෙන ප්‍රධාන කාර්යයන් ඒ අය වෙන් කර ගෙන තිබෙනවා. අය වැය හා අදාළ තොරතුරු සම්බන්ධ අය වැය කමිටුව, දෙපාර්තමේන්තු කමිටු, වෙනත් මූල්‍ය තේරීම් කමිටු සඳහා තොරතුරු සැපයීම, ඒ වාගේම එම කමිටුවල සීමාවන්වලට අදාළව සේවාවන් සැපයීම, අය වැය පරතරය අඩු කිරීම සඳහා වන ඒ අයගේ යෝජනා ආදී වශයෙන් වෙන් කර ගෙන තිබෙනවා. මේක ඉතාම ඵලදායී ලෙස ඒ අය ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒ නිසා ව්‍යවස්ථාදායකයට පැවරී ඇති වගකීම මැනවින්ම, ගැඹුරින්ම අය වැය කාරක සභාව තුළ සාකච්ඡා වෙනවා. එතකොට මන්ත්‍රීවරුන්ටත් වැඩිපුර කාර්ය භාරයක් තිබෙනවා.

අද අපේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයාට තිබෙන කාර්ය භාරය බැලුවොත්, මන්ත්‍රීවරයා පාර්ලිමේන්තුවට එනවා; උපදේශක කාරක සභාවට සහභාගි වෙනවා; ඒ වාගේම පාර්ලිමේන්තුවේ අදහස් ප්‍රකාශ කරනවා. නමුත් ප්‍රතිපත්තිමය තීන්දු සහ මූල්‍ය වියදම් කිරීම්වලදී ඔහුගේ දායකත්වය කොපමණ දුරට අඩුවෙන්ද ලැබෙන්නේ? මේ පාර්ලිමේන්තුවේ අපේ කාර්ය භාරය වෙලා තිබෙන්නේ රජයේ මුදල් නිසියාකාරව පරිහරණය කිරීම. ඒ සඳහා අපි දෙන දායකත්වය මොකක්ද? අපි තියන්නේ පශ්චාත් මරණ පරීක්ෂණ. අපි COPE එකට ආයතනවල නිලධාරින් ගෙන්වනවා. වැරැද්ද වුණාට පසුව COPE එකට ගෙන්වලා නිලධාරියාට දඬුවම් දෙන එක එහෙම නැත්නම් ඒ ආයතනය පිළිබඳව තොරතුරු සොයන එකයි කරන්නේ. නමුත් ඊට කලින් කරන්න තිබෙන දේ මේ පාර්ලිමේන්තුවෙන් ඉෂ්ට වෙලා තිබෙනවාද?

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවත් අන්තිමට ඒ අයගේ වැරැද්දයි හොයන්නේ. අපි රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට ගිහින් නිලධාරින්ට දොස් කියනවා, ප්‍රශ්න අහනවා. මේ ඔක්කොම කරනවා. නමුත් ඊට කලින් කරන්න තිබෙන රාජකාරිය අපි පාර්ලිමේන්තුව තුළ කරලා නැහැ. ඒ නිසා තමයි ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා ගෙනාව මේ යෝජනාවේ වැදගත්කම තිබෙන්නේ. මේ යෝජනාව තුළින් අපිට මේක මුලදිම හදා ගෙන ඉස්සරහට යන්න පුළුවන් ක්‍රමවේදයක් ඇති වෙනවා. ඒක තමයි ඉතාමත්ම වැදගත් වෙන්නේ. ඒ වාගේම අත්‍යවශ්‍ය, කාලීන වැදගත් විෂයන් පිළිබඳව තෝරා බේරා ගන්න අපිට පුළුවන්, මොන විෂයන්ද වඩාත්ම රටට වැදගත් වෙන්නේ කියා. හැම අමාත්‍යාංශයක්ම වැදගත්. නමුත් මහ ජනතාවගේ මූල්‍ය පරිපාලනය පිළිබඳව -මහජනතාව වෙනුවෙන් විශාල වශයෙන් මුදල් වියදම් කරන අමාත්‍යාංශ පිළිබඳව- අපි වැඩි අවධානයක් යොමු කරන්නට ඕනෑ. ඒ නිසා අය වැය කාරක සභාවේදී අපට ඒ පිළිබඳව ප්‍රමුඛත්වයක් දෙන්න පුළුවන්. අපි අධ්‍යාපනයට කොපමණ වැය කළ යුතුද? ගිය අවුරුද්දේ අපි අධ්‍යාපනයට වැය කරලා තිබෙන්නේ සියයට 4යි. අපි ලබන අවුරුද්ද වන විට මේක සියයට 6ක් දක්වා වැඩි කරන්නට ඕනෑ. අපි අනවශ්‍ය වියදම් අඩු කරලා ඒවා එතැනට තල්ලු කරන්න ඕනෑ. ඒ විධියේ තීන්දු, තීරණ රාශියක් මේ කාරක සභා තුළින් අපට ගන්න පුළුවන්.

ඉන්දියාව, කෙන්යාව වාගේ රටවල මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත කමිටු පත් කරනවා. අද කෙන්යාවේ මන්ත්‍රීවරු තිස් දෙනෙකුගේ කමිටුවක් මඟින් තමයි අය වැය කාරක සභාව, Budget Office එක සමන්විත වන්නේ. ඇමතිවරයෙක් එකේ සභාපති වෙන්න බැහැ. මන්ත්‍රීවරුන් අදහස් ප්‍රකාශ කරලා, මන්ත්‍රීවරුන්ම තීන්දු අරගෙන ඊට පස්සේ තමයි අදාළ අමාත්‍යාංශයේ ඇමතිවරයා ගෙන්වලා ඒ පිළිබඳව සාකච්ඡා කරන්නේ.

මෙහි මූලික කාර්ය වන්නේ පාර්ලිමේන්තුවේ වැය ශීර්ෂයක් ඉදිරිපත් කිරීමේදී නිසි ක්‍රමවේදයකට එන එක. ඒ තුළින් ආර්ථික ක්‍රියාකාරකම් සහ මුදල් වෙන් කිරීම් සෑම අංශයක් සඳහාම අවශ්‍යතාව අනුව බෙදී යනවා. මේ අවුරුද්දේ මේක ස්ථාපිත කළොත්, -මෙවර අය වැයට පෙර- සම බරව රටට අවශ්‍ය විධියට ක්‍රියාත්මක කරන්න පුළුවන් මූල්‍ය පරිපාලන ක්‍රමවේදයක් අපිට සකස් කර ගන්න පුළුවන්.

මම මීට වඩා දීර්ඝව කථා කරන්නට යන්නේ නැහැ. කථානායකතුමාගේ අවසරය ඇතුව ඉදිරියේදී අපට මෙම සොයා බැලීම් කරන්න පුළුවන් නම් විශාල වෙනසක් මේ රටේ ඇති කරන්න පුළුවන් කියලා මම හිතනවා. මන්ත්‍රීවරයාගේ කාර්ය භාරය නිසියාකාරවම ක්‍රියාත්මක කරන්න පුළුවන් ඉතාමත්ම හොඳ යෝජනාවක් හැටියට මේක සලකමින්, මේ යෝජනාවට අපේ සහයෝගය ලබා දෙන බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Dr. Harsha De Silva, you have 10 minutes.

[6.07 p.m.]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Sir, I think it is a very timely move by the Hon. Thilanga Sumathipala to have brought in this Adjournment Motion today to establish a Budget Committee and hopefully expand the scope of that Committee. I applaud the Hon. Member's courage to bring this type of Motion to this House. I hope that he will get the necessary support to take this forward.

Beyond the Budget Committee, Sir, we need to look at two other types of Committees: one is a Public Finance Committee and the other one is a set of Oversight Committees. As the Hon. Leader of the Opposition has already stated, these two Committees have been proposed previously. What is important here is this. I will just read the first sentence: "There shall be a Committee to be designated, 'The Committee on Public Finance' consisting of a Chairman and eleven Members nominated by the Committee of Selection provided that the Chairman shall be a Member of the Opposition". So, that is a crucial point. The proposal of the Hon. Sumathipala does not have anything like that. But, it is important that the Opposition also plays an equally important role in implementing what is in the Constitution of this country. Article 148 of the Constitution specifically states, I quote:

"Parliament shall have full control over public finance".

It does not say that the ruling party shall have full control over public finance. When it says "Parliament", it means all 225 of us, save the Speaker. So, what the framers of this Constitution really meant, Sir, is that both sides of this House have equal opportunity to participate in that process. It is true that the Government presents the Budget. But, it is also true that the Opposition has equal responsibility to ensure that the tax payers' money is spent in the most appropriate way.

Now, Sir, we debate here the Appropriation Bill for a month but we do not debate at all how much loans we take, how we take those loans and on what terms we finance this expenditure. As a matter of fact, there is only one sentence in the Appropriation Bill that gives a limit on what the Treasury can borrow for that year. So, I think if we create a Public Finance Committee and, like the Hon. Leader of the Opposition along with some other Members have previously proposed, a set of Oversight Committees, nine Oversight Committees, to look into the various aspects of Government, from internal administration to environment and natural resources to international relations. Therefore, it is the spirit in which the framers of this Constitution envisaged that this House will conduct the duties of managing the nation's finances.

Talking about the nation's finances, in the last few days we have been in a very harsh debate on the Employees' Provident Fund. I do not intend going into it in detail. But, in the context of an Oversight Committee, had we had an Oversight Committee, had we had a Budget Committee, we would have been able to summon these officials. Now, we are talking about the Public Accounts Committee. That is bean counting - closing the stable door after the horse has bolted. That is not what we are proposing here. Sir, the Employees' Provident Fund has not come to the Public Accounts Committee for the duration of this Government. For six years these people have not come to the Public Accounts Committee.

So, Sir, how is it then possible for us as Members of Parliament to have full control of public finance.

As a matter of fact, there is a clause in the 1958 Bill of the Hon. T.B. Ilangaratne that if the EPF is unable to make a minimum payment of two and a half per cent to the members of the EPF that this House shall allocate such funds from the Consolidated Fund and subsequently those funds should be paid back. Therefore, it is very clear that the EPF has to be managed in an appropriate way and this House is responsible for that.

Now, we know that the day before yesterday an international agency, the Standard and Poor's rating agency, had issued a statement alleging that there are conflicts of interest in the way the Employees Provident Fund is managed. Those conflicts of interest have been very specifically referred to by the then Attorney-General, I believe in the early 2000s, and the logic for that is that the Monetary Board, while regulating the commercial banks, also regulates the EPF. Therefore, the conflicts of interest can arise because it is the same regulatory agency that is looking at both the commercial banks and the EPF. That is why the Investment Policy created then very specifically said, "No, the EPF should not be investing in banks and financial institutions". It said, "No, it cannot". It also said, among other things, that it can invest only in what are called "blue-chip" equities, meaning, companies of repute, meaning companies that are at least listed on the main board of the stock exchange; not those companies that are listed in the secondary board. Now, what has happened is, in the recent past, all those regulations, or shall I say, the guidelines have been violated. The EPF has violated its own investment guidelines and are now engaged in buying and selling shares of stocks and also in the process "nationalizing these private banks" because if you look at the shareholding structure of most of the large commercial banks today, you will find either the EPF or the ETF and the Government-owned banks and insurance companies control the largest number of shares individually and collectively. So, while there are guidelines, these guidelines have been violated.

Now, the Hon. (Dr.) Sarath Amunugama read the Government's reply to the statement made by the Leader of the Opposition -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon Member, please wind up now.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Sir, can you please give me three more minutes, I will finish quickly.

Yesterday, the Central Bank issued a statement with its usual allegations that the Opposition is trying to destabilize this economy. Regularly, they say this. Then, they say, "Based on the above, the EPF wishes to affirm that there is no conflict of interest and that the EPF believes that the statement by S & P seems to be based on certain recent allegations that have obviously been designed to achieve the objective of discrediting the EPF". We have no intention of discrediting the EPF.

We are not here to do that. We are not bankrupt politicians. That is not what we are saying. Sir, all what we are saying is that if there are certain guidelines laid down, those guidelines must be adhered to. In a situation where we do not have any authority to question these people before problems arise, and even afterwards when we have no opportunity to summon them before the Committee on Public Accounts for six years, how can we, Sir, live by what we are supposed to live by, according to the Constitution of this country?

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

The Hon. (Dr.) Sarath Amunugama today said, "The EPF investing team and the Department is completely independent of the Bank Supervision Department". So, why he is saying that is because the Bank Supervision Department is the department that regulates the banks and the EPF Department is the department that invests in those banks. Therefore, the point is being made that there is complete independence between these two departments. I do not have time to go into this but I am going to -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, please wind up now.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Sir, I will wind up now. I will just make this point. We can talk about this later in great detail. I am sure it will become a point of debate. The Hon. Gitanjana Gunawardena yesterday tabled a document on the dates of the Investment Committee meetings and persons who have attended for that in the year 2011. Of the people who are in this Investment Committee for 2011, the first person is the gentleman by the name of Mr. P.D.J. Fernando. He left subsequently and joined a company called Taprobane Holdings Limited, which is owned by a gentleman by the name of Mr. Ajith Devasurendra who has been in the news. Subsequently, the Deputy Governor, Mr. B.D.W.A. Silva was appointed as the head of the Investment Committee of the EPF. But, what we found out was that he is the Deputy Governor in charge of bank supervision.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, please wind up.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Sir, I am winding up. He is in charge of bank supervision. He is the Deputy Governor in charge of bank supervision. He is heading the Investment Committee of the EPF. How can the Hon. (Dr.) Sarath Amunugama come here and say that there is independence between the Bank Supervision Department and the EPF? These questions can be discussed later on. To wind up, Sir, once again I commend the Motion brought by the Hon. Thilanga Sumathipala. We would like to support that and in addition to that, we would like to propose that the Public Finance Committee and the 10 Oversight Committees also be looked into that.

Thank you.

[6.21 p.m.]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
*Bismillahir Rahmanir Raheem.*

Mr. Presiding Member, when we are asked to discuss certain structural alterations in our Parliamentary system, I feel, Sir, that I have to perform a pleasant task and I remind this House that the Executive President, who is called upon to be present in this House once in three months is a very significant and progressive piece of constitutional provision in our Parliamentary system, came to this House 42 years ago and first entered Parliament on the 6th of June, 1970. He has completed 42 years since he first entered Parliament and today, His Excellency Mahinda Rajapaksa is hailed as one of the great leaders in Asia. Significantly, today he is addressing the Earth Summit in Rio de Janeiro, Brazil together with all great leaders in the world. So, for little Sri Lanka, he has been a beacon of light and has assumed almost the leadership of Asia because he is the most senior leader in this part of the world.

Sir, I should remind that he came to Parliament from the Beliatta Electorate at the age of 24 as the youngest Member of Parliament. He polled 23,103 votes with a majority of 6,626. That is a percentage of 57 per cent. On that occasion, he had a poster pasted in his Electorate, with a *kavi*, which I quote:

"දහදුක් විඳින ජනතාවට සහය දෙමින්
ජාතිය නැඟූ රුහුණෙහි මිණි පහන වෙමින්
මියගිය පියාගේ පියවර අනුව යමින්
පොඩි පුතු පෙරට එයි ඔබ හැම පරද වමින්"

That is how he registered his first entry after the great victory and still, he is reigning victorious. This *kavi* was quoted by Mr. C. Kuruppu, the Librarian of the Parliament, in his article "ජනාධිපතිතුමා මන්ත්‍රීවරයකු ලෙස පත් වී වසර 42යි" published in the "Silumina" newspaper of 27th May, 2012.

Now, Sir, the Hon. Thilanga Sumathipala, my dear Friend and Colleague, has earned the goodwill of perhaps both sides of this House and there is concensus - [*Interruption.*] Yes, the Hon. Member is my "dear Friend" outside the House and inside, he is my "Honourable Colleague" and he has moved a very timely Motion.

What does it call for, Sir? I would like to quote from "Practice & Procedure of Parliament" by M.N. Kaul and S.L. Shakdher and edited by P.D.T. Achary. What the Hon. Member exactly envisages is given in that book under Parliamentary Committees - Chapter XXX - of the Lok Sabha. It states, I quote:

" A. Committees in General

Parliament transacts a great deal of its business through Committees. These Committees are appointed to deal with specific items of business requiring expert or detailed consideration. The system of Parliamentary Committees is particularly useful in dealing with matters which, on account of their special or technical nature, are better considered in detail by a small number of members rather than by the House itself. Moreover, the system saves the time of the House for the discussion of important matters and prevents Parliament from getting lost in details and thereby losing on matters of policy and broad principles."

What a truth the Hon. Thilanga Sumathipala has realized in Parliament today! This is the system that is followed in the Lok Sabha, the greatest democracy in the world!

Sir, Parliamentary practices and procedures are based on traditions. This is what Erskine May, the authority on Parliamentary procedure and practices, says in the Introduction of his voluminous book, I quote:

" 'The law, privileges, proceedings and usages of Parliament' in a nation with a long history and an unwritten constitution must be discovered largely by observing its practice, rather than by consulting fundamental texts and the decisions of a Supreme Court."

The Great Britain has an unwritten Constitution and up to this day, they have not faltered in their Parliamentary system. It is the Mother Parliament. We are following the same system which is called the Westminster system. Erskine May further goes on to state in its Introduction, I quote:

"The 'law of Parliament' includes those aspects of Parliamentary activity that depend for their effectiveness on recognition by the courts, and such law - although it may be unwritten - is only changed by way of statute. But most Parliamentary procedure and usage derives from the admitted right of each House to regulate its own proceedings,…"

That is, the House of Lords and the House of Commons there. We had the Senate earlier. Now, we have only one Chamber. Earlier, we had a bicameral system; it is a unicameral system that we have today. So, these practices and procedures are being adopted and followed by democracies all over the world.

Sir, I have here a very important magazine called "The Parliamentarian" which we receive regularly, and that also mentions about the practices followed in various Parliaments in the world including the Parliaments of Tongo, Panama, Seychelles etc. It is very well edited by the Commonwealth Secretariat, UK, and the Hon. Members of this House also receive copies of it regularly.

Sir, now I must also add a word of caution**.** That is, Parliament is Supreme. The whole power vests in Parliament. We are the voice of the people. We derive the power from the people's sovereignty. Of course, we say, in our Islamic terminology, that we derive power from God. But, in the Parliamentary system, it is from the people.

When we try to shift or reshuffle it a little bit here and there, there should not be any injuries caused to the existing system because our Parliamentary system is foolproof. It has been thought of very well and the Standing Orders are very well drafted. We are very clear on that. There are 142 numbers in our Standing Orders, which have provisions for the various Committees like the COPE, the Committee on Public Petitions, the Committee on Public Accounts, the Consultative Committees and so on.

Today, what has happened is that there is a freak Opposition; the Opposition is in tatters. For a healthy Parliamentary democracy, there must be a powerful Opposition. Sir, I would recall the first Election in 1947. Through manipulation, you can make the winning party lose and the losing party win. Sir, take for example, the 1947 Election, It was a staggered election. It was held for 19 days: from 23rd, 25th, 26th, 27th, 28th, 30th of August and 1st, 4th, 6th, 8th, 9th, 10th, 11th, 13th, 15th, 16th, 17th, 18th and 20th of September, 1947. For how many days had it gone on?

Now, we have a foolproof system that we have the election conducted in one day covering the entire Island. That is the progress we have made through this. What happened at the Election held in 1947? The United National Party polled a total number of 751,432 votes, securing 42 seats. Out of a total of 95 seats, six, of course, was nominated under the Soulbury Constitution.

Sir, the most important thing is, the Opposition received about 111,000 votes at that Election.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, it is almost 6.30 p.m. now.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Then, Sir, the tornado sent down by that fearful speedster, the Hon. (Dr.) N.M. Perera, just missed by, what we call in Cricket parlance, a "whisker", missing the off stump of that clever batsman, the Hon. D.S. Senanayake and lobbed into the gloves of the wicketkeeper, Lord Soulbury. The ball flew within a kissing distance, so to say. The Hon. Thilanga Sumathipala knows that cricket parlance.

Today, we would say healthy Parliamentary traditions could be built as a consensus has been reached in this House between the Government and the Opposition. In future, we can look forward to having great and healthy traditions built through Parliament of Sri Lanka, which

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

would be a lesson to most of the Parliamentary democracies in the world.

As I began, Sir, may I again pay the tribute of the entire House to His Excellency the President, who has rendered a distinguished service since becoming a Member of this House 42 years ago.

Thank you, Sir.

***එකල්හි වේලාව අ. භා. 6.30 වූයෙන් මූලාසනාරූඪ මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2012 ජූනි මස 22වන සිකුරාදා අ. භා. 1.30 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது, பி. ப. 6.30 மணியாகிவிடவே தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயேபாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி பாராளுமன்றம், 2012 யூன் 22, வெள்ளிக்கிழமை பி. ப. 1.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது*

*It being 6.30 p.m..,* MR. PRESIDING MEMBER *adjourned Parliament without Question put.*

*Adjourned accordingly until 1.30 p.m. on Friday, 22nd June, 2012.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**දායක මුදල් :** පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

**சந்தா ;** ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.